

යමුනා මාලිනී පෙරේරා

# නින්නාදේ

kathapothak.blogspot.com

kathapothak.blogspot.com

සසර පුරාම සැරිසරලා සැරිසරලා හොයාගත්ත කෙනෙක් ගානටයි මට නම් සඟීක් ගැන හිතුණේ. මොන අතින්ද අපි ගැලපෙන්නෙ කියලා කවරුහරි ඇහුවොත් අහන්න තියෙන්නෙ මොන අතින්ද අපි නොගැලපෙන්නෙ කියන ප්‍රශ්නෙ විතරමයි. ඒ තරමට තකට තක. ජාඩියට මූඩිය කියලත් ඉස්සර කාලෙ කවුද කෙනෙක් කියලා තියෙන්නෙ මේ වගේ සම්බන්ධෙකට වෙන්න ඇති.

මට මෙවෙලෙ මතක් වෙන්නෙ ටෝල්ස්ටෝයි ගෙ ජීවිත කතාව. පිරිමියෙක් එක්ක වාසය ලේසි නෑ. වගේම උගත්කම් තියෙන පණ්ඩිත පිරිමියෙක් එක්ක වාසය කොහොමවත්ම ලේසි නැහැ. පොල් ගහක් පෙන්නලා සඟීක් කිව්වොත්,

"හිමනා........ මේං........ පුවක් ගහක්........"

කියලා, කිසිම අරෝවක් නැතිව "අනේ හැබෑවටම ඔව් නේන්නම්" කියලා කියන්න මම කට මැදගෙනයි හිටියෙ.

ඒ වුණාට "ඒ පුවක් ගහේ හැදෙන්නෙ පොල් නේද?" කියලා සඟීක් ඊළඟට කිව්වාම මට කියන්න තිබුණේ.

"අනේ ඇත්තමයි........ මේං පුවක් ගහක පොල් හැදිලා........ ගිනස් වාර්තාවක් නේද කියලා.

එතකොට නම් හැබැයි සඟීක්ට කේන්ති යනවා.

"ඔයා මොකද ගිනස් වාර්තා ගැන කියන්නෙ? ඒක හරිම අතිශයෝක්තියක්. ඔයාට කියන්න තියෙන්නෙ........ "ඔව් ඇත්තමයි පුවක් ගහේ පොල්." එච්චරයි. අර අනික් කෑල්ල ඔයාගෙ බුද්ධිය ප්‍රදර්ශනය කරන්න ඔයා එල්ලගත්තු බෝඩ්

ලෑල්ලක් විතරයි. ඒක මේ නිකං දිරච්ච හං පලච්ච බෝඩ් කෑල්ලක් විතරයි.”

සගීත් එහෙම කිව්වාම මට ටිකක් දුක හිතුණා. ටික.......? මොන ටිකක්ද හොඳටම........! ඒත් පවුලෙ සගීත් මොකටද එයාගෙ හිත රිදවන්නෙ........ මම නිහඬ වුණා.

නිමිනා සාමෝදයා - දිනපොත
දිනය: 1970 ජන. 12

මට ඕනෑ විදියට හිතන පතන කෙනෙක් මිසක් මට වෙන කිසිම කෙනෙක් අවශ්‍ය නෑ කියන ආකල්පයට මම ඇවිත්. ඒ ඇවිත් තියෙන්නෙ මගේ වටපිටාව මට විඳින්නට ලැබෙන දේවල් වලින් මගේ හිත සැලෙන කොට මගේ හිත ගානට පෑම් වෙනවා. ඊළඟට එකෙන් හැදෙන්නෙ බොහෝම මුවාත ඇති ආයුධයක් මේ ලෝකේ කාටවත් බය නැති පන්හරයක් මගේ ඇඟට එනව. මේ ලෝකෙ කිසිම දෙයක් මට ඕන විදියට නැත්නම් මට ඒකෙන් ඇති වැඩක් නෑ නැමයි.

මගේ කර උඩ තියලා මසුරන් පොදි බැඳ ගැට ගැහුවත් මම මගේ ගතිය අරිය එකක් නැහැ. ඒ මගේ හැටි.

සගීත් උදාකර - දිනපොත
දිනය 1970 ජන. 12

ඔය දිනපොත්වල කෑලි එක්කාසු කරන පිස්සුව තාම ඉවරයක් නෑ වගේ. කොහේ හරි ගිහිල්ලා කොහේ හරි කුණු ගොඩක් උස්සාන ඇවිත් මෙසේ උඩ පොදි ගහනවා. මගේ විනෝදාංශය අස්වාභාවික එකක් යැයි මගේ බිරිඳ සිතයි. ඇයට එසේ සිතන්නට හොඳටම නිදහස ඇත. ඒ ඇය බිරිඳක් නිසාය. තමුන්ගේ සැමියාට නින්දා කිරීමේ අයිතිය සහ ඔහුව අවිශ්වාස කිරීමේ අයිතිය සේම ඔහුට පාච්චල් කර හෙලා දකීමේ අයිතිය ඇත්තේ ආදරණීය බිරිඳකට මිස වෙන කාටද?

ඉතින් දැන් මම ඇස් පියාගෙන මගේම මනෝ ලෝකයට ගොඩ වදින්නෙමි.



මා නින්දෙන් ඇවිදින හැටි මුලින්ම මට දන්වා සිටියේ මෙලොව මා ඇසුරු කළ මුල්ම ගැහැනිය අම්මාය! ඇත්තටම එවක මා දන්නා එකම ගැහැනිය වූයේ මගේ අම්මාය. මගේ නිදන ඇඳ ළඟ වතුර බේසමක් තබන්නට අම්මා පුරුදු වූයේ මගේ නින්දෙන් ඇවිදින පුරුද්ද නිසාම වන්නට ඇත. පසු කලෙක මේ පුරුද්ද තවත් ගැහැනියකට බෝ වුණේය. ඒ මගේ බිරිඳටය.

අපේ නිදන ඇඳ ළඟ බිමට තෙත ගෝනියක් දැම්මට ඈ පුරුදු වුණාය. තෙත ගෝනියේ වහතු ගඳ නිසා ඇතැම් රෑක මට නින්ද ආවේ නැත. ඒ නිසා බිරිඳට නින්ද ගිය පසු තෙත ගෝනි පඩංගුව පැත්තකට ඇද දමන්නට මම පුරුදු වුණෙමි. ඉඳ හිට දවසක් දෙකක් විතර නින්දෙන් ඇවිද ගොස් ආයෙත් අවදි වී විත් ඇඳට ගොඩවෙන මට ඉබේටම සිනා පහළ වෙයි.

නින්දෙන් ඇවිදිමින් මා සොයන්නේ පියවි ලෝකයේ පියවි විදියට මට නොයාගත නොහැකි කිසියම් දෙයක් වන්නට බැරිද ? මමම කල්පනා කළෙමි. කල්පනාකර හිත හදා ගත්තෙමි. අවසානයේදී මට එය අවබෝධ වුණි. එයින් පසුව කවදාවත් මා නින්දෙන් ඇවිද්දේ නැත. ඒ වෙනුවට සිහිනයෙන් ඇවිදින්නට පටන් ගත්තෙමි.

මේ පොත කියවන පාඨකය, ඔබ දැන් අන්ද මන්දව සිටිනවා ඇතැයි මම කල්පනා කරමි. එසේ නොවුණොත් නොවැ පුදුම. පොත කියවන්නට පටන් ගත් වෙලේ පටන් ඔබේ සිත පෙළන අසහනය මට තේරෙයි මට දැනෙයි. ලෝකයේ සියලුම සත්වයෝ අසහනයෙන් පෙළෙන්නාහ. එනිසා මට විතරක් හෝ ඔබට විතරක් එයින් නොපෙළී සිටින්නට කිසිදු අයිතියක් නැත්තේය. ජීවත් වන්නට සිදුවන දේ ඇත්තේ මේ අසහනයෙන් මිදීමේ උග්‍ර ආශාව ඔස්සේය.

මේ වදන් කිපයට මට සමා වුව මැනවි. ඔබේ රස වින්දනයට මා බාධා කළේ කුහක තත්කට නොවේ. මෙසේ මම සිටින තාක් කල් ඇස්, කන්, නාසා, දිව, ශරීරය යන පංචේන්ද්‍රියන් රස ගන්වන්නට වෙර දරනවා ඇත. ඉන් එක ඉන්ද්‍රියකට හෝ කෙණිහිල්ලක් වෙනවාට ඔබ කැමති නැත......

ඉස්කෝලේ ඇරිලා කිරිකොක් රෑනක් වගේ එන කෙල්ලන්ගේ මූහුණු අතරේ මගේ ඇස් ඒ ගහක් වගේ දිව ගියා. මදූයි පාසලෙන් අස්වෙන්න ඔන්න මෙන්න තියෙන කාලෙදි තමා ඇගේ බහක් මට ලැබුණේ. කමක් නෑ ඒත් මදෑ.

මාව දැකලා නිම්නා කුලෑටි කමින් ඇඹරිලා ගිහිල්ලා බස් නැවතුමේ කෙළවරටම ගාල් වුණා. මදූයි තව ඩිංගෙන් පිටිපස්සේ තිබෙන පන කාණුවට එයාගෙ කකුලක් වැටෙනවා. මට හිනා, ඒත් අමාරුවෙන් නතර කරගත්තා. ඒකිගෙ කුලෑටිකම එක අතකට දස වදයක්. හරියට මේ මිනී මරන්න යන්න කතා කළාම වගේ ඒකි ගැහෙනවා. කෝටියක් විතර ඇස් පිල්ලම් ගැහෙනවා. කටත් වෙව්ලනවා. මට නම් හිනා. මා එක්ක ගිය යාලුවා මේක බලන් ඉන්න බැරි කමටම හෙමිහිට මගෑරලා යනවා. ඒ කෙල්ලගෙ සබකෝලෙ දුරුවං කරන්න. ආදරයේ කෝඩුකාරයෝ....... ඔහොම තමයි ඉතිං. එක වෙලාවකට නිම්නාගේ කුලෑටිකමයි සබකෝලෙයි නිසා මට තරහත් එනවා. ඒ නිසා ප්‍රේමයේ රසය හරිහැටි විඳගන්න ලැබුණේ නෑ කිය කියා පසුතැවෙන්න මං කැමති නෑ. මං නිම්නට ආදරේ කරන හැටි උගන්නන්න පටන් ගත්තා.

මට ගෙදරින් සැහෙන ප්‍රශ්න. අම්මයි තාත්තයි අඬ දබර රෑ ඇහැ පියවෙන්නෙත්, උදේට ඇහැ ඇරෙන්නෙත් ගෝරනාඩු වලින්. පාඩම් කරන්නම බෑ....... මොන පාඩමක්ද ? හැළි වළං පෙලොවෙ වදින සද්ද කෙළවරක් නැහැ. මැටි වලින් හැදූ වළං ටික පොළොවෙ ගහලා ඉවර වුණාට පස්සෙ අම්මා නුවණක්කාරයි කියලා හිතෙන වැඩක් කළා. ඒ මැටි වළං වෙනුවට ඇලුමිනියම් භාජන ගෙනාපු එක. ඒවට සැහෙන වියදමක් ගියා. අම්මා කිව්වෙ කරේ තිබුණු මාලෙ උගස් තියලා ඒ බඩු ගෙනාවා කියලා. ඒත් ප්‍රශ්නෙ කෙළවර වුණේ නැහැ එතැනින්. මැටි භාජනයක් නම් පොළොවෙ ගැහුවාම ඒක 'ජක්' ගාලා එතනම ඉවරයි. ඇලුමිනියම් එහෙමල් බඩු පෙලොවෙ ගැහුවාම ඒවා දෝංකාර දිදී තව තව සද්ද මවනවා. වෙන මහම මහ ගෝසාවක් කන්දොස්කිරියාවක්.......! සද්ද පැටව් ගැහිල්ලක්........



මේ යුද්ධයේ උච්ච අවස්ථාව ආවෙ බොහොම ඉක්මනින්ම. දවසක් රෑ ඔක්කොම සද්ද නැවතිලා තිබුණා. බැලින්නම් තාත්තා ගෙදර නැවිත් තාත්තා වැඩකරන වැඩපොළේම නවතින්න පටන් අරන්.

ගේ නිශ්ශබ්ද වුණාට ඒත් මට පාඩම් කරගන්න බැහැ. හරියට කැරකිලා කැරකිලා නතර වුණාම එතකොටත් මොළේ කැරකෙනවා වගේ. මට පාඩමට හිත යොදවන්නම බෑ. මම වැඩි වැඩියෙන් නිම්නගෙ කැමැත්ත පැතුවේ ඒකයි. දැන් මට සතුටුයි. මොනවා නැතත් නිම්නාගෙ ආදරේ එයාගෙ සැලකිල්ල, ගෞරවේ මට තියෙනවනෙ.

අද හවස නිම්නව හම්බ වුණා. මගේ හිතේ කැකෑරිච්ච දුක ඔක්කෝම අමතක වුණා. නිම්නා මටම කියාපු කෙල්ලක්. ඈ ඉපදිලා ඉන්නෙ මා වෙනුවෙන්ම තමා.

*සශීක් උදාකර - දිනපොත*
*දිනය: 1970 ජන. 16*

මීට දවස් දෙකකට කලින් මට දිනපොතේ ලියාපු ඒවා දැකලා අද මටම හිනා. ඒකෙ තියෙන්නෙ මෙහෙම.

''අනේ මන්දා ආදරේ කරන කට්ටිය සංසාරේ පතාගෙන එන අයයි කියලා මම අහලා තියෙනවා. දැක්ක ගමන් හිත ගැස්සෙනවලු. හදවත නතර වෙන ගතියක් දැනෙනවලු. මටනම් අර නිම්නා කෙල්ල දැක්කම ඒ එකක්වත් ඇති වුණේ නැහැ. මම හිතන්නේ ඕවා මේ සාහිත්‍ය කාරයන්ගෙ බොරු මනස්ගාත වාර්තා. සාමාන්‍ය මිනිස්සුත් ඒවා අහලා කියවලා ඒ අයටත් එහෙම වෙනවා. කියලා හිතනවා ඇති. සංසාරෙ පැතිල්ල කොහොම වුණත් මම ඒකිට කැමති කියලා ඒකි දිහා බලන කොට හෙලන අහංකාර බැල්මට මට පොළව පලාගෙන යන්නයි හිතුනේ. ඒ මදිවාට කොල්ලන්ගෙ නක්කලේ මට ඉවසන්නම බැරි වුණා.

''විකේ......... උඹත් පිරිමියෙක්ද බං මේ තරමට තෝංජල් වෙන්න.'' උන් මට කියනවා..........

මට පුදුමාකාර හීනමානයක් ආවා. "හොඳයිකො මම දවස් දෙක යනකොට පෙන්නන්නම්කො මේ උදාකරගෙ උදාමෙ........ මං ඔය කෙල්ලව උස්සලයි පස්ස බලන්නෙ........"

සශික් උදාකර - දිනපොත
දිනය: 1970 ජන. 14

අයියෝ........ බස් එකට නැඟ ගත්තෙ නම් පුදුමාකාර ආවේගයකින්........ රස්සාවල් කරලා හෙම්බත් වෙලා තැලිලා පොඩිවෙලා ඉන්න මගී කට්ටිය බස් එකේ. නෝනලා වාඩිවෙලා........ සමහරු බාගෙට නිදි. වාඩිවුණාට වඩා කට්ටියක් නැගිටලා සීට් අතරෙ තව සමහරු පොල්ලෙ එල්ලිලා........ චිම්පන්සියො වගේ එහාට මෙහාට පැද්දෙනවා.

මහත දෙහෙත බඩක් තියෙන ගෑනු කෙනෙක් තමුන්ගේ බඩ තෙරපා ගෙන හිටියෙ වාඩිවෙලා ඉන්න ගෑනු ළමයෙකුගෙ උරේ උඩට. ඒ ළමයා අපහසුවෙන් වට පිට බලලා ආයෙ උඩ බලලා කරබාගත්තෙ අම්ම කෙනෙක්නෙ කියලා හිත හදාගෙන වෙන්න ඇති. තවත් පිරිමියෙක් තමන්ගෙ ශරීරෙ අපර භාගයෙ පූර්ව කොටස තෙරපාගෙන හිටියෙ තවත් ගෑනු ළමයෙකුගෙ දකුණු බාහුවට. ඒ ළමයා කැරකිලා බලලා ගස්සලා ටිකක් එහාටවෙලා හරිබරි ගැහිලා වාඩිවුණා. මෙන්න අර පිරිමියා කෑ ගැහුවෙ නැතැයි........

"හා ........ අතන මෙතන රස්තියාදුවෙ යන්න හොඳයි. අපි පොඩ්ඩක් ගැවුණාම තමා කසන්න පටන් ගන්නෙ........ ගාත කියද ........එන්නද අද ........?"

මිනිහා එහෙම කියාගෙන ගල් ආද වගේ සෙනඟ අතරින් රූටලා ගිහිල්ලා බැහැගත්තෙ නැතෑ. හැමෝම බැලුවෙ අර ගෑනු ළමයා දිහෑ. වස ලජ්ජාව........ ගෑනු ළමයගෙ මූණ රතුවෙලා. පිරිමි දෙතුන් දෙනෙකුයි ගෑනු දෙන්නෙකුයි ඔලොක්කු බැල්මක් දැම්මා ඒ ගෑනු ළමයට. එක්කෙනෙක් සද්දෙට උගුර ඇහෙව්වා. ඒකෙන් කුපිත වෙච්ච එක පිරිමියෙක් සද්දයක් දැම්මා.

"ඔහොම තමයි නංගී........ මේ කාලෙ හැටි. වැදගත් ගෑනු ළමයෙකුට වාහනේක යන්න බැහැ. හැම්තැනම ඉන්නේ මහ අවලම් බල්ලො........"



ඒ කතාවට ගෑනු ළමයා ඒ පුද්ගලයා දිහා බැලුවෙ දෙවියෙක් දිහා බලන ගානට. අනේ කාගෙ වුණත් අයිය කෙනෙක්. කාගෙ වුණත් පුතෙක්........ ඇගේ ඇස්වලට කඳුළු ආවා. පව්........ මෙහෙම ගැනියෙක් අසරණ වූ වෙලාවක පුංචි වචනෙකින් හරි පිහිටකට ඉන්නෙ එහෙමත් පිරිමියෙක්.

ඊට පස්සෙ හැමෝම නෙවේ........ එතැන ටික දෙනෙක්ම බලා හිටියෙ අර ගෑනු ළමයා බහින තැනින්ම ඒ ගැලවුම් කාරයාත් බහීවිද කියලා.

ඒත් එහෙම දෙයක් වුණේ නැති නිසා කට්ටිය ගමනේ ඉතුරු හරිය ගියේ නිදි කිර කිරා කම්මැලි කමින්.

ඒ වගේ දේකදි ගෑනියක් වෙනුවෙන් හඬක් නඟන පිරිමියෙක් දිහා අනෙක් පිරිමි වගේම ගෑනුත් බලන්නෙ අමුතුම ඇහැකින්.

"මිනිහානම් හොඳ මහිලා සමිති කාරයෙක්." එක පිරිමියෙකු ළඟ හිටි කෙනෙකුට කොඳුරලා කියනවා මම අහගෙනයි. ඒ සිද්ධියට භාජනය වෙච්ච තරුණිය කලින් කී වීරයා දිහා බැලූ ස්තුති පූර්වක බැල්ම මගේ දවසේ මතකයට අලුත් ලකුණක් තිබ්බා වගේ. ඇගේ කතාව නිරුද්ධ වෙලා බැල්ම විතරක් වෙදිකා ගත වුණේ ලෝක ඇස් කියන කැමරාවට තියෙන බය නිසා. මං මොකටද මේ සිද්ධිය ගැන මේ තරම් ලියල තියෙන්නේ. ඒක මටම ප්‍රශ්නයක්. ඒත් මට මේවා ගැන නොලියාම බැහැ. මේ ඔක්කොම ලියාගෙන ලියාගෙන ගිහිල්ලා මට අන්තිමට මතක් වෙන්නෙ සශික්........ පව් සශික්........

නිම්නා සාමෝදා - දිනපොත
දිනය: 1970 මාර්තු 02

පුංචි කාලෙ ඉඳන්ම හිතේ ලොකුම හීනයක් වෙලා තිබුණේ රඟපෑම. ඒත් අනේ මන්දා දන් කාලෙ නිළියන් දිහා මිනිස්සු බලන්නෙ මහම මහා අමුතු විදිහකට. නිළියො කියන්නෙ අබිසරු ලියෝ කියලා හිතන පට්ට මෝඩයොත් ඒ අතරේ නැත්තෙ නෑ. එක අතකට සමාජ දෘෂ්ටි වලට බැණ අඩ ගහලා දොස් කියලත් පලක් නැහැ. ඇයි සමහර අයගේ හැසිරීම් නිසාම තමයි

ක්ෂේත්‍රය බාල්දු වෙන්නෙ. අපේ සර්ලා නම් මුල ඉඳන්ම අපිට කියලා දුන්නා මේ නම්බුකාර වෘත්තිය රඟපෑම බාල්දු කරන්න එපා කියන එක.

ඇත්ත! කලාව බාල්දු කරන එක සහගහන පටිසන් දෙන පාපකර්මයක්. කලා හැකියාව හරියට දේව වරමක් වගේ. ඒ වරමේ මුවාවෙන් නරකයි තුච්ඡ වැඩ කරන්න.

මම රඟපාපු නාට්‍යයක් බලන්න ආව සගීක් මට හරියට ගීතයක් වගේ. අනේ එයාගෙ ඇස් එකම ගීතයක්......... මුලු රැයක් පුරාම වුණත් ඒ ගීනෙ දිහා බල ඉන්න පුළුවන්......... ඒත් සගීක්........! එයා ගැන මම හරිහැටි මුකුත් දන්නෙ නැහැ. ඒත් එයා හරි හොඳ කෙනෙක්. ඒ වගේම එයා අමුතුයි. එයාට හොඳයි පාරේ යන කෙල්ලො එක්ක හිනාවෙන්නයි උන් දිහා බලන්නයි. ඒත් මා දිහා කොල්ලෙක් බැලුවොත් අහනවා ඔයා එයා අඳුනනවද? නෑ කිව්වොත් එහෙනම් මොකද එයා දිහා බලලා හිනාවුණේ. ඔන්න ඔය වගේ! ඇත්ත තමයි ඉතිං දකින දකින අය එක්ක හිනාවෙන එක ගෑනු ළමයෙකුට ඔබින්නෙ නෑ තමයි. ඒත් ලස්සන බැල්මකට හිරිමල් හිනාවකට උත්තර නොදී පිට පාරේ යන්නෙ කොහොමද? මම එහෙම හිතුවා විතරයි. මෙන්න වදේ සගීක්ටත් එහෙම හිතිලා.

හරිම තණ්හාව නේද කිසිම දෙයක් අතාරින්නෙ නෑ හත් මගේ කණින් රිංගන්න හිතන්න නම් එපා.

මට ඇත්තටම සගීක්ගැන පුදුමයක් වගේම බයකුත් හිතුණා. එයාට අර මොකක්ද පර සිත් දන්නා නුවණ තියෙනවද මන්දා අධි මානසික බලයක් තියෙන වග ඇස්වලිනුත් පේනවා.

''හෑ හා.........  දන්නවද.........මට තියෙනවා පරාචිත්තක ප්‍රඥාව !''

සගීක් එහෙම කිව්වෙ මගේ මූණ දිහා ඇස් පුරාම බලලා. අර උමතු බැල්මෙන් බලලා.........මට දෙලෝ රත්වුණා. මේ'විදිහට හිත කියවන්න පුළුවන් කොල්ලෙක් එක්ක කෙල්ලෙකුට ඉන්න පුළුවන්ද ? පුංචිම කාලෙ මං හිතුවා හිත කියන එක එළියෙ පේන්න ඇත්තං කොච්චර හොඳද කියලා. ඒත් එහෙම හිතුනේ හිත පිරිසුදු කාලෙ. ටික ටික ලොකු වෙන්න ලොකු වෙන්න



හිත ටිකක් සවුත්තු වුණා. මම මටම ඇත්ත කියන්න එපායැ. හෘද සාක්ෂියට බොරු බෑනෙ. ඊට පස්සෙ කාලෙක හිත කන්ට්‍රෝල් නැතිවම ගියා. දකින දකින දේට ආසා කරන්න හිතෙනවා. ඒ ඇලිල්ල පුදුම ඇලිල්ලක් ගලවාගන්න බැරිම ඇලිල්ලක්.

පුංචි කාලෙ අපේ ආච්චිගෙ කතාවක් තියෙනවා 'විදුරගෙ පස් පලේ ඇලෙනවා' කියලා. ආන්න ඒ වගේ ඇලිල්ලක් තමා මගේ හිතට වෙන්නේ. ඇත්තටම ටිකක් ලොකු වෙනකොට මටම තේරුණයි මගේ හිත මට කන්ට්‍රෝල් නෑ කියලා. ඒකට ඉතිං දන්නවනෙ මම මොනව කරන්නද? දකින දකින දේට ආසා වෙන්න හිතෙනවා. මේ තරුණ කමේ හැටිද මන්දා. කිසිම දෙයක් අඟක දාතන් හිතෙන්නෙම නෑ. ඒ මදිවට මගේ කේන්දරෙත් මොකක්ද අප්සෙට් එකක් තියනවා. ඒක අප්සෙට් එකක් කියලා අම්මලා නං කිව්වෙ නෑ. ඒත් ඒකෙ නම් ඇහුවාම නං මට හිතුණා ''අතිධාවන කාමයෝගය''මේ ළමයට පිහිටලා තියෙනවා ඒත් බය වෙන්න එපා. ඒක නරක යෝගයක් නෙමේ. මෙවාට ගැළපෙන කේන්ද්‍ර තිනෙවා ඔන තරම්.

පුංචි කාලෙදි කේන්දර බලපු ගුරුන්නාන්සේ එහෙම කිව්වා මතකයි. අනේ......... ඔය කිව්වට හැමෝටම ඔය වගේ මොනව මෙනව හරි යෝග නැතැයි. මගේ කේන්දරේට හරියන එකකුත් කොහොම හරි නැතැයි.

කොහොම වුණත් සගීක්ට මම ආදරෙයි. එයාට තව කව්රු හරි ඉන්නවද මං දන්නෙ නෑ. ඒත් මම එයාට ආදරෙයි. එච්චරයි.

මනෝරමා නාගසේන - දිනපොත
දිනය: 1979 මාර්තු 02

දිනපොත්වල කොල එහා මෙහා දිග හැරී ඇත. ඒවායේ අකුරු එහා මෙහා නළියනවා වගේ මට දැනෙයි. ඇත්තටම මේ කොල ගොඩ අවුස්සා බලමින් මා ලබන තෘප්තිය මොකක්ද? මේ සියල්ලෙන් විද්‍යමාන කෙරෙන්නේ ජීවිතය නොවේද චර්යානුබද්ධ ගවේෂණවල වැදගත්කම අවධාරණය කර ගත හැක්කේ කීයෙක් කී දෙනාටද ?

බිරිඳ සමන්තා කාමරයට එබී යනවා දුනෙයි. ඇගේ අතේ ඇන්නේ තෙත ගෝනිය වන්නට ඇත. එකවරම මට තෙත ගෝනිය මතක් වූයේ ඇයි. දූන් මගේ ඇඳ ළඟට ඇය තෙත ගෝනිය මතක් වූයේ ඇයි. දූන් මගේ ඇඳ ළඟට ඇය තෙත ගෝනි දමන්නේ නැත. ඒ බව මතක් වන්නේ පසුවය. තෙත ගෝනි කුමටද ? මා දූන් නින්දෙත් ඇවිද යන්නේ නැති නිසා. අනිත් අතට මා දූන් නින්දෙන් වුවත් කොහේ යන්නද ? තරුණ කාලේ නම් කොහෝ හරි යාවී කියා බයට තෙත ගෝනි දමන්නට ඇත.

දන් ඉතින් මේ මුළු ගෙටම ඉන්නේ අපි දෙන්නා විතරය. වත්තේ වැඩපල කරන කඩේ පීලේ යන තේගිස් නිදාගන්නේ අපේ ගරාජයේය.

"පුතාලා ඒවිද දන්නෙ නැහැ. මේ සැරේ අවුරුද්දටවත් නේද?" සමන්තා මඳක් උස් හඬින් කියයි. මම උපැස් යුවළ නළලට ගෙන ඈ දෙස බලමි.

"දූල නම් අවුරුද්ද පහුවෙලානේ එන්නේ......... එයාලගෙ ගෙදර නැකැත් කටයුතු ටික කරලා ඉවර වෙලානෙ."

"ඒක නං හොඳයි එන එක නම්......... ඒත් ලේලි කොහොම වෙනත් දූව එක්ක නම් ඔයාට කට පරිස්සම් කරගන්න වෙයි. මතකනේ යුද්ධ ප්‍රකාශ කරලා තිබුණා........."

මා කියන්නේ සැහැල්ලුවට සිනාවෙමින් වුවත් සමන්තාගේ මුහුණට නැගෙන්නේ බැරෑරුම්කමේ සෙවණැල්ලකි. ඒ සෙවණැල්ල වැටුණාම ඇගේ මුහුණ කළු පාටය.

ඇත්තටම දූව එවා තිබුණු ලියුම නම් එකම ගාලගෝට්ටි ලියුමකි. අම්මා හරිම පටු විදිහට හිතන්නෙ. බලන්න අම්මට අපි පුංචි කාලෙ අම්මගෙ අම්මා උදව් කළා. නමුත් අම්මා අපි ගැන එහෙම හිතන්නෙ නෑ. අම්මා තාමත් අම්මගෙ වැඩ. ළමයි දාගෙන වියුහන් දෙනවා. උදේ සිට හවස් වෙනකම්ම.

දූව එවා තිබුණ ලියුම සමන්තා මට පෙන්නද්දී ජීවිතේ කවමදාවත් ඇති නොවුණ දුකක් මට ඇය ගැන හිතුණා මතකයි.ඇත්තටම මගේ බිරිඳ කවදාවත් මේ තරම් අසරණ වෙලා නැතිව ඇති. කොච්චර කොහොම වුණත් ගෑනි පව්. තමුන්ගෙ දූවට තමුන්ව තේරුම් ගන්න බැරිවුණු අවනඩුව වළලාපු ඇස් මම දුක්කෙ සමන්තාගෙන්.



සමන්තා හොඳ දහිරියවන්ත ගෑනි. ඒක මම කියන්නම ඕන. නැත්නම් මගේ හාද සාක්ෂිය මට දබරැඟිල්ල දික්කරාවි ගුණමකුවා කියලා. සමන්තායි මමයි බඳිනකොටත් එයා ගුරු රස්සාව කරනවා. ගුරු රස්සාව ගෑනියෙකුට හොඳම රස්සාව කියලා කවුරුත් පිළිගන්නා දෙයක්. හවස තුන හතර වෙනකොට ගෙදර! සතිඅන්තෙ වගේම නිවාඩු කාලෙ ගෙදරමයි. ඒත් ඇත්තටම සමන්තා ඒ කාලෙත් නිකම් හිටියෙම නෑ. වියුහන් දෙන්න පටන්ගත්තා. ගෙයිම එක පැත්තක දිග බරාඳෙ තමා ඇය පංති කළේ. ගණිතය පංතියයි සිංහල පංති දෙකකුයි ඈ බොහෝම සාර්ථකව කළා. අතමාරුවට තව ගුරුවරයෙකුයි, ගුරුවරියකුයි ආවා. මේ කාර්ය බහුලතාවය නිසා තමයි එයාට අම්මලාගෙ උදව් ඕන වුණේ. එයා නිකම්ම ගෘහනියක් වෙලා හිටියානම් තමුන්ගෙ ළමයි බලාගන්න අනුන්ගෙ උදව් ඉල්ලන්න යන්නෙ නෑ.

බැඳපු අලුත හැමෝම කැමති රෝමියෝ ජුලියට්ලා වගේ තනියෙන් ඉන්නනෙ......... වැඩිහිටි කට්ටිය එක්ක හිරවෙලා ඉන්න මම කොහොමත් කැමති මිනිහෙක් නෙවි.

වෙන එකක් තියා වැඩකාරියෙක් තියාගත්තවත් මම කැමති වුණේ නැත්තෙ ඒක අපේ පෞද්ගලික නිදහසට බාධාවක් කියා. ඒත් අපිට ඒ සුන්දර ලෝකෙ වැඩිකල් ඉන්න බැරිවුණා. අම්මා ගෙන්න ගන්න වුණා දරුවා ලැබුණාම. සමන්තාගෙ රස්සාව ගැන අපේ අම්මත් කේන්තියෙන් හිටියේ.

රස්සාවල් කරන ගෑනු ගෙනාවාම මළ කරදරේ. ඈ එහෙම කිව්වෙ අපි වැඩට උදව්වට කෙනෙක් හොයන කාලෙදී. ඒත් පස්සෙ කාලෙක මගේ රස්සාව නැතුව හිටපු අවුරුදු පහේම අපි ඔක්කොම රස්සා වුණේ සමන්තාගෙ රස්සාවෙන් තමයි. සමන්තගෙ අම්මයි අම්මගෙ අක්කා කෙනෙකුත් අපේ ගෙදරම පදිංචියට ආවා. කොරේ පිටට මරේ වගේ. එවා තියන්නයෑ සියල්ල විඳ දරාගන්නවා මිසක්.

දේශපාලන පලිගැනීමක් මත මගේ අහිමි වෙච්ච රස්සාව නිසා මම මොන තරම් දුකක් වින්දද දරුවො දෙන්නා පුංචි කාලෙ. ඒ කාලෙ සමන්තයි මායි අතරෙත් කැඟැඹීම් ගැටුම්

ඇතිවුණා. ඒවා මේ මහා දරුණු විදිහට වෙන ඒවා නෙමේ. බොහොම සියුම්....... ගැටුම...... නොරිස්සුම් බැලුම් කෙණෙහිලි. අගල් හයේ විතර කිනිස්සක් ඇස්වලට අරගෙන සමන්තා මා දිහා බැලුවෙ පපුව කීතු කරන බැලුම්.........

ඔක්කොටම වඩා කුල කියවිල්ල ......... ඔය කාලෙදි තමා මම ටිකක් පොත් ලියන වැඩේට පෙළඹුනේ. ඒ අතරේ ආණ්ඩුවෙ රස්සාව බලා ඉඳිල්ල බල්ලට දාලා මම කොන්තරාත් වැඩවලට බැස්සා.

මට යම්තමට හරි මගේ අම්මලට සලකගන්න පුළුවන් ආර්ථිකයක් උදාවුණේ ඊට පස්සෙයි.

"ඇයි අනේ දෙයක් ඇහුවාම උත්තර දෙන්න බැරි......... ගල්ගිල්ලා වගේ කරබාගෙන ඉන්නෙ......... මම බිත්ති එක්කද කතා කරන්න ඕන ?"

සමන්තාගේ කෑගැහිල්ලෙන් මම පියවි ලෝකෙට එන්නෙ හරියට නින්දෙන් ඇවිදපු මිනිහෙකුට තෙත ගෝනියක් පැගිලා ඇහැරුණා වගේ.

"ඔයා කියන කතාව නං ඇත්ත. මේ සැරේ අවුරුද්දටවත් පූනාලා ආවොත් හොඳ තමා......... නැත්නම් අපිට මේ මළපාළුව ඉවසගන්නම බැරි වෙයි. රතිඤ්ඤා සද්දෙට කන් පැලෙන කොට ........."

සමන්තාට හිනා එයි.

ඈ හිනාවක් මූණේ ඇඳගෙන මගේ ලියන මේසය අසලටම එයි. "පව්......... සමන්තා......... දැන් ඇගේ තරුණ විය ගෙවිලා ඉවරය. ඇස්වල තරුණ කමේ තිල්ල බොර වෙලාය. දෙතොල්වල රතු මැකිලා ගොරහැඩි ගොරක ලෙල්ලක් ගානය. ඒත් ඉස්සර ඈ මොනතරම් ලස්සනට හිටියාද ?

"මං හවස පන්සලට ගිහිල්ලා එන්නම්. අල්ලපු ගෙදර ටීටක්කා එක්ක. ඔයාට තේ හදලා ප්ලාස්ක් එකට දාලා යන්නද? නැත්නම් මං ආවාම හදන්නද?"

ප්‍රශ්නයක්. මම ටිකක් කල්පනා කරන්නේ පුරුද්දට.

"ඔයා ගිහිල්ලා ආවාම අපි දෙන්නම බොමු. ඔයා එනකම් මම මේ ලියැවිල්ලෙ වැඩේ ඉවර කරන්නම්කො"



සමන්තා උපහාස සිනාවක් වගේ එකක් මුවගට ගනියි. ඊළඟට ඈ පිටුපා යයි. මට ඇව තේරෙන්නෙ නැත. මම ආයෙත් මගේ ගුහාවට වදිමි.

* * *

සභද්‍රා මුතුමාල අමුතුම මාදිලියේ චරිතයකි. මම ඇගේ දිනපොත් තිරුවක් පෙරලන්නෙ කුහුල් සිතින්.

ජීවිතේ ගැන මම නම් මහමේරුවක් කරලා හිතන කෙනෙක් නම් නෙවෙයි. මට තියෙන එකම රෝගෙ කිසිම පිරිමියෙක් විශ්වාස කරන්න බැරි එකමයි.

මට ගෙදරින් හරි බැණුම......... ඒත් ලෝකාපවාදයෙන් බේරෙන්න මම කසාද බඳින්න ඕනියැ. පිරිමි කියන්නේ ආදරේ කරන්න පුළුවන් සත්වයෝ නෙමෙයි. මම දන්න තරමින් උන්ගෙ ඇස් හරියට මන්තර වගෙයි. ඇස්පිල්ලන් ගහන ගහන සැරේට ඒ මන්තරේ ජප වෙනවා. ඉතිං කෙල්ලෝ වහවැටෙනවා. පිරිමියෙකුට ගැහැනියක් වහ වැටුණොත් එතැනින් පස්සෙ ආයෙ කවදාවත් ඒ ගැනිට ගැලවීමක් නෑ. ඒ ගැනිගෙ ආත්මය මිරිකාගෙන ඒ පිරිමියා ජීවිතාන්තය තෙක්ම ගත කරනවා. කෝ ඉතිං ගැනියෙකුට සැනසීමක්.

තමන්ගෙ කාමුක චේතනාවන් ඉෂ්ට කරගන්න පිරිමියා භාවිතා කරන්නෙ ගැහැනු ශරීරයක්. නමුත් ටිකක් ලස්සන මෝස්තර රටාවකට කැමති නිසා මේ රාගයට ආදරය කියන වචනය ආරෝපණය කර ගන්නවා......... බොරුවට ආදරෙයි ආදරෙයි කිය කියා ඉඳලා අවස්ථාවක් ලද මොහොතේම පිරිමියා රාගයට අවතීර්ණ වෙනවා.

මේ අදහස මට ආවෙ කලකට ඉහත මගේ තිබ්බ සම්බන්ධයෙ නිසා වෙන්න ඇති. ගෑනු ගැන නම් පව් හිතෙනවා. පිරිමින්ගෙ යකඩ වගේ දැත් අඬුවලට මිරිකෙන්න පෙරුම් පුරාගෙන ඉන්න තරමක්, යථාර්තය අවබෝධ වෙච්ච ගැනියෙක් කවදාවත් මේ මායාවෙ ගිලෙන්නෙ නෑ.

සභද්‍රා මුතුමාල - දිනපොත

*දිනය: 1970 මාර්තු 15*

නිමනයි මායි අද බොහෝම සතුටු හවසක් ගත කළා. අපි තෝරගත්තෙ ගාල්ලෙ කොටු පවුර. මේ ඕලන්ද බලකොටුව එදා කොහොමට තියෙන්න ඇද්ද කියලා හිතෙනවා. "ඕලන්දක්කාරයා හරි අපූරුයි නේද? මේ වගේ කල්පාන්තයක් පවතින දෙයක් හදන්න."

"ඒ ඔක්කොම යුද්ධ කෙරුවාවල් නේ......... දැක්කද මේ තියෙන්නෙ පොළව යට වෙඩි බෙහෙත් ගබඩාව."

කලින් විස්තර දැනගෙන හිටිය නිසා කොටු බැම්ම පිළිබඳ විස්තර මම වැමෑරුවේ හරිම සතුටින්. මම යමක් කමක් දන්නා කෙනෙක් මිස නිකමෙක් නොවන විත්තිය මට පෙන්නන්න ඕන. ඒ මුවාවෙන් නිම්නාට මගේ අගේ. මොකද සාමාන්‍යයෙන් ගෑනු ළමයි පිරිමි ළමයි ගැන එයාලගෙ බුද්ධිය ගැන අවතක්සේරුවෙන් තමයි හිතන්නෙ.

"මට හම්බ වෙච්ච ගොඩක් කොල්ලො මුකුත් දන්නෙ නැති මහ බූරු කොල්ලො."

නිම්නා කිව්වෙ ගල් බැම්මේ දෙබුක්කාවක් අස්සේ හොඳහැටි වාඩිවෙලා. මාත් එතනම වාඩි වුණේ ඉඩේටම. ඇගේ උරිස්ස වටා අතක් යවාගෙන මම ඈත පහළින් පෙනෙන පිට්ටනිය දිහා බලා හිටියා. නිම්නා තොරතෝංචියක් නැතිව කියවනවා. ඒත් මම කතාව නවත්තලා ඒ වෙනකොට.

තරුණකමේ හැටි තමයි......... මට මං ගැන පුදුම නෑ. කවියො වර්ණනා කරල තිබුණ ආදරයේ චමත්කාරය බුක්ති විඳිනකොට මොන කතාද? අනේ අපේ කිසිම කතාවක් නෑ. වැඩ විතරයි.

නිම්නා හිනාවුණා. මාත් හිනාවුණා. අපේ හිනා ගල් පවුරේ වැදිලා මහා හඩින් දෝංකාර දුන්නා. අපි ආයෙත් හයියෙන්ම හිනාවුණා. ඊළඟට අපි ඇවිදගෙන ගියා මූද පේන පැත්තකට.

"නිම්නා ඔයා යාලුවෝ එක්ක හැම තිස්සෙම චක චක ගගා කට කියවා කියවා ඉන්න එපා. ඔය හොඳ පොත් එහෙම කියවන්න! මම ඊළඟ දවසෙ ඔයාට ගෙනල්ල දෙන්නම් හොඳ පරිවර්තන නවකතා දෙක තුනක්. මගේ ළඟ තියෙන ඒවා.

"ඔයා මට එදා ලියලා එවූ කවිය හරිම ලස්සනයි. හරිම



පුදුම ආකර්ෂණයක් ඒ කවියෙ තියෙන්නෙ......... ඔයාට හොඳට ලියන්න පුළුවන්......... මම ආසයි මටත් ලියන්න පුළුවන් වුණා නම්........."

නිම්නා කිව්වෙ අවංකවම බව මට හිතුණා. ඒත් මම ලියපු කවිය ලස්සනයි කියලා විතරක් නතර වුණ එක ගැන මට කේන්ති. මේ කියවලා එයා ඒවා ටිකක් විග්‍රහ කරලා රස වින්දනයක් කරනවා නම්. එච්චරවත් දෙයක් බැරිනම් වැඩක් තියෙනවාද? මට ආයෙ තරහටම හිතෙනවා.

ලෝකයේ ඉන්න විශ්ව සාහිත්‍යය බබළවන ලේඛකයො ගැන මට හිතෙන්නෙ ලොකු ගෞරවයක්. මමත් කවදා හරි පොතක් ලියාවි කියලා මට හිතෙනවා. විශ්ව කීර්තියට පත්වෙච්ච ගොඩාක්ම ලේඛකයින්ගෙ ළමා කාලය හරිම දුක්බරයි.

ඔයා අහලා තියෙනවද ඇල්බර්ටෝ මොරේවියා කියන ඉතාලි ජාතික නවකතාකාරයා. එයා වයස අවුරුදු නමයේදී බරපතළ ලෙඩකට ගොදුරු වුණා. අවුරුදු පහක් විතර ඇඳේම හිටියෙ එයා අස්ථි ක්ෂය රෝගයෙන්. ඒත් මොන දේකටවත් එයාගෙ බුද්ධිය රෝගී වුණේ නැහැ.

නිම්නා ඇනුමක් පිට කරනවා මට පෙනෙද්දී මම කතාව නතර කළේ කේන්තියෙන්ද ......... දුකෙන්ද මම වත් දන්නෙ නෑ. කොහොමත් අද ඉර බහිනකන්ම අපි කොටු බැම්ම උඩට වෙලා හිටියා ගෙදර එනකොට කලුවර බෝවෙලා නිම්නගෙ අද හමුවීම මගේ හිත කය දෙකම සැහැල්ලු කළා.

*සගීක් උදාකර - දිනපොත*

*දිනය: 1970 අප්‍රේල් 02*

අද දවස ගැන මට ගොඩාක් හිතන්න තියෙනවා. මගේ ඔලුවත් එක්ක හරිම බරයි. සගීක්ගෙ බයික් එකේ එයාගෙ පිටිපස්සෙ එල්ලිලා ගාල්ලට ගියේ. අම්මෝ ඒක හරිම ත්‍රාසජනක ගමනක් වගේ. ඒත් මම ඒ ත්‍රාසජනක කමට කැමතියි. හවස දෙකට විතර ගෙදරින් පැනගත්තෙ බොරු දහයක් විතර කියලා. මම හරියට බය වුණා පැනගන්න බැරිවෙයිද කියලත්. පැන ගන්න බැරි වුණානම් එහෙම ඉඳලා ඉවරයි.

සයික් එහෙම නම් පිටු දහයක විතර කන්දොස්කිරියා ලියුමක් ලියලා එවාවි මට ජීවිතෙත් එපා වෙන්න. එයා කවදාවත් තේරුම් ගත්තෙ නෑ මම ඉන්න තත්වය. පවුලේ එකම ගෑනු දරුවා විදියට මට තියෙන තහංචි එයාට නම් විහිළු වගේ. ඒ එයාට සහෝදරියකුගෙ ගතිගුණ තේරෙන්නෙ නැති නිසා වෙන්න ඇති. එයාගෙ පවුලෙ පිරිමිම හතර දෙනයි. ඔක්කොම එයා වගේම යක්කු වගේ ඇති.එක අතකට පව් ඒ අම්මා. සයික් කියන විදියට පවුලෙ හරි ප්‍රශ්න. මට නම් තේරෙන්නෙ නෑ ඒවා. අපේ අම්මයි තාත්තයි කවදාවත් රණ්ඩු වෙන්නෙ නැති නිසා වෙන්න ඇති. ඒ දෙන්නා හරියට යාලුවො දෙන්නෙක් වගේ.

කවදහරි මම බඳින එක්කෙනකුත් අපේ තාත්තා වගේ වෙන්න ඕනි කියලා මට හිතනවා. ඒත්......... සයික් තාත්තා වගේද? අපේ තාත්තගෙ ගතිගුණවලට අහලකින් වත් තියන්න පුලුවන් කෙනෙක් නෙමෙ සයික්. සයික් හරිම අඩබ්බර තරුණයෙක්. කිව්වොත් කිව්වාමයි.

ඒත්......... මට ආදරේ ඉගැන්නුවෙ එයා! කවදාවත් කොල්ලෙක් අතින් අල්ලපු නැති මගේ අත මුලින් ඇල්ලුවෙ එයා ජීවිතයේ ප්‍රථම ප්‍රේමය......... ප්‍රථම හාදුව......... ඒ ඔක්කොම එයා මම එයාට ආදරෙයි!

නිම්නා සාමෝදනා - දිනපොත
දිනය: 1970 අප්‍රේල් 02

මම රඟපාපු පළවෙනි නාට්‍යයේ මංගල දර්ශනය තිබුණෙ අද ලුම්බිණියෙදි. මට හරිම සතුටුයි. මගේ ජීවිතේදි නම් මෙ සතුට කියන එක ලැබෙන්නෙ බොහොම අමාරුවෙන් පෙරිලා පෙරිලා වගේ එන්නෙ. ඒක හරියට කොහේ හරි කැටි ගැහිලා තියෙන දෙයක්. මේ නිකං ගුලියක් වගේ දෙයක්. ලිහිලා, බේරිලා, පෙරිලා එන්නෙ හරිම ලෝබකමින් වගේ. මොනවා කරන්නද ඒ මගේ ලබා උපන් ක්‍රමවේදෙ. ඒ ගැන මගේ දුකක් නෑ.

නාට්‍ය දර්ශනය ඉවර වෙලා අත්පුඩි හඬ මැකිලා ගියා. විශාල තිරේ දෙපැත්තට ඇවිත් මැදට යා වෙද්දි මම නෑ ගහලා ළඩ පැන්නා. ඒ සතුටින් වගේම ආත්ම තෘප්තියෙන්. මෙන්න ඒ



හුදෙකලා සතුට මට වැඩිවෙලා තනියම විඳින්න ලැබුණෙ නෑ. අපේ කණ්ඩායම වට කරගත්තු රසික රසිකාවියෝ අපව සිප වැළඳගෙන සුබපතන්න ගත්තා. දෙයියනේ අපිත් මොකක් හරි වටිනාකමක් තියෙන මිනිස්සු නේද කියලා තේරුම් ගත්තු ඒ රසික ඇස් රසික හිත් දෝතින් තුරුලු කරගන්න තරම් අමුතුම ආදරයක් ඇති වුණේ. අවංක සතුට ගඟක් වගේ දෝරෙ ගැලුවා. නිෂ්පාදක තුමා අධ්‍යක්ෂක තුමා නළු නිළියො ගංවතුරකට අහුවෙලා කැරකෙනවා වගේ රසික සාගරයෙ ගිලිලා ගියා. හරි පුදුමයි. සුබ පතපු අය අස්සෙ එක්තරා දෑසක් කොණකට වෙලා මා දිහා බලාගෙන හිටියා. එයා ඇවිත් හිටියෙ එයාගෙ වයසෙම යාලුවෙක් එක්ක. ඒ ලෙවල් ඉවර කරලා කැම්පස් යන්න හරි රස්සාවකට යන්න විභ බලා ඉන්න කාලේ වගේ වයසක ඒ කොල්ලා ඉන්නේ.........

උසයි......... හීන්දෑරියි......... කොණ්ඩෙ කේල්......... හොඳ වෙලාවට කොණ්ඩෙ ඒ විදියෙ බැරිවෙලාවත් යැංකියෙක් වගේ ස්ට්‍රේට් හෙයා තිබුණනම් මම දෙපාරක් බලන්නෙ නෑ ඒ දිහා. ඒ කොල්ලා ටෝච් එකක් ගහගෙන එන්නවා වගේ මා දිහා බලා හිටියෙ.........ටෝච්......... මොන ටෝච් ද බැටරි කෑලි හතරේ කබල් ටෝච් නෙමෙ......... ඒක වොට් එකසිය ගානක පතංගර ආලෝක දහරාවක්. ඒ එළිය ළඟ මට දැනුනෙ මම නිකම්ම නිකම් රෑ බදුල්ලියක් වගේ. මගේ උපමාවලට මටම හිනා.........ඒත් අර ඇස්වලින් මගේ දවසේ රංගන විඩාව මොහොතකට සංසිඳුණා වගේ හැඟීමක් දැනිලා මගේ හිත ගැස්සුණා.

ඇත්තරම ජීවිතේ පළවෙනි වතාවට මගේ හිත ඒ තරමටම ගැස්සුණේ.

මනෝරමා නාගසේන - දිනපොත
දිනය: 1970 අප්‍රේල් 02

සයික් හරිම කපටියා. එයා හම්බවෙන්න මොන තරම් අමාරුවෙන්ද ? මට ගෙදරින් පැනගන්නෙ කියන එක එයා දන්නවා වුණත් ඉන්නේ හරියට ඒ බව නොදන්නවා වගේ. ඒකත් පුදුමම උප්පරවැට්ටියක්. එතකොට එයාට ඒ ප්‍රශ්නෙ එක්ක

තැවෙන්න ඕනෙ නැහැනේ. ඒ කාලෙත් එයාට විනෝදෙන් සැහැල්ලුවෙන් ඉන්න පුළුවන්නෙ. ප්‍රශ්නවලදී ආදා .වගේ ලිස්සලා යන මේ ගතිය ඉස්සරහටත් තියේවිද ? මන්දා........ මිනිස්සු කඩපිල් ගානෙ බඩු මිල ගැන කතා වෙනවා කියල බඩු මිල පහළ යන්නෙ නෑනෙ කියලා සගීත් කිව්වා. වෙලාවකට එයා මහම මහා දේශපාලන කපටි කතා කියන්නෙ. ඒත් එයාම කියන්නෙ දේශපාලකයෙක් එයාලගෙ පරම්පරාවෙ හොයා ගන්න නෑ කියලා. ඔය කිව්වට දේශපාලන හෙංචයියො ඇති ඔයාලගෙ කට්ටියෙ ඕන තරම කිව්වම කොල්ලට තරහ ගියා. මට දඹරැගිල්ල උළුක්කලා. මම ඒ ඇඟිල්ල අල්ලලා අනික් කැත්තට නැමුවා. එයා පැනලා මාව බදාගෙන සිපගත්තා. මම බය වුණු තරම. වටපිට බලන්න මට ඇස් මදි වුණා. එයාට ඇස් මදි වුණේ මගේ මූණ දියා බලා ඉන්න.

හොඳ වෙලාවට එවෙලෙ බස් හෝල්ට් එකට කවුදෝ දෙන්නෙක් ආවා. එතකොටම බස් එකකුත් ආවා. මගේ මූණ රතු වෙලා කන් දෙකත් රත් වෙලා සෝ සෝ ගෑවා. සගීත් මනමාල හිනාවක් දාලා කිව්වා

''යමු මොනවා හරි බීලම යමු........''

එයා ඉස්සර වුණා. ගිනිකණ වැටිච්ච මම ගොනා පසුපස යන කරත්තෙ වගේ ඔහේ ඇද්දිලා ගියා. මට පෙනුනෙ සගීත් ඇඳගෙන හිටිය කමිසෙ ඉරි ටිකයි කලිසමේ කලු පාටයි විතරයි. ඉක්මනට ලෝකෙන් වහන් වෙලා ගිහිල්ලා ගෙදරට ගිහින් නාන කාමරේට වදින්නයි මට ඕන වෙලා තිබුණේ. කොහොම වුණත් අද හමුවීමත් හරිම චමත්කාරයි. ඒ වචනෙ ඒකට උපමා කරන්න පවා මදි. මටම හිනා. මගෙ වචනවල තියෙන දූගී දූප්පත් කමට. දූගී දූප්පත් කම් හිනාවට කාරණයක් නොවුණාට මෙහෙම අවස්ථාවල් විස්තර කරන්න උපමා හොයනකොට ඒ දූප්පත් කම් හරි හෝන්ඩියි........ අම්මගෙයි තාත්තගෙයි ආදරේට වඩා ආදරවන්තයෙකුගෙ අදරේ මොනතරම් වෙනස් ද කියලා මේ ලෝකෙ කවුරුවත් මේතාක්ම විස්තර කරලා නැත්තෙ ඒක වෙන්නත් ඇති. අම්මලාට බොරු කරලා බොරු කියලා හොර හොරෙන් මම මෙහෙම සගීත්ව මුණ ගැහෙන එක හොඳ නෑ කියලා ඒත් මගේ හිත කියනවා.



''මං දන්නවා මගේ කෙල්ල කවදාවත් නොමඟ නොයන බව. කවුරු ආස්සරේ කළත් පුතේ තමුන් හොඳනම් තමුන්ගේ සීමාව ඇතුළේ ආත්ම ශක්තියෙන් තමුන්ට ඉන්න පුළුවන්. ගෑනු ළමයෙකුට තියෙන වටිනාම ආබරණේ තමයි තමුන්ගෙ නිකැලැල් චරිතය........'' තාත්තා එහෙම කිව්වෙ මම වැඩිවිය පත්වෙච්ච උත්සවේ දා මගේ කරට රත්තරන් චේන් පොටක් දාන ගමන්. එවේලෙ අම්මගෙ ඇස්වල පිරිලා තිබුණු කඳුළු දිළිසුණා. මට ඒ කඳුළු අතරින් අම්මගෙ හදවත පෙනුණා. අනේ ඒ හදවත පුරාම පිරිල තිබුණේ මට තියෙන ආදරේ. අම්මලා පව්........ මට ආයෙත් හිතෙනවා.

යොවුන් ආදරේකදී තමන්ට ඇස් දෙක වගේ ඉන්න මව්පියන් දෙන්නා රවටන්න සිද්ධ වෙන එක මහා පාපයක්. මට එහෙම හිතුණා. දැනුත් හිතෙනවා. හෙටත් හිතේවි. තව දවසක් ඒ බව සගීත්ට කිව්වා. සගීත් මූණට ඇඳාගත්තෙ හීන් හිනාවක්. ඒ හිනාව දිගින් වැඩියි. පළලින් මදිවෙච්ච හිනා කොටස පිට පැන්නෙ එයාගෙ ඇස් වලින්. එයාගෙ මායාකාරී ඇස් මට තවත් දික් වෙලා පෙනුණා.

''මෝඩ කෙල්ල. ඔයාගෙ අම්මලා තාත්තලත් අපේ වයස පසු කරලා තමයි ඔය වයසට ඇවිල්ලා තියෙන්නෙ.'' එයා මගේ නහයෙන්ම ඇදලා එයා ළඟට ඇරගෙන මගෙ නළල සිපගත්තා. එතකොට මට හිතුණ සගීත් මගේ දෙවැනි තාත්තා වගේ කියලා........ හරි පුදුමයි. ඒක පූජනීය හැඟීමක්.

නිම්නා සමෝදා - දිනපොත
දිනය 1970 අප්‍රේල් 09

''ආ........මේ පුතා කෝල් එකක් දුන්නා මේ දැන්. මං පන්සලට ගිහිල්ලා එනකොට එක සීරුවට රිංග්ස් යමින් තිබුණා. හොඳ වෙලාවට මම ආවෙ. පුතාට තරහත් ගිහිල්ලා තිබුණේ. කලිනුත් දෙපාරක්ම කෝල් කරලා ඔයාට ඇහුණේ නැද්ද?''

සමන්තා කාමරයට ඇඟ බාගයක් දමාගෙන කියයි. ඇගේ අත්වල නැවරුණු හඳුන්කූරු සුවඳක් මගේ නැහැය පසාකරගෙන යයි.

''මට ඇහුණේ නැතුව ඇති සමන්තා. දන්නවනෙ මම

මේ කාමරේ ලියන කොට ටෙලිෆෝන් වලට ආන්සර් කරන්න එන්නේ නැති බව! මම කියන්නේ මඳක් කේන්තියෙනි.

"පුතාගෙ හිතේ පරණ කෝන්තරේත් තාම තියෙනවා වගේ. දන්නවද කොල්ලා කතා කරනකොට තේරෙන්නෙ, ඔයාට ටිකක් දොස් කිව්වා." ඇය කියද්දී මම නෑසුණා සේ මගේ පැන පිරික්සමි.

"මේ ඇහුනද මං කිව්ව දේ....... පුතා තාම ඉන්නෙ ඔයා එක්ක කේන්තියෙන් වගේ.......! අවුරුද්දට එන්න වෙන එකක් නෑ වගේ කියලා ඔය කිව්වෙ......."

"මොකා?....... ඇයි....... මා එක්ක කේන්ති? ඇයි එයා එයාගෙ වයිෆ් එක්ක සතුටින් නෙමේද ඉන්නේ.......? ඇත්තට එයාටත් තියෙන්නෙ ඔයාගෙ ගතිගුණමයි. බොරුවට පරණ දේවල් හාර හාරා වමාරා කන ලෙඩේ. අවුරුද්දට එන්න බැරි එක වෙනම දෙයක්. මෙච්චර නිකම් බොරුවට පටලාගන්න එපා. ඒ දෙන්නා හරිම ජොලියෙන් ඉන්නවා කියලා ඔයාමනේ කිව්වෙ ගිය සතියේ එවපු ෆොටෝ බලල ....... මොනවද මේ විකාර කතා.......!"

මගේ හඬ වේගවත් වෙන්නේ ඉබේටමය. සමන්තාගේ මුණේ ඇඳෙන්නේ උපහාසය ද අපහාසය ද කියා මට තේරෙන්නේ නැත. මොහොතකට හරි මාව කුලප්පු කළා කියලා සන්තෝෂයක් ඇගේ මූණේ ඇත. තරුණ කාලෙදිත් ඇය මේ මලේච්ඡ සතුට මේ විදියෙන්ම වින්දා යැයි මට මතකය කියයි.

ටික වෙලාවකින් තේ කෝප්පය සමග බිස්කට් දෙක තුනක් දමූ දීසිය රැගෙන මගේ මේසය ළඟට එන්නේ කරබාගෙනය.

"මම පුතාට නරකක් කළේ නැහැනෙ. ඔයා ඒක හොඳටම දන්නවා. මං එයාව නුදුසුදු කසාදයකින් ගලවලා එයාගෙ ජීවිතේ බේරලා දුන්නා....... එච්චරයි !"

මම ඇයගේ තේ පැන් සංග්‍රහය පිළිගන්නේ ඒ වැකිය කියමින්ය.

"හරි.......හරි ....... ඉතිං මම ඔයාට මුකුත් කිව්වෙ නැහැනේ....... මං කිව්වේ පුතාගෙ පිළිවෙල ගැන....... එයාලා දැන් හොඳ සතුටින් ඉන්නවා. ඒ දූලාරි කෙල්ල හරිම



හොඳයි....... එයත් මට කතා කළා. අනේ චූටි පුතාත් දැන් හුරතල් වයසනේ."

මම පිටුපා යන සමන්තා දෙස බලන්නේ වැරදිකාර හැඟීමෙන්. වැරදිකාර හැඟීම යනු පුදුම දෙයක්. එය හෘද සාක්ෂිය සමග ඇතිවන කතාබහක් නොවේද?

හිස් දීසිය සහ තේ කෝප්පය පැත්තකින් තබා මා නැවතත් මගේ සප්ත මහා සාගරයට බසිමි.

* * *

නිම්නාට ආදරේ කරන්න පටන් ගත්ත එක හරිම වාසනාවක් කියා මටම කල්පනා වෙයි. ගමනක් යන්න කතා කළාම, හමුවෙන්න කතාකළාම ඇගේ මුහුණ වෙනස් වෙයි. ඇස් උඩ යයි.

"ආ....... පොඩ්ඩක් බලන්නම්කො මට පැනගන්න පුළුවන් වෙයිද කියලා. කෝ බලන්න හෙට තාත්තා ගෙදර. අයියලා දෙන්න මොකක් කරයිද මන්දා. හෙට ක්ලාස් නැති බව අම්මලා දන්නවානේ......." ඇය කියවන්නට පටන් ගත්තේ ගිරවියක් වගේ.

මට තරහ යයි. ඔය කියන තරමට ඇයට ගෙදරින් ඇති තහංචියක් ගැන මට තේරෙන්නේ නැත. බොරුවට ගණන් උස්සන එක කෙල්ලන්ගෙ මෝස්තරයක්නෙ.

"ඒ කියන්නේ ඔයාට එන්න බෑ කියන එක......."

ඊළඟට දවසේ ඉතිරි පැය කීපය සතුටින් ගතවෙන්නේ පුරුදු විදියටම. ඒත් මට හිතෙන්නේ නිම්නා වගේ නෙමේ මනෝ ඊට වඩා වෙනස් කෙනෙක් වගේය. මනෝරම්‍යා මට හමුවූ දවස මතකය. ලුම්බිණියෙ නාට්‍යයක මංගල දර්ශනය දා එදා හමුවුණාට පස්සෙත් ඇය මට කතාකර තිබුණා මතකය. ඒ මගේ යාලුවා විරාන්ට දුරකතන ඇමතුමක් දෙන ගමන්ය.

මගේ හිත උණුසුම් වෙයි. මනෝගේ අදහස් වලට මගේ කිසියම් කැමැත්තක් ඇති වෙයි. ඇගේ ඇමතුම් අංකය අපේ තියාගෙන කී පාරක් නම් ඇයට අමතන්න හදා නිකම් හිටියාද?

නිම්නා පව්.......! නිම්නා දන්නවා නම් පොළොවෙ හැපි හැපි ඇඬාවි. ඒත් මට මගේ ජීවිතේ ගැන දුකය. මටය කියා සතුටක් මේ ජීවිතයේ මට ලැබිය යුතු නැද්ද?

අනිවාර්යයෙන්ම එය එසේ විය යුතුය.......!

ළමා කාලයේදී මා අත් වින්ද දුකට හිලව් වෙන්ට තරුණ කාලයේදී අනිවාර්යයෙන්ම මට මොනවා හරි ලැබෙන්නට ඕනෑමය. මගේ යාලුවෝ....... උන්ට හැම තැනම රජ සැපය, කෑම සැපය, බීම සැපය, නිද්‍රා සැපය ඒ ඔක්කොමත් හරිය රති සැපය....... උන්ට හැම තැනමත් කෙල්ලෝ.

ඒක මේ නිකම් ස්ටයිල් එකක් වාගේ. ලොකු ලොකු ඉස්කෝලවලට යන කොළඹ කොල්ලන්ගෙ ස්ටයිල්. ගමෙන් ආපු මගේ යාලුවා කිත්සිරි ඒවා ගැන එහෙම කිව්වා මතකය. කිත්සිරි හරි ! ඒත් කොලුකමට ගමක් නෑ ! බලාගෙන ගියාම කොයි කෙල්ලත් එකයි, කොයි කොල්ලත් එකයි මේ කොළඹ රටේ.

මනෝට තියෙන්නෙ ආරාධනාත්මක බැල්මක්. ඒක හරියට පුළුන් ගොඩකට ගිනි තියන්න එන පාන් දැල්ලක් වගේ එකක් මනෝලා වගේ කෙල්ලෝ ගාවදි නිම්නා පරදිනවා. ඒත් ඒ එක අංශයකින් විතරයි.

'නිම්නා වගේ කෙල්ලන්ගෙ තියෙන ආඩම්බරකමට අහංකාර කමට කැමති කොල්ලො ඕන තරම්. ලේසියෙන්ම ඇඟේ ඇලෙන්න එන 'බඩු' මට නං අරහං.' අද කිත්සිරි එහෙම කියනකොට මට හිනා ගියා. එයා දන්නවා මනෝගෙයි මගෙයි තිබ්බ පුංචි විතර ඇල්ම බැල්ම ගැන. මනෝ හොඳට පොත් කියවන කෙනෙක්. ඒක මට හරියට වටින දෙයක්. සාහිත්‍ය ගැන ලේඛකයො ගැන මං කියන ඒවා නිම්නාට නිකම් ග්‍රීක් වගේ. ඔහේ අහගෙන ඉන්නවා. ඒ වගේද මනෝ.......

මං අද හවසට නිම්නා මගේ සුන්දරිය හම්බවෙනවා.කොහොම වුණත් අද මගේ හිත ගත උණුසුම් කරන්නේ මටත් හොරා....... මට තියෙන එකම පුදුමය ඒකයි. ඒත් නුඹෙන් සිත නොම්දෙයි. පුදුමයක් තමයි.......!''

*සගීත් උදාකර - දිනපොත*

*දිනය 1970 මැයි 12*



සගීත්ව එදා දැක්කට පස්සේ අනේ ආයෙම එකම එක පාරයි මට එයා එක්ක කතා කරන්න ලැබුණේ. ඒකත් මේ දෙනෝදහක් මැද්දෙදි කවිපොතක් එළි දක්වන උත්සවයකදී මහජන පුස්තකාලෙ තිබ්බ. මම එදා ඒ උත්සවේට ගියේ විවේකයක් ඇතිව නොවෙ. කොහොම හරි ගිහිල්ලා කවිපොතක් කවුන්ටරෙන් අරගෙන කර්තෘගෙ අත්සනක් ගහගන්න මට ඕනෑ කරලා තිබ්බෙ. කර්තෘ මාව පර්සනලි දන්නෙත් නෑ. ඒත් කවිවලින් මට එයාව හොඳට දැකලා තියෙනවා ඒ කවි වලට අනුරූප රූපෙ දකින්නත් එක්ක තමා මම එතැනට ගියෙ.

මොන මොනව දේකටවත් මට වෙලාවක් නැති හැටි. ඩාන්සිං ක්ලාස් එක ඉවර වුණේ සෑහෙන්න පරක්කු වෙලා. සර්ට පරක්කු වෙලා තියෙන්නෙ එයාගෙ තිබ්බ කොන්ෆරන්ස් එකක් පරක්කු වෙලා පටන් ගෙන පරක්කු වෙලා ඉවර වෙච්ච නිසා.

ඔහොම තමයි එක තැනකින් පරක්කු වුණොත් රතිඤ්ඤා නූල වගේ එක දිගට ඒ පරක්කුව පත්තු වෙනවා. මටත් වුණේ ඒකමයි. නැත්නම් හෝල් එක ඇතුළට ගිහිල්ලා යස අගේට පුටුවකත් වාඩි වෙලා දේශන දෙක තුනක් අහලා මගේ ප්‍රියතම කවියා දිහාත් බලලා අඩුම ගානේ වචනයක් හරි කතා කරලා එන්න තිබුණ නේද කියලා පසුතැවෙන කොට තමයි පොත් කවුන්ටරේ ළඟදී සගීත්ව දැක්කෙ. එයා හිටියෙ එයාගෙ පුරුදු යාලුවත් එක්ක. සගීත් හිනාවුණා. මට හිනාවෙන්න අමතක වුණා. මම යන්නම් තොල් විහිදවලා හලෝ කිව්වා. සගීත්ට කතා කරන්න වචන නැති වුණා ! තප්පර ගාණක්ම මුලු ලෝකෙම බර අපි දෙන්නගෙ ඔළුවට ආවා. ඊළඟ තත්පරේදී මුලු ලෝකෙම සැහැල්ලුව අපේ ඇස් උඩ. ඊළඟට මොන කවි සම්මන්ත්‍රණද විනාඩි විස්සකටත් වඩා අපි දෙන්නා කතා කළා. දෙයියනේ සගීත් ළඟදී මට කතා කරන්න දේවල් මොන තරම්ද ?

මම සාමාන්‍යයෙන් නිශ්ශබ්ද කෙනෙක්. ඉස්කෝලෙදී පංති යාලුවො මට විහිළු කරන්නෙ 'නිශ්ශබ්ද විලියම්' කියලා. එච්චරට නිහඬ මට කතා කරන්න මාතෘකා දෙන උල්පතක් පාදුවේ සගීත්. එයා කවුද මොනවද කරන්නෙ විස්තර ටිකක් දැනගන්න

ඔනෑ වුණා. ෂූවර් එකටම එයාට කෙල්ලෙක් නැති වෙන්න බෑ. පෙනුම මනමාලයි. ඒත් හරිම ඕසන්ට් මනමාලකමක්. ඇයි.......... විදහාගත්ත හීන බලන ඇස්........! මට ආසම ඇස් ගීතය........! මට අපේ ගෙදර ගැන හිතනකොට හරිම අමාරුයි මගේ අනාගතය ගැන හිතන්නත්.

අම්මා මට යෝජනා කරලා තියෙන කොල්ලට මං කැමති නෑ. අම්මයි අම්මගෙ මනමාලයා බාප්පයි හදන්නේ මගෙන් ඉක්මණට නිදහස් වෙන්න වෙන්න ඇති. මට අම්මා ගැන ඇතිවෙන්නෙ තරහක්. 'අම්මා' කියන්නෙ ලෝක පූජිත කෙනෙක්. හැම රජාම හැම හිඟන්නාම අම්මට සලකනවා. ගෞරව කරනවා. හිතින්. ඒ වගේම හැම සත්පුරුෂයාම හැම අපරාධකාරයාමත් තම අම්මට ගරු කරනවා. නාම මාත්‍රය පවා ගෞරවනීය දෙයක් ඒත් ඇයි මට මගේ අම්මා ගැන එහෙම හිතෙන්නේ නැත්තේ. මට තාත්තා ගැන දුකයි.

ජීවතුන් අතර ඉඳිද්දීත් තාත්තා ඒ තරම් සතුටින් හිටපු කෙනෙක් නෙමෙයි. අපේ අම්මට තාත්තව ස්ටයිල් මදි වුණාද කියලත් මට හිතෙනවා. නිතර අපේ ගෙදරට ආ ගිය මගේ පංති යාලුවා තමයි මට විහිළු කළේ උඹලගෙ 'පොෂ් අම්මට' තාත්තා පේන්නෙ ගොඩේ බයියෙක් වගේ නේද කියලා. එහෙම කියලා එයාම කිව්වා බඳිනවානම් බඳින්න ඕන තමන්ගෙ ගතිගුණවලට සමාජ ප්‍රතිරූපෙට ගැලපෙනම කෙනෙක් කියලා. එයා කියන්නෙ කේන්දර වල කොටු දොළහ නෙමේ ගලපන්න ඕන, හරිනම් ඒවාගේ කාරණාවල් කියලා.

අනේ මන්දා ජාතිය, දේශය, කුලය, මැණියෝ වගේ පස් මහ බැලුම් බල බලා හිටියොත් කාටවත් කිසිම කෙනෙක්ව බැඳ ගන්නවත් මේ ලෝකෙ පවත්වා ගන්නවත් බැරි වේවි. ගැලපෙන ඒවා කිව්වට එහෙනම් අම්මා බැන්දෙ දෙමළ බාප්ප කෙනෙක්. ඔය යසට ඉන්නේ දෙන්නා. ඒක වෙන්න ඇති මටත් අර ගඟුල් කියන හාදය ජෝඩු කරන්න යන්නෙ මටත් බැරිය එනකොට දෙමළ ජාතිය බෝකර කර ඉන්න. මගේ කේන්දරේ තියෙනවද මංදා මම ජාතිය නගන එකියක් කියලා. මටත් හිතෙන ඒවා.

ජාතිවාද වගේ පටු දේවල් ගැන හිතන්න තරකයි. ඒත්



බඳින්න ගියාම නෑදෑ සමාජ ගැලපිල්ල ගැනත් හිතන්න වෙනවා. අනේ මන්දා පශ්චිම දන්නා විතරයි මට කසාද ගැනත් එක එක දේවල් මතක් වෙන්න ගන්න හැටි. ආයෙ සශික්ව තවදා හමුවේද මන්දා. ඒත් එදා එයා මට කිව්වා අලුත් සිඩි ලෝන්ච් එකක් ගැන. පදනම් ආයතනයෙ තියෙන. බලමු ඒකට යාගන්න පුළුවන් වුණොත් හොඳයි.

මනෝරමා නාගසේන - දිනපොත
දිනය: 1970 මැයි 15

දැන් ඉඳන්ම අපේ අම්මයි තාත්තයි මට මඟුල් ජෝඩු කරන්න උත්සාහ කරන්නෙ මම මොකක හරි පැටලෙයි කියලා බයේ වෙන්න ඇති. ඉස්කෝලෙ දහතුනේ පංතියේදී හිටපු මගේ යාළුවො දහතුන් දෙනාගෙන් දොළහකටම කොල්ලෝ හිටියා. එක කොල්ලා නෙමෙයි සමහරුන්ට දෙක දෙක....... අනේ මංදා මටනම් ඉවසන්නම බැරි කොල්ලන්ගෙ ගස් ගඳමයි. මනා මංදා මටනම් ඉවසන්නම බැරි කොල්ලන්ගෙ ගස් ගඳමයි. මහා හපුටු ගඳයි. ඔලුව පුරාම ඩාදිය දාලා කන් දෙක දෙපැත්තෙත් නූලෙ වැක්කෙරෙන ඩාදියත් එක්ක කොල්ලෝ බස් හෝල්ට් එකට ආවාම....... අපෝ මූණ පළාතම ඩාදිය ගඳයි. අනේ මංදා ඒත් අපේ කෙල්ලො කට්ටිය කෙළ හල හලා උන් එක්ක තදේ දාගෙන ඉන්නෙ කිචි බිචි ගගා.

ටයි ආපු කෙල්ලෝ හැට්ට කරවල් කපාපු කෙල්ලෝ පංචාල කරවල් එක්ක කෙල්ලෝ....... ඔය කෙල්ලො කොයි කවුරුත් මොන යුනිෆෝම් එකෙන් ඇඟ වහගෙන උන්නත් මහ විසේකාර සන්නි කෝලම් කියලා හිතෙන්නේ මේවා දක්කම. ඒ මදිවට මේ අහක ඉන්න මටත් සමහර කොල්ලෙක් අනුම් පද කිව්වා.

"මොකෝ වේලෙනවද ?"

"ඇයි කරවල කියල හිතුවද ?"

මට තරහක් ආපුවම හෝල්ට් එක දෙදරනකම්ම උන් ටික හිනා වුණා. එදා ඉඳලා මම හෝල්ට් එකට යන්නේ ඔය තදියං කාරයො ටික යනකම්ම ඉඳලා.

"මොකද පුතේ පරක්කු?" අම්මා එහෙම අහනකොට මම කිව්වෙ මම මොනිටර් නිසා පංතිය පිරිසුදු කිරීම වැඩ

ටිකත් කරලාම තමයි එළියට එන්නෙ කියලා. අම්මලාට ඕනම බොරුවක් ඇත්ත. පව් අම්මලා මට අපේ පංතියෙ යාලුවො ටික අම්මලාට කියන බොරු තොගේ දුක්කම හරිම දුකයි. එන ආත්මෙ නම් උඹලා උපදින්නෙ දිව නැතුව ඕං........ මං උන්ට එහෙම කිව්වාම උන් මා එක්ක තරහ නෑ කවදාවත්. උඹටත් මේවා දවසක තේරෙයි කියලා උන් වෙන කතා පටන් ගන්නවා. ඉස්කෝලෙ පන්සලේ බුදු මැදුරෙ ආවතේව ටිකත් මට පැවරුණේ බෞද්ධ සංගමයෙ සභාපතිත් මම නිසා. වෙලාවට බුද්ධ පූජා පැන් පූජා තියන එක ගැන හොස්ටල් එකේ කුස්සි අම්මව දැනුවත් කළේ මම. ඒ නිසාමදෝ යාලුවො මට කිව්වේ උපාසකම්මා කියලා. වරකට එක කොල්ලා බැගින් මූදු වෙරළවලයි, ෆිල්ම් හෝල් ගානෙයි, මල් වතුවලයි රස්තියාදු වෙනවට. වඩා උපාසකම්මා කියන නම හම්බුයි මට නම්.

කොහොම වුණත් අම්මලාට නම් මට හරියන මනමාලයෙක් හොයන එක අමාරු වෙයි. ගමේ පන්සලට ගියාම මට පුදුම සහනයක් දනෙන්නෙ කවදා හරි මගේ අත ගන්න කොල්ලා මේ පන්සල් පරිසරයේදී මුණ ගැහෙයි කියලා මම හිතනවා.

සහදා මුතුමාල - දිනපොත
*දිනය: 1970 මැයි 15*

අද නම් හරි අමුතු දවසක්. මායි නිම්නායි හමුවුණේ බොහොම අමාරුවෙන් පෙරුම් පුරලා. නිම්නාගෙ මේ ඍදුං පඍදුං ගැහිල්ල මට නම් අහලම ඇතිවෙලා.

තාත්තට ද්‍රෝහි වෙන එක පවක්ලු. තාත්තලාට බොරු කිය කියා අපි මෙහෙම හම්බ වෙන එක ගෙවාගන්න බැරි පාපයක්ලු. මං ඇහුවා එහෙනං මේ පව් හෝදන්න මොකක්ද කරන්න ඕන කියලා. ඊටට මුකුත් කතා නැහැ. අම්මල තාත්තල ළඟට ඇවිත් කතා කරන්නයි එයාට ඕනෑ. මොකවත් නොමේ අපේ සම්බන්ධෙ ගැන ! ඒත් තවම රස්සාවකුත් නැතුව මං කොහොම එහෙම ඉදිරිපත් වෙන්නද ? නිකම්ම නිකමෙක් වගේ.

''කෙලින්ම එයාගෙ තාත්තා මාව බෙල්ලෙන් අල්ලල එළියට දාවි.'' ඊට පස්සෙ නිම්නා ගත් කටටම කිව්වේ ''එහෙනම් අපි



හම්බ නොවී ඉඳිමු'' කියල. අපි දෙන්නා මේ කාරණාව උඩ හොඳටෝම රණ්ඩු වුණා. මග තොටේ ඉන්නවා කියලත් අමතක වෙලා වගේ අපි දෙන්නා හොඳටෝම බැණගත්තා. යම් යුද්ධෙ වගේ. අන්තිමේදී නිම්නා ගස්සාගෙන යන්න ගියා. මට තේරුණා ආයෙ කවදාවත්ම එයා ආපහු හැරෙන එකක් නෑ කියලා. මම කෑ ගහගෙන ගිහිල්ලා එයාගෙ උරිස් දෙකෙන් අල්ලලා මගේ ඇස් මායිමට ඇගේ ඇස් එල්ල කරවා ගත්තා. අපි දෙන්නා ඇස් ගින්දරෙන් පිච්චුණා! අපි දෙන්නා ඊට පස්සෙ අත් අල්ලාගෙන බස් නැවතුම්පළට ආවා. ආපු ඉස්සෙල්ලාම බස් එකට අපි ගොඩවුණා.

මට මතක් වුණේ පානදුරේ ඉන්න මගේ හොඳම යාලුවෙක්. පද්මිත්. අපි කෙලින්ම බැස්සෙ පද්මිත්ලගේ ගෙදර ළඟින්. මාර වෙලාවක්....... එයාගෙ අම්මයි තාත්තයි නංගිල දෙන්නයි කොහේදෝ ට්‍රිප් එකක් ගිහින්. අඩබඩ ගාලා කෙක්කක් මානලා මිදුලෙ ගහෙන් තැඹිලි ගෙඩි දෙකක් කපලා අපි දෙන්නට බොන්න දුන්නු ඌ ගත් කටටම ඇහුවෙ ''මොකෝ මේ උඹල දෙන්නා එක පාරටම කඩාපාත් වුණේ හරියට පොර කුකුල්ලු දෙන්නෙක් වගේ.......''

අපි දෙන්නටම බකස් ගාලා හිනා ගියා. හිනාවෙලා හිනාවෙලා බඩ පණ නැති වෙනකම්ම හිනැහුණා. බලා හිටපු පද්මිතයත් හිනාවෙන්න ගත්තාම අපි දෙන්නට තව හිනා ! ඒ හිනාවෙන කොට පද්මිතයගෙ බඩ දෙදරන හැටි දකලා. අනේ එහෙම දවසක්.

රණ්ඩුවෙන් ගිනියම් වෙච්ච පපු, තැඹිලිත් බීලා හිනාත්වෙලා හොඳටම කූල් වුණා.

''නෑ........ අපි දෙන්නා ටිකක් වලියක් දාගත්තා බං ඒකයි........''

''ආ........ ඒකද........ ඉන්න මගේ කාමරේ තියෙනවා ඉස්සරහ දොර වහගෙන ඕන වලියක් දාගන්නවලා. එහෙමනං........ මං යනවා ළිඳට නාගෙන එන්න. වැඩි ඈතක් නොමේ වත්ත පහළට. පද්මිතයා ගියාට පස්සේ මම නිම්නාව අතින් අල්ලාගෙන ඉස්සරහ කාමරේට වුණා.

"මොන තරම් නිදහස් නැනක්ද? ඔනෑ තරම් කතා කර කර රණ්ඩු කර කර ඉන්නත් පුළුවන්......."

ඒත් නිම්නා අමුතු වුණා. නිම්නා මා දිහා බැලුවෙ හරියට මම ප්ලෑන් කරලා එයාව මෙහෙම පාලු තැනකට එක්ක ආවා වගේ.......

"මට එළියට යන්න ඕනෑ.......! ඈ කිව්වේ තර්ජන ස්වරයෙන්. ඔව් මම ඇව කාමරෙන් එළියට එක්කරං ගියා. මගේ අත් නිකම් ගිව්වෙ නෑ. එයාව ආදරයෙන් බදා වැළඳගෙන මාත් එක්ක කට ගහන කට පොඩිය මට්ටු කළා.

"ඔයා හරි නරකයි......."

නිම්නා එහෙම කිව්වෙ හුස්ම හිරවෙන ගතියෙන්. මා ගැන ලොකු ආදරයක් ඒත් ඒ බැල්මෙ තිබුණා. මම ඒක සතුටුද්දෙන්ම කියෝගත්තා.

ගෑනුන්ගෙ මායම් තමයි. ඇස් කියන්නෙ වෙනම දෙයක් කට කියන්නෙ තවත් දෙයක්. ඒ හිත කියන දේ....... දෙයියොවත් දන්නෙ නෑ ! කොහොම වුණත් අද තමයි මාර දවස.

සයික් උදාකර - දිනපොත
*දිනය: 1970 ජූනි 01*

මායි සයිකුයි ක්ලාස් එකට එහා හෝල්ට් එක ළඟදි රණ්ඩු කරගත් හැටි මතක් වෙනකොට ඇඟ කිළිපොලනවා. එවෙලෙ එයාගෙ මූණ මහාම මහා රකුසුයි. කොණ්ඩෙත් ඇඟි බැමත් කෙලින් වෙනවා වගේ පේන්නෙ. නහයත් තව ටිකක් දික්වෙලා තොල් තොදටම ඉරිවෙලා පහළට එල්ලි එල්ලී බනිනකොට මම නම් ආසම නෑ.

එයාට මේ රණ්ඩු පුරුදු වෙන්න ඇත්තෙ එයාගෙ අම්මගෙ නුයි, තාත්තගෙනුයි වෙන්න ඇති. මට හිතාගන්න පුළුවන් ඒ එහ දෙන්නා මරාගන්න හැටි. දවසක් සයි කිව්වෙ වළං පොඩි කරන කතාවකුත්. ඒ වුණාට මං කැමති නෑ එයා එහෙම ගෝරිකාරයෙක් නම්. මට මතකයි අපේ තාත්තා අම්මත් එක්ක , කියනවා දරුවෙකුට කසාදයක් කරලා දෙනකොට බලන්න ඕන ගේ දොර වතු පිටි හරකබාන යාන වාහන ගැන නෙමේ කියලා. ඕග නැදැයො සහෝදරයෝ ලොකුවට හිටියත් වැඩක් නැහැ



අදාළ ළමයගෙ දෙමව්පියන්ගෙ පවුල් ජීවිතය කොහොමද කියල හොයන එක තමයි ප්‍රධානම දේ කියලා.

අනේ ඒ අතින් බලනකොට සයි පව්....... එයාගෙ ලකුණු ඔක්කොම නැපිලා යනවා අම්මලා ගැන හෙව්වොත් නම්. ඒත් ඒ වගේ පවුලක ඉපදිච්ච එක ගැන එයා මොනව කරන්නද ? මොකෝ කුලීන්ගෙ උවමනාවට ඕන ඕන තැන්වල උපදින්න තරම් බලයක් නොකෙකුට තියෙනවායැ. ඒත් මට ඒක අතකට හිතෙනවා සයි තපටියෙක් කියලත්. ඒක පාරටම මාවත් ඇදගෙන ගිය හැටි යාලුවෙක් විතරක් ඉන්න පාලු ගේකට. කලින් සමහර විට ගෙදරට කෝල් එකක් දීලා තිබුණද කවුද දන්නෙ.

මාව කාමරේට කොටු කරගත්තට පස්සෙ මිනිහගේ මූණෙ ඇඳුණු හැඟීම හරිම අමුතුයි. නිකම් හරියට මහ වරදක් කරලා කොටුවෙච්ච මූණක කතාව එතන තිබුණේ. මට බය හිතුණෙ ඒකයි. මට මතක් වුණේ මගේ අම්මයි තාත්තයි. අනේ මගේ තාත්තා මොනතරම් ආදරේකින් ඇහැක් වගේ මාව බලාගත්තද....... එයාලා දැනගත්තොත් මම මෙහෙම ගෙදරක කොල්ලෙක් එක්ක කොටුවෙලා ඉන්න බව. මට ඒක පාරටම සයික් ගැන මහා පිළිකුලක් ඇති වුණා. ඒත් ඊළඟ මුහුර්ත තත්පරේදී....... මට එයා ගැන පිළිකුල් හිතුණද....... ගෙදර ආපු මම නාන කාමරේට වෙලා මගේ මූණ දිහා බැලුවෙ අමුතුම කෙනෙක් දිහා බලන බැල්මෙන්.......

සයික් ගැන වැරදි විදිහට හිතපු එක පව්.......! එයා ඒ විදියේ නරක කෙනෙක්නම් එයාට ඕන තරම් අවස්ථාව තිබුණා මාව පොළඹවාගන්න බලහත්කාරෙන් හරි.......

සයික් හරිම කඩවසම්. එයාට අකැමැති වෙන කෙල්ලෙක් මෙ ලෝකෙ ඉන්න විදියක් නෑ. මට ආඩම්බරයි. ඒ වගේ 'හැන්ඩ්සම්' මගේ කොල්ලා වෙච්ච එකට.

මගේ යාලුවො කට්ටියගෙ කොල්ලො සයික් එක්ක බලන කොට හරියට අර....... නවදලී හෝටෙල උපමාව තමයි මතක් වෙන්නෙ. ඒත් ප්‍රශ්නෙ තියෙන්නෙ ඉදිරි අනාගතයේදී මොකක් වෙයිද කියලා. සයිට හොඳ දෙමව්පියෙක් නෑ. රස්සාවක් නෑ. අනේ මන්දා....... සයිගෙ කම්පියුටර් කෝස් එක ඉවර වුණොත්

එයාට හොඳ රස්සාවකට ඉල්ලුම් කරන්න ලැබෙයි. මම මගේ එකවුන්ටන්සි පංති යන්නෙත් මොකක් හරි රස්සාවක් හොයාගෙන මගේ කියලා නිදහස් ජීවිතයක් පටන්ගන්න ඕන නිසා. මට මේ උපදෙස් දුන්නෙ සගිම තමයි. අම්මල තාත්තලාගෙන් යැපිල ඉන්නාතාක් අපිට අපි වෙනුවෙන් හඬක් නගන්න ශක්තියක් නෑ කියලා සගි කිව්ව කතාව සහතික ඇත්ත. නිතර මා එක්ක රණ්ඩු ඇල්ලුවත් සගි උණුසුම් ප්‍රේමවන්තයෙක්.

*නිමිනා සාමෝදනා - දිනපොත*
*දිනය: 1970 ජූනි 01*

"ඔව් ඒ මගේ හැටි තමයි." මට එහෙම කියන්න සිද්ධ වුණේ අපේ දහම් පාසලේ උගන්නන ධර්මසේන සර් එක්ක. නම වගේම ධර්මසේන නම ධර්මයෙන්මයි වැඩ. එයා කතා කරන්න ගියාම හාමුදුරුවො පරාදයි. ධර්ම දැනුම් ගබඩාවක්. අපි දෙන්නා අතරේ පුංචි වාදයක් ඇති වුණා. මම කිව්වා ජාතක කතාවලින් සිද්ධ වෙලා තියෙන්නෙ හැම තිස්සෙම ගෑනුන්ට අසාධාරණයක් කියලා. එහෙම එකක් කියන්නකො කියලා ධර්මෙ මට අභියෝග කළා.

"මට මතකයි එක කතාවක තිබුණා එක මහලු අම්මා කෙනෙක් අසනීප වුණු තමාව නාවද්දී ඇඟ අතුල්ලන පුතාගේ පහසට ලොල් වෙලා කාමුක සිහිවිලි ඇතිකරගත්තා කියලා."

මම එහෙම කිව්වම ධර්මෙට කට උත්තර නෑ, 'ගෑනු තමට නින්දා කරන දේවල් විතරමද ඒ කාලෙ ලේඛකයෝ උලුප්පවලා ගත්තෙ ?'' මම එහෙම කියනකොට ධර්මෙ ටිකක් කල්පනා කළා.

"ඔයා දන්නවද ඒ නානාප්‍රකාර විදියෙන් ගෑනු සිත විවරණය කිරීමක් ඒ කරලා තියෙන්නේ. පිරිමි චරිතත් ඒ එක්කම විවේචනය වෙනවා. ඒවා ඔයාලා දකින්නෙ නෑ, මොක ඔයගොල්ලො දාගෙන ඉන්න අර කාන්තා විමුක්ති කණ්ණාඩිය නිසා......... අනිත් එක ජාතක කතාවල තියෙනවා ගෑනුන්ගෙ වරදකට සමාව දීපු පිරිමියෙක් ගැනත්.'

"මොන මොරුද 'ගැහැනු තවුරුද වරදෙ නොබැඳෙන' කිය කියා පලිව්වි කළා. 'තැන ගෑනිගෙ පතිව්‍රතාව වගෙයි' කියලා



ආප්තෝපදේශ හදලා ඉතිරි අන්තිම ආත්ම ගරුත්වෙත් නැති කළා......."

ධර්මෙ හිනාවුණා...... ඔලුව දෙපැත්තට වන වනා පණ්ඩිත සෙයියාවක් පෑවා.

"මෝඩි....... කියවලා බලන්න පන්සිය පනස් ජාතකයෙ උච්ඡට්ඨභත්ත ජාතකය. ඒකෙ එක බැමිණියෙක් තමන්ගෙ සොර සැමියට බත් බෙදල දෙනව....... සැමියා ගෙදර නැති වෙලාවෙ, ඒ මදිවට ඒ මිනිහත් එක්ක යහන්ගතත් වෙනවා. ඊට කලින් මේක බලා ඉන්නෙ යාචකයෙක්. එයත් හිඟමන් ඉල්ලාගෙන ආවත් හිඟමන් නොලැබී අර බැමිණිය එක්ක තරහිනුයි මිනිහා හිටියේ. ඔය අතරෙදී අර අම්මණ්ඩිගෙ ඇත්ත සැමියා එනවා. ගෑනි ඉක්මනට බත් කකා හිටපු හොර මිනිහා අටුවට නග්ගවලා ඒ බත් පිඟානටම උණුබත් බෙදලා සැමියාට දුන්නා. කන්න ගිහිල්ලා මිනිහා බත් පිඟානට ඇඟිල්ලක් ගහලා කියයි 'මේකෙ යට බත් සීතල ඇයි' කියලා. හිඟන්නත් මේ සීන් එක බලාගෙන. මිනිහට ඉවසුම් නැහැ. මේ හොරේ ගැන කියනකං. පුදුම බඩගින්නෙන් ආපු මිනිහට දුන් තවත් දෙන්නෙක්ම බත් කනකං බලා ඉන්නත් වෙලා. ඒ නිසා මිනිහා ඇත්ත සැමියාට තමා දන්න සිද්ධිය කියලා දැම්මා. ඒකෙන් වෙන්න පුළුවන් මහා විපත ගැන පොඩ්ඩක්වත් හිතුවෙ නැතිව. නමුත් ඒ සැමියා හොර සැමියාව මැරුවෙවත්, බිරිඳව මැරුවෙවත් නෑ. අවවාද කරලා බැණලා සොර සැමියා එලවලා බිරිඳව තියාගත්තා."

"හා....... හා....... ඇති ඇති ඔයා හරි." මම කිව්වා.

"ලස්සන වැඩේ තියෙන්නෙ ඒ කතාවෙ හැටියට අර හිඟන්නා නම් අපේ බෝධිසත්වයො. ඔන්න බලන්න සාමාන්‍යයෙන් හැම කතාවකම බෝධිසත්වයො හොඳ වැඩමනෙ කරන්නේ. බලන්න මේකෙ කරලා තියෙන වැඩේ."

ධර්මෙ හිනාවුණා. එක අතකට ධර්මෙගෙ කතා රසවත්. මොනවා හරි ඉගෙන ගන්න දෙයක් එයාගෙ හැම වචනයකම තියෙනවා. බලාගෙන ගියාම පිරිමි හැමෝම මෝඩයොවත්, සල්ලාලයොවත්, බොරු කාරයොවත් නෙමේ. ඒත් ඒ හැම එකක්ම හරස් කඩේ පිහිටලා තියෙනවා එක්තරා අනුපාතෙකට.

අනේ මන්දා අම්මලා මට හොයන මනුස්සයා මොන අනුපාතෙක කෙනෙක්ද කියලා මට හිතාගන්නවත් බැරි වෙයි. හැබැයි එක එක්කෙනාට ආදරේ කරලා පිලුණු වෙච්ච ප්‍රේමවන්තයො නම් මට එපා....... සෙකන්ඩ් හැන්ඩ් දේවල්වලට මං කොහොමත් කැමති නෑ.

*සඟදා මුතුමාල - දිනපොත*
*දිනය: 1970 ජූනි 02*

බුදු අම්මෙ පදනම් ආයතනයට මහා සෙනගක් ආවා. මගේ ප්‍රියතම ගායකයාගෙ සී ඩී ලෝන්ච් එකට එන එක සෙත්තුවල කට්ටිය. දෙයියනේ මට හිතුණා ගායකකමත් නරක නෑ කියලා. ලස්සන වැඩේ තියෙන්නෙ දේශපාලකයො දෙන්නෙකුත් උන් හිටි ගමන් කඩා වැච්චච එක. එක අතකට පව් එහෙම කියන එකත්. ඒ අයත් ලේ මස් තියෙන, හැඟීම් දැනීම් තියෙන සංවේදී මිනිස්සුනෙ. දේශපාලන ලෝගුව දාගත්තාට. ඉතිං මිනිස්සුන්ගෙ ඇස් යොමු වෙන්නෙ අමුතු විදිහට තමයි. ඒත් ඉතිං ඒ වැඩත් කවුරුම හරි කොරන්නත් එපෑ. නළු නිළියො, ක්‍රීඩකයො, සාහිත්‍ය කාරයො බොහොම දෙනෙක් හිටියා. ඒ ඔක්කොම අතරේ බැබලිච්ච සඳ වගේ ගායක තුමා ! එයා ගායනා කරන කොට මෙලෝ සිහියක් නැතිව දැහැනකට සම වැදිලා වගේ බලා ඉන්න මම ආසයි. එහේ මෙහේ දුවන පනින හිත එක අරමුණක තියා ගන්න විනාඩි හතරක විතර භාවනාවක් වගේ ලස්සන ගීතයක්. ගායනා අස්සේ කතාත් යනවා. එනකොට දැහැන බිඳෙනවා. ආයෙ මෝහනය වෙන්න ටික වෙලාවක් ගත වෙනවා. එහෙම මෝහනය වෙලා ඉඳිද්දී මගේ උරහිසට ඇඟිල්ලක් ඇනුණා.

හැරිලා බැලින්නම්........ කවුද........ සගීත්........ උදාකර....... උදා වූ චන්ද්‍රයා වගේ හිනාවක් දාගෙන එයාගෙ පුරුදු යාලුවන් එක්ක! කතා කරන්න මට ඕන වුණා. කතා කරන්න එයාටත් ඕන වුණා. ඒත් එයා අතින් සන් කළා කතා කරන්න එපා කියලා. වාඩිවෙලා ගීත රස විඳින මහ සෙනග අපිට කරවටු ඇස් බැලුම් යවන්න කලින් අපි අපේ කටවල් අගුල් දාගත්තා.

සංගීත රාත්‍රිය නම් අපූරුයි. මගේ හනියට ගිය මානවීටත් සගීත්ව හඳුන්වලා දුන්නා. සංගීත සාදයෙන් පස්සේ මානවීත් සගීත්ට කැමති වගේ. එයාලගෙ කතා බහත් ගානට ගියා. සගීත් කියන්නේ හොඳ දොඩමලු ගංගාවක් වගේ. වචන පැහැදිලියි....... අර්ථවත්. ඒ එක්කම එයා කතාකරන ඇස් වලින් එන බැල්ම....... විවිධ අරුත් ගේනවා.



හරි අපූරු සංගීත සන්ධ්‍යාවක් ගත කළේ. මගේ ප්‍රියතම ගායකයා ළඟට පොරකාලා පොරකාලා ගිහිල්ලා වචන දෙකක් කතාකරලා සමරු පොතෙත් සටහනක් දාගත්ත.

ඒ ඔක්කොම කරලා එනකමුත් සගීත් හිටියා. තුනී වෙන සෙනග අතරේ එයා මගේ සමරු පොත දිහා බැලුවා අමුතු බැල්මක්. ඒ බැල්මටම මගේ අතින් සමරු පොත දික්වුණා එයා දිහාට. අඩක් සීතල අඩක් උණුසුම බැල්මකින් එයා මගේ අතින් සමරු පොත අරගෙන සටහනක් දැම්මා. ඇත්තටම එයා ඒ සටහන දැම්මෙ මගේ හදවතේ පතුලේ.

*මනෝරමා නාගසේන - දිනපොත*
*දිනය: 1970 ජූනි 08*

එකතු කරපු දිනපොත් වල දින වකවානු පෙරලී පෙරලී යනවාද මගේ අතින්. එහෙම නැත්නම් ඒ පෙරලන්නේ පැත්තකට වෙලා බෙල්ල නවාගෙන කැරකෙන විදුලි පංකාවද්දයි මං දන්නේ නැත.

එක්කෝ මම අක්මුල් නැති මොකක්දෝ අවුලක පැටලිලාය. නැත්නම් මම කාලය සිසාරා ගමනේ යෙදෙන දේශාටකයකු වෙලාය. මම මොහොතක් කාමරයේ ඇති කැඩපත දිහා බලමි. එතුළින් මගේ ලියන මේසයද ඊට තබා ඇති පුටුවෙන් හිඳ ලියන මාවද පෙනෙයි. විශාල කොල ගොඩක් සර සර නද නගමින් මගේ මේසය මත හලියයි. ඒවා විසිර යා නොදී රැකී ඇත්තේ ඉතා සියුම් බන්ධනයකිනි. විසිරී යන මගේ සිත එක්සත් කරවන සියුම් බන්ධනය ආදරය වී තිබුණු යුගයක් තිබුණි.

"කෝ ඔයා තවම එළියට ආවෙ නැද්ද කෑම කන්නවත්"

බිරිඳ දම්වැලකින් අල්ලාගෙන බල්ලා රැගෙන යයි. එසේ යන බල්ලා මගේ කාමරයේ ජනේලය අසල නවතිද්දී ඇය එසේ

කියන්නේ ජනේලයෙන් එබෙමිනි. මේසය මත ඇති සර සර ගා නටන කොල ගොඩ දැක ඇයට ඇති වූයේ සිනාවකි.

මොනවා ලියනවද නැත්නම් මොනවා කියවනවාද මන්දා ඇගේ ඇස් වල ලියැවුණි. ඒත් ඒ ගැන කිසිත් කීවේ නැත. කාලය පුදුමාකාරය. මා ලියන දේවල් කුමක්දැයි කිකිළියක් සේ අවුස්සා බලන කාලයක් ඇගේ තිබුණි. මගේ ලියන මේසය හැඩිකර දානවා තරම් තරහක් මට වෙන කිසිම දේකින් ඇති කරවන්ට බැරිය. ඒ බව දන්නා නිසාදෝ සමන්තා පුරුදුව සිටියේ තමාගේ ආවේගයන් ඒ ආකාරයෙන් මා හරහා පිටකර ගැනීමටය. බොහෝ විට ඇයට මගෙන් ගුටිකන්ට උවමනාවක් තිබුණු බව මට වැටහුණේ ඉවෙන් මෙනි.

නමුත් ගැනියෙකුට ගුටි ගහන්ඩ තරම් පහත් නිහීන කමක් මා තුළ තිබුණේ නැති කම නිසා ඇගේ දුෂ්ට චේතනාව පරාජය විය. එසේ ගුටියක් කා අඩාගෙන ගෙදර ගිහින් මට නින්දා කරන්නට ඇට තිබුණු උවමනාව පිස්සුවක් සේ හැඟී ආ කාලයක්ද තිබුණි. නමුත් අද ඈ ඒ ආක්‍රමණික වේගයෙන් සපුරාම මිදිලාය. නැතහොත් කාලය විසින් ඈ එයින් මුදවා ඇත.

හරියට මගේ නින්දෙන් ඇවිදීමට තෙත ගෝනි පඩංගු දමමා සේ ඇයගේ මේ මානසික නොසන්සුන්තාවයට කාලය හොඳ තෙත ගෝනියක් වී ඈ ඒවායින් වළක්වා ඇත.

සමන්තා දමවැලෙන් අල්ලාගෙන යන බල්ලා සමග ගේට්ටුවෙන් පිට වන්නේ ඌ ලවා අපේ හතර මායිමෙන් පිටත මල මූත්‍ර කරවීම සඳහාය. මෙය මට මහා ලජ්ජාවට කාරණාවකි. මුල් භාගයේදී මේ කර්තව්‍යය අප අතරේ විශාල ප්‍රශ්නයක් ඇති කළ දෙයක් විය.

"ඔයාට ලැජ්ජා නැද්ද අපේ බල්ලව එළියට අරන් ගිහිල්ලා අනිත් කාගෙ හරි තැනක මල මූත්‍ර කරවන්න......." කෑ ගැසුවේ මාය.

"ඒක හරි වැඩක්නෙ....... නැත්තං ඔයා කියන්නේ බලු ටොයිලට් එක්ක හදන්න කියලද?"

"ඇයි අපිට පුළුවන්නම් අපේ මල මූත්‍රා අපේ වත්තෙ හතර මායිමේ දාගන්න. ඇයි අපේ බල්ලාගෙ ඒවා විතරක් අනුන්ගෙ වතුවලට දාන්නෙ. ඒක නම් අසාධාරණයි.......!"



ටිකින් ටික ඇවිලෙන දෙබස නතර වන්නේ වෙනම තැනකින්ය. ඒ, ඒ කාලයේ හැටිය. මතකයේ හැටියට අපේ ජීවිත කාලයේදී සමන්තා මේ රැගෙන යන්නේ අපේ ගෙදර සිටින හතර වැනි මුර බල්ලාය. අප වයසට යන තරමක්, ගෙදර ඇති කරන සුරතල් මුරකරුවන් ජීවිතය අවසන් කරමින් අලුත් සාමාජිකයන් එකතු කරමින් ඉදිරියට ගොස් ඇත. නමුත් අප නවමත් කරමින් සිටින්නේ අප එදා කළ දේවල්මය. ඒ දේවල් ගැන දරන මතය විතරක් වෙනස් කම් වලට භාජනය වෙලා ඇත. ඒවාද සාපේක්ෂය. කිසිවක් කෙලින්ම කිව නොහැක.

සමන්තා බල්ලාව රැගෙන එන්නට කලින් මා කෑම කාමරයට යන්නේ ඉක්මනින් ඒ වැඩය අහවර කර එන්නටය. රෝවර් මගේ මිත්‍රයා නුඹගේ ශරීරකෘත්‍යය කරන්නට නුඹගේ ස්වාමිදූව සමඟ තව ටිකක් දුරකට දුරකට යා යුතුය. එවිට මට මගේ පාඩුවේ නිවී හැනහිල්ලේ මගේ පාතරාසය බුදින්නට හැකි වේවි. දුරකතන ඇමතුම් කරදරවලින් මිදී හිස පාත් කරගෙන මගේ කුටියට යද්දී ගේට්ටු කොක්ක නාදවනු ඇසෙයි. සමන්තා රෝවර් සමඟ පැමිණ ඇත.

දැන් මම මගේ සුරතල් හීලෑ බලු පැටවා දමවැලෙන් බැඳගෙන විවිධ මං පෙත් ඔස්සේ වේ මගින් වේ මගට ඇවිදිමි. මගේ සිත මතකයේ යදමින් බැඳගෙන ටිකක් එහා වේ මගකට අවතීර්ණ වන වෙලාවය.

* * *

වයස අවුරුදු විසි අට පනිද්දී මිනිහෙක් අසහනයට පත්වෙන මුල්ම කාරණය රැකියාව සම්බන්ධ කාරණයය. ඒත් මට රස්සාවට කලින් පරස්නාව සම්බන්ධ කාරණයට අත ගහන්න සිද්ධ වුණු හැටි....... උසස් පෙළ සහතිකය, ඉංග්‍රීසි සහතිකය, ගණකාධිකරණ සහතිකය, අර සහතික මේ සහතික එකතු කරලා පුච්චලා තළලේ අළු ගාගන්න හිතෙන තරම්.

ගිය එක සම්මුඛ පරීක්ෂණයක්වත් මට ඇල්ලුවෙ නෑ. මට ඇල්ලුව තැන්වල මහවුන්ට මාව ඇල්ලුවෙ නැහැ. ඒත් පුස් නාම්බෝ වගේ හිස් මිනිස්සු ඕනෑ තරම් හොඳ පුටුවල ඉන්නෙ.

ලොකු පුටුවලට වෙලා ඉඳගෙන දේශපාලන ලියුම් බලෙන්....... මේක පුදුම ලෝකයක්.

තේජස පතුරුවනවා. ඔයාගෙ ආදරේ නිම්නා මාත් එක්ක හැමදාම රණ්ඩු. ඔයාගෙ ආදරේ පට්ටපල් බොරුවක්. එයා මට කියනවා. එහෙම කියලා රවලා බලනකොට කේන්තියෙ රැස් මගේ සිත් ඉරේ විහිදෙනවා ඇති. මගේ ඇස් ගිනිපුළිඟු වගේ වෙනකොට ඈ අඬනවා. දෝතින්ම මුහුණ වසාගෙන.

රෝදූ මගේ හිතට සඳරැස් සීතල වැස්සක් වැටෙන්නෙ එනකොට.

"ආදරෙයි කියලා මම මැරෙන්නද කෙල්ලෙ ....... මම මොනවා කරන්නද ? ඔයාට තේරෙනවා නේද ? මගේ ෆැමිලි බැක් ග්‍රවුන්ඩ් එක ගැන. දැනගත්ත ගමන් මාව නිකම්ම ඔයාලගෙ අම්මලාගෙන් කැපිලා යනවා. අඩුම ගානෙ මට හරිහමන් ජොබ් එකක් තියෙනව නම් කටක් ඇරල දිවක් නමල අම්මලට කියන්න එන්නවත් පුළුවන්......."

"ඉතිං මමය කියලා මොනවා කරන්නද ? හොඳයි ඔයාම හිතන්න. දැන් මට විසි හතරත් ඉවර වුණා. අම්මලා මට බඳින කෙනෙක් හොයනවා."

"ඔයාට මට වඩා හොඳ කෙනෙක් ලැබෙයි නිම්නා........ මම වගේ පට්ටපල් මෝඩ පව් කාරයෙක් නැතිවට....... ඔයාට හොඳ උසස්, වැදගත් මහත්තයෙක් ලැබේවි....... ඒක මට විශ්වාසයි."

නිම්නා ඒක අහලා පරල වෙලා වගේ නැගිට්ටෙ.

"එහෙනම් මොන කෙහෙල්මලකටද මාව මෙච්චර දුරක් අරරගෙන ආවෙ....... සශී." ඈ මගේ බෙල්ලටම පැන්නා. මම ඇගේ අත් ඉවත් කළේ කේන්තියෙන්.

"එහෙනම් යං....... රෙජිස්ට්‍රාර් කෙනෙක් ළඟට දැන්ම....... ගිහිල්ලා අපි කසාද බඳිමු. ඉවරනෙ. මට කරන්න පුළුවන් එච්චරයි."

"දැන් කසාද බඳින්න ඔයාට පිස්සුද....... එහෙම කසාද බැඳලා කොහොමද ? බැඳලා අපි යන්නෙ කොහාටද ? ඉන්නේ කොහේද ? කන්නෙ අඳින්නෙ කොහොමද ?"

ආයෙත් තර්ක විතර්ක කෝටියක්.......ඈ වැලපින්නක්



වගේ ඇඬුවා. අඬලා විසඳෙන ප්‍රශ්නයක් නම් මාත් අඬනවා. නිම්නා එක්කම අඬලා කඳුළු ගංගාවක් හදලා ඒ කඳුළු ගඟේම පීනාගෙන මං එගොඩ වෙනවා මගේ නිම්නා එක්කම.

අපිට එනකොට ප්‍රශ්න තියේවිද ? ප්‍රශ්න තියේවි. අපි රණ්ඩු වේවි. වේල දෙක කන්න නැති වෙනකොට මේ තියෙන ආදරේ වෙන අතකට සංක්‍රමණය වේවි.

එතකොට අපි දෙන්නා නිකම්ම නිකම් හුළං පිරිච්ච බැලුම් බෝල දෙකක් වගේ තමයි. දවසක අපිව පුපුරලා යාවි." අපේ මුලු ලෝකෙම එතැනින් ඉවර වේවි.

*සශික් උදාකර - දිනපොත*
*දිනය: 1978 ජන. 22*

ජීවිතේ නිකම්ම නාස්ති කරගත්තා කරලා මට හිතෙනවා. මම මේ ගැන මගේ යාලු කෙල්ලො එක්ක කතා කළාම එයාලා කියන්නෙ "සශී පව්" කියලා. උන් එකෙකුටවත් තේරෙන්නෙ නෑ මට වෙලා තියෙන හරිය. මගෙ අම්මයි තාත්තයි මට ඇති තරම් සැප දීලා හදන එකත් මට ආදරේ කරන එකත් ඇත්ත. ඒත් එහෙම වුණා කියලා 'මම පව් නැද්ද 'මම කෙල්ලෙක්. ඇයි එහෙම වෙච්ච පලියට මට මෙහෙම කළේ.

ඔලුව පැලෙන්න තරම් දුකක් මට දැනෙනවා. දෙවියනේ මම මොකටද අවුරුදු ගානක් තිස්සෙම සශික් මත්තෙම හිටියෙ. කී දෙනෙක් මා එක්ක යාලුවෙන්න ආවද. මම ඒ එකක් ගැනවත් හිතුවෙ නෑ. මට හිටියෙ සශික් විතරමයි. දෙවියනේ තහංචි මැද්දෙ වැට කඩොලු අස්සෙ මම සශික්ව මුණ ගැහුණෙ මොනතරම් යුද්ධයක් කරලද ? සශිත් මාත් එක්ක මොන තරම් රණ්ඩු වුණාද? ඒ වගේම ආදරේ කළාද?

ජීවිතේටම මට දැනුණේ ඒ පැය විතරමයි. ආයෙ මට කවදාවත් වෙන කෙනෙකුගෙ ස්පර්ශයක් ලබන්න බැරි වේවි. මට හිත හදාගන්න බාරි වේවි. සැහෙන කාලෙකට මම කාටවත් නැති වෙලා වගේ ඉන්න වේවි. ඒත් ඒ කොයි තරම් කාලෙකටද? සමහර විට මැරෙනකල්ම මට එහෙම ඉන්න වේවි. සශී මාට

මුලා කළා. සඟීට වඩා හපනෙක් ආවොත් මාව මුලා කරන්න මං එදාට මුලා වෙව්ද ? ඇත්තටම මුලා වෙව්ද ?

පිරිමි හරිම ආත්මාර්ථකාමියෝ. එයා එයාගෙ බැරි අමාරුකම් ජීවිතේ දුක වේදනාව ගැන කියලා එයාට සතුටු වෙන්න මාව භාණ්ඩයක් කරගත්තා කියලයි මට හිතෙන්නෙ. හුඟක් ඉස්සරෝම දවසක (මම මේ දිනපොතේ ඒ ගැනත් ලියලා කියලත් මට මතකයි.) එයාගෙ යාලුවෙක් වන පද්මිනීලගෙ ගෙදර ගිය දවස මට මතකයි. එදා එයාගෙ මූණ කට කියවාගන්න බැරි සෙල්ලිපියක් වගේ පෙනුණේ. මම බය බිරාන්ත වෙලා ගියා. එදා තරම් මම ජීවිතේටම බය වෙලා තිබුණේ නෑ.

ඒත් දෙයියනේ ඊට පස්සෙන් පහු කී දවසක් නම් ඒ වගේ අවස්ථාවල් උදාකර ගන්න පෙළඹුනාද? සඟීත් මම ඇයි ඒවාට විරුද්ධ වුණේ නැත්තෙ. විරුද්ධ වෙලා පලක් නැති නිසාද? නැත්නම් මටත් එහෙම යන්න උවමනා නිසාද ? දෙය්යම්පා මගේ හෘද සාක්ෂියට එකඟව මට තිබුණේ එකම බයක්. ඒ සඟී මාව ඇතැරලා යාවි කියලා බය. එයා එක්ක එක වතාවක් හරි තනිපංගලමෙ හමුවෙලා අනුරාගී හැඟීම වලින් හෙම්බත් වුණු දවසෙම මට තේරුණා මට නම් ඉතිං සඟී හැර වෙන කෙනෙක් පතන්න බෑ කියලා. ඒ මගේ හැටි. ඒ නිසා දෙවැනි තුන්වෙනි සතර වැනි හය හත්වැනි වතාවලදී මම ඉබේටම සඟීගෙ ආදරයට නෙමේ අනුරාගයට නැටවෙන රූකඩයක් වුණා.

ඉතින් අද ඇයි මම මේ දේවල් මේ දිනපොතේ ලියන්නෙ. මොකටද ? අතීතය වැඩක් ඇද්ද ? මෙච්චර අතීතය ගැන හිත හිතා ලතවෙන එක මානසික රෝගයක් කියලා මටම තියෙනවා. වර්තමානය ගැන හිතලා හිත හදාගන්න මම උත්සාහ කරනවා සඟීත් ලෝක කපටියෙක් !

තම්ශා මට එහෙමයි කිව්වෙ සඟී ගැන. දෙයියනේ එහෙම කොහොම හිතන්නද ? මං ආදරේ කළේ මුලු හදවතින්ම නම්....... මට එහෙම හිතන්න පුළුවන්ද ? එයා ජීවිතේ අහපසු අවස්ථා මඟ අරවා ගන්න මාව ප්‍රයෝජනයට ගත්තා. අන්තිමටම උරණ වෙච්ච මගේ හිතම මට කිව්වා මටම පුදුමයි....... එයා 'ටයිම් පාස්' කරන්නද මාව යොදාගත්තෙ ?



සඟීත්ගෙ ඇස්.......? ඒ මායාකාර ඇස් යට මං දැක්ක ආදරේට මොකද වුණේ.......? මේ වේදනාව විඳින්නම නම් මම ඇයි එයාට හමු වුණේ. දෙවියනේ මේ වගේ පාපකර්මයක් කළේ ඇයි. තුන් හිතින්ම අහිංසක මට....... මේ කළ දේ....... වාව ගන්න පුළුවන්ද ?

නිමනා සමෝදනා - දිනපොත
දිනය: *1978 ජන. 03*

ජීවිතේ හරිම පුදුමාකාර දෙයක්. වෙලා මට පේන හැටියට. ජීවිතය දිහා ඔයාට හරියටම දකින්න ඕනෑ නම් ඉන්න තැනින් අඩි කුහාගතරක් වත් උඩට ගොඩ වෙන්න වෙයි.

මනෝ මට එහෙම කිව්වාම මට හිතාගන්න බැරිවුණා මේ කෙල්ල පුදුමාකාර දැනුම් කෝෂයක් කියලා. මට අනේක වාරයක් හිතෙනවා නිමනා මොනවද දන්නෙ කියලා. හුරතල්කම හුරුබුහුටි කම මටසිළිටි කම ඒ ඔක්කොම නිමනා ළඟ.

ඒත් ජීවිතේ මොනතරම් රළු ද කියල තේරෙන්නේ ජීවිතේ අත පත ගාන කොට. අම්මගෙයි තාත්තගෙයි අඬ දබර ....... ඒ එක්කම එකම සහොදරයගෙ හොර මැරකම් නිසා ඇති වෙච්ච තත්ත්වය. ගමට මූන දෙන්න බැරිව මූණ බෝක්කුවක් අස්සෙවත් ගහගන්න හිතුණු වෙලාවල් ඕනෑ තරම්.

නිම්නාගේ ඇසුරේ ඉඳිද්දී මම ඒ ඔක්කෝම ජරා කැළිකසල කුණු කාණු වලට උඩින් ඒවායේ දුගඳ වත් නොදැනී ඉහළ අහසේ පාවෙලා ගියා. සිහිනයෙන් විතරක් ලබන්න පුළුවන් කියල හිතෙන දේවල් මට හැබැහින්ම නිමනාගෙන් ලැබුණා! ඒ කෙල්ල මට ජීවිතේ ජරාව අමතක කෙරෙව්වා. ඒ කෙල්ල මට ජීවිතේ අරුත කියලා දුන්නා. ඒත් නිම්නාගෙන් වෙන් වුණාට පස්සෙ මට පරණ බොලොක්කයක් වගේ පොළවටම කඩා වැටුණා.

පොළොවෙ තියෙන රළු බොරලු බොතල්කටු ඇනිල මගේ පා පතුල් තුවාල වුණා. ලේ ගැලුවා. ඒත් ඒවා එකක්වත් මට වේදනාවක් විදියට නොදැනුනේ මගේ හිතින් ලේ ගල ගලා තිබුණ හින්දා වෙන්න ඇති.

මනෝරමා මට පෙන්නලා දුන්නු අලුත් ජීවිතේ.......අවි

තුන හතරක් උඩට නැඟලා ජීවිතේ දිහා බලන නාට්‍යකාර ඇස්.......මට ලබා දුන්නු අලුත් ජීවිතේ මගේ හිත සුව අරභයා සැනපෙව්වා. 'උදාන්ත දිවාකර' ජීවිතේ දිහා අලුතින් බලන්න පටන් ගත්තා. ඇඟ ඇතුලේ මෙතුවක් කල් කැටිවෙලා තිබ්බ්ච ආවේග ඔක්කොම එකට කැකෑරිලා ආයෙ දියවෙලා අලුත් අලුත් ජීවිත කැලි හද හදා නාට්‍යයට එකතු වෙනකොට....... ඒකෙ අපූරුව......! ඒකෙ අපූරුව. කියවන්න පුළුවන් වේදිකාවෙ පහළට වෙලා ඉඳගෙන ඇස් උඩ තියාගෙන ඉන්න ප්‍රේක්ෂක ඇස්වලින්! ඇරිලා තියෙන හීන් ගිනා රේඛා මවාගෙන ඉන්න තොල්වලින්....... ඇත්තටම ඔයා හරිම අපූරුයි මනෝ........

වැහිලා තිබ්බ්ච මගේ ඇස් ඇරෙව්වා ඔයා. මම දන්නෙ නෑ හරියටම ඔයා කවුද කියලාවත්. ඒත් අවුරුදු ගණනාවක් තිස්සෙ වැහිලා තිබ්බ මගේ ඇස්......... ඔයාව හඳුනාගෙන හිටියෙ යන්තමින්........ මම නිම්නා එක්ක ආදරෙන් බැඳිල ඉන්න කාලෙදී ඔයාව මුලින්ම හමුවුණේ. දෙවියනේ දැන් අවුරුදු කීයක්ද? පහක්......... දහයක්......... කාලෙ ගතවෙන ඉක්මන්.

මනෝ හරි පුදුම කෙල්ලක්........ නිම්නාගෙ අනික් පැත්ත. ගතිගුණවලිනුයි, දැනුම අතිනුයි වුණත්, මනෝ හරිම ප්‍රායෝගික කෙල්ලක්. එයා ළඟ හීන නෑ. හීන පුම්බලා ආකාසෙට ඇරලා කට ඇරගෙන බලා ඉන්න එයාට ඕන නෑ. එයා හීන අතගෑවෙ නෑ. ඇස්වල කතාවලට පාර කිව්වා. තොල්වල කතාවලට එක්කෝ ඔව් නැත්නම් නෑ කිව්වා.

අපි ටිකක් හුදකලා වෙලා කතා කරමුද කියලා මම අහන්න කලින් මනෝ ඇහුවා. මට පුදුමයි. ඒක හරි අපූරු මිත්‍රත්වයක් වගේ.

"ඔයාට හොඳට ලියන්න පුළුවන් නේද?" මම ඇහුවම ඇට හිනා.

"කොහොමද දැනගත්තෙ?"

"කතාකරන ගීතමය භාෂාවෙන්........"

"ලේඛන කලාව බොහොම හොඳ දෙයක්. හරියටම කළොත්. දන්නවද ලෝකේ ධනවත්ම ලේඛිකාව කවුද කියලා......... ඒ 'හැරි පොටර්' කතා පෙළ ලියූ ජේ. කේ. රෝලින්ග්."

"එයා එංගලන්තයේ ඉන්න ධනවත්ම 12 වැනි කාන්තාව.



බලන්න ඉතිං ලේඛන කලාව තියා මොන කලාව වුණත් හරියටම කරනවානම් ඒක හොඳ ජීවන මාර්ගයක්."

"ඒ වගේම දන්නවාද දෙයක්. එයා මොනතරම් දුප්පත් කෙනෙක් වෙලා හිටපු කෙනෙක්ද කියලා.........එයා ඒ දුප්පත්කම උහුලාගන්න බැරිව දිවි නසාගන්නත් හදපු කෙනෙක්. බලන්න පස්සෙ එයාට එයාගෙ දෛවය තමුන්ගෙ හැකියාවෙන් ධනය උපයාගන්න මාර්ගය සලස්වලා දුන්නා."

මනෝ එහෙම කිව්වෙ මා දිහා කරුණාවන්ත බැල්මෙන් බලමින්. මගේ අඟ හිඟකම් ගැන මනෝට හොඳ දැනීමක් තිබුණා. මගේ ඇඳුම්වල හැටියට, මගේ පාවහන්වල හැටියට ඩවා වෙනත් දේකින් හරි ඈ දන්නවා මම දුප්පත් කෙනෙක් කියලා. නාට්‍යවලින් හම්බ වෙන සොච්චම මදියි ජීවත් වෙන්න. මම රස්සාවකට දිගටම උත්සාහ කළේ ඒකයි........ නමුත් හිතූ තරම් ලේසි නෑ. සමහර රස්සාවල් හම්බවෙන තැන්වල කිසිම නිදහසක් නැති බව තේරුණා. නිවාඩු ගන්න වැඩවලට. ඒ නිසා මම ඒක කපා හැරියා. මගේ ආර්ථික ප්‍රශ්න තේරුම් ගත්තු එකම එක්කෙනා මනෝරමා විතරයි. එයා පුදුම මාන්සියක් ගත්ත මට රැකියාවක් අල්ලා දෙන්න.

අද දවසත් පුදුමයි. ටෙලි නාට්‍යයක වැඩ ඉවර වෙලා මම පාරේ එමින් හිටියා. ත්‍රී වීලරයක් ඇවිත් මගේ ළඟම නතර කළාම මම තිගැස්සුණා. බැලින්නම් ඒ මනෝ.

"නගින්න" මූණ එළියට දාගෙන ඈ කිව්වාම මට පුදුමයි. මාත් නැග්ගා. මගේ කරේ එල්ලෙන පුංචි බෑග් එක දිහා මනෝ බැලුවෙ දුකෙන්. මනෝට තියෙන්නෙ අම්ම කෙනෙකුගෙ ඇස්. එයා කවදහරි කාට හරි මාතෘ භාර්යක් වේවි කියලා මට හිතුණා. සමහරක් ගෑනු අයට විතරයි මේ බැල්ම තියෙන්නෙ. ගැහියෙක් පිරිමියෙක් දිහා බලන බැල්ම කියවන්නත් ලේසි නෑ. ත්‍රී වීලරේ අපිව හලලා ගියේවිහාර මහා දේවි උද්‍යානයේ. ඉරත් බැහැගෙන යමින් තිබුණා. අපිට කතා කරන්නත් ගොඩාක් දේවල් තිබුණා.

පුදුම දෙයක් සිද්ධ වුණේ. පාර දිගේ ඇවිදගෙන යද්දී මනෝ මගේ දකුණු අත එයාගෙ වමතින් අල්ලා ගත්තා. මම ඒ අත තදින්ම අල්ලා ගත්තා. ඇගේ අතේ මුද්ද දක්ක නොමෙයි

දෑනුන! මට එවෙලේ මම පුදුමයෙන් ඇගේ ඇඟිල්ල එසෙව්වා
මුද්දත් එක්කම!

''මනෝ........ ඔයා කසාද බැඳලා ?''

මම එහෙම ඇහුවෙ නෑ ගහලා හරියට අදෝනාවක් වගේ. මට හොඳට මතකයි එයාගෙ මූණට ආවෙ පුදුම පරාජිත ස්වරූපයක්. එයා පසුතැවිල්ලෙන් මුද්ද දිහා බැලුවෙ........

''මේ මට අද ගලවන්න අමතක වුණා........'' එච්චරයි ඇය කිව්වෙ. ඇති වුයේ නෑ මට තරහක් ඈ ගැන. මොකද අපි අතරෙ එහෙම ගනුදෙනුවක් නෙමෙයි ගිවිසුමක් තිබුණේ නැහැනෙ. හිත හදාගන්න පුළුවන් කාරණාවක් අවශ්‍ය නිසා. ඒ අදහස එළියට පැන්නෙ හරියට කෙහෙල් කැන් වැට පනිනවා වගේ.

''ඔයා ඇයි මට කිව්වෙ නැත්තෙ ඔයා බැඳපු කෙනෙක් බව........''

''ඇයි ඔයා මගෙන් එහෙම ඇහුවෙ නැත්තෙ....?''

ඒ ප්‍රශ්න දෙකම බොළඳ ඒවා. ඒක නිසා අපිට එහෙම හිතුනේ නැතුවා වෙන්න පුළුවන්.

ඒත් තිගැස්මක් මගේ හිතේ ඉතිරි වුණා. මනෝ මගේ කායික පහසට ලොල් බව ප්‍රදර්ශනය කරමින් සිටිය නිසයි.

මේ ලෝකයේ ඉන්න සදාචාර සම්පන්න ශිෂ්ටම ගැහැනිය මනෝරමා නාගසේන කියලා මම කොහේවත් පොතක ලියාගෙන තිබුණේ නැනෙ ඉතිං මට මොකෝ.

''ඇයි ඔයාට අප්සෙට්ද ?''

''මොකකටද ?''

''මගේ මුද්දට........ !''

''හෑ හා........ හා........ !

මම ඇහිවෙන්න හිනාවුණා. බඩ පිටේ ඇලෙනකම් හිනාවුණා. අවට මල් ගස්වල මල්, තුරු අගිසිවල එල්ලිගෙන බලා හිටියා. හරියට මහ සද්දෙන් බිමට වැටෙන්න බලාපොරොත්තු වෙලා වගේ. අහසේ ඉතිරි වෙලා තිබුණු එකම එක තරු කැටයත් හිටියෙ උදේ පායන ඉර ගැන කිසිම බලාපොරොත්තුවක් නැතිව වගේ........

එක අතකට මොන පුස්සක්ද ජීවිතේ කියන්නෙ........ මොන ප්‍රශ්නයක්ද මගෙන් ඇහුවෙ........ ?



''මට අපහාස කරන්න එපා ! මනෝ........ ''

මම කිව්වෙ තරහින්........ දවසක් හරි ඇගේ දෙතොල්වල පහස ගැන පුදුමාකාර තේන්තියෙන්........

''මේ මොන කෙහෙල් මලක්ද මං යනවා යන්න........ !

මනෝ නැගිට්ටෙ පුදුම තේන්තියෙන්. නැගිට්ට පාරට වාඩිවෙලා හිටපු ගල් බංකුව දෙදරුවා වගේ, පොළොව දෙදරවාගෙන යන ගිරි දේවි වගේ ඈ යන්න ගියා.

*සශික් උදාකර - දිනපොත*
*දිනය 1980 පෙබ. 24*

අද මට හුගාක් දේවල් හිතන්න තියෙන දවසක්. හිතන්න තියෙන්නෙ මොනවා ගැනද කියලත් මට හිතාගන්න බැහැ. අම්මලා යෝජනා කරපු කෙනා එක්ක නෙමෙයි මට විවාහ වෙන්න වුණේ. ටිකක් හරි කැමැත්තක් තියෙන කෙනෙක් එක්ක.

මගේ හිතේ කැමැත්ත තියන එක පුදුමයි........ සශික් දැක්ක දා ඉඳන්ම මගේ හිත එයා ගැන පැහැදුණා. කතාකරන වාරයක් පාසා මම එයාට ළං වුණා. එයා වෙනුවෙන් මගේ හිතේ කොණක ලස්සනම ලස්සන සිරියහන් ගබඩාවක් ඉදිවුණා. එයාවත් දන්නෙ නැතිව ඇති අපි අදහස් වචන හුවමාරු කරගත්තේ බොහෝම ලෙන්ගතුකමින්. මගේ දෑනුමින් එයාගේ දෑනුම පෝසත් වෙද්දි එයාගේ දෑනුම මගේ දෑනුමින් ඔපවත් වුණා.

'පුදුමාකාර ඩබලක් උඹලා දෙන්නා' මගේ යාලුවො එහෙම කියලා මට හිනාවුණා. ඒත් මොන එකක්ද මන්දා කවදාවත් සශික්ට හිතන්න බැරිවුණා මම එයාගෙ කියලා.

මේක මට ප්‍රශ්නයක් වුණා. ඉවසන්නම බැරි ප්‍රශ්නයක් වෙද්දි මගේ හොඳම යාළුවා තනුජා කිව්වෙ මිනිහගෙ හිත ඇතුලෙ වෙන කවුරු හරි ඇති. උඹ ඒක සහසුද්දෙන්ම දැනගනිං කියලා.

ඇත්තටම මට මොඳක වුණේ. ඒ සත්‍ය දැනගන්න මම බය වුණා. ඒ නිසා මම කවදාවත්ම සශික්ගෙන් ඇහුවෙ නෑ මට ආදරේද කියලා. අහලා එයා මට නෑ කිව්වොත් මගේ ලෝකේ

කඩා වැටෙවි නේද කියලා හිතනකොට මට බය හිතුණා. ලද පමණින් සැනසිලා ඉන්න එක වඩාත් හොඳයි කියලා මම තීරණය කළේ ඊට පස්සෙයි. විශ්ව විද්‍යාලෙදීත් කවුරු හරි මාත් එක්ක යාලුවෙන්න එනකොට මට ඒක මඟ ඇරගන්න පුළුවන් වුණේ සශික් ගැන හිතලා. ඉඳහිටලා සශික්ව කැම්පස් එකටත් ගෙන්න ගත්තේ ඒ ගැලවිල්ලට.

බලන්න දන්නෙම නැතිව කාලය ගතවෙලා ගිය හැටි. ඔව්........ අපටත් හොරා කාලය ගලාගෙන ගිහිල්ලා අපි දන්නෙම නැතිව ගිම්හාන්ව බඳින්න මම කැමති වුණෙත් එයාව බැන්දෙත් හරියට හීනෙකින් වගේ. ගිම්හාන් හොඳ වැදගත් පවුලක කෙනෙක්. හොඳට සල්ලිය බාගෙ තියෙන මහා ධනවත් තැනකින් ආපු යෝජනාවට අම්මලා උඩින්ම කැමති වුණා.

මට හිතාගන්න බැරි වුණා කැමති වෙන්නද අකැමැති වෙන්නද කියලා. හිතාගන්න බැරි වෙලාවක හිතාගන්න බැරි දෙයක් අතට වැටිච්ච පුංචි ළමයෙක් වගේ මම අන්දමන්ද වුණා.

මගේ යෙහෙළියො රොත්ත පුදුම වුණා. මේ තරම් සල්ලි බරත් මට කැමති වුණේ අහවල් දේකටද කියලා.

“ගෑනිගෙ පින කුණු මුල්ලෙ කියලා ඉස්සර පඬිවරු කියලා තියෙන්නෙ කට කහනවට නොවෙනෙ බං........ ”

“අපොයි කතා කරන්න එපා ඉස්සර පඬිවරු ගැන නම් කට කහනවට නෙමෙයි අත කහනවට හොලියා බැරිව වගේ ගෑනුන්ගෙ නැති වරදක් ඇති කරල තියෙන්නෙ. ඔය ඉසිවර පණ්ඩිතයොම තමා........ ”මං කිව්වම කෙල්ලන්ගෙ කටවල් වැහුණ. ”උඹ ඔය භාවය මඟුල් ඔක්කොම නතර කරලා පොත් ලියන්න පටන් ගනින්. මං හිතන්නෙ ඒක තමා උඹට හරි යනම මාධ්‍යය නැද්ද ?”

ඇයි කාව්‍ය කලාට මට ලේඛන කලාවත් හිතුවොත් කරගෙන යනැකි. අපි වගේ නොමේ අනන්ත දුක් විඳින ලේඛිකාවො ජීවිතේ අනන්තවත් ජය අරගෙන තියෙනවා. ගැහැනියෝ විදියට දුක් විඳ විඳ ආර්ථික අශේනි මැද්දෙ ඉදිරියට ආපු කමලා දාස් ගැන උඹලා දන්නෙ නැතෙ.



හැමෝම කටවල් ඇරගෙන බලා හිටියෙ මට ටිකක් කතා කරන්න ඉඩ දෙන්න ඕනෑ කියලා කතාවෙලා වගේ. “ඈ අල්ලපු රටේ ලේඛිකාවක්. දවල් තිස්සේ රෑ තිස්සෙ ගෙදර ළමයින්ටයි මනුස්සයටයි කන්න උයලා පිහලා ඉවර වෙලා ඒ මේසෙ අස්කරගෙන ඈ වාඩි වුණේ පෑනුයි කොලයි අරගෙන ලියන්න! දුගී දුප්පත් කමේ හැටි බලපං. ලියන්න කියල වෙනම තැනක් පුටු මේස නෑ. කමලා දාස්ලා වගේ දිරිය කාන්තාවෝ තමයි වටින්නෙ. ඉන්දියානු සාහිත්‍යය ඇතුළේ මහා පෙරළියක් ඇති කරපු කාන්තාව කමලා දාස්ගෙ ඇතුල් ජීවිතේ එකම දුකක්...”

“මූන්ට උඹත් කමලා දාස් කෙනෙක් වෙයංකෝ. අපිටත් ඔය හොඳ හොඳ දේවල් ටිකක් කියවන්න පුළුවන් වෙයි.

බැහැ බං මං කොහොමද කමලා දාස් කෙනෙක් වෙන්නෙ? මට තියෙන එකම දුක ඒකයි. මට ලැබිල ඉන්නෙ පීනන්න තරම් සල්ලි තටාකයක් තියෙන ස්වාමි පුරුෂයෙක්. මට ඕනෑ තරම් සල්ලි. සැප පහසුකම් අතට පයට වැඩකාරයො. ඒ මදිවට නිදහස.

“මාර නිදහසක් බං මට තියෙන්නෙ.” මං එහෙම කිව්වම මගේ යාලුවන්ගෙ ඇස් උඩ යනවා. උන්ට ඉරිසියාත් ඇති. කාටද මොන ගෑනිටද ඉරිසියා නැත්තෙ.

ගිම්හාන් කඩවසම්. හොඳ රස්සාවක් තියෙනවා. ලොකු බූදලේකුත් එක්කම. වාහන, දැසිදස්සො, යාලු මිත්‍රයෝ, නෑදෑයෝ. ඕනතරම්. ඒත් එයා හරි අමුතුයි. මං ආස කරන කලාකාරයෙකුගෙ ඕනැම කලා උත්සවෙකට යන්න මට එයාගෙ අවසරය තියෙනවා. කා එක්කද ගියේ........කොහොමද කවුද එහෙදි හම්බ වුනෙ. ඒ වගෙ කතා එයාගෙ ශබ්ද කෝෂයේ නෑ. කොතැනකට හරි යන තැනකට ගිහින් ජාමෙ බේරගෙන ගෙදර එන බවට ස්ථිර විශ්වාසය එයාගෙ හිතේ තියෙනවා.

එක වෙලාවක මේක මට ඉසරදයක්. ඇයි එයාට මාව ටිකක් සැක කරන්න බැරි. එයාගෙ හිතල ඇල්මැරිච්ච ආදරේ මට එපාවුණා වැඩිදවසක් නොගිහින්ම. මඟුල් මුද්ද ගලවල තියලා ලාච්චුවට දාලා මම ගියා සශීක්ව මුණ ගැහෙන්න.

සශීක්........ පුදුම පිරිමියෙක්....... එයා සැක කරන්න දන්නවා. බැල්මකින් හරි පළි ගන්න දන්නවා. ඊළඟට රණ්ඩු

වෙන්න දන්නවා. කෑ නොගහා මුළු ලෝකෙටම ඇහෙන්න ගොරනාඩු කරන්න දන්නවා, ඒකට ගිම්හාන්.......!

ගිම්හාන් කියන්නේ ගහක් ගලක්....... මට එයාට අඟවන්න ඕන වුණා මම කැමති තවත් කෙනෙක් ඉන්නවා කියලත්........ ඒකමයි මම සගීක්ව යොදා ගත්තෙ. ඒත් ගිම්හාන් මාව කවදාවත් අවිශ්වාස කළේ නෑ. මං ආස කරන ගායකයෙක්, නළුවෙක්, ක්‍රිකටර් කෙනෙක් ගැන මම මැරෙන්න හැදුවත් එයා නෙමේ සසල වුණේ. මටත් සිංදුවක් කරන්න ඕන කිව්වම ඒකටත් ඒකග වුණා. ඒ නිසාම තමයි මට සගීක්ව අතාරින්න ඕන නොවුණේ. මම හුඟාක් වෙලාවට මගේ මානසික ආශාවල් පිරිමහගන්නා. කවුරුහරි කිව්වොත් මගේ ජීවිතේ අසම්පූර්ණයි කියලා, මම නම් ඒක කියටවත් පිළිගන්නෙ නෑ.

මම අද ආයෙත් සගීක්ට කතා කරලා මූණ ගැහෙන්න යොදාගත්තා. ඒකයි මම සගීක්ට ආදරේ......."

*මනෝරමා නාගසේන - දිනපොත*

*දිනය: 1980 මාර්තු 10*

මට අද හරිම දුකම දුක දවසක්. පුදුමාකාර දුකකින් මුළු හිතම හිරිවැටිලා. ආදරය ගැන මම හදාගෙන හිටපු මනෝ ලෝකෙ මොනතරම් මායාවක්ද කියල හිතෙන වාරයක් පාසා මගේ ඔලුව හිරි වැටෙනවා. අවුරුදු පහක් තිස්සෙ අම්මලා තාත්තලාට බොරු කිය කියා මූණ ගැහී ගැහී කරපු ආදරේ මේ විදියට පුස්සක් විදියට බිඳිල යයි කියල මම කවදාවත් හිතුවද? මම හිතුවෙ සුරංගනා කතාවක වගේ සගීක් රාජ කුමාරයෙක් වෙලා අස්සයා පිටේ නැගිල පරිවාර සේනාවත් එක්ක එයි කියල. ඔක්කොම පවුරු කඩා බිඳ දමලා එයා ඇතුල් වෙනවා අපේ රාජධානියට. ඉස්සරහට එන ඕනෑම හතුරෙක්ව පෙති ගහන්න තරම් මහා ආවේගයක උණුසුම එයාගෙ ඇස්වලින් පිටවෙනවා. හරියට පළිඟු වගේ. ඒ පළිඟු කැටේ අතරින් මට එයාගෙ හදවත පේනවා. අනේ මටම විතරයි ඒ හදවත පේන්නෙ. වෙන කවුරුහරි ඒ හදවත දකින්න ආවොත් ඒ ඇස් අන්ධ වෙයි. එච්චරට මගේ ආදරේ එයාට බලවත්. ඉතින් සගීක් එහෙම ඇවිල්ල කෙලින්ම



අපේ තාත්තාව හම්බ වෙනවා. ඒ හීනෙ මැකිලා යද්දි ආයෙ මට නව හීනයක් පෙනුණා.

ඒ පාර සගීක් එන්නෙ අහසින්.......! අහස් වීරයෙක් වගේ පියාඹන්න නමුත් එයාට තියෙනවා අනේ ඒ අත්තටු ආදරයේ අත්තටු. ඒවා වෙන කවුරුවත් නෙමේ මම වියලා දුන්නු ආදරයේ අත්තටු. වෙන කවුරු හරි වියන්න ආවා නම් සගීක්ට ඒ අත්තටු ....... ඔව් එයාගෙ අත් කොර වෙව්.......! පව් නෑ එහෙම කිව්වට. එච්චරටම දැඩි ආදරයකින් බලවත් ආදරයකින් මගේ අත්වලින් එයාට අත්තටු වියලා දෙන්නෙ ඒකයි.

ඉතින් සගීක් කෙලින්ම එන්නෙ අපේ සඳලුතලේට. අපෝ එයාගෙ ලස්සන, ප්‍රාණවත් ගතිය. ඒත් මං බයයි එයා දිහා බලන්නවත්. මම කියනවා ඔයා කෙලින්ම තාත්තා ළඟට යන්න. අම්මා ළඟට යන්න. ගිහිල්ලා කතා කරලා එන්න. මං නොකියා කිව්වෙ ඒ දේ ඒත් සගීක් අම්මා ළඟටවත් තාත්තා ළඟටවත් නොගිහිල්ලා සරුංගලයක් වගේ උඩ පාවෙවී ඉඳලා යන්න ගියා. ඈතින් ඈතට එයා නොපෙනී යන හැටි මම උඩුමහලේ මගේ කවුළුව ළඟ ඉඳන් බලා හිටියා. එතැන ඉඳන් තමා මම ඉර දිහා බලන්නෙ........ හඳ බලන්නෙ........ ඒ වගේම තරු ගණින්නෙ.......හිතින් දේදුනු අඳින්නෙ. සගීත් මගේ ඇස් මානෙන් නොපෙනී ගියා. ඉර හඳ තරු බැහැලා ගියත් ආයෙ කොයි වෙලාවක හරි දකින්න ලැබෙනවා. අහස ඒ තරමටම විශ්වාසයි. ඒත් මිනිස්සු විශ්වාස කරන්න බැරි විත්තිය මට ඔප්පු කරලා පෙන්නුවෙ සගීක්.

ඇත්තටම මම සගීක්ට කොච්චර ආදරේ කළාද ? මානසිකව වගේම භෞතිකවත්........ එකම දෙයක් විතරයි මම එයාට පූජා කළේ නැත්තේ.......

මගේ ඇස්වලින් කඳුළු ගලනවා........ දිනපොතත් තෙමිලා බත්කරවන්න තරම් කඳුළු. ඒත් මම ඒ .......කඳුළු ලෝකෙට පෙන්නන්නෙ නෑ. සගීක්ට බැරිවුණේ ඇයි පිරිමියෙක් විදියට ඉදිරියට ඇවිත් අපේ ආදරය දිනාගන්න සටනේදි ක්‍රියාත්මක වෙන්න.

එයා වැල්ලෙ මූණ හංගාගත්ත කැස්බෑවෙක්.

මට ජාති ජාතින් එයා අමතක වෙන්නෙ නෑ. එයා මට කළ

මෙ අපරාදෙට එයාට පව් සිද්ධ වෙන එක වලක්වන්න බෑ...... කවදා හරි එයාට ඒක පලදෙනවා.

පසිඳුට මම කැමති වුණේ මාව කාට හරි කසාද බැඳලා දීමේ චේතනාවේ හිටිය අම්මලාව සනසන්න.. එයාලට උනත් සැනසිල්ලක් කියල දෙයක් තියෙන්න එපායැ. තමුන්ගෙ එකම දරුවා විවාහයක් කරවලා එකලාසයක් කරවන එක එයාලගෙ ලස්සන හීනයක්. ලස්සනට....... හුඟාක්ම ලස්සනට පිළියෙල කෙරිච්ච මංගල උත්සවේක මනමාලි මම........ මහට........ මට මහට !

නිමනා සමෝදනා - දීන පොත
දිනය: 1980 මාර්තු 10

එන්න එන්නම පුදුම ඉක්මණකින් කාලය ගෙවිලා යනවා කියලයි මට හැමදාමත් හිතෙන්නේ. ඒක හරියට තත්පර එකතු වෙලා ගුලි ගැහිලා පොකුරු පිටින් විනාඩි බුරුතු පිටින් පැය කටු කරකවාගෙන කරකවාගෙන යනවා වගේ. මේ දුන් නැගෙන ඉර ඩොක් ගාලා මූදට පැනලා ආයෙත් උදේ පාන්දර ඉස්පාසුවක් නැතිව අහසට පනිනවා වගේ. මෙච්චර කාලයක් තිබ්බ කාලයේ 'ස්ලෝ මෝෂන්' එක, එක තත්පරෙන් අධිවේගවත් වෙලා වගේ. කොහැන ඉඳන්ද මට ඒ අදහස ආවේ. කොහැනද ඒ නැරවුම් ලක්ෂණය කියලා මම කල්පනා කරනවා.

බෝධිය ළඟ මල් වට්ටි ටික ලස්සනට අඩුක් කරමින් ඉන්න තැනට ධර්මෙ ආවෙ සුදු පාට ලස්සන ඇඳුම් කට්ටලයකින් සැරසිලා. පෝය නිසා හඳ අහසෙ මුදුනෙ බැබලෙනවා. පන්සලේ සෙනගත් ඕනෑ තරම්. ගෙදර අයගෙන් මිදිලා හෙමින් සැරේ බෝධිය ළඟට ආවෙ වාපා එක්ක. වාපාටත් අලුත් ගුරුපත්වීමක් ලැබිලා. ඒ උද්දාමයෙන් හිටියෙ. මට ලැබිච්ච ගුරු පත්වීම ගැනත් මට සතුටුයි. දහම් පාසලේ නොමිලේ උගන්නාපු පින පල දුන්නා කියලයි මට හිතුණේ. ඒත් ධර්මෙගෙ මූණ නම් අමුතු වෙලා තිබුණ බවයි පෙනුණෙ.

"හිය ඉරිදා ආවෙ නැත්තෙ අසනීප වෙලා වෙන්න ඇති."



එහෙම කියාගෙන වාපා හෙමිහිට මාරු වුණා.

ධර්මෙගෙන් සද්දයක් නාපු නිසා මම ඔලුව උස්සලා බැලුවා එයා දිහා. හඳ එළිය කැරැල්ලක් වැටිලා එයාගෙ නළලෙ කෙස්කැරැල්ල රන්වන් පාටින් දිලිසුණා. මම කවදාවත්ම පිරිමියෙකුගෙ ලස්සනක් ඒ විදියට දැකලා තිබුණේ නෑ. ඊත්කොටම වඩා එයාගෙ ඇස්වල නැවරිච්ච මලානික රෝස පාට....... අම්මෝ ඒ පාට මට හැඟීම් දන්නා වගේ දැනුණේ.

"ඇයි ධර්මෙ....... අසනීපෙන්ද ?"

මම ඇහුවෙ මගේ කටහඬ හුඟාක්ම සියුම් කරමින්. මගේම කන්වලට මගේ කටහඬ ඇහුණේ අමුතුම ලෝකෙකින් එන හඬක් වගේ.

"මාව බණ්ඩාරවෙලට මාරුකරලා.......!"

මට එක පාරටම දැනුනෙ මුළු පන්සලම මුළු දහම් පාසලම බෝගහ වටේ කැරකෙනවා වගේ. බෝ කොළ විලි විලි හඬ නගා හඬන්න පටන් ගත්තා. සට සට ගාලා පිනි කැට වැටුණා. පිනි කැට දෙකක් මගෙ ඇස් පියන් උඩට පැන්නා. ඇත්තටම මට ජීවිතේ දැනෙන්න පටන් ගත්තේ ඊට පස්සෙයි. ධර්මෙගෙන් මම ඉගෙන ගත්තු ධර්ම කතා.......? ඒවා එකක්වත් මීට පස්සෙ ඇහෙන්නෙ නෑ. ඊළඟට අම්මලා මට හොයන මනමාලයො ගැන මතක් වුණා. දෙවියනේ මම කොහොම, මොකක් කියලා බේරිලා ඉන්නද ? ඔයා යන්න එපා ධර්මෙ. ඇත්තටම මට කියන්න ඕන වුණා. එතකොටම වාපා ඇවිත් කිව්වේ ලොකු හාමුදුරුවො ධර්මෙට කතාකරන බවක්.

ධර්මෙ එක් වරක් මා දිහා බලලා හැරිලා ගියා ආවාසයේ දිහාට. මට දුකයි. අයෙ මට දහම් පැසල් එන්න බෑ කියලා නිකමට නෙවේ ඇත්තටම හිතුණා.

මට හරිම දුක දවසක් අද. ඒ වගේම හරිම සතුටු දවසක් ! දෙවියනේ මමත් හැඟීම් දැනීම් තියෙන කෙල්ලෙක්. මගේ සමහර යෙහෙළියො මට විහිළු කර කර හිටියෙ මම හරි අස්වාභාවික කෙනෙක් කියලා (මාව තේන්ති ගස්සන්න ඊට වැඩි දෙයක් නෑ.) මම අස්වාභාවික කෙනෙක් නෙවෙයි කියලා දෙවියනේ මගේම හීන මට ඔප්පු කළා.

ධර්මෙ ඔයා යන්න. ඒත් මගේ හිතේ මුල්ම ආදරයක් ඇති

වුණේ ඔයා ගැන විතරමයි. ඊට පස්සෙ වෙන්න ඕන දේ ගැන මම දන්නේ නැහැ ධර්මෙ. මම අද ඇස් පියාගත්තා ඔයා ගැනම හිතාගෙන.

සඳුා මුතුමාල - දිනපොත
දිනය: 1980 මාර්තු 10

'උදාන්ත දිවාකර' කියන මගේ 'නාට්‍ය නම' පුදුම විදිහට නැගලා යනවා. ඒ අතරේ මනෝරමා මට එන්න කියා එවපු පණිවුඩය මට ටිකක් විතර හිතන්න කාරණා සැලැස්සුවා. එයාගෙ මුද්ද...... ඔව් අර වගන්තරා මුද්ද මගේ ඇඟිලි වල ගැව්ච වෙලාවෙ ඇතිවෙච්ච ගැහීම මහා අමුතු එකක්.

මේ ලෝකෙ මනුස්සයෙකුට ඒක විස්තර කරන්න පුළුවන්ද මන්දා. එක පිරිමියෙකුට ආදරේ කරන්න පුළුවන් එක ගැහැනියකට විතරයි කියලා නියම කළේ කවුද ? එක ගැහැනියකට ආදරේ කරන්න පුළුවන් එකම පිරිමියෙකුට විතරයි කියලා තීරණේ කළේ කවුද ? මම නිම්නාට ආදරේ කරන ගමන් මනෝරමාත් ආස්සරේ කළා. මනෝ ගේ අදහස්වලට මගේ අදහස්වල ගැලපීම උඩ අපි අතරේ තිබුණ මහාම ආකර්ශනයක්. ඒකෙ හැටි දෙයියොත් දන්නෙ නෑ.

කොහොම හරි මනෝරමා හමබ් වෙන්න මම ගියෙ හිතේ ටිකක් චකිතයෙන්. ඒක හැම පිරිමියෙකුටම උරුම පිරිමි චකිතකම. හරිම හිතා...... ඉස්සෙල්ලම ගල් බංකුව උඩ එයා ඉන්නව දකල මම මාර ගහට මුවා වෙලා නැවතුණා. ඊළඟට එයා හැරිලා බැලුවා! මූණට මූණ හමුවෙච්ච බළල්ලු දෙන්නෙක් වගේ අපි එකිනෙකා දිහා බලාගෙනම හිටියා.

එක පාරටම එයා ගල්බංකුවෙන් නැගිට්ටා. මම ගස් මුවාවෙන් මෑත් වුණා. එයා අඩියක් ඉස්සරහට තිබ්බා. මමත් අඩියක් විතර ඉස්සරහට තිබ්බා. ඇට කම්මුල් පාරක් ගහන්න තරම් කේන්තියක් මට ආවා. මම ඒ කේන්තිය ඇස්වලට ගත්තා. මගේ ඇස් ක්‍රෝධයෙන් දිළිසෙන්න ඇති. ඒ දිළිසිල්ලට එයා දාලා අඑවෙලා යාවි කියලා මටම හිතුණේ මගේ දෙකොල් පොටවල් වෙව්ලන්න ගත්තාම.

ඒත් දෙවියනේ මොකක්ද වුණේ. මනෝරමා නාගසේන



හැපින්නක් වගේ ඉස්සරහට පැනලා සජිත් දිවාකරව බදාගත්තා. සිට්කිට්යේ වෙලාගත්ත. ඒ වෙලිල්ලට මම අන්දමන්ද වුණා.

පත්තරවලින් ඇවිත් අපිට කැමරා මානාගෙන ඉන්නවා වගේ මටයි දැනුනේ. ඒත් මනෝට ගානක්ම නෑ. ඈ මගේ ආලිංගනයේ හිරවෙලා හිටියේ. හරියට...... හරියට......කෝ මට උපමාවක් එන්නේ නෑ. වැස්සක් වැටෙනකොට සතුටින් ඉපිලිලා ගිය කාන්තාරයක් වගේ ඈ වාවගන්න බැරි සතුටක් වින්ද.

සොඳුරු වැස්සට දුවෙන කතරක් ආදරෙයි පණ මෙන්......
විදුලි පන්දම් දෙකක් වගේ අපේ ඇස්. මගේ හදවතේ හැම අඳුරු හෙවනැල්ලකටම වැටුණා....... මං බය වුණා. මගේ හිත ඇතුළෙ කාමත් ගුලිවෙලා ඉන්න නිම්නාව ඇයට පෙනේවිද කියලා.

"සජිත්"

අන්තිමේදී ඈ මාව අතෑරලා ගල් බංකුව උඩ වාඩිවුණා. මම හිතුවෙ නෑ අනුරාගයේදී ගැහැනියක් මේ තරම් සෘණිකයි කියලා. නිම්නාගේ විරුද්ධ පැත්ත මනෝ....... ඒකත් යසයි.

'ඔයා කවදාවත් මාව අතෑරලා යන්න එපා සජි. ඔයාට පව් සිද්ධ වෙවි ! ඇගේ දෑස් වලින් ඈ මගේ වෙලා හිටියා. ස්ව කැමැත්තෙන්ම.......? නෙමේ ඒක පාර්ශ්වික කැමැත්තෙන්ම. මට තේරෙන්නෙ නෑ මට ඕන වුණේ නිම්නාගෙන් හිස්වෙච්ච මගේ හදවතේ හිස් තැන අනුරගන්න විතරක්ද මන්දා. මගේ කාලෙ මරා ගන්න මට ඕන වුණාද මන්ද. කාලෙ ගතකරගන්න විදියක් මට නැති වෙයි කියලා මට හිතුණේ නිම්නාගෙ ආශ්‍රය නතර කරපු දවසට. මම නිකම් මම මළා වගේ හිතුණේ ඇත්තටම ඒක මනක් වුණාමයි.

ඒත් මනෝගේ අනුරාගී ප්‍රේමය මාව ජීවිතේට අරගෙන ආවා. නාට්‍ය ජීවිතෙන් මම ලබන තෘප්තිය ඒ ඔක්කොටම වඩා මට වටිනවා කියලා මට හිතුණා. මට නාට්‍ය ජීවිතේ දුන්නෙත් මනෝමයිනේ....... අම්මගෙයි තාත්තගෙයි අයියගෙයි ජීවිතවලින් මට එල්ල වුණු කරදර කරච්චල් දරාගෙන කාගෙන මට ඉදිරියට යන්න පන්නරයක් ලැබුවා. මේ ජීවිතේට මම ආදරෙයි. මට හිතෙනවා.

සජිත් උදාකර - දිනපොත
දිනය: 1980 මාර්තු 12

මානසික ලෝකයක විතරක් ජීවත් වෙන්න අමාරුයි කියලා මට දැන් ටික ටික තේරිගෙන එනවා. ධර්මේ ගියා ගියාමයි. අදට සුමාන තුනක් වෙනවා. තාම නෑ ඉන්න තැනකින් ලියුමක්වත්. එච්චරටමත් මාව මතක් වෙන්නෙ නැතිව ඇති ඒකයි.

අම්මලා විවිධාකාර විදියේ මංගල යෝජනාවල් ගේනවා මට. ඒ වෙලාවල කියන්න උත්තරයක් නැති වෙලයි ඉන්නෙත්. උන්හිටි ගමන් ධර්මේට මොකද වුණේ. බණ්ඩාරවෙලට ගියාට පස්සෙ එයාට කවුරු හරි කෙනෙක් හම්බ වුණාද කියලා කවුද දන්නේ. අඩුම ගානෙ ඔච්චර ටෙලිෆෝන් කණු තියෙනවා. එක කෝල් එකක් දෙන්න බැරිද ? ඉස්කෝලෙට හරි....... ධර්මෙ ගියාට ධර්මෙ කියූ බොහෝ දේවල් මගේ හිත ඇතුලෙ තැන්පත් වෙලා. ඒවා අපතේ නොයවා මගේ හිතේම පොදිගහපු හැටි, කාටහරි පුළුවන්ද කාගෙවත් හිතක ඒවගේ අඩුක්කිරිල්ලක් කරන්න. හරියට බඩු අරගෙන වගේ. නැත්නම් කුලියට අරගෙන වගේ. කාගෙවත් හිතක තමුන්ගෙ අදහස් තැන්පත් කිරීමද ආදරේ කියන්නේ...... ආදරේ ගැන මට අර්ථකථන දෙන්න තේරෙන්නේ නැහැ. මගේ යාලු කෙල්ලො නම් එක එක විදියෙ අර්ථකථන දෙනවා. ඒ එකක්වත් මට අල්ලන්නේ නෑ. මගේ ආදර නාට්‍ය වෙනස්. උන් කියනවා.

'පුදනකොටම කාපි යකා කිව්වා වගේ' මදෑ මගේ හිත.. පුංචි පුංචි ගොයම් පැල මතුවෙච් ආපු පුංචි කෙතක් වගේ. මම දෙයියනේ ඒ කෙත සරු කරන්න දිය වේලි කැපුවා. මාන්සි නොබලා පස් පෙරලලා පස් පෙරලලා හදපු කෙත. කරල් බර වුණාම ඒවා කන්න එන ගිරවු එලවන්න දෙයියනේ මම පඹයෙකුත් හැදුවා. හරියට නූපන් දරුවන්ට කේන්දර හදනවා වගේ වැඩක්ද මම කළේ.

මොකද උගේ මූණ එහෙම පිටින්ම කලු වෙලා. අසනීපයක්වත්ද? මගේ ස්ටාෆ් එකේ යාලුවො ඇහුවාම මටම දුකයි මං ගැන. ඒ අතරේ අම්මලා කවුදෝ කෙනෙක් ගැන නිතර කතා වෙනවා මට ඇහෙනවා. උදාකර කියලා කට්ටියක් ගැන කතා වුණා. කවුද ඒ උදාකරලා. අමුතු නමක්.

ධර්මේ මොන ලෝකෙක හරි ඉඳලා ඇවිත් මාව ඒ



ලෝකෙට එක්ක යනවා නම් මට බෝධිය ළඟ ඉන්නවා වගේ සැනසිල්ලෙන් ඉන්න පුළුවන් වෙයි. දෙයියනේ.......!

සහදා මුතුමාල - දිනපොත
දිනය: *1980* මාර්තු *13*

වැඩ ගොඩ ගැහිලා එන්න එන්නම කැම්පස් එකේ වැඩ ගොඩ ගැහෙනවා. ඒ අතරේ ස්ටාෆ් ප්‍රශ්න. එක සේවකයෙක්වත් විශ්වාස කරන්න බැහැ. කියලා තාත්තා කියූ කතාව නම් කෝටියක් වටිනවා. ඇත්තටම කිසිම කෙනෙක් ආයතනයට ආදරයක් ඇති කෙනෙක් නැහැ. තම තමන්ගෙ ලාබ ප්‍රයෝජනේට තමා රස්සාව කරන්නෙ. අතට අහුවෙච්ච තැන කියක් හරි ගසා කන්න තමා බලන්නේ. බොරුවට පෙන්නන්නේ අපේ ආයතනයට පුදුම ආදරයක් තියෙනවා වගේ. මට මේක නම් හුගාක්ම තේරිලා තියෙන දෙයක්. මැනේජ්මන්ට් එකේ ඉන්නා අයගෙ විවිධාකාර කුමන්ත්‍රණ තියෙනවා. ලොකුම ලොක්කන්ගෙ කනෙන් රිංගලා යන්න පොඩි ලොක්කො දන්නවා.

මේවා ගැන කිව්වට තාත්තට තේරුමක් නෑ. එයා අහන්නේ අවුරුදු හතළිහක් තිස්සේ එහෙමනම් මේක කොහොමද කරගෙන ගියේ කියලා. වෙලාවකට දමලා ගහලා යන්නත් හිතෙනවා. මෝඩ මුදලාලිලා අහුවුණාම ගණන් කාරයො තමන් දන්න ගණන් ඔක්කොම දාලා ස්ටේට්මන්ට් හදලා ගොනාට අන්දවනවා. තාත්තා ඒවා තේරුණත් නොතේරුනා වගේ ඉන්නවාදත් කියලා හිතෙනවා. තාත්තලත් ලොකු ලොක්කෝ ලක්ෂ ගණන් පිල්ලි ගහන ඒවා ගැන ඇහැක් ඇරලා බලන්නේ නෑ. දුප්පත් ඩ්‍රයිවර් කෙනෙක් රුපියල් පන්සියයකට විතර තෙල් වංචාවක් කළොත් චක් ගාලා කර මුලින් අල්ලලා අයින්කරලත් දානවා.

මට මේවා ඔක්කොම එපා වෙලා තියෙන්නේ. මගේ මංගල්ලෙ දා ආපු ලංකාවෙ ව්‍යාපාරික ප්‍රභූව දක්කම මට තාත්තා ගැන පුදුමත් හිතුණා. තාත්තා දන්නවා ඇති සමාජේ ජීවත් වෙන විදිය. ඒක තාත්තගෙ එක්තරා ශෛලියක්. ජීවත් වෙන මගේ ශෛලිය ඊට වෙනස්ද මන්දා.

තාත්තා පවුලට හරිම සමීප කෙනෙක්. මට අම්මට

අක්කලාට එයා හොඳටම බැඳිලා ඕනවටත් වැඩිය. වෙන මිනිස්සු සල්ලි එඩ පිනනකොට පවුල අමතක කරනවා. ඒක නගරෙට ඒක පවුල ගාතෙ පවත්වගෙන යනවා.ඒකට අපේ තාත්තා. අම්මා ජීවත්ව ඉන්නකම අම්මට බැඳිලා හිටියා. අම්මා නැති වුණාට පස්සෙ කම්පැනියටම බැඳිලා. වයසට ගිහිල්ලත් එයා මට වඩා හරිම ඇක්ටිව්.

මගේ මනමාලි මනෝරමාව කම්පැනියට හවුල් කරගන්න කියලා තාත්තා මට කිව්වෙ ඒකම වතාවයි. මම ඒක ගැන එයාගෙ හැඟීම එච්චරටම උනන්දුවක් නැති ඒක ගැන කොහොමද කියලා මට දකින්න ලැබුණේ නැහැ.

මනෝරමාව බිස්නස්වලට හවුල් කරගන්න මගේ නම් කිසිම උවමනාවක් තිබුණේ නැහැ. නාට්‍ය වල රඟපාන සිංදු කියන ගායකයො පස්සෙ දුවන මනෝ වගේ කෙනෙක් කොහොමද බිස්නස් වලට හිරකරන්නේ. ඒ මදිවට මනෝට සිංදු කියන පිස්සුවක් හැදිලා.

මනෝරමා මට නිකම් ජීවිත සහකාරියක් විතරද මන්දා. තාත්තා කියූ නිසා කසාද බැන්දා මිස මට මගේ ජීවිතේ ඉදිරියට ගෙනියන්න විවස්තර ගැනියක් පැත්තකින් තියාගන්න මට ඕනෑ වුණේ නැහැ. ඒක මට අමුතුයි. ජීවිතේ කොටස්කාරිය පංගු කාරිය කියන්නෙ මොකක්ද මම දන්නෙ නැහැ. කැම මෙසෙදි හම්බ වෙන නිදන කාමරයෙදි හම්බ වෙන විරුද්ධ ලිංගිකයා ද පාට්නර් කියන්නේ. අනේ මන්දා මට එයා ගැන විශේෂ ආදරයක් ඇතිවෙන්නෙම නෑ. මගේ ජීවිතේදී මම සහෝදර සහෝදරියෙක් නැතෙ. ඉතින් කෑමක් හරි කාමරයක් හරි ෂෙයාර් කරගෙන ඉන්නවත් මට තේරෙන්නෙත් නැතෙ. මගේ පිරිමි යාලුවොත් කීදෙනෙක් මාව තේරුම් ගන්නද මන්ද?

මුල් දවස්වල මනෝරමා මං ගැන ටිකක් හෙව්වා මට ඒක අරුමයක් වුණා.

''ඔයාගෙ ෂර්ට් කලිසම් එහෙම හෝදන්න තියෙනවද?'' එයා ඇහුවම මම පුදුම වුණා.

'ඔයා මොකටද එහෙම අහන්නේ ? මම මගේ ඒවා දන්නේ ලොන්ඩරියටනේ.......''



මම කිව්වම එයා මා දිහා බැලුවෙ අමුතු විදියට.

''ඔයාගෙ ඇඳුමුත් ලොන්ඩරියට දාන්න........ හැම සිකුරාදාම පාල ඇඳුම් අරගෙන ලොන්ඩරියට යනවා........'' මං කියද්දි මගේ අම්මා එතැනින් යන ගමන් මනෝරමා දිහා අමුතු විදියට බැලුවා. මම දැක්කා. මනොරමා ගේ මූණ බයෙන් වෙව්ලලා ගියා වගේ පව්........එයා.

එයා අපේ ගෙදර ඉන්නේ හරියට බූත බංගලාවක ඉන්නවා වගේ. සීරුමාරුවෙන්ද මන්දා. අපි එක්ක කතාකරන්න හරිම බයයි. හරියට එයාට විරුද්ධව අපි යුද්ධ කරන්න යනවා වගේ.

*ගිම්හාන් අලහප්පෙරුම - දිනපොත*

*දිනය: 1980 මාර්තු 15*

* * *

''ඔයාට අමතකද මන්ද අර මුතු නංගිලගෙ දූවගෙ වෙඩිං එක.''

දොර රෙද්ද අතරින් හිස පමණක් ඔබාගත් සමන්තා නැවත මා පියවි ලෝකයට කැඳවයි.

''අනේ මන්ද........ මේ උත්සව වල කෙළවරක් ඇතැයි? හැම සතියකම මොකක් හරිම මඟුලක්........නැත්තං මරණයක් හරි උපන් දිනයක්. අයියෝ........ මෙකෙන් ගැලවිල්ලක් ඇත්තෙම නැද්ද මන්දා.'' මගේ කටහඬ රළු වැඩි වුණාවත්දයි මට හිතෙන්නේ සමන්තාගේ මුහුණ කළු වලාවකින් වැසී යන විටය.

ඇත්ත තමා........ මම හිතන්න ඕන දේ කියනවා. කියන්න ඕන දේ ලියනවා........අනේ මගේ කට........ නෑ........ අනේ මගේ කල්පනාව හොඳ මදි වෙගෙන එනවා කියන අදහසින් සමන්තා බලා සිටියි. ඒය රෑත් මම හිතෙන් ඇවිදපු කතාව ආයෙත් ඇ ඇදගනියි කියලත් බයක් ඇත.

මම උපැස් යුවළ ගලවා මේසය මත තබා........ කාමරයේ දොර වෙත පිය නගමි. සමන්තාට සතුටුය. ඇ හිස දොර රෙද්දෙන් ඇරගෙන කාමරයේ දොර ළඟ එළියේ පුටුවේ ඇඳියන්නේ මා සමඟ කතාබහකට සැරසීගෙනය.

''හැබැටම මටත් අමතක වෙච්ච හැටි. කවද්ද දූං ඕක
තියෙන්නෙ.......?''

''අනේ අනේ තමුන්ගෙම නංගිගෙ දුවගෙ වෙඩිං එක
අමතක කළා නේ....... මතක තියාගන්න දූ පෝරුවට නග්ගන
වැඩේක් ඔයාට තමා බාර වෙලා තියෙන්නෙ.......''
''ආ....... ඔව් නේන්නම්....... කවදද දීනෙ?''

මම මගේ දිනපොත පිරික්සමි. ඇත්ත නේන්නම් දිනය
වශයෙන් නම් අනිද්දාය. තැන නම් කොළඹ මහ හෝටලේය.
අපරාදෙ දවසක්ම ගතවේවි....... මගේ හිත කෙඳිරි ගායි.

''ඔයාගෙ සූට් එක නං හරි. මටයි සාරියක් ගන්න
වෙන්නෙ.......'' සමන්තා ඊළඟට කියද්දි මට ඇගේ අභිමතාර්ථය
පැහැදිලි වෙයි. ''කලින් සාරි දෙක තුනම පවුලේ වෙඩිං වලදි
කට්ටිය දැකලා තියෙනවා. ඔයාට හරි නැතෙ මම එකම සාරිය
පට්ටා ගගහා අඳින එක. ඔයා ලොකු බිස්නස්කාරයෙක් වෙච්චි.
ඒ මදිවට කලාකාරයොත් හඳුනන ලේඛකයෙකුත් වෙච්චි.......හ්ම්
ඒකයි මං කිව්වේ.''

ඇ ඇඟ ගස්සමින් නාරි ලීලා පපා එතැනින් යයි.

''හරි....... මම සල්ලි දෙන්නම්. ඔයා හවසට සාප්පු යන්න
දාගන්නකො.......''

''හා....... ඔයාට තේ එකක් ගේන්නද.......නැත්නම
කෙලින්ම බත් කනවද ?

ඇ මගේ උවමැන් ගැන කරදර වෙයි. මට ඒ ගැන
සතුටුයි.

''හා....... තේ එකක් හදලා කෑම මේසෙ උඩින් තියන්න.......
මං ඇවිත් බොන්නම් තව ටිකකින්.''

ජීවිතය සම්බන්ධව මහා පාලුවක් දැනී මම එසේ කියමි.
මා සතු පොත් සාප්පුව සහ මුද්‍රණාලය පවත්වාගෙන යන්නේ
මගේම පරණ මිත්‍ර සුමිත්‍රාරච්චිය. ඒවා ගැනවත් සොයා බලන්ට
බැරි තරමේ කම්මැලි කමක් මට කෙසේ ඇති විදැයි මාවත්
දන්නේ නැතිකම විශේෂයකි. මේ නොදන්නා කම නිසාම මට
මගේම සිත ගවේෂණය කිරීමේ අභිරුචියක් රෝගයක් ලෙසින්
වැළඳෙයි. මේ රෝග බීජය පිළිකාවක් සේ ඇතිවී පසුව මගේ



සිරුර පුරාද මගේ අධ්‍යාත්මය පුරාද විහිදී විසිරී යන ආකාරය
මට දැනෙයි. එය මට හැඟෙයි.

සමන්තා සමඟ අපගේ ඥාති දියණියගේ මංගල්‍යයට යාමට
ඇති මගේ නොකැමැත්ත කුමක්දැයි මම සිතමි. ප්‍රිය සම්භාෂණ
සඳහා හෝ ඥාති මිත්‍ර සහසබඳතා සතුටුසාමීචි කෙරෙහි මෑතක
සිට මා තුළ ඇතිවූ අප්‍රසාදයද මට එසේ සිත්වන්නේ ? නැත්නම්
වෙනත් දෙයක්ද !

සමන්තා ගැන සිතා හෝ මා එහි යා යුතුය. අද මට වඩා
නෑ හිත මිතුරන් ඇසුරු කරන්නියක වන හෙයින් මට ඇගේ
ප්‍රතිරූපය රැක දෙන්නට සිදුවී ඇත්තේය. මගේ නෑ හිත මිතුරන්
අතරේ මට වඩා ඇ ජනප්‍රිය චරිතයක් වී ඇත. ඒ පසුගිය
කාලවකවානුවලදී ඇ විසින් මා විසින් අප විසින් මුහුණ පාන
ලද ඇතැම් දෙදෙවෝපගත ක්‍රියාදාමයන් නිසාමද?

* * *

කාමරයට වැදී මම මනෝරමා නාගසේනගේ දින පොත්
තිරුව කියවාගෙන යමි.

මට පුදුමාකාර කල්ලූවක් ලැබුණා මගේ සංගීත වැඩවලට.
ඒ අපේ සංගීත ගුරුතුමාගෙන්.

සිංදුවක් හදලා පටිගත කරලා රේඩියෝ එකේ ප්‍රචාරය
වෙනවා අහන එක මගේ හීනයක් වෙලා තිබුණේ. ඒ හීනය හැබෑ
කරගන්න ඕනෑ කියන උවමනාව යටපත් කරගෙන මම හිටියද
මන්දා. නාට්‍ය වැඩවලට එහෙ මෙහෙ දුවද්දී ඒ වැඩ වැඩිකමත්
වගකීම් හින්දමත් මට ඒවා අමතක වෙන්න ඇති.

මගේ ජනප්‍රිය ගායකතුමාගෙ ප්‍රසංගය දිනේදීත් එයාට
සුබපතන්න ගිය වෙලාවෙදීත් මට ඒ සිංදු කියන තණ්ණාව
මතු වුණා. අද මට හවස සගික් හම්බ වෙච්ච වෙලාවෙ මම ඒ
අදහස කිව්වා.

''ඕවට වියදම් කරන්න සල්ලි තියෙනවද ?''

එයා ඇහුවෙ හරියට මට එයාගෙන් සල්ලි කඩාගන්න
හදනවා කියල බයෙන්ද මන්දා.

"ආපෝ ඔයා බයවෙන්න එපා......... ඔයාගෙ අලුත් රස්සාවෙන් ගොඩාක් සල්ලි හම්බ වෙන නිසා ආඩම්බරයි නේද? මට මගෙ හස්බන්ඩ් කිව්වා සල්ලි දෙන්නම් කියලා......... දන්නවද........" මම පුංචි එකෙක් වගේ සශීක්ව තෝරවොත් කලා.. එයාට හරිම හිනා. දැන් ඉතිං රස්සාවකුත් තියෙන නිසා මිනිහා වෙනදට වඩා ජැන්ඩි පහට ඉන්නවා. මට ඉරිසියාවකුත් ඇති වුණා. ඔහොම ගිහින් තව ටික දවසකින් කවුරු හරි කෙල්ලෙක් මාට්ටුකර ගනිවි. සශීක්ගෙ හිනාවයි බැල්මයි දකිනකොට මට තෘෂ්ණාවක් ඇතිවෙනවා. බලාගෙන ගියාම සශීක් හරිම කපටියා. එයා හරිම අසරණ විලාසෙන් මගේ වම් අතේ වෙදගිල්ල අතගෑවා. මුද්ද දාපු ඒකේ සියුම් ඡායාවක් ඒ ඇඟිල්ලෙ තියෙනවා. මුද්ද ගැලෙව්වත්, එයාටත් ඒක පෙනිලා. ඒ අත අයින් කරලා අනිත් අතින් අල්ලා ගත්තා.

මොනවා වුණත් සශීක් හරිම හැඟීම්බර ප්‍රේමවන්තයෙක්. අපි හැන්දෑවම ගත කළේ අපටම උරුම ලෝකයක. අපි ගැන හොයන්න අපිට බාධා කරන්න කවුරුවත් හිටියෙ නෑ.

"අපි හරිම සාර්ථක විදියට තුන්වැනි සිල්පදය කඩනව නේද?" සශීක් එහෙම කිව්වාම මම උඩ ගියා.

ඒ වරද මගෙද ? එයාගෙද ? මට හිතාගන්න බැරි වුණා. එකට එකතු වෙලා වැරදි කරලා වැරැද්දෙ මූලය හොයාගෙන යද්දී වරදේ අයිතිකාරයා ගැන හොයනකොට ඔය ප්‍රශ්නෙ මතු වෙන එක ස්වාභාවිකයි. වරදක් කරන බව තේරිලත් ඒ වරද නොකර ඉන්න උත්සාහ නොකරන එක වරදක්. මගේ හිත එහෙම කිව්වට මගේ මූව ගොලු වුණා. ඒක තමයි කාම තෘෂ්ණාව මට හිතුණා.

"මොකෝ......... ඒ පාර හදවත පැත්තක තියලා උපාධි මොළෙන් හිතන්න කල්පනා කෙරුවාවත්ද ? මනෝ ?"

මට දෙන්න උත්තරයක් තිබුණේ නෑ. මට නිකමට හිතුණා......... මෙහෙම. මම කසාද බැඳපු එකේ වාසිය සශීක් ලබාගෙන තියෙනවා. ඒක තමයි ජාගර පිරිමිකම.........! එයා දැන් ඉස්සරට වඩා මට මේ හැටි සමීප ඒකයි.

ගලා යන දිය පාරකින් වතුර දෝතක් ගන්න අනාදිමත්



කාලෙක සිටන්ම පිරිමි පුරුදු වෙලා හිටියා......... මට නොයෙක් ඉතිහාස කතා මතක් වුණා. ඒ එක්කම සශීක් කියූ දේකින් මගේ ඔලුවට හෙනයක් පාත් වුණා වගේ වුණා.

"ඔයා ලියසර පත්තරේට ලියන තිරු ලිපිය මම කියෙව්වා. ඇත්තටම මනෝ කොහොමද ඔයා ලංකාවෙ කාන්තාවන්ට තමුන්ගෙ ස්වාමියාට අවංක වීමේ අගය වගේම පතිවෘතා සීලය රැකීමේ ප්‍රතිපත්තිමය චර්යාව අවධාරණය කරලා මේ තරම් ලස්සනට අවවාද දෙන්නේ......... හෑ හා.........!"

මට දෙලෝ රත්වුණා. මේ කතා කරන්නෙ සශීක්මද? නැත්නම් තමුන්ගෙ කාම සන්තර්පනයෙන් උදම් අනන හිවලෙක්ද කියලා මට හිතුණා.

"ලංකාවෙ ගොඩාක් ගෑනු ඕක කරනවා මනෝ......... ඔයා කලබල වෙන්න එපා. විවිධ මාධ්‍ය වලින් කාන්තාවන්ට උපදේශන සේවා පවත්වාගෙන යන්න අවස්ථා දීලා තියෙන්නේ ඇත්තටම ඒවා පිළිපදින ගෑනුන්ට නෙමේ. එහෙම ගෑනියක් ඉන්නවා නම් ඒ විස්සකට එක්කෙනයි.

"ඔය කියන විස්සෙන් එක්කෙනා කොහේද දන්නෙ නෑ ඉන්නේ........." මම එහෙම කියලා මගෙ ගමන් බෑගය එල්ලාගෙන සෙරෙප්පු දෙකත් දාගත්තා. සශීගෙ තොල් පිට පෙරලිලා ගිය සියුම් ඇඹරිල්ල මම දැක්කා. මට හිත යටින් හිනා. ඇත්ද මගෙන් අහගත්තා.

"හ්ම......... දැන් යමු ඉතින්........."

මම ආයෙමත් කිව්වෙ සශීක්ට උපහාසෙට නෙමේ අපහාසෙට. කාපු බීපු තැන්වල ආයෙ මොකට ටැග් ගහෙනවද......... පරණ ග්‍රාමීය කතාවක් මට මතක් වුණත් කටට ආවත් මම ඒක කිව්වෙ නෑ. හොඳ වෙලාවට ඒක මගෙ කටින් කියවුණේ නෑ.

"ඊළඟ දවසෙ මම ඔයාට සිංදු කියයක් ලියලා ගේන්නම්කෝ."

පහේ පංතියෙ කොලුවෙක් ගුරුතුමීට කියනවා වගේ සශීක් එහෙම කිව්වාම මට දුක හිතුණා.

අද අපි සමුගත්තා ඒ විදිහට. ගෙදරට ආවාම මට දැනුණේ මහාම හිස් බවක්. ඒ හිස් බවට දුකක් ගෑවිලා තිබුණා.

ශිම්හාන්ගෙ මූණ දැක්කාම මට ඒ හිස් බව තවත් දැඩිව

දැනෙන්න ගත්තා. එතකොට ඒත් මට දුකක් නෙමෙ තරහක් දැනුනේ.

*මනෝරමා නාගසේන - දිනපොත*
*දිනය: 1980 අප්‍රේල් 18*

අද මම නවාතැනට ආවෙ පුදුම සැහැල්ලුවකින්. ඒත් ඒ සැහැල්ලුව මගේ හිතේ තිබුණද මම දන්නෙ නෑ. කෙනෙකුට පුළුවන් නම් හිතෙන් ගතෙන් දෙකෙන්ම සැහැල්ලු වෙන්න එතැන තමයි හැමදාම සැහැල්ලුව තියෙන්නෙ.

මගේ අලුත් රස්සාව ස්ථිරයි. ඒකෙ සතුට මට දැනුණා. ඒ එක්කම අද හැන්දෑවෙ මනෝ කියාපු දේකින් මට හුඟාක් රිදුණා. ඒ රිදිල්ල මොකක්ද කියලා දුරට හිතනකොට තමා තේරුණේ ඒක අර විස්සෙන් එක්කෙනා කොහේද ඉන්නේ කියන කතාව නේද කියලා. ඇත්තටම මට නිමනා........ මගේ නිම්නා මතක් වුණා. ඒ වෙලාවෙ........

නිම්නා මගේ ආදරණීය නිම්නා........ ඔයා විස්සෙන් එක්කෙනෙක් කියලා කිව්වොත් ඒක ඔයාට කරන මහාම අපහාසයක් වේවි නිම්නා........ ඔයා සීයට එක්කෙනායි. මේ මුළු ලංකාවම පීරලා ගෑනු හෙව්වත් ඔයා වගේ ගෑනියෙක් ඉන්න එකක් නෑ කියලා මට හිතෙනවා.

ඒත් ඒ කාලෙ අපි යාලු වෙච්ච අලුත මම ඔයා ගැන මොන තරම් තරහකින්ද හිතුවෙ. ඔයාට මම හිතින් අපහාස කළා. නින්දා කළා. ඔයාට මම හිතින් චෝදනා කළේ බොරු සිල් ගන්න උපාසකම්මා කෙනෙක් කියලා. ඔයා මහ වාතයක් කියලා මට මගේ යාලුවෝ සී දෙනෙකුට නම් කියලා තිබෙවද ? ඒවා කිසිම දෙයක් ඔයා අද වෙන තුරුත් දන්නෙ නෑ නිම්නා. ඔයා දැන් ඔයාගෙ සැමියා එක්ක පවුල් කනවා ඇති. හොඳ බිරිඳක් වෙලා ඉන්නවා ඇති. කමක් නෑ. මගෙත් ආයු ලැබ මටත් වඩා කල් ඔබ ජීවත් වේවා. එච්චරයි මට ඔයා ගැන කියන්න තියෙන්නෙ. මම ඔයා ගැන තෘෂ්ණාවක් ඇතිකර ගත්තෙ නැත්තේ ඇයි කියලා මම නම් දන්නෙ නෑ නිම්නා. මම ඔයාට ආදරේ කළා. ඔයා ලෝකෙ කාටවත් වැඩියෙන් මට ආදරේ කළා. ඒත් අපි දෙවිදියකින් පව්කාර වුණා. ඒ ආදරවල් පවත්වාගන්න බැරි වෙලා..



ඒක කාගෙ වරදද කියලා මම දන්නේ නැහැ. ඔබෙ වරදද එය මගෙ වරදද මා දන්නේ නැත! ඔයා ඇසුරු කරන කාලෙම තමා මනෝරමා මගේ ජීවිතේට එබිකම් කරන්න ගත්තෙ ........ඒකෙ වරද නම් මම පටවන්නෙ ඔයාට. අපි දෙන්නා ගෙ සම්බන්ධෙ බිත්තියක් නම් ඒ බිත්තියෙ සිදුරු හදලා තිබුණෙ ඔයා. මට අවට ලෝකෙ බලන්න ඒ සිදුරුවලින්. ඒ සිදුරු වලින් ඔයා අවට ලෝකෙ බැලුවෙ නෑ. ඔයා ඒ සිදුරු හදලා තිබුණේ මායි අවට ලෝකයයි යාවෙන විදියට. අන්න ඒ සිදුරකින් තමා මනෝරමා මගේ හිතට එබිකම් කළේ........ කොච්චරක් නම් කාලයක් මේ එබිකම් කෙරිල්ල වුණාද කියල ඔයාවත් දන්නෙ නෑ නිම්නා.

සමහර දාක ඔයා එන්න කියාපු දවසට එන්නෙ නෑ. ගෙදර එන්නෙ අම්මලත් එක්ක කොහේ හරි යන්න වෙලා. ඔයාට හැමදාම තියෙන ප්‍රශ්න. ඔයා එනකම් බලාගෙන ඉඳලා ඉඳලා හොඳටම හෙම්බත් වුණාම මම ගියා මනෝලගෙ නාට්‍ය රිහසල් තැනට. අනේ මාව දැක්ක ගමන් මනෝ මුළු ලෝකෙම අමතක කරලා මා ළඟට දුවගෙන එනවා. මට මනෝව බදාගෙන ඉකි ගගහා අඬන්න පුළුවන් මානසිකත්වයක් එනවා. පුංචි එකෙක් වගේ. ඒ මදිවට මම මනසින් දඬුවම් විඳල විඳලා ගිහින් එයා මාව පිළිගන්න කොට මට ඉවසුම් නැහැ.

ඒත් මනෝ කවදාවත් ඇහුවෙ නැහැ මගෙන් ඇයි මේ කියලා. එයා කළේ මාව සනසවන එක විතරයි. එයා මට ගොඩාක් දේවල් කතා කළා. ඒත් මට දුක හිතෙනවා. ඔයත් මට ජීවිතේම කැප කළා නේද කියලා මතක් වෙනකොට. මම ඔයාට ආදරේ කරන කාලෙදි ඔයා දැනගෙන හිටියානම් මම මනෝ එක්ක සම්බන්ධයක් පවත්වාගෙන යනවා කියලා ඔයා මොකක් කරාවිද කියලා මට හිතාගන්න බැරි වේවි.

ඔයා මාව අතෑරලා යන එක මට දරාගන්න බැරිව මාව පිස්සෙක් වේවි. මගේ හිතේ හැටි එහෙම තමයි. පිරිමියෙකු ගෙන් ආරක්ෂා වෙන විදිය විතරක් දන්නා බිරිඳක ගේ සැමියෙක් පිරිමියෙකුව සනසන්න දන්නා ගණිකාවක් ළඟට ගියාම දැනෙන ගැස්ම මට මනෝරමා ගාවදී දැනෙන්න ගත්තා.

මම කවියක් ලිව්වා ඒ ගැන. ඔයාට ඒ ගැන මෙලෝ

ඒත් මනෝරමාට ඒ කවි යෙදුම තේරුණා.
තේරුමක් නෑ........ ඒත් මනෝරමාට ඒ කවි යෙදුම තේරුණා. මම දිනපොතේ මේ මනෝරමාට හොඳ රසිකත්වයක් තියෙනවා. මම දිනපොතේ මේ පිටු දෙකම ඔයා අමතමින් ලිව්වේ ඇයි කියලත් මට ප්‍රශ්නයක් නිමනා.

ඒක හරියට ඔයා සමහර වෙලාවලට හිනාහොවී මූණ පුරා ඇඳගෙන ඉන්න අර ගුප්ත ඉනාව වගෙයි. ඒක හරිම ආකර්ශනියයි. ඒ වගේම වේදනාබරයි. මනෝරමා එයාගෙ මුද්ද ගලවලා මගේ ළඟට එන හැම වතාවකම මම එයාව පිළිගත්තා.

*සගීක් උදාකර - දිනපොත*

*දිනය 1980 අප්‍රේල් 20*

උඹෙ වයිල් රඟපාන නාට්‍යයක්වත් උඹ බලන්නෙ නැද්ද බං. මගේ යාලුවෝ මගෙන් අහනකොට මට කියන්න උත්තර තිබුණෙත් නැහැ. මගේ කියන හැඟීමක් නැති කමද කියන්න මම දන්නෙත් නැහැ. නමුත් එයා අතන මෙතන බස් වලින් ගිහිල්ලා රස්තියාදු වෙන එකට නම් මම කැමති නැහැ.

ඒක ගැන මුලින්ම අදහස් දුන්නෙ අම්මා. 'ඔය ළමයා හැම තැනම කරක් ගහලා ගෙදර එනවා. පුතා දන්නෙත් නෑ කොහේ යනවද කියලා. කියලා යන්නෙත් නෑ යන තැනකට. කාල බීලා ලැස්ති වෙලා එයාගෙ ගමන් බිමන් යනවා. මොකක්ද පුතේ මේකෙ තේරුම. උඹ කසාද බැන්දෙ මොකටද? උඹලටය කියලා ළමයෙක් හදාගන්නෙ නැද්ද ? පරම්පරාව මෙතනින් ඉවර කරන්නද උඹලට ඕනෑ........"

අම්මා කියපු භයානක කතාවලට මට හීන් දාඩිය දැම්මා. ළමයි හම්බ වෙන්න නම් අපි එකට ජීවත් වෙන්න ඕනනේ.........අපි අතරෙ එහෙම සම්බන්ධතාවයක් නැති බව දන්නෙත් අපි දෙන්නාම විතරක් වෙන්න ඇති.

මේ ප්‍රශ්නෙ මගේ යාලුවෝ දන්නවා. උඹලා මේ ගැන විවේචනය නොකර ඉන්නවා නම් මම කැමති. මම මුලින්ම වාරණයක් යෙදුවා....... ඒත් යාලුවෝ ඒවා අහන්නෙ නෑ. මුවර් එකටම උඹේ ගෑනිට කවුරුහරි ඇති......... ඒකයි මෙ 'දිගෙ ඉවසගෙන ඉන්නෙ.

ජයාන් එහෙම කිව්වාම මගේ ඇස් උඩ ගියා. ඇස්වල





බැඳිලා තිබුණු අඳුරු පටල ඉරිලා ගියා වගේ දැනිලා මොකක්දෝ හිතට වේදනාවකුත් ආවා.

කවදාවත් ගෑනියෙක් කැමති වෙන්නෙ නෑ බං පඹයෙක් වගේ ඉන්න පිරිමියෙකුට......... උන් ජීවිතේ හොයාගෙන ගෙයි එළිපත්තෙන් බැරිනම් පිළිකන්නෙන් හරි පිටවෙලා යනවා.

සිදත් එහෙම කිව්වාම මට හිතුණා මම මෙතෙක් කල් මොකද මේ ගැන හිතුවෙ නැත්තෙ කියලා. දැන් අපි බැඳලා අවුරුදු තුනයි. මගේ ව්‍යාපාරික කටයුතු එක්ක තියෙන අවිවේකය ඒ වගේම මගේ විදේශ ගමන් නිසා මේවා ගැන ටිකක්වත් සොයා බලන්න මට පුළුවන් වුණෙත් නැහැ. අම්මා හරි ඒ දේ මතක් කළ එක හොඳයි.

මම මනෝරමා ගැන සොයලා බලන්න මගේ යාලුවෙක් විදියට මම හුඟක්ම විශ්වාස කරන දම්නාත්ව යෙදෙව්වෙ ඒ නිසයි. "මම උඹට සම්පූර්ණ විස්තරේම හොයලා දෙන්නම්කො පැය විසිහතරක් ඇතුළත." කියලා දම්නාත් කියනකොට තමයි මට මාර ලැජ්ජාවක් ඇති වුණේ. දෙයියනේ මේ නීති පොතේ ලියලා අත්සන් කරලා මගේ භාර්යාව විදියට බාරගත් ගෑනිට විරුද්ධව නේද මම මේ රහස් දූතයො යොදවන්නෙ කියලා මගේ යටි හිත මට පලිච්චි කළා. ඒ වුණත් ආයෙත් මගේ හිත ඇතුළෙ ගර්වය නැඟිලා ආවා.

අම්මා කියූ එක ඇත්ත. මනෝරමා ලෝබ නැතිව වියදම් කරන්නෙ කාගෙ සල්ලිද ? මගේම සල්ලි. එයා හම්බකරන, ඉටි ගෙඩියක් නෑ. අම්මා කියනව වගේ. පෝස්තර වලට, ඩ්‍රයිනෝ වලට, සිංදු රෙකෝඩිං වලට, ඔක්කොටම වියදම් කරන්නෙ කාගෙ සල්ලිද? මගේ සල්ලි. ඒ නිසා මට එයා ගැන හොයා බලන්නෙ නැතිව හිටපු එක ලොකුම ලොකු වැරැද්දක්. ඇත්තටම මේ අවුරුදු තුනටම මට ඒ ගැන කල්පනාවක් වුණේ නැති හැටි.

ඒත් මනෝරමා මට වරදක් කරලා තියෙනවද මට ආයෙ හිතෙනවා. මම බිස්නස් වැඩ වලට කාලය මිඩංගු කරනවා. යාලුවන්ගෙ නෑදෑයින්ගෙ උත්සව වලට යනකොට මම එයාව ලස්සනට සරසවාගෙන යනවා. එයා එක්ක වාගෙන් නැගලා ගිහින් බහිනකොට බලාගෙන ඉන්න අයගෙ ඇස් නළලට

එනකොට මට ආඩම්බර හැඟීමක් දැනෙනවා. ඒ මගේ වයිෆ් ලස්සනයැයි කියලා ඒ අයගේ ඇස්වල ඇඳිලා තියෙනවා දැක්කාම. ඒ හැඟීමෙන් මනෝරමාත් හොඳටම ආඩම්බර වෙනවා ඇති. ගැනියෙකුට ඊට වඩා සතුටක් තවත් තියේද ?

උත්සවේට ආපු අනිත් ගෑනු ඔක්කොටම වඩා ඉහලින් කැපී පෙනෙන විදියට මනෝරමා ඉන්න එකේ සතුට මට වඩා එයා භුක්ති විඳිනවා ඇති. මේ රටේ ගෑනු කීදෙනෙක් ඉන්නවාද හරියට ඇඳුමක් පැළඳුමක් නැතිව ආභරණ නැතිව, සරුව පිත්තල ඉහේ හිටන් පොරවගත්ත ගෑනු ළඟදී මනෝරමා බැබළෙන්නෙ පබාවතීගෙ පිළිරුව වාගේ. ඒත් උත්සවයක් ඉවර වෙලා ගෙදර ඇවිත් ඇඳුම් මාරු කරගෙන එයා කාමරෙන් එළියට එන්නෙ මූණ කුණ්ඩ හට්ටියක් කරගෙන. මනෝරමාගේ මේ චර්යාව නම් මට ප්‍රහේලිකාවක්. ඒ ඇයි කියලා අහන්න මට උවමනාව තිබුණෙත් මට හිතෙන්නෙ නැහැ. අද රෑත් වුණේ එහෙම දෙයක්. මට මේ දිනපොතේ ඒක සටහන් කරන්න ඕන වුණේ වෙනම දෙයක් නිසා. මනෝරමාගේ හැසිරීමේ රටාව මගේ හිතට හරි බරක්.

*ගිම්හාන් අලහප්පෙරුම - දිනපොත*

*දිනය: 1985 පෙබ. 10*

ටික ටික ජීවිතේ මට තිත්ත වෙගන එනවා. ඇත්තටම සයින් නිසා තමයි මම මේ විදියට ජීවිතේ අල්ලගෙන ඉන්නෙ. එයාත් නොහිටියානම් ඇත්තටම මම කොහොමද ජීවත් වෙන්නෙ. මෝඩ පිරිමි හිතාගෙන ඉන්නේ ගෑනියෙකුට අත කණ පිරෙන්න රත්රන් බඩුයි ඇඟ දවටගන්න රත්සලුයි තිබුණාම ඔක්කොම හරි කියලා. හැමදාම ගිම්හාන් එක්ක උත්සවේකට සාදයකට ගියාම මම අනෙක් ගෑනුන්ගෙ ඉරිසියා බැල්මවල් වලින් බැටකන්නෙ ඒ නිසා බව මම දන්නවා.

ඔයා නම් හරි ලකී......... හැමෝම කියන්නෙ එහෙම. ඒ කතාව අහලා මට ඇතිවෙලා......... ඒ නිසාම ඊයෙ රෑ සාදයේදී මට එහෙම කියූ ලේඩි කෙනෙකුගෙන් මම නිකමට ඇහුවා ඇයි එහෙම කියන්නේ කියලා. හාපෝ නොදන්නවා වගේ අහන හැටි......... යානවාහන, ගෙවල් දොරවල් නම් කාටත් තියෙනවා කියමුකො. ඒත් ගිම්හාන් වගේ හැන්ඩ්සම් හස්බන්ඩ් කෙනෙක්......... හරිම කෙයාරිං......... සල්ලි ගොඩාක් තියෙන හස්බන්ඩ් කෙනෙක්......... ඔයා කැමති කැමති ඇඳුම් ගන්න, ජුවෙලරි ගන්න සල්ලි විසිකරන ඔයාගෙ වැඩවලට ඕනෑ තරමක් චෙක් ලියලා දෙන කෙනෙක්.........



ඒ මනුස්සයා හුස්මක් කටක් නොගෙන ඒ ටික කියවාගෙන කියවාගෙන ගිහිල්ලා ඉවර වෙලා මහා හුස්මක් ගත්තා. හරියට පුම්බලා තිබුණු පපුවෙ හුළං ටික ඔක්කෝම උත්සව ශාලාවට මුදාහැරියා වගේ. මට තනියම හිනා. මගේ හිත ඇතුලේ හිටපු කෙනෙක් මෙහෙම කිව්වා.

අනේ අනේ පව මෝඩයෝ.......... ගැනියෙක් වුණාම ඔවා විතරද ඕන බං.......... උඹ හිතන්නෙ කන්නයි අඳින්නයි පළඳින්නයි යන්න එන්න වාහනයි කැත හැතුව ළඟින් තියාගෙන යන්න පුරුෂ පරාණෙකුයි තියේනම් ජීවිතේ සම්පූර්ණයි කියලා නේද ?

අනේ මගේ කට.........! පාංකඩයක් හරි යකඩයක් හරි වෙලා යුගල සයනක දෙපැත්තේ බිත්ති දිහා බලාගෙන බුදියගන්න ගෑනියෙකුයි පිරිමියෙකුයි දෙවි දේවතා දෙන්නෙක් ගානට හරිම වාසනාවන්තයි කියලද හිතන්නෙ.

මොකක් හරි එකක් ඉවරවෙලා ගෙදර ඇවිත් ඇඳුම් මාරු කරගන්න ගමන් මට යකා වැහෙන්නෙ ඔවා මතක් වෙලා. ගිම්හාන් නිකම් අමුතු විදිහෙන් මා දිහා බලලා හිනාවෙන්නේ එයාගෙන විලාසිතා ඇඳුම් ආබරණ කුලියට අරන් මොණරෙක් බවට පත් වෙච්ච අච්චි ගෑනි මං කියලා හිතාගෙන වගේ. එයාගෙ නෑ මිතුරු පඟරට ෂෝ එක දාන්න මාව අරගෙන ගිය එකේ සතුට ඒ මූණෙං වාං දමන කොට මට ඉවසුම් නෑ.

දෙයියනේ මේ මොනවත් නැති වුණත් සාමාන්‍ය මනුස්සාංගෙට ඉන්න පිරිමියෙක් මට ලැබුණ නං මං මෙහෙම හන්නත්තාර ජීවිතයක් ගත කරන්නෙ නැහැ නේද කියලා මතක් වෙන කොට මට එන කේන්තියට මට මොනවද කරන්න බැරි. ඔක්කොටම එහා ගිම්හාන්ගෙ අම්මා.........! කොයි වෙලෙත් දන් මගේ පස්සෙන්ම ඇහැ ගහගෙන......... ඒකට තාත්තා......... ඒ මනුස්සයා තමුන්ගෙ පාඩුවෙ වැඩ කරගෙන ඉන්නවා. ඒ

මනුස්සයා ගෙදර ආවාම තේ එක හදලා දෙන්නෙ ගෙදර වැඩකාරී. මහ ගෑනි පැත්ත පළාතක නෑ.

දවසක් මම තාත්තට තේ එක හදලා දුන්න එකට ගෑනිගෙ මූණ අප්සෙට් ගිහිල්ලා මොකක්ද මට නොතේරෙන කතාවක් කිව්වා. ඒක වෙන්නැති ඊළඟ දවසට තාත්තා මට කිව්වෙ......... දූ දූගෙ වැඩක් කරගෙන ඉන්න......... සෝමා වෙනද වගේම මට තේ එක ගෙනැත් දේවි.

මට දුක හිතුණා. කාගෙ වුණත් තාත්තා කෙනෙක්නෙ කියලා හිතලා. තාත්තාට මා ගැන දුක ඇති. කාගෙ වුණත් දුවෙක් නේද කියලා......... පුදුමෙ තියෙන්නේ මේ ලෝකෙ ගෑනු තමා ගෑනුන්ව තේරුම් ගන්නේම නැති ජාතිය. මොන තරම් කිව්වත් කාන්තාව පුරා කෑමට ලක් වෙන්නෙ පිරිමින්ගෙන් කියලා. ඉස්සෙල්ලාම ගෑනියෙක්ව සූරන් කන්නෙ තවත් ගෑනියෙක්ම තමයි.

කොයිම ක්ෂේත්‍රයක බැලුවත් ගෑනියෙකුට බය නැතිව ම කැපිල්ල දාන්නෙ ගෑනියෙක්ම තමයි. තමුන් කරන නිර්මාණයකදිවත් ගෑනියෙක්ව හවුල් කරගන්න ගෑනියෙක් කැමති නෑ. ඒ වුණාට කාන්තාවට සිද්ධ වෙන අසාධාරණකම් ගැන කතා කරන්න ගිහිල්ලා ගෙදර ඉන්න මිනිහත් එක්කත් රණ්ඩුවෙලා කසාදෙ කඩාගන්න ගෑනු දුන් නම් ඕනතරම්.

ගෑනුන්ගෙ මේ ජරාගතිය නැත්නම් ඇත්තටම උන් හොඳයි පිරිමින්ට වැඩිය! අවස්ථාවාදී කමෙන් අංක එකට ඉන්න පිරිමි සංහතියට වඩා ගෑනු නම් අහිංසකයි......... කොයි වෙලෙත් තමන්ට තියෙන තැන නැති වේවි කියන බයට තමා ගෑනු අනුන්ව කපන්නෙ. ඒක හරි ළඳ බොළඳ ගතියක්. ගෑනු කොහොමත් ළඳ බොළඳ සුකොමල ජාතියක් විදියට නේ පණ්ඩිත පිරිමි අර්ථ දක්වලා තියෙන්නෙ. ඉතින් ඒ විදියට උනුත් හැසිරෙනවා ඇති.

අද හවස සගික් අමුතුයි. මට ඒ ගැන නොහිතා ඉන්නම බැහැ වගේ. ඒක හරියට අහසට වලාකුළු ගැන නොසිතා ඉන්න බැහැ වගේ. වැහි වලාවක් ආවත් සුදට සුදේ අලුත් වලාවක් ආවත් තමන්ගෙ ඇඟමත ඇහිරෙනකොට අහස අහක



බලාගෙන ඉන්නවා. කොයිදේත් පිළිගන්න හිතාගෙන. වැස්ස කඩා වැටෙනකොට වුණත් වැහි වලාකුල් ටික හේදිලා යනකන්ම අහස හරි උපේක්ෂාවෙන් බලාගෙන දරාගෙන ඉන්නේ.

''මොකෝ අද පරක්කු වුණේ?'' සගික් තමුන්ගෙ පළමුවෙනි වෙඩිමුරය මුදාහැරියෙ ඒ විදිහට. වෙනදාට වඩා සටන්කාමී ගතියක් ඒ ස්වරූපෙ තිබුණා කියලා. මට තේරුම් ගියේ විනාඩි විස්සක් විතර ගත වුණාට පස්සේ. අනේ දෙයියනේ පිරිමින්ගෙ තියෙන එකසිය විසි අට මායම්.........!

අපි දෙන්නා ඊට පස්සෙ එයාගෙ බයික් එකට නැගලා ගියා ගියා ගිහිල්ලා නතර වුණා පාක් එකේ......... ''කෝ ඔයා මට ගෙනාවද අර සිංදුව?''

බොහොම කල්පනාභරිතව සගික් එයාගෙ ඔලොගුවෙන් මට කඩදාසි කොළ කීපයක්ම දුන්නා අරගෙන. ඒවා කියවද්දී මට තරු පෙනුනා.

දෙයියනේ......... සගීක්......... ඇට්ටි හැලෙන විරහ සිංදු.........! අම්මෝ මට මගේ වචනත් වාවගන්න බැරිව කඳුලක් ආවා. කොහොමද ඔයා මේ තරම් ලස්සනට මේවා ලිව්වේ......... සගීක්......... ''නුඹ උන්නු තැන හදේ තාමත් හරිම උණුසුමයි.........''

''කොහොමද ඔයා මේව ලිව්වේ? මට කේන්තිත් එක්ක. සගික් එක්ක මටත් නොදැනී එයා කොහොමද මේ තරම් දරුණු විරහවකට ගියෙ.........?

''ඒවා මට ලියවුණා නිම්නා ගැන හිතලා!''

''නිම්නා.........! ඒ කවුද .........?

මම ඇහුවෙ නොරිස්සුම්කමින්. ඊට පස්සෙ තමයි සගීත් එයාගෙ ආදර පුරාතීතෙ වැමෑරුවෙ. එයාගෙ ආදරණීය වස්තුව අහිමි වුණාට පස්සෙ තමයි එහෙනම් මේ මගෙන් පාලුකපාගෙන තියෙන්නෙ.

පැය දෙකක් විතර අපි අතරේ හීතල දෙබස් හුවමාරුවක්. දෙබස්වලට වඩා ඒක හැඟීම් හුවමාරුවක්. මට මම ගැනම දුකයි. තරක නෑ වැඩේ. එයා එයාගෙ ප්‍රේමවන්තිය ගැන හිත හිතා නගන අදෝනාවල් මගේ කටින් ගායනා කරවන්න. අනේ අනේ මෙහෙමත් පිරිමි......... හරි අපූරුයි.

මගේ හිත ඉරිසියාවෙන් බරවෙලා පිපිරෙන්න ඔන්න වෙන්න වුණා. අපි දෙන්නා බහින්බස් වෙලා හොඳටම හෙම්බත් වෙද්දී ඉරත් අවරට යන්න ගිහිල්ලා.

"ඔයාට මට තව එකක් කියන්න ඕනෑ. හැබැයි කලබල වෙන්න නම් එපා මෙහෙම කියනවට. ඔයාගෙ හස්බන්ඩ් දූත් ඔයාගෙ පස්සෙන් චරපුරුෂයො එවනවා යන එන තැන් හොයලා........."

ඒක ඇහුවම මට හරියට පුදුම හිතුණා. මම මෙතෙක් කල් හිතුවෙ නැති දෙයක්.......... ගිම්හාන්ට මොකද හිතුණේ එහෙනම් මාව සැක කරන්න හරි මුර කරන්න හරි..........

මට එක අතකින් සතුටකුත් ඇති වුණා. අඩුම ගාණෙ ගිම්හාන් මං ගැන හොයන්නවත් පටන් අරන්. ඒත් දෙවියනේ මගේ ප්ලෑන් ඔක්කොම වතුරේද ? මට එක පාරටම හීල්ලුනා..........

"ඇයි මනෝ.........ඔයාගෙ ඇස්වල කඳුළු මේ තරම්.........?"

සශික් එහෙම අහනකොට මට උහුලන්න බැරි වුණා. දෙයියනේ මට මේ ලෝකෙ ඉතිරිවෙලා ඉන්නෙ ඔයා විතරයි සශික්......... මම සශීගෙ උරහිසේ මූණ හංගගත්තා. සශීත් ඔහේ පිටට තට්ටු කර කර හිටියා. ම... මට ඕනෑවෙලා තිබුණෙ සශික් ඔයාගෙන් අපේ ආදරේ සදාකාලික සිහිවටනයක්......... මට ඒක දෙන්න කරුණාකරලා.........මගේ ජීවිතේ සම්පූර්ණ කරලා දෙන්න පුළුවන් ඔයාට විතරයි.......... ඔයාට විතරමයි. මම පිස්සියක් වගේ කියාගෙන කියාගෙන ගියා. සශික් අන්දමන්ද වෙන්න ඇති. ඒත් මගේ හිත දැඩි වුණා. ඇයි මෙච්චර කල් එයා මගෙන් ප්‍රයෝජන ගත්තා නම් මමත් මොකක් හරි ප්‍රයෝජනයක් ගත්තාම මොකද වෙන්නෙ.........

කොහොම කොහොම හරි ඒ සියල්ල ඒ විදියෙන් සිද්ධ වුණා. මම කළුවරත් එක්ක ඇවිත් ට්‍රයිෂෝ එකෙන් බහින කොට ඉස්තෝප්පුවෙ හිටපු ගිම්හාන්ගෙ අම්මා පුප්පාගෙන ගෙට ගියා.

'කොහෙද මෙච්චර වෙලා ගියෙ.........?'

ඊළඟට ගිම්හාන් වේදිකාවට ආවෙ වෙස්මූණක් පැළඳගෙන වගේ......... දෙයියනේ ගිම්හාන්ගෙ මූණෙ තියෙන නපුරුකම......... වෙඩි පුපුරන ගෙණ උතුරන වැහි දෝරෙගලන සද්දෙ අස්සෙ



මම කාමරේට ආවෙ මුරණ්ඩු හිතින්.......... අද හැන්දෑවම හරිම අමුතුයි. ඒක් ගතියක් තියෙනවා.

මනෝරමා නාගසේන - දිනපොත
දිනය: *1983* මාර්තු *14*

මගේ මුළු ජීවිතේටම අලුත්ම ඉරක් උදාවෙලා එනවා කියලා මට හැඟෙන්න පටන් අරන්......... මගේ ඊර්ෂ්‍යාවෙ උසස් වීමත් එක්කම හිතට ලොකු ධෛර්යයක් එක්කාසු වෙලා. මෙහෙම ඊර්ෂ්‍යාවක් මට නිම්නා එක්ක යාලු වෙච්ච කාලෙදි තිබුණා නම් කිසිම කැතක් නැතිව නිම්නගෙ දෙමාපියෝ ළඟට යෝජනාව අරගෙන යන්න තිබුණා. ඒත් දෙවියනේ මොනවා කරන්නද ? මගේ ඉරණමට හැමදේම දෙන්නේ ප්‍රමාද වෙලා. හෙට්ටු කරලා අමුතුම විදියට තෙම්පරාදු කරලා. ඒ ඉරණමත් එක්ක මම සැහෙන්න හෙම්බත් වෙලා.

මනෝගෙ හස්බන්ඩ්ගෙ යාලුවො දෙන්නෙක් ඊයෙ මගේ කාර්යාලයට ඇවිත් මට තර්ජනය කළ හැටි මට තවම මනෝට කියන්න බැරිවුණා. එක අතකින් මේවා මෙහෙම කෙළවර වෙච්ච එක හොඳයි. මරාගෙන මැරි මැරී වෙන මිනිහෙකුගෙ ගෑනියක් පස්සෙන් යන්න මට පිස්සුවක් නෑ.......... අනික මනෝගෙයි මගෙයි අතරේ තිබුණු සම්බන්ධෙ මනින්න මිනුම් දඬු මොනවාද කියන්න මම දන්නෙ නැහැ.

නිම්නාට එයාගෙ හස්බන්ඩ් ඉන්නවා. මනෝරමාට එයාගෙ හස්බන්ඩ් ඉන්නවා. මොන මොන දුර්වලකම් තිබුණත් ඒත් පිරිමියෙක් නේ.........

මට.........?

මට තමයි කවුරුවත් නැත්තේ.

මෙහෙම කල්පනා කර කර ඉඳිද්දී ......... මගේ දිහාට විදුලි පන්දම් එළියක් වැටිලා තිබුණා. මහ දවාලෙ කොහොමද මගේ මූණට විදුලි පන්දම් එළි වැටෙන්නේ......... විදුලි පන්දම් නොවේ දේවතා එළිවගේ. මම පුදුම වෙලා වටේට බැලුවා. ලස්සන දිග ඇස් දෙකක් මා දිහාවෙම බලාගෙන......... ඇස් මිනිකණ වැටිලා. මම වටපිට බැලුවා. මම ඉන්නේ කාර්යාලයෙ. මගේ විදුරු

කාමරේ ඇතුලෙ ......... කාර්යාලෙ පුටු මෙස......... තැන් තැන්වල මිනිස්සු ගැහැනු වාඩිවෙලා තමන්ගෙ රාජකාරි වැඩ.........

කවුද අර විදුලි පන්දම්කාරි.........?

හොයලා බැලින්නම් ඈ නිසලා.........! නම වගේම ඈ නිසලයි. හුරුබුහුටියි. විරල ගණයේ ලස්සනක්. ඈ හැරිලා බලලා මට හිනාවක් පෑවා. මොකක්දෝ ටෙලි නාට්‍යයක හිටපු නිළියක් මට මතක් වුණා. මටත් හීන් හිනාවක් දැම්මා. මම මොකටද හිනාවෙන්නෙ......... එය කාර්යාලයට අලුතෙන් ආපු කෙනෙක්. මම එයාගෙ බොස්.........!

ජීවිතේට අලුත් එළියක් වගේ එකක් වැටුණා වගේ දැනුණා.

*සගීක් උදාකර - දිනපොත*
*දිනය: 1983 අප්‍රේල් 01*

මම අද ගියා සතුටු උයනට......... කී කාලෙකට පස්සෙද මේ නිදහස් ගමනක් ගියේ. චූටි පුතා විසිවෙවී දුවනවා. මහත්තයාවත් පණ ගිහිල්ලා එයා පස්සෙන් දුවලා. වාඩිවෙලා ඔහේ ඈතක් බලාගෙන ඉන්නකොට මට නොයෙක් දේවල් මතක් වුණා. විවිධාකාර......... වි.........වි.........ධා.........කාර දේවල්. ඒත් ඒවා දිනපොත්වල මොකටද ලියන්නෙ. මිනිස්සුන්ගෙ ජීවිතවල ඕනතරම් ඇති ලේඛනගත නොවිච්ච වේදනාවල්. දුක් කන්දරාවල්. සතුටු උයනට හැම තරාතිරමකම දෙමාපියෝ එනවා. දරුවොත් අරගෙන. ජෝඩුවක් නිකම්ම බලාගෙන ඉන්නවා දැක්කා. දරුවො නැති ජෝඩුවක් වෙන්න ඇති......... මගෙ හිත කිව්වා. දරුවො නැති එකේ දුක දිනපොතක එහෙම ලියන්න ගත්තොත් කොහොම වෙයිද ? ඒ නිසා වෙන්න ඇති මට හිතුනෙ ලේඛනගත නොවිච්ච වේදනාවල් ගැන.

අපි ඉන්න ලේන් එකේම පුංචි ගෙයක් ගැන මට මතකයි......... ඒ ගෙදර පුංචි දරුවො තුන් දෙනෙක්ම පඩි පෙළ වගේ. උදේ පාන්දරම බඩගිනි වෙලා පොඩි දෙන්නා කෑගහනවා ඇහෙනවා. එයාලගෙ තාත්තා කුලී වැඩ කරන කුලී කාරයෙක්......... මහත්තයා මට කිව්වෙ, ගෙවල් ගානෙ ගිහිල්ලා මොකක් හරි දවස් කුලියක්



හොයාගෙන ගෙදර ගේන දේකින් තමාලු පවුලම යැපෙන්නෙ.

මට මතක් වෙන්නෙ අපේ 'පුතාට' කවා ගන්න තිබෙන අමාරුව. කන්න තියෙන තැන්වල දරුවන්ට කන්න බෑ. කන්න නැති තැන්වල දරුවො දුක් විඳිනවා. අපේ දරුවන්ට හදල දෙන දේ කාගන්න බෑ. පුතුට කවන්න ගිහිල්ලා බැරිම තැන අම්මා එහෙම අනන්තවත් කිව්වා. මට මතක් වෙන්නෙ සගීක්......... එයාගෙ ළමා කාලෙ හරි කටුකයි කියලා එයා කිව්වා මතකයි. සගීක්ට ලස්සනට කවි සිතුවිලි පහළ වෙනවා. ඒ වගේ දේවල්වලට මම දවසක් ඇහුවාම කොහොමද කවි සිතුවිලි පහළ වෙන්න කියලා. සියලු දුක් වින්ද නිසා කියලා තමයි යන්තමට කිව්වෙ. දුක් වින්ද ගිය ආත්මෙ සැහෙන්න පව් කරලා ඇති. මං කිව්වාම ඒකට තරහා ගියා. මොකටද එහෙනම් පව්කාරයන්ට ආශ්‍රය කරන්නෙ කියලා මට ඇස්සුවා. සගීක් නපුරු වෙලා තිබුණේ එයාට විඳින්න ලැබිච්ච දුක් හින්දමයි කියලා මට හිතෙනවා.

ඒකට අපේ මහත්තයා.........පසිඳු! පින්කරපු කෙනෙක්. තරහ යන්නෙත් නෑ. මට බනින්නෙත් නෑ. මගේ දේවල් හාරා අවුස්සන්නෙත් නෑ. ඒත් මං ගැන සෝදිසියෙන් ඉන්නේ.........

''මොකෝ නිමා......... බර කල්පනාවක. ආ......... පරණ බොයි ෆ්‍රෙන්ඩ්ව මතක් වුණා නේද ? හෑ හා.........''

එයා හිනාවෙවී මා ළඟට එද්දී මට ලජ්ජා හිතුණා.

''ඔයාට කොහොමද අනුන්ගෙ හිත් දන්නා නුවණ ලැබුණේ.........?''

මං ඇහුවෙ විහිළුවට......... ඒත් එයා වෙනස් වුණා.

''එතකොට ඔයා ඇත්තටම එයා ගැන හිත හිතාද හිටියේ.........?''

මූණ පුරාම කළු වලාකුල් ඇඳගෙන එයා එහෙම අහනකොට මට දුකයි.

''අනේ නෑ.........! මං ඔයාට විහිළුවක් කළේ මම මොකටද කවුරුවත් ගැන හිත හිතා ඉන්නෙ අහවල් පිස්සුවකටයැ. මෙච්චර හොඳින් මට සලකන මහත්තයෙක් ඉද්දී.........''

එහෙම කිව්වාම එයා ඇවිත් මගේ උරහිසට අතක් දමාගත්තාම මට ලොබ හිතුණා. රාජිනිවත් වෙන කෙනෙක්

ගැන හිතන එක පව් මේ වගේ අවංක ගුණයහපත් මනුස්සයෙක්
ලැබිලා ඉද්දී........ මට එහෙම හිතුණා.

සගික් වගේ අවස්ථාවාදී පිරිමියෙක් ගැන මම මොකට හිතනවද ? මා එක්ක යාලුවෙලා ඉද්දීම එයා තවත් නාට්‍ය කරන කෙල්ලක් ඇසුරු කළා කියලා මට කිව්වෙ ප්‍රසාදි........ මට ඒක අදහන්නත් බැරි වුණා. සගික්ගෙන් වෙන් වෙලා ආව දවසට වැඩිය මම හොඳටම ඇඬුවා ඒක අහලා.

ඒත් මට පසිඳුව බඳින්න හිත හදාගන්න උදව් වුණේ හිතට ආපු ඒ ආවේගය බව මම දන්නවා. ඒත් දෛවය මට කුරිරු වුණේ නෑ. පසිඳු කියන්නෙ දාහකින් හොයා ගන්න බැරි මහත්මා ගතිගුණ තියෙන පිරිමියෙක් බව අවබෝධ වුණාට පස්සේ මගේ හිත හුඟාක්ම සැපවත් වුණා. ඇත්තටම මම පසුතැවිලි වුණා. මොන එහෙකට සගික් වගේ පිරිමියෙකුට වසඟ වෙලා. මගේ තරුණ කාලෙ එයා වෙනුවෙන් හිත බද්දට දුන්නද කියා.

හිත බද්දට දෙන කතාවට මටම හිනා. ඇත්තනෙ දූන් කාලෙ කෙල්ලන්ට තමුන්ගෙ ප්‍රේමවන්තයාට හිත සින්නක්කර දෙන්න විදිහක් නැහැනෙ. බද්දට හරි කුලියට හරි තමයි ඉතිං......... පසිඳු එක්කයි චූටි පුතා එක්කයි මම සතුටු උයනේදී හොඳටම සතුටු වුණා කිව්වොත් නිවැරදියි.

*නිමිනා සාමෝදයා - දිනපොත*
*දිනය: 1983 අප්‍රේල් 01*

මේ ලෝකේ විශ්වාස කරන්න පුළුවන් පිරිමි ඉන්නෙ දෙන්නයි. එක්කෙනෙක් ඉපදිලා නැහැ. අනෙක් කෙනා මැරිලා. ධර්මෙ ගැන මම මහමෙරකට විශ්වාසයක් තිබ්බා. (ඒත් එක අතකට අප අතරෙ ප්‍රේම සම්බන්ධයක් තිබුණෙ නැහැ නේද කියලත් හිතෙනවා.) ඒ වුණාට ඇයි එයාට ගිය තැනකින් ලියුමක් හරි කෝල් එකක් හරි එවන්න තරමට සාධාරණ වෙන්න බැරි වුණේ ? මට තියෙන එකම ප්‍රශ්නය ඒකයි. ගෙදරින් මට හොයලා තියෙන මංගල්ලෙ ගැන මගේ හිතේ ටිකක් බයත් හිතෙනවා.

එයා ලොක්කෙක්ලු වාහනයක් තියෙන.......... ඉංග්‍රීසි කතාකරන, සද්දන්ත ගෙයක් තියෙන, සද්දන්ත පිරිමි කෙනෙක්



තමා අපේ අම්මලාගෙ එකම සිහිනය. අනේ මන්දා උඳේ ඉඳන් රෑ වෙනකම්ම ඇහෙන ඒ හිතේ කැගහන, කතාකරන සද්දෙ දූන් නම් මගේ කන්වලට ඇහිලාම ඇතිවෙලා. ආපු කපුවා තේ බීලා බත් කාලා බුලත් විට සප්පායම් වෙලා කොක්හඬලලා කියන කතන්දර හොඳටෝම ඇතිවෙලා. අනේ මන්දා මගේ ජීවිතේ මෙහෙම ගිහිල්ලා කොයි කොදෙව්වක නතර වෙයිද කියලා හිතෙනවා.

මට ගැලපෙන කෙනෙක් හොයාගන්න අමාරු වෙයි. අම්මලාගේ පැහිච්ච ඔළුවලට ඒක පෙනෙන්නෙ නැති හැටි. ඉස්කෝලෙ ගිහිල්ලා උගන්නනවා ගෙදර එනවා......... ළමයි වෙනුවෙන් එක එක පාඩම් හදාගෙන යනවා. ආයෙත් එනවා එච්චරයි දූන් දහම් පාසල් ගමනත් නැති නිසා ඉරිදට වස කම්මැලියි. මට ගැලපෙන කෙල්ලෙක්වත් නැහැ. ආශ්‍රය කරන්න ගෙවල් ළඟ පවුලක. අනික අපේ අම්මලගෙ වලව් උජාරුවයි අහංකාර කමයි හින්දා කිසිම කෙනෙක් අපිව ආස්සරය කරන්න එන්නෙ නැහැ. මේක පුදුම හිරකාර ජීවිතයක්. මේකෙන් ගැලවෙන්න තියෙන එකම ක්‍රමේ තමයි විවාහ වීම. මගේ හොඳම හෙයෙළිය එහෙම කිව්වෙ ස්ටාෆ් රූම් එකේදි.

ගැලවෙයිද, කබලෙන් ලිපට වැටෙයිද මම ඇහුවෙ හිනා වෙවී. ඇත්ත තමයි ඕනම ගෑනු ළමයෙක් මේ දෙගිඩියාවෙන් පෙලෙනවා. ඒ පෙලිල්ල ඉවර වෙන්නෙ ඉතින් මඟුල් පෝරුව උඩදිවත්......... මංගල යහනේදීවත් කොතැනකදි වත් නොවෙයි. දෙමාපිය, නෑදෑ, යාලුමිත්‍ර සනුහරෙන් මිදිලා එකම වහල යට දෙන්නා තනිවුණු වෙලාවෙදියි කියලා ඇය කිව්වාම මට හීන් දාඩිය දැම්මා. ආදරේ කරලා දැනහඳුනාගෙන නම් කමක් නෑ. කින්ද මන්ද මොකවත් නොදන්න පිටස්තර පිරිමියෙක් ඇඟට අත තියන්න එනකොට මට නම් හිතාගන්නත් අමාරුයි එහෙම අවස්ථාවක්.

කොහොම වුණත් නවම මම ඒ ගැන හිතනවා........ හොඳින් රස්සාව කරන එක යුතුකමක් කරගත්තාම ඉරුකමේ වගකීම එහෙමම රැගෙනවා කියලා මට හිතෙනවා. ගුරුවරයා තමයි ලෝකය හදන්නේ. ලෝකෙ ඕනෑම ලොක්කෙක් වුණත් කවුරු හෝ ගුරුවරයෙකුගෙ ගෝලයෙක්........ ලෝකයේම උත්තම

වෘත්තිය ගුරුකම. ඒකෙ ආය කතා දෙකක් නෑ. මම වෘත්තියේ ගාම්භීරකම ගැන හිතලා උනන්දුවෙන් පාසලේ දෛනික කටයුතු කරනවා. ළමයින්ගෙ බාහිර ක්‍රියාකාරකම් වලට උදව් වෙනවා. දැනුම මිනුම තරඟ, චිත්‍ර තරඟ, වගේම ක්‍රීඩා තරඟවලට ඉදිරිපත් වීම දිරිගන්නනවා.

ඒ ඔක්කොම කරන්නේ මගේ මානසික තෘප්තියත් පෙරදැරි කරගෙන. එතකොට ජීවිතේ හරිම සැහැල්ලුයි. මම කැමති ධර්මේ වගේ ගුරුවරයෙක් මගේ සහකාරයා විදියට ලැබෙනවානම් ඒක මම ඉතිං හිතින් කෙඳිරුවාට වැඩක් ඇත්ද. දවස පුරාම අපේ ගෙදර දෝංකාර දෙන්නේ මට කතාකරලා තියෙන මනමාලයාගෙ පවිටන්දරේ........ එයා හොඳ සමාජගත පුද්ගලයෙක්ලු. දැනටමත් නමක් තියෙනවලු. ඉදිරියේදී රටේ නම පතලවෙන කෙනෙක්ලු........ අනේ මන්දා........

සහෘදා ශ්‍රීකුමාල - දිනපොත
දිනය: 1983 අප්‍රේල් 09

* * *

සමන්තාත් මාත් දෙහිවල පිහිටි අප නැගණියගේ නිවසට ගියේ උදේ පාන්දරමය. හෝටලය වෙත යාම සඳහාද පිටත්වෙන වෙලාවක් හදා තිබුණි. නිවසට රැස්ව සිටි ළඟම ඥාති සමූහයා මා දුක හෙලන තුටු පහටු බැල්ම හා ගෞරව පූරස්පර බව මසිත සතුටක් ජනනය කරවයි.

හැම මුහුණකම තැවරී ඇත්තේ සතුටේ ප්‍රහර්ෂයේ වත්සුණුය.

"ආ........ අයියා කලින්ම ආපු එක අපට ලොකු හයියක්. ජෝඩුව හෝටලේට එන්න පැයකට කලින්වත් අපි එතනට යන්න ඕනනේ." නංගී මාව පිළිගත්තේ සමන්තාව සිප වැළඳ ගනිමින්.

මුහුණු පිරියම් කර වත්සුණු ගල්වා චාම් කොණ්ඩා මෝස්තරයකින් සැරසී සිටි නංගි ගේ මුහුණ කවදාවත් නැති තරම් සතුටකින් පිරිපුන්ය. මස්සිනාද කවියකු මෙන් එහෙ මෙහෙ



දුවමින් වයි කෝට් සූදානම් කරයි. මේ ඔවුන්ගේ එකම දුවගේ විවාහ මංගල්‍යයයි. මට මේ අත්දැකීම ලැබුණේ මීට අවුරුදු ගණනකට පෙරදීය. දුවගේ මංගල්‍යය කෙසේ වෙතත් පුතාගේ මංගල්‍යය මගේ සිත බෙහෙවින්ම සසල කළ දෙයක් වූ හැටි මතකය.

ඒ කාරණය සම්බන්ධයෙන් ඔහු සාහසිකයකු ලෙස හැසිරුණේ ඇත්තටම මා ඊටත් වඩා දාමරිකයෙකු වූ නිසාද ?

"රංජිත් අයියා........ අපි යමුද එහෙනම්........"

මස්සිනා බන්දුලගේ හඬින් මම පියවි ලෝකයට එන්නේ තිගැස්සෙමිනි. සමන්තා මා දිහා බලා සිටින්නේ අමුතු විදියටය. අපි හැමෝම නොසිතන අවස්ථාවකදී මම තමන්ගේ සිත නමැති ඉබිකටුව තුළට හිස දමාගැනීමට සූදානමින් සිටින ඉබ්බෙක් මෙන්ය. ඉබ්බා කටුව තුළට හිස සහ අතපය රුවාගන්නේ කිසියම් ආපදාවක් සිදුවෙතැයි ලැබෙන සංඥාවල් අනුවය. එහෙත් මිනිස් සිතට එවැනි සංඥා බාහිරව අවශ්‍ය නැත. මිනිස් සිතට ඒ සංඥා ලැබෙන්නේ අභ්‍යන්තර හෘද සාක්ෂියෙන් යැයි මට සිතෙයි.

හෝටලය කරා ගොස් කටයුතු පිළියෙල වන අතරතුරදීත් මට මතක් වන්නේ පුතාගේ විවාහයමය.

ටික වේලාවකින් මංගල බෙර හඬ මධ්‍යයේ මනාලියගේ ප්‍රවේශයත් ඊට මොහොතකට පසුව එවැනිම පෙරහැරකින් මනාලයාගේ ප්‍රවේශයත් සිදු වෙයි. මනාලයා පසුපසින් එන ඥාති මිත්‍ර සමූහයා මට පෙනෙන්නේ සෙන්පතියකු පිටුපසින් එන හේවා බල ඇණියක් ලෙසිනි. එය සතුරු සේනා බල ඇණියක්ද ?

"ඔන්න ඔයා දැන් ලෑස්තිවෙන්න දුවව පෝරුවට නග්ගන්න. පෝරු මහත්තයා කිව්වාම."

සමන්තා මට ඇණ දෙයි. මා වටපිට බල බලා අන්දමන්ද වී සිට ආ කාර්ය අමතක කරාවිදැයි ඈ බිය වන සෙයකි. මට අමතකවීම සිදු කරන්නට ඉඩ නොදීමට ඇය කල්තියා කාගෙන් හෝ මුදල් අය කරගෙන ඇතිවාක් මෙනි. හරියට මම සිත් පිත් නැති රොබෝ කෙනෙකැයි සිතා ඇතිවාක් මෙනි.

නින්දෙන් ඇවිදිනවාට පිළියමක් ලෙස [illegible]

ඇවිදිනවාට දමනවා සේ මගේ කාල්පනික චිත්තය එහෙ මෙහෙ ඇය සූදානම් කරන්නේ ඇගේ මනිමතාන්තර නමැති නෙත ගෝනි පඩංගුය.

'හොඳයි දූන් සූදානම් වන්න මනාල මහත්මිය පෝරුවට නැග්ගීම සඳහා එතුමියගේ මාමා ඇයව කැඳවාගෙන ඒමේ අවස්ථාව.' මම වහා දියණිය කරා යමි. ඈ ඇගේ වම් අතින් මගේ දකුණු බාහුව අල්ලා ගෙන මා ඇයව පෝරුව ළඟට හැරලවන අවස්ථාව. ඊළඟට මට ඇසෙන්නේ ජයමංගල ගී නාදයයි. ඊට එහායින් ඇසෙන්නේ හිත මිතුරු ඥාති පරම්පරාවේ සතුටු සාමීචි කතා බහ ........ ඊට පසුව සංගීත රාවය......... තේක් සුවඳ......... සුවඳ විලවුන් අභිබවා නැඟෙන ආහාර සුවඳ.........යළිත් කන් බිහිරි කරවන සංගීත නාදය......... මගේ හිසේ සිට ගලා එන ඩහදිය සීරුවෙන් දෙකන් අතරින් වැස්සේ. උරිස් දෙපැත්තෙන්ද රස්නයක් දනෙයි. ටයිකෝට් හැඳගෙන බොහෝම සතුටු සයුරේ ගිලෙමින් සිටින අය වායුසමීකරණය කළ හෝටලය තුළ සිටින්නේ තවුතිසාවක සිටින තරමේ සැහැල්ලුවෙනි.

ඔවුන්ගේ සැහැල්ලුව මට නදින්ම දනෙන්නේ මා සිටින්නේ සැහැල්ලුවෙන් නොවන නිසාදැයි නොදන්නෙමි. ළයට තද වෙන්නට හැට්ටා ඇඳගෙන ඉනේ සිට විහිදෙන පුම්බන ලද සායවල් ඇඳගත් අඟනුන් මතක් කරවා දෙන්නට හදන්නේ හැරණී කවිපද දෙකමය.

සිසිවන උවන ඉඟ සුග ගන හැක මිටින
නිසි පුලුළුකුල.........

මම වහා හෝටල් අංගනය කරා යන්නේ හුස්ම ටිකක් සැහැල්ලුවට ගැනීම සඳහාය. මගේ සිත බරවෙලාය......... සිරුරද අනිවාර්යයෙන්ම බර වෙලාය. මගේ බර කිරා බැලුවොත් මේ ශාලාවට එන විට තිබූ බර මෙන් දෙගුණයක් වෙලාය.

උන්හිටිගමන්ම වෙස්ට් කෝට්, කෝට්, කලිසම්, ටයි ගලවා දමා උඩට අහිලෙන්නට උවමනාවක් සිතට එයි.

''ඩාර්ලින්......... ඔං මේ බැලුවා ඔයා කොහේද කියලා.........''

''ඔයාට ඩාදිය දාලා නේද......... ඇඟම සීතල වෙලා.''

මට සමන්තා ගැන ඇති වන්නේ පුදුමාකාර ශෝන්තියක්.



තමන්ගේ ස්වාමියාගේ රෝග ලක්‍ෂණ මුළු ලෝකෙටම හඬගා කියන්නට ඇයට පිස්සුද ?

''නැනුගහා ඉන්න මෙයා......... මට ඇති අමාරුවක් නෑ.........
මේ වෙස්ට් කෝට් එක ටිකක් ඇඟට හිරයි.........''

සමන්තා හිනාවක් දාගෙන මගෙන් ඉවත් වන්නේ සතුටින්ය. මගේ හිතත් යාලුමිතුරන් අතරේ සැහැල්ලු තැනක් හොයාගෙන ඇවිදියි. මධුපාන වටමේස රෝස වනාන්තරයේ දූන් ඉතින් අපි මනුෂ්‍යන් සහ සමනලුන් මිස වෙන කවුරුන්දැයි දන්නේ නැත.

සුවඳ හුයාමයක් කාලයෙන් මනින්නට බැරිය. තත්පර කටු, විනාඩි කටු, හෝ පැය කටු පියවි ඇසට පෙනෙන්නේ නැත. තත්පර කටුවේ රැඩිකල් විලාශය මිනිත්තු කටුවට අවමානයක් නොවේ. පැය කටුව බිම බලාගෙන උපාසක ලීලාවක් මවාගෙන යයි.

සියල්ලේම කෙළවර කුමක්ද ?

සියලු දේම වයස්ගත වීම පමණි. වයස්ගත නොවී තරුණ කාලයේම සිටියානම් ඇත්තටම සිත මීට වඩා සුන්දරය. ආදරය සුන්දරව දනෙන අනුරාගී යොවුන් වියට ආදරය නොකරන අය සිටිනවාද නොදන්නෙමි.

''දූන් ගෙදර ඇවිල්ලත් පැය බාගයක් වෙනවා තාම නෑ ඔයා චේන්ජ් කරලාවත්......... ඇයි කෑම හරි මදිද......... එහේ......... කෝපි එකක්වත් ඕනද බොන්න.........'' සමන්තාගේ හඬ මා හිනස්සවන්නේ පුරුද්දටය.

''පිස්සුද සමන්තා මම බඩ පිරෙන්න කෑවා බිව්වා......... මට දූන් මහන්සියි නිදිමතයි තියෙන්නේ. ඔයා දොරවල් වහලා නිදාගන්න. මම ටිකකින් නිදාගන්නම් කෝ.........''

සමන්තා එතනින් ගිය විගස මම මගේ ලියන කාමරයට යමි. ලියන කාමරයේ ලියන මේසයට අමතරව ඇති කුඩා ඇඳ මම කැමතිම ගෘහ භාණ්ඩයක්.

ඒ නිදාගැන්මට නොවේ. හාන්සිවී ඇස් පියාගෙන කල්පනා කරන්නටය. මගේ මනෝ ලෝකයට යන්නටය. මම නැවත මගේ දිනපොත් ලෝකයට යමි.

*

* *

අද මට තේරුණා මම පත්වෙලා ඉන්න හැබෑම තත්වෙ......... දෙයියනේ ගිම්හාන්ගෙ චරපුරුෂයො මාව කොටුකර ගත්තා. මෙතෙක් දවස් මම සගික් එක්ක කරපු නාඩගම් ඔක්කෝම එළි කරගෙන ඒවා කියනකොට මට හිතුණේ පොළොව පලාගෙන යන්න. ගිම්හාන් වන මෘගයෙක් වගේ මට කඩා පැන්නා. මගේ කම්මුලට ගැහුවා. මට කෑගැහුවා. මට හොඳටම තරහ ගියා. මට හොඳටම බැණ වැදුණා.

කාමරේදී මම ගිම්හාන්ගෙ කනේ ඇඟිලි ගහගන්න කිව්වා.........

''ඔයාගෙ දුර්වලකම් වහගන්න ඕනැවට ඔයා මට අපහාස කරන්න එන්න එපා ගිම්හාන්......... ඔයාගේ දුර්වලකම් නිසා මේ ඔක්කොම දේවල් සිද්ධ වුණේ කියලා ඔයා පිළිගන්න ඕනෑ........''

ඒ ටික කිව්වා විතරයි හුලං බැස්සා වගේ......... ගිම්හාන් නිහඬ වුණා. වන මෘග පිරිමියෙක් මෙල්ල කරන්න තියෙන හොඳම ආයුදේ ඒකද මන්දා........

''කරුණාකරලා මාව ඩිවෝස් කරලා දාන්න.''

මම කිව්වෙ දෙපාරකට හිතල නෙමේ. අම්මලා ඔහ කුදයක් ගහගත්ත දෙන්. මට තරහටම එහෙම හිතුණා. එක එක්කෙනාව සතුටු කරන්න මං මොකටද මගේ ජීවිතේ පූජා කරන්නෙ.

ඒත් මගේ සිතිවිල්ල එහෙමම අපතෙ ගියේ ගිම්හාන්ගෙ කර්කශ වචන ඇහිලා.

''ඩිවෝස් කරන්න? නෑ මං තමුසෙව ඩිවෝස් කරන්නෙ. අද ඉඳන් තමුසෙට නාට්‍ය මඟුල්, සිංදු කීම් ඔක්කොම තහනම්. ඉන්න එකයි ඇත්තෙ සදහටම මළ බෙරේ ගහ ගහා''

ගිම්හාන් ඇත්තටම අමනයෙක් බව මට අද තමා හොඳටම තේරුම් ගියෙ........ දෙයියනේ මේ මිනිහත් එක්ක ඉඳලා මට ඇති සෙතේ මොකක්ද ඇත්තට........ යන්නෙ නෑ මීට පස්සෙ මම මිනිහගෙ භාර්යාව විදිහට මඟුල් ගෙවල්වලට පාටිවලට ජෝඩු දාලා........ හොඳ වැඩක් මමත් කරන්නම්කො.

මම මගේ සිතුවිලි සේනාව එක්තැන් කරගත්තා. ක්‍රෝධයෙන් වෛරයෙන් මගේ හිත පිරිල නිසා. ඒ එක්කම මගේ මුළු ශරීරයම



අඩපණ වෙලා වගේ ඔළුවත් පිස්සු වාගේ වුණා. ඔක්කොටම වඩා මට වේදනාව සගික් මාව මග අරින්න හිතාගෙන කියාපු කරපු දේවල්මයි. ගිම්හාන්ගෙ චර පුරුෂයො අපි පස්සේ එනවා කිව්වේ එයාටත් මොකක් හරි බලපෑමක් වෙලාද දන්නෙ නෑ. ඒ වුණාට ඒ මොන බලපෑම් ආවත් එයා මට ආදරේ නම් මා පස්සේ එන්න එපායැ.

රාඩියක් පර සතුරො ආවත්
නෑ සියන් පිරිවරාලා
ලී-සියක් මල් පුබුදුවන්නම්
ප්‍රේමයෙන් සනසවාලා........

ඒ තමා සගික් මට ලියූ පෙම් කවි. කවි වල තියෙන ඒවා කොහේද හැබෑ ජීවිතේදී. අනික එයා මට ප්‍රේම කරලා තියෙන්නෙත් අර තිම්නා ද මොකක්ද කියන ගෑනිට ආදරේ කරන ගමන්. මගේ හිත ඇතුළෙ ආයෙ වෛරයක් ගොඩනැගිලා. ඒක මුළු සමාජයටම කෙරෙන වෛරයක්ද මන්දා.

තිම්නා මගේ හැතිරී......... ගිම්හාන් මගේ සතුරා. මගේ හිත මැතිරුවා. මගේ දෙකකුල් පණ නැති වෙලා මොකක් හරි අසනීපයක් හැදිගෙන එනවා වගේ තේරෙනවා. නෑ මම මැරෙන්නෙ නෑ. ගිම්හාන් මට කරපු අපරාදෙ පළිය මම ගන්නවා. හැබැයි සගික්ටත් මං ඉඩ දෙන්නෙ නෑ. වෙන කාට හරි ආදරේ කරන්න. දැන් මගේ හිත වන මෘගයෙක් වගේ වෙලා මටම තේරෙනවා. ඒත් මට කරන්න දෙයක් නෑ.

මනෝරමා නාගසේන - (ඇලහේපොළුම)

*දිනය: 1983 අප්‍රේල් 11*

නමින් තිසලා වුණාට එයා බොහොම සසලයි. හැම තිස්සෙම එහෙ මෙහෙ යමක් හොයා ඇවිදින ඇස්........ යමකිසි දෙයක් නොකියා කියන තොල්........

මතා නටා නැටවෙන ඇස් බැම........
ඉඟි බිඟි තර කර පැද්දෙන පුළුල් නිකට........

නිසලා අදින්නෙ හරිම කෙටි ඇඳුම්

ඉස්සර කවියො ගෑනුන්ව වර්ණනා කරපු මෝඩ උපමා මොනවාද කියලා හිතෙනවා. පුළුළුකුල කරත්ත රෝදයක් වගේ වුණා නම් ඒකෙ තියෙන ලාලිත්‍යය මොකක්ද ? අනිත් එක සිසිවත උවන කවිය ලියපු කවියාට ටිකක් ඔල්මාදෙත් තියෙන්න ඇති. නැත්නම් එකම ප්‍රාණවාචී දේක තියෙන අවයව විග්‍රහ කරන්න අප්‍රාණවාචී සහ ප්‍රාණවාචී උපමා දෙවර්ගයක් යොදුවෙ ඇයි. එයාගෙ අපූරු කවිකම........ මූණට - සඳ, ඉණ - මිටින් ගන්න පුළුවන් බව, පුළුල් උකුල - කරත්ත රෝදය, පියයුරු - හංසයන්! හරිම නොගැලපීමක්. අනිවෙ දුක්කේ......... හැබැයි ඒ වගේ දුර්වල කවිම තමා අද වෙනකම් අපේ මිනිස්සු කලුමර මර වණන්නෙ. මම ලිව්වොත් එහෙම නෙවෙයි ලියන්නෙ.

ළමැද යන එන ගමන සසලාය
පුලුලුකුල එහෙ මෙහෙට ඇසලාය
දඟසුගල තුන් සිතම වටලාය
සසල කළ මහද ඇය නිසලාය

මෙ කවිය ලියලා නිසලාට දුන්නා ෆයිල් එකකට යටින් තියලා. මම බලා හිටියා ඇගේ මූණ දිහා. මේක්අප් තට්ටුවක් දාලා ඉන්න නිසා මම හිතුවා ඇගේ මූණෙ හැඟීම් මට කියවන්න බැරි වෙයි කියලා. ඒත් ඉතා සියුම් විදියට ඇගේ මූණෙ හැඟීම සසල වුණා මට පෙනුණා. ඈ ලජ්ජාවෙන් ඇඹරුණා. මා දිහාට දුම්මෙ ලස්සන බැල්මක්.

"හරි......... නරකයි......... සර්........."

මං ඇට කියලා දුන්නා මට සර් කියන්න එපා කියලා. ජැන්ඩි පහට අඳින පළඳින සෑහෙන වත් පෝසත් කම් ඇති කුරුඳුවත්තෙ පදිංචි නිසලා වැඩට ආවෙ සල්ලි නැති කමකට නෙමෙයි. ගෙදර ඉන්න කම්මැලි නිසා.

මට ඈ ගැන ඈ හඳුන්වලා දුන්නෙ ඒ විදියට.

නිසලා මට හුඟක් ආදරේ බව මට තේරුණා. මගේ හිතත් දුන් නිදහස්. ඉතින් මටත් බැරිකමක් නෑ නිසලාට ආදරේ කරන්න.



අනික වියදම් කරන්න නෙමේ......... වීසි කරන්න වුණත් නිසලාට සල්ලි තියෙනවා.

නිසලා කාර්යාලයට ආවේ බස් එකෙන්.

"ගෙදර වාහනයක් තියාගෙන මොකටද බස් එකේ එන්නෙ........." මම එහෙම ඇහුවම නිසලාට හිනා.

වාහනේකින් ඇවිල්ලා කොහොමද සයික් සමාජෙ ගැන යම් යම් දේවල් ඉගෙන ගන්නෙ.........?"

වානෙන් හැදූ වාහනයක් ඇතුළට වෙලා කවරයක් දාපු ඉටි බෝනික්කෙක් වෙන්න මට කොහොමටවත් බෑ. ඔයා දන්නවනේ මේ රස්සාවට වුණත් මම ආවෙ ආර්ථික වාසියකට නෙමේ. මානසික සැනසීමට. ගෙදර හිර වෙලා ඉන්නවාට වඩා මොන තරම් හොඳද මෙහෙට එන එක.

නිසලා එහෙම කියද්දී මට කියන්න උත්තරයක් නැති වුණා. ඈ හරියට අහසින් කඩා වැටිච්ච ග්‍රහලෝකෙක කෙනෙක් වගෙයි මට හිතුණෙ. එච්චරට අමුතු අදහස්. ඒ මදිවාට ඈ සමාජශාලා ජීවිතේට අසීමිත විදිහට ඇබ්බැහි වෙලා. ඇත්තටම මම ඒකට කැමති වුණේ නෑ.

"ඔයාට බැරිනම් ඔය ක්ලබ් ජීවිතෙන් මිදෙන්න......... මමත් නෑ කියලා හිතාගන්න එහෙනම් හෙට ඉඳලා........!"

මගේ නියෝගයට කෙල්ල මෙල්ල වුණා. මගේ අහසට ආව අලුත්ම හඳ......... නිසලා......... ඔයානම් මේ ගිනිදන කතරේ සීතල සඳ එළියක්ම තමයි.

*සගීක් උදාකර - දිනපොත*
*දිනය 1983 අප්‍රේල් 11*

යෝජනා මාර්ගයෙන් කසාද බැඳලා ජීවිතේ අවුල් කරගත්ත අය ගැන මම සෙවිල්ලක් කළා. මගේ යාලුවා සෙවිල්ලක් කළා ප්‍රේම සම්බන්ධතාවලින් බැඳලා ගුටිකෙළ ගන්නා ගමන් පවුල් කන අය ගැන. අනේ දෙවියනේ බලාගෙන ගියාම යෝජනාවලින් බැඳපු සියේට පනහක් සාර්ථකයි. ප්‍රේම සම්බන්ධතාවලින් බැඳුණු අය සියයට දහයයි සාර්ථක. ඔන්න සමීක්ෂණේ.

මගේ යාලුවා වාගා බොහොම සතුටින් මේ සමීක්ෂණ

වාර්තාව අපේ අම්මලාට ඉදිරිපත් කරන්න දුවගෙන ආවා. එයත් හරිම උනන්දුයි උදාකර ගැන මට ආපු යෝජනාවට.

හොඳට කාලා ඇඳලා ජැන්ඩි පහට ඉන්නත් ජනප්‍රිය තොරණ යට බැබළෙන්නත් පුළුවන්නේ යස අපූරුවට. ඉද හිටලා පත්තරේකින් රේඩියෝ එකකින් අවට ලෝකයට පෙනී ඉන්නත් බැරියැ. චාපාට ඉතින් ඔවා රජ මඟුල්. මට නම් කිසිම දැනීමක් හැඟීමක් නෑ. අපේ තව හොඳම යාලුවෙක් මඟුල් කාලා මාස හතරකින් දික්කසාදෙටත් ගිහින් තිබුණු වෙලාවෙ මගේ හිත නම් කීවෙම මඟුල් නම් අරහං කියලා.

“උඹ ඔහොම කියන්නෙ නැතිව ටිකක් එයාගෙ පිංතූරේ එහෙම බලලා කතාකරපං........ සබී........”

චාපා එහෙම කියලා ගවුම් සාක්කුවෙ දාගෙන හිටපු ෆොටෝ එකක් මට දික්කලා! මං බලාගෙනයි අම්මෙත් හිනාවෙලා ගෙට ගියා. ෆොටෝ එක දැක්ක මගේ මූණෙ මල් හතක් පිපුණා වගේ මට දැනුණා. මට එහෙම දැනුණා නම් එයාටත් ඒ වග හොඳට ජේන්න ඇති. මං එහෙම හිතලා ඔලුව උස්සනකොට අම්මලා තාත්තලා ඔක්කොම මා ඉදිරියේ. දැන් මොකද කියන්නේ........ මං හිතන්නෙ ඒ අභියෝගය තමා එයාලා හැම දෙනාගෙම ඇස්වල ලියැවිලා තිබුණේ. මම නම් කවදාවත් හිතුවෙ නෑ ‘උදාකර’ලා ‘උදාකරලා’ කිව්වට මේ තරම් කඩවසම් කෙනෙක් ඒ පවුලෙ ඇති කියලා. මට ටිකක් ලජ්ජා හිතුණා. මම කවදත් පිරිමි උදවිය ගැන ඒ හැටි උනන්දුවක් තියෙන කෙනෙක් නෙමෙ කියලා හැමෝමත් දන්නවා. මගේ ඒ පිරිමි උනන්දුව හීන කරන්නත් බොහෝ කාරණා තිබුණා. ඒවා මගේ යාලුවන්ගේ අත්දැකීම් උඩ මම ලබාගන්න පරිචය කියලයි මම හිතන්නෙ. පිරිමින්ගේ බොරුකාරකම්, රැවටිලි වගේම කාමුක චේතනාවල පාලනයක් නැතිකම මම යෙහෙළියන්ගේ ජීවිත කතා ඔස්සේ දැන ඉගෙනගෙන තියෙන දේවල්.

ඒවා ගැන මම දන්නා තරම් අම්මලාවත් දන්නේ නැතිව ඇති කියලා මට හිතුණේ දවසක් ඒ වගේ සිද්ධියක් මම අම්මාට විස්තර කරද්දී අම්මා ඇස් උඩ තියාගෙන බලාගෙන හිටපු ආකාරය දැකලා. එක අතකින් පව් අම්මලා........ නැලිලා



පොඩිවෙලා නැහැ. මේ සමාජයේ මොනතරම් විෂමාචාර දේවල් සිද්ධ වෙනවාද කියලා අම්මලා තාමත් දන්නෙ නැහැ.

කොහොම හරි මං කියූ දේවල් අහගෙන ඉඳලා අම්මා තාත්තා ළඟට ගිහිල්ලා කියූ දේ මට මගේ කන් දෙකටම ඇහුණා.

“දූ දැන් හොඳටම නරක් වෙලා. යාලුවො ආස්සරේ කරලා........”

මට තනියම හිනා. අම්මා ගිහින් සැනසෙන්න ඇති හොඳ වෙලාවට මම කැම්පස් නොගියේ කියලා කැම්පස් ගියානම් මීට වඩා දේවල් මම ඉගෙන ගනීවී කියලා සහතිකේටම හිතන්න ඇති........ පව් අම්මා........ තාත්තාගේ කුල ගෙදර ඇතුලෙ අම්මා සැනසිල්ලෙ ජීවත් වෙනවා. අම්මට තාත්තා ගැන සැක සංකා නෑ. ඒ තාත්තා ගැන නරක ආරංචියක් කොහෙන්වත් අම්මට ඇවිල්ලා නැති නිසා. නැතුව තාත්තා නරක කෙනෙක් නොවන නිසා නෙමෙයි. ච්........ මම මේ මොනවද හිතන්නෙ........ තමුන්ගෙ තාත්තාවත් විශ්වාස කරන්නෙ නැති තරුම කෙල්ලෙක් ගානට මාවත් වැටිලද මන්දා. නෑ........ මට එහෙම හිතවන්නෙ සමාජයේ අහක යන දේවල්වලින් පැරිච්ච මගේ හිත වෙන්න ඇති. එහෙම හිතන එක පව් කියලා මට හිතවන්නෙ මං ලබපු දහම් ආභාෂය දහම් පාසල් ආශ්‍රය තුළින් ඉගෙන ගත්තු සදාචාර සම්පන්න මානසික පරිසරය.

සැකය කියන්නෙ අවිද්‍යාව මම ඒක දන්නවා. ඒත් සැක කරන්න පුළුවන් වීමත් හැකියාවත් තිබීමත් විද්‍යාවේම අංගයක් නේද කියලා මටම හිතෙනවා. ඔලුව පාත් කරගෙන හිටමනේ උඩ වාඩිවෙලා, පොල් ගාන ගෙදර ගෑනි. ඔලුව පාත් කරගෙන පිටි කොටන, වී කොටන ගෙදර ගෑනි. හැමදාම පිරිමින්ගෙ නොපනත්කම් ඉදිරියෙ ඔලුව පාත් කරගෙන ඉඳිවී කියලයි පිරිමි හිතනවා ඇත්තේ.

අන්තිමට ගෑනිට වෙන්නෙත් ඒ පාත් කරගත්ත හිස මහ පොළොවෙම ගහගත්ත තමයි. පිරිමියා තමාව රවටලා කියලා දැනුනාම! අපේ තාත්තා හොඳ තාත්තා කෙනෙක්. ගෙදර දොරට දරුවන්ට තමුන්ගෙ බිරිඳට යුතුකම් ඉෂ්ට කරනවා. ඒක අපේ

ගේ ඇතුලෙ ඉඳන් අපිට පේන දර්ශනයක්. ඒත් පිටට ගිහින් බැලුවාම තමයි තාත්තගේ පිටස්තර ජීවිතේ ගැන සමාජගත ජීවිතේ ගැන කියන්න පුලුවන් කමක් තියෙන්නෙ. ඒත් කවුද ඉතිං පිටට ගිහිල්ලා ඕවා ගැන දකින කෙනෙක් ඉන්නෙ. මොකෝ නැදෑයෙක් මිත්‍රයෙක් ඕවා කියයිද ? මට මතක් වෙන්නෙ අපේ නමයෙ පංතියෙ හිටපු වජීරා........ වජීරාව ඉස්කෝලෙට එක්කරං එන්නෙ එයාගෙ තාත්තා........ තාත්තාගේ කාර් එකේ........ ඉස්කෝලෙ ඇරිලත් වජීරා ඉන්නවා තාත්තගෙ කාර් එක එනකම්. වජීරා කවදාවත් බස්වලට රස්තියාදු වුණේ නැහැ. ඒ වුණාට දවසක් වජීරලාගේ ගෙවල් ළඟ ඉන්න සමුද්‍රා කියාපු කතාවෙන් අපි යාලුවෝ රොත්තම අන්ද මන්ද වුණා එයා කිව්වෙ වජීරගෙ තාත්තාට මාලඹෙ පැත්තෙ තව පවුලක් ඉන්නවා කියලා!

අපෝ........ මං නම් මේ ලෝකෙ කිසිම පිරිමියෙක් විශ්වාස කරන්නෙ නෑ. මං එහෙම කිව්වෙ වජීරගෙ තාත්තා සමහර දාට පාසල් විවේකයේදී ඉස්කෝලෙට ආවාම අපි යාලුවෝ කල්ලියටම පොප්සිකල් අරන් දෙන හැටි මතක් වෙලා බඩ පපුව දාලා ගිය නිසා. ඇත්තටම ඒ වෙලාවලට අපිට හිතුනෙ ලෝකෙ ඉන්න හොඳම තාත්තා වජීරගෙ තාත්තා කියලා! වජීරා කිව්වෙත් එහෙම තමයි. ඒ වුණාට ඒ තාත්තාම තව දරු පවුලකට ලෝකෙ ඉන්න හොඳම තාත්තා වෙලාතෙ. මම මොන එහෙකට මේ තරමට අතීත ආවර්ජනේට යනවද මන්දා. ඒත් මම දැකපු අර පිංතූරෙ නම්........ හිත ඇතුලෙම ඇඳිලා ගියා.

*සඳා මුතුමාල - දිනපොත*
*දිනය: 1983 අප්‍රේල් 12*

රස්සාවෙන් හොඳ පැත්තකට එන්න පුළුවන් වුණාම මං ගැන වැඩිය ගණන් ගත්තෙ නැතිව හිටපු අම්මත් මගේ පැත්තට හැරෙන්න ගත්තා හරිම පුදුම විදිහට. ඒ එක්කම අම්මගෙ මල්ලි කෙනෙක් හිටියා බැඳපු නැති. එයත් අපේ ගෙදරට ගාල් වුණා.

අපේ පරණ ගේ බිඳලා දාලා ඒ පාරේම ලොකු තට්ටු දෙකේ ගෙයක් මට ගන්න පුළුවන් වුණේ වාසනාවට. අම්මගෙ මූණේ හැබෑම හිනාවක් මං දැක්කෙ එදා.



ඒත් අම්මගෙ තරුණ කාලෙදි එහෙම හිනාවක් මූණේ පැන්න පළාතකවත් තිබුණේ නැහැ. අම්මයි තාත්තයි මරා ගන්නවා බලා ඉඳලා අපේ මූණුවලත් කවදාවත් ඉතිං හිනා කොයින්ද ? මම යම් තැනකට ආවට පස්සෙ ඈත් වෙලා හිටපු අපේ ළඟ නෑදෑයො හොඳටම ළං වුණා. අම්මා ඒකෙනුත් පුදුම විදියට සතුටක් වින්දා. අර මිනිහටත් යසට ඉන්න තිබුණා නෙ අපිත් එක්ක. කොහෙද මනමාල විසේ ඉහට ගහලා ගියා මිසක් මේ පොඩි අයයි මායි කන්න අඳින්න හොයාගන්නෙ කොහොමද කියලවත් බලපු එකක්යැ. ඔන්න ඔහෙ හොඳ වැඩේ එක්කො තරුණු අඩු පටිසන් දෙන්නත් එපායැ.

ආයෙත් අම්මාම එහෙම කියනවා. අම්මාගෙ හිතේ තාත්තා ගැන තියෙන්නෙ වෛරයකට වඩා කලකිරීම මං හිතන්නෙ. ඒ වෛරයෙවත් කලකිරීමෙවත් පාට මොකක්ද කියලා මට තේරුණේ නැහැ ඒ කාලෙදී! මේ කාලෙදී මට ඒ පාට ටිකක් තේරෙනවා වගේ මට හිතෙනවා.

උණක් හෙම්බිරිස්සාවක් විතරක් නෙවි, බඩ ගින්නක් තදේට දැනුනාමවත් කියන්න කෙනෙක් නැතිව හිටපු මට........ පාරෙ ඇවිදින හිඟන කොල්ලෙක් වගේ කුණු බක්කියක් හරි පෙරළාගෙන කන්න සිතුණු ළමා කාලයක් තිබුණු මට........ හරි පුදුමයි. දැන් කාගෙත් සැලකිලි ලැබිලා රජෙක් වගේ ඉන්න සිද්ද වුණු එකට.

අම්මා වෙනදා ඇඳන් හිටපු ගොමස්කඩ රෙදි ඔක්කොම පුච්චලා දාලා ගෙදරට ඔසරි අඳින්න පටන් ගත්ත එක හොඳයි. 'උදාකරලා' හොඳ වැඳගත් මිනිස්සු...! කපුවෝ එහෙ මෙහේ ගිහින් ගිරව් වගේ එහෙම කියන බව අම්මා මට කිව්වා. අයියෝ ඉතිං ඔය කපු කටවල්වලින් මොනවා කියන්න බැරිද ...? මං එහෙම කිව්වට අම්මා හිනාවෙලා තොල්වලට ඇඟිල්ල තියලා අනතුරු අඟවනවා. මාමාත් හොඳ පිරිසිදු ඇඳුම් ඇඳගෙන පත්තර ටික එහාට මෙහාට පෙරල පෙරලා ඉඳලා කෑම කනවා. තේ බොනවා. කලට වේලාවට සැප ඇඳක නිදියනවා.

මාමා තමයි කඩේ පිලේ යන වැඩ, ගේට්ටුව අරින වහන වැඩ ඒ වගේම මුරකාරකම කරන්නෙත්. මාසෙ අන්තිමට එයාගෙ අතටත් කීයක් හරි දෙන්න කියලා අම්මා මට කිව්වෙ කනකොඳුරා

කැක්කුමට වෙන්න ඇති. නැත්නම් ඉහිං කන්න ඇදින්නයි ඉන්න හිටින්නයි දීලා තියෙද්දී ආයෙ මොකටද පඩියක්.........

''හොඳ තැන් කීපයකින්ම පුතාට යෝජනාවල් ඇවිල්ලා තියෙනවා පුතේ.. ......... පුතා තමයි අපේ පවුලටම පත්තු කරපු පහන වගේ ඉන්නේ......... පවුලෙ අනිත් අය අද කොහේද? පුතා කොහේද ? පුතාගෙ නම කිව්වාම නොදන්න කෙනෙකුත් ඉන්නවාද මේ රටේ.........? මට හිතාගන්නත් අමාරුයි පුතේ......... පුතාට ආපු එක යෝජනාවක් මහනුවර මන්ත්‍රී කෙනෙකුගේ දුවකට......... මේ බලන්න. ලිපි ගොනුවකුත් අරගෙන අම්මා ඇවිත් හති දාගෙන දිගු ධාවන මාර්ගයක දුවනවා වගේ කියවාගෙන යයි. මට ඒ කිසි දෙයක් ගම්‍ය වන්නේ නැත. මගේ යහළුවන් කිහිප දෙනා මගේ ජීවිතේට බොහෙවින් සමීප වී සිටින්නේ හරියට හෙවනැලි වගේ.

හොඳම යාලුවා සුමිත්‍රාරච්චි. අපි එකතු වෙලා බිස්නස් එකක් පටන් ගන්න යනවා. ඒ එක්කම මනෝහරන් එයාගෙ තාත්තාට මුද්‍රණාලයක් තියෙන නිසා පොත් මුද්‍රණයත් බෙදා හැරීමත් දෙකම පටන් ගත්තා. මෙවා දවසින් දවසම දියුණු වෙගෙන යන ව්‍යාපාර......... ඒ අතරේ අපේ ගෙට ඉස්සරහා කඩ සාප්පුවකුත් බද්දට ගන්න අද මම තීරණය කළා......... මෙවා ගැන කියවන කොට විස්තර අහගෙන ඉඳලා නිසලා කරන්නේ කරන්නෙ හයියෙන් හිනාවෙන එක. ඒ හිනාවට මම හරිම ආසා බව දන්නා නිසාදෝ නිසලා හිනාව නම් නවත්වන්නේ නෑ. අවන්හලක ඉඳන් එහෙම නිසලා එක්ක විනෝද වෙවී ඉඳිද්දී කී දෙනෙක් නම් හැරිලා අප දිහා බලනවාද ? අලුත් මෝස්තර විලාසිතාවකට හැදිච්ච නවීන පන්නයේ පුංචි සුරංගනාවී ගැන මට යාලුවො විහිළු කළා. අපි අදත් ගිහිල්ලා විනෝද වෙලා ආවා. මම නිසාව ගෙදර ඇරලලා එනකොට රෑ දොළහමාරයි. මාමා ගේට්ටුව ඇරියෙ යස්ස මූණක් දාගෙන. ගෙදර ඇවිත් ඇඟ පත හෝදාගෙන ඇඳේ හාන්සි වුණාම මටම හිනා. මුළු ගෙදරම වහල දෙදරන්න තරම් මට හිනා.

*සගීත් උදාකර - දිනපොත*
*දිනය: 1983 අප්‍රේල් 20*



ගෙදර කාමරේකට වෙලා බිත්ති හතරට කොටුවෙලා ඉන්නකොට මට නානාප්‍රකාර දේවල් කල්පනා වෙන්නෙ. මම ගත කරපු සෙල්ලක්කාර ජීවිතේ මේ විදියට නිමාවේවි කියලා මම නම් හීනෙකින්වත් හිතුවෙ නෑ. අද මගේ හොඳම යෙහෙළියො දෙන්න ආවා මාව බලන්න. උන් ආවෙ හිරගෙදරක ඉන්න කෙනෙක් බලන්න එනවා වගේ මහාම තැති ගැන්මකින්. මිදුලේ තියෙන විශාල බලු කූඩුවේ ඉන්න ගලිවර් ගේ ඉඳන් කුස්සි මුල්ලෙ ඉන්නා පූස් පැටියා දක්වාම තියෙන්නෙ එකම අණසක ජාලයක්. ගිම්හාන්ගෙ අම්මා හරියටම වේවැල පිටිපස්සට කරගෙන ඉස්කෝලෙ ගොඩනැගිල්ලක් ගොඩනැගිල්ලක් ගානෙ ගාටන ප්‍රින්සිපල් නෝනා කෙනෙක් වගෙයි.

මගේ යාලුවො දෙන්නා බයවෙන එක අරුමයක්යැ. මම අඬ අඬා මගේ කතාව යාලුවො දෙන්නට කිව්වෙ හෙමින් සැරේ හොරෙන් හොරෙන් වගේ. ගිම්හාන් කියන්නෙ ලස්සනට ලෝකෙට පෙනුනට අමුම අමු අපිරිසිදු සත්වයෙක් කියල මම කියනකොට චාපාගෙ මූණ ඇඹුල් වුණා. තේජනී ඇඟිබැම උඩට ගත්තා.

කලාදුරු පිරිච්ච කණ කවදාවත් සුද්ධ කරන්නැති, බඩ පපුවේ කුණු හත්තට්ටුවක් තියෙන ඔලුවෙන් ගස් ගඳක් එන ගිම්හාන් කොච්චර අමාරුවෙන් කැගහලද මුල් දවස්වල නාන්න පිටත් කළේ. රට රටවලත් ගියාට ඇඟේ තියෙන ගස් ගඳ යවා ගන්න කිසිම උවමනාවක් නෑ. හැම තිස්සෙම එයා නහය හාර හාර ඉන්නවා. එක්කො දත් හාරනවා. මුල් දවස්වල මට මේක හරිම හිසරදයක්. ඔය වගේ දේවල් කරන්න එපා කියල කොච්චර කිව්වත් අහන්නෙ නෑ. මොන තරම් වටිනා ඇඳුම් ඇන්දත්, වටිනා සපත්තු දැම්මත් රත්තරන් දම්වැල් කරේ පැටලුවත් මිනිහගෙ රඟ දන්නෙ ගෙදර හැති. වටේට ඉන්න යාලුවො රොත්තටත් මේ ගිම්හාන්ගේ වඳුරු ගති වෙනස් කරන්න බැරිවුණාද කියලා පුදුමත් හිතෙනවා.

උනුත් වටවෙලා ඉඳගෙන එහෙයියො වගේ ගිම්හාන්ගෙ පොකට් එකට විද විද විනෝද ගමන් වල ඇවිද ඇවිද සතුටු වෙනවා.

මම හිතන්නෙ නෑ ගිම්හාන් වගේ කෙනෙක් මේ රටේවත් ඇති කියලා දෙයියනේ මට මතක් වෙන්නෙම සශික්වයි.

ගිම්හාන් වගේ කලවැද්දෙක් ගැන මම කියන්න හිටියෙ නෑ කාටවත්. ඒත් ඒ ගැන මට කියන්න සිද්ධ වුණේ එයයි, එයාගෙ අම්මයි දෙන්නම මගේ වැරදි ගැන කිය කියා රට පුරා ප්‍රචාරය කරන නිසයි. ගිම්හාන්ගෙ ගතිසිරිත් ගැන කාටවත්ම නොකියා ඉන්න මට පුළුවන් වෙන්නෙ නෑ. මම සශික් ළඟට කාන්දමක් වගේ ඇදුනෙ ගිම්හාන්ගෙ මේ විකර්ෂණය නිසාමයි කිව්වොත් නිවැරදියි.

මගේ හිත හුඟාක්ම නිදහස් වුණා. අද වාපායි තේජායි දෙන්නට මගේ සත්‍ය විස්තරේ කියල දාපු එක හොඳයි දෙවියනේ. අපිරිසිදු කම් පැත්තකින් තියමු. ගිම්හාන් කොහොමද මේ තරමට උපාසකරාල කෙනෙක් වගේ කෙළෙස් නසාගෙන ඉන්නේ........

උන් දෙන්නට තිබුණු ලොකුම ප්‍රශ්නෙ මේක. මම දන්නවා දැන් මය පාර උන්ට වෙන දෙයක් ඕනෑ නෑ කතා කරන්න මේකම ඇති ජීවිතේට. මම සශික්ට කියලා තිබුණු ගිම්හාන්ගෙ විස්තරේ. සශික් නමුත් මුකුත්ම කිව්වෙ නෑ එයාට විරුද්ධව.

පුදුම මිනිහෙක්නෙ කියන වචන දෙක විතරයි කටින් පිටකළේ. ඒ වුණත් දැන් සශික් මාව මග අරින හැටි මට දරා ගන්න බෑ. මම ගෙදරට හොරෙන් කෝල් එකක් ගන්න විදියක් නැති නිසා සශික්ට කතා කළා යාලුවෝ දෙන්නගෙම ගෙවල්වල ෆෝන් වලින්. ඒත් සශික් නෙමේ ඒවාට උත්තර දුන්නේ. පස්සෙ පණිවුඩ කාරයෙක් ඇරියා මට ටිකකට කතා කරන්න කියලා ඒත් නෑ. මට තියෙන ලොකුම වේදනාව ඒක තමයි. දෙවියනේ ඒ තරම් වේදනාවක් මේ ලෝකෙ වෙන කාටවත්ම වෙන්න දෙන්න බෑ. සශික්ට හැර.

*මනෝරමා නාගසේන - දිනපොත*
*දිනය 1983 අප්‍රේල් 20*

මගේ ජීවිතේ අංග සම්පූර්ණද? මම හිතනවා මම කවුද මම මගෙන්ම අහනවා. මගේ ළමා කාලය මට හීනයක්. මම ඉපදුණේ පුංචි එංගලන්තයෙ. ඉපදිච්ච අන්තම අන්ත දුප්පත්



දරුවෙක්. කාත් කවුරුවත් නැති විදියට හැදිච්ච අනාථ දරුවෙක් එහා එංගලන්තයටත් ගිහිල්ලා ආවා කිව්වම පුදුමයි.

තාත්තා අල ගොවියෙක්. අම්මා ගෙවිලියක්. මම මොකටද මේවා ගැන මෙහෙම මතක් කරන්නෙ. පසුතැවෙන්නද ? නෑ මම පසුතැවිලි නවත්නලා ගොඩාක් කල්. හරකෙක් ඇනලා තාත්තා මැරුණෙත්. අල්ලපු වත්තෙ හරක් පට්ටි මාමගෙ තෝප්ප හරකෙක් ඇනලා තාත්තා මැරුණාම අම්මට විතරක් නෙමේ පුංචි අපි හතර දෙනාටම සෙනසුරු ලැබුවා. අපිට නෑදෑයො උදව් කළේ නෑ. යාලුවෝ හිටියෙ නැහැ. මල්ලිලාට ඇඳුම හැඳුනා. නුවර එළිය පළාතෙ සීතලත් එක්ක අපිට ඉන්න බැරි වුණා. තියෙන පුංචි ඉඩං කෑල්ල විකුණලා කොහේ හරි යන්න අම්මා කල්පනා කළා. ඒත් ඒ වැඩේ ලේසි වුණේ නෑ. හැමෝම ලෑස්ති වුණේ කුණු කොල්ලෙට ඉඩම් කෑල්ල අරගන්න. අපේ ඉඩමේ අල වගාව එහෙම පිටින්ම අඩාල වුණේ තාත්තගෙ මරණෙත් එක්කම.

අනේ අපි විඳපු දුකක්. අපි බඩගින්නෙ කෑ ගහලා මොර කියලා ඇඬුවා. අම්මා පොළට ගිහිල්ලා මොනවා හරි ගෙනත් තම්බලා දුන්නා. ඒ අතරේ තමයි අම්මා නිව්ටන් බාප්පත් එක්ක ඇයි හොඳයි කම් පැවැත්තුවෙ. නිව්ටන් බාප්පා වත්තෙ වැඩවලට උදව් වුණා. ඒ වගේම අම්මත් එක්ක ඊට වඩා මොකක්ද සම්බන්ධයක් තියෙන බව අක්කා මාත් එක්ක කිව්වා. අම්මා සම්පූර්ණයෙන් වෙනස් වුණා. නිව්ටන් බාප්පා විතරක් නෙමේ ඒ පාර අම්මා අමුතුම ජීවිතේකට ඇබ්බැහි වුණා සමහර දාට ගෙදර එන්නෙ උදේ පාන්දර. මහා බඩු මල්ලක් අරගෙන. හාල්, පිටි, සීනි, පාන්, කේක්......... අම්මා අපිට කන්න දෙන්න තමුන්ගෙ ඇඟ විකුණලා කියලා දැන ගත්තෙ පසුවෙලා. නිව්ටන් බාප්පා අම්මව ඒක ඒකාට විකුණනවා වෙන්නැති අපි හිතුවා.

කොහොම වුණත් අම්මාට ගමේ හොඳ නමක් තිබුණේ නෑ. අපි දිහාත් ගම්මු බැලුවෙ අම්මා දිහා බලපු ඇහෙන්. අපිට ඇනුම් පද කිව්වෙ අම්මාට පලිච්චි කරලා කතා කරන කටවල් වලින්.

'පවුල් විනාශ කරන හැකිරි.........අනේ කර්මාන්තයක් කරගෙන ජීවත් වෙන්නෙ නැතුව ගමම විනාශ කරනවා.

අම්මා ගැන මැඩි නැන්දා එහෙම කිව්වෙ මගේ අම්මෙල්

කාලක් ගේන්න කඩේට ගිය වෙලාවෙ. ''තොපිලා දාලා පිච්චිලා යන්න ඔනෙ! ඔය අම්මා කරන මළදානෙන් කාලා බීලා වගතුවක් තියෙයිද ? දෙයියනේ සෝවාන් වෙලා වගේ හිටිය මගේ මිනිහා මෙකි නොසන්ඩාලයෙක් කළා. දූන් ඒ මිනිහට ගෙදර මතකත් නෑ. ගෑනි මතකත් නෑ. නොද්දකිං විතරක්.''

සෝමා නැන්ද මගේ කකුල් ඉස්සරහටමයි කාරලා කෙල ගැහුවෙ. මටවත් අක්කටවත් මේ දේවල් ගැන අම්මට කියන්න හයියක් තිබුණෙ නෑ. දවසක් වෙලාවක් බලලා අක්කා අම්මත් එක්ක මොනවද කිව්වා මම බලාගෙන හිටියා.

මම හිටියෙ නිදාගෙන වගෙත් නොනින්දක වගෙත්. අක්කා කියූ දේ අහලා අම්මාට හොඳටම තරහ ගියා. ''ඔය කතා කියන එක පරයෙක්වත් පරට්ටියෙක්වත් එනවද උඹලට කන්න දෙන්න........ මං මගේ පණ තියෙනකං උඹලව බඩගින්නෙ තියන්නෙ නෑ බොලල්ලා........ උඹලා ඉස්කෝලේ ගිහිල්ලා ඉගෙන ගෙන රස්සා හොයාගනිල්ලා. එතකල් මං දෙන මේ මලදානෙ කාලා ජීවත් වෙලා හිටපල්ලා. අපිට බඩගින්නේ වෙලිලා කරවෙලා වත්තෙ ගස් යට මැරෙන්න බෑ බං........ අපිටත් ජීවිතයක් ඔනෑ..!

මට බැණුපුවාවෙ ඔනෑම එකෙක්. බොරුවට ඔය දවල්ට ගෑනිලාත් එක්ක එකතුවෙලා මට පලිච්චි කරන හැම එකාම කසිප්පු වඩියකුත් ගහගෙන රෑට එනවා මාත් එක්ක කැලේට රිංගන්න.

අම්මා එහෙම කියලා ආයෙ බය වෙලා වගේ අක්කා දිහා බැලුවා. ඊළඟට අඬන්න පටන් ගත්තා! මම මේක උඹට කිව්වෙ ලොක්කියෙ උඹට යමක් කමක් තේරෙන නිසා. උඹ ලොකු එකියක් නිසා නංගිවයි මල්ලිල දෙන්නවයි උඹ බලා ගන්න ඔනෑ හොඳට. ඒ වගේම මේ ගමේ එකාලෙගෙන් උඹලා දෙන්නා පරෙස්සම් වෙලාත් ඉන්න ඔන. මං මෙහෙම පංචං ගෑනියෙක් වුණාට උඹලා අනාගතේ හදාගන්න ඔනෙ. මීට වඩා හොඳ විදියට.''

මට එදා අම්මා ගැන දුක හිතුණා හොඳටම.

ඊට පස්සෙ කාලයක් ගත වුණා. මට ගෙදරින් පැනලා



යන්න සිද්ධ වුණේ හරිම පුදුම විදියට. ඒ සිරිපාල මාත් එක්ක යාලු වෙලා ගෙදරින් පැනලා යන්න යෝජනා කළ නිසා.

''නියටවත් අපේ ගෙදරින් නම් උඹට කැමති වෙන්නෙ නෑ. උඹලගෙ අම්මගෙ පට්ටන්දරේ හින්දා. ඒ නිසා මට ආදරයක් තියේනම් උඹ මා එක්ක පැනලා වරෙන්. හික්කඩුවෙ මගේ යාලුවෙක් ඉන්නවා. අපි එහේට වෙලා රස්සාවක් හොයාගෙන දෙයියනේ කියලා ඉඳිමු නිරංජලා.''

සිරිපාලගේ ඒ යෝජනාවට මම කැමැත්ත දුන්නේ ඒ දෙකක්ම කල්පනා කරලා. අඬලා අඬලා හිතලා අක්කටත් නොකියාම මම සිරිපාලත් එක්ක පැනලා ගියේ නරකාදියෙන් මිදිලා දිව්‍යලෝකෙකට යනවා කියලා හිතාගෙන. හික්කඩුවෙ ඒවගේ අමුතුයි. සිරිපාල සුද්දන්ගෙ ගයිඩ් කෙනෙක් විදියට වැඩ කරන්න අල්ලා දුන්නේ සිරිපාලගෙ යාලුවා. ආනන්ද. කාලයාගේ ඇවෑමෙන්........ මට මොකද වුණේ........ මට සිද්ධ වුණා රට ඉඳන් එන සුද්දන්ගෙ කෙලිබඩුවක් වෙන්න. අම්මගෙ රස්සාවටම මාව ඇදල දැම්මෙ සිරිපාල නේද කියලා මට පුදුම වෛරයක් ඇති වුණේ ඌත් එක්ක. අපි අතරෙ අඬදබර ආරවුල් ඇති වුණා. මට සිරිපාල එක්ක ජීවිතේ තිත්ත වුණා.

දවසක් වැල්ලෙදී ලොකු ආරවුලක් වෙලා සිරිපාල මැරුම් කෑවා. වැල්ලෙම එකෙක්ගෙ අතින්. මම අනාථ වුණා. ඊට පස්සෙ මොන තරම් දේවල් වුණාද ? ඒත් මම මොකටද මේ දේවල් මෙහෙම අද කල්පනා කරන්නෙ. සගික් උදාකර එක්ක මගේ තියෙන සම්බන්ධෙ පුදුමාකාර එකක්. එයා මගේ ජීවිතේට ආවෙ පුදුම විදියට.

එයාගෙ මූන වගේම අදහසුත් හරිම ලස්සනයි. 'ඔයා මගේ ජීවිතේට ආපු දේවතා එළියක් වගේ.' එයා මට කිව්වෙ එහෙමයි. ඇත්තටම මමයි අන්ධකාරෙ ඉන්නෙ. ඔයා තමයි මගේ ජීවිතේට ආපු දේවතා එළිය........ මගේ හිත එහෙම කිව්වා........ ඒත් මම ඒක කටින් කිව්වෙ නෑ. එහෙම නොකියන්න මට හේතු තිබුණා.

කකුල් පේන්න කොටට ඇඳුම් අඳින කන් දෙකෙන් වැක්කෙරෙන අරුංගල් දාන, නවීන පන්නෙට හැඩ ගැහිච්ච

පලියට මම සමනලියක්ද ? කිරිල්ලියක්ද ? මට එහෙම හිතුනෙ සශික් එයාගෙ කාව්‍ය භාෂාවෙන් මෙහෙම කියනකොට.

"ඔයා මට පේන්නෙ කොහේදෝ ඈත දූපතකින් පාවෙලා ඇවිත් මගේ ළඟින් ලැගුම් ගත්තු රන්පාට සමනලියක් වගේ........"

ඉස්සෙල්ලාම දවසෙ ඔෆිස් එකේදී මට එයාව දැක්කාම පුදුම හිතුණා. මට හිතුණේම එයා මම කලින් දැකලා පුරුදු කෙනෙක් කියලා. මං එයා දිහා බලාගෙනම හිටියා. පස්සෙ තමයි මම දැනගත්තෙ මට වැඩකරන්න තිබුණේ එයා යටතෙ කියලා. පුදුම හමුවීමක්.

සශික් කවුරු වගේද මම කොහොමද එයාගෙ මූණ මෙච්චර මතක. මම ගෙදර ඇවිල්ලත් කල්පනා කළා. ක්ලබ් එකේදී දැකපු කෙනෙක්........? නෑ ඉස්සර අපි නුවර එළියෙ ඉද්දී දැකපු කෙනෙක්........? නෑ. මට හිතාගන්න බැරිවුණා. පස්සෙ මමම තීරණේ කළා ඒ ගිය ආත්මෙදී දැකපු පුරුද්ද වෙන්න ඇති කියලා.

සශික් මාත් එක්ක ඉන්නෙ හරිම සතුටින්. 'ඔයාට කලින් ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියෙ නැද්ද?'

මං එහෙම ඇහුවෙ........ සශික්ගෙ තිබුණු නො ඉවසිලිවන්ත ප්‍රේමාලිංගන ස්වරූපය දැකලා. මට හමුවුණු කිසිම පිරිමියෙකු ගෙන් මම ඒ වගේ උණුසුම් චර්යාවක් දැකලා නෑ. මගේ ප්‍රශ්නෙට සශික් හිනාවුණා විතරයි. ඇත්තටම සශික් කියන්නෙ ඔනෑම ගැනියෙක් ආශාවෙන් බලාපොරොත්තු වෙන උණුසුම් මිනිහෙක්.

ඇල්මැරිච්ච පිරිමි, වයසක සුද්දො........ මට ජීවිතේ එපා වෙලයි තිබුණේ. සශික් මගෙ ජීවිතේට නව ජීවනයක් ගෙනාවෙ ඒ විදියට. අපි හොඳට විනෝද වුණා. කතා කළා. විනෝද ගමන් ගියා.

මම ඉන්න විශාල බංගලාව දැකපු දවසෙ සශික් පුදුම වුණා.

"මෙච්චර විශාල බංගලාවක්........! අම්මයි තාත්තයි ඔයයි විතරද ඉන්නෙ........?"

සශික් ඇහුවෙ උද්යෝගයෙන්. මම ඔව් කිව්වා. ඒ මූණේ



දැල්විච්ච උද්යෝගෙටයි. මා කෙරෙහි ඇති මෙච්ච ලොකු පැහැදීමටයි. මට තණ්හා සිතුණ සිසා. මේ විශාල බංගලාවෙ මට ඉන්නෙ වැඩකාරි විතරයි. එක පැත්තක කාමර දෙකක කෑල්ලෙ ඉන්නෙ වයසක ජෝඩුවක්. බොහොම වැදගත් සල්ලිකාර ජෝඩුවක්. එයාලගෙ වාහනේ පාක් කළේ බංගලාවෙ එක ගරාජයක. අනෙක් ගරාජය මගේ වාහනේ. මේ ජෝඩුවට මම කුලියට ඉන්න දුන්නා. ඇත්තටම මට පාලු නිසා. භූත විමානයක් තරමට මේ බංගලාව විසාල නිසා. බංගලාව මුර කරන මුරකාරයා ඉන්නේ ඉස්සරහා මුර මඩුවෙමයි. අර ජෝඩුව මගේ අම්මයි තාත්තයි කියලා මිනිහත් හිතනවා ඇති. මිනිහා ගොලුවෙක්.

ඒ නිසා එයාට අනං මනං කතා අහන්නවත් කියන්නවත් බෑ. ගෙදරට වාහනයක් එනවා දැක්කම ගේට්ටුව අරින වහන එක තමා රාජකාරිය. කෑම බීම ඔක්කොම පිටින් නිසා ගෙදර එක්ක සම්බන්ධයක් නෑ.

"අම්මලා දවසක කැමති වේවිද අපි කසාද බඳිනවට?"

දවසක් ආ රෑ හෝටලේක තනිවෙලා ඉද්දී සශික් මගෙන් ඇහුවෙ හීනෙන් බයවෙලා වගේ.

මම හැබැහින් නිකමටවත් හිතුවෙ නැද්ද මන්දා සශික් එක්ක යුග ජීවිතයක් ගැන මුලදී නම්. නමුත් පස්සෙන් පසු එයත් එක්ක එකට ජීවත් වෙද්දී මට මගේ ඉදිරි ආරක්ෂාව ගැන හිතලා ඒ විදියට හිතන්නත් ඇති. මම සිවිලිම දිහා බලාගෙන කල්පනා කළා. දරිද්‍රතාවයෙන් පිරිච්ච මගේ අතීතය........ අතින් අත මාරුවෙච්ච මගේ ස්ත්‍රීභාවය........

සශික් කීයටවත් හිතන්නෙ නෑ මම එහෙම ගෑනියක් කියලා. එයා හිතාගෙන ඉන්නෙ මම මහ ධන කුවේර දෙමාපිය දෙන්නෙකුගෙ නාස්තිකාර, පේන්තුකාර, වියදම්කාර දෝණියක්ද කෙනෙක් කියලා විතරයි. සශික්ගෙ ඉල්ලීම පිට මම ක්ලබ් නවත්තලා දාපු එක ඇත්ත. සශික් මුණ ගැහුණට පස්සෙ මම වෙන පිරිමි ආශ්‍රය කළේම නැති තරම්. කොහේද එහෙම හැඟීමකටවත් ඉස්පාසුවක් දුන්නද සශික්ගෙ ආදරේ. සශික්ගෙ හිත කොයිවෙලෙත් පත්තුවෙච්ච පන්දමක් වගේ.. එයා හරි දක්ෂයි. එයාගෙ බිස්නස් වැඩවලටත් හොඳ සහායකයො ඉන්න

එක එයාගෙ වාසනාවක්. නැත්නම් මෙච්චර විවේක සුවයක්
කොහොමද ජීවිතේ විඳින්නෙ.
කොහොමද ජීවිතේ විඳින්නෙ ?'' සශික් එහෙම

''මොකද මං අහපු එකට උත්තර නැද්ද ?'' සශික් එහෙම
අහද්දී මං ආයෙම මහ පොළවට පාත් වුණා.

''ඒ ගොල්ලගෙ මහා විශාල බුදලේට මං වගේ බෑණ
කෙනෙක් මදි කියලා හිතාවිද?''

මට හිත යටින් හිතා. නල්ල මලේ බුදලයක් තමා මට
තියෙන්නෙ. ඒවා ගැන වග විස්තර මොටද ඉතිං. ඒත් මම
එදා සශික්ගෙ මොකක් හරි වෙනසක් දැක්කා. සශික්ගෙ ඇස්
අමුතුයි. වෙනදා පේන පැහැදිලි පළිඟු කැට ගතියට මොකක්
හරි බොර පාටක් මුසුවෙලා තිබුණා. ඇස් බොර කරන ඒ අමුතු
හැඟීම එයාට ආවේ අනාගතේ බර ගැන මතක් වෙලාද! මගේ
පසුබිමින් තියෙනවා කියා ඔහු සිතන මහා ධන සම්භාර කන්ද
ගැන හිතලාම එයාගෙ ඇස් බොර වුණාද මන්දා. එදා එයා
හිටියෙ හරියට අන්ධවෙලා වගේ. මෝහයෙන්ද රාගයෙන්ද මං
දන්නෙ නෑ. ආදරයෙන් නම් නෙමෙයි! මම මේ ගැන හිතලා
හිතලා බැරි කමටම ලිව්වාද මන්දා හෙට දවසම මම මීට වඩා
යමක් ලියාවි.

ජීවිතය හිස් පිටුවක්. එහි යමක් ලියා තැබිය යුතුය.

නිසලා නිරංජලා - දිනපොත
*දිනය: 1983 අප්‍රේල් 22*

ඔෆිස් වේලාවෙන් පස්සෙ නිසා එක්ක විනෝදවෙලා
ගෙදර එන දවසක මට හිතුණා මම දැන් පොත් කියවිල්ලෙන්
ඈත් වෙලාද කියලත්. මට බය හිතුණා ඒ ගැන. පොත පතින්
ඈත් වෙනවා කියන්නේ මාගේ මානසික මට්ටම පල්ලම් බහින
එකට. පොතක් ලියන එකයි නාට්‍යයක් කරන එකයි මගේ හීන
දෙක ! දවසේ දහසක් වැඩ. ඔෆිස් එකේ වැඩ එක්කම මම දවල්ට
දෙපාරක් විතර එළියට යන්නෙ මුද්‍රණාලයෙ වැඩ ගැනයි මගේ
අනෙක් බිස්නස් කටයුතුයි ගැන හොයල බලන්නයි. ඒ අතරේ
අම්මගෙන් පුදුම වදයක් එන්නේ. ගෙදර ගිය ගමන්ම අම්මා
පුරුදුවෙලා ඉන්න ස්තෝත්‍රයක් පටන් ගන්නවා.



ඒ මගේ මංගල්ලෙ ගැන. අනේ මන්දා ඇවිල්ලා තියෙන විවාහ යෝජනාවල ෆයිල් එක අම්මගෙ අතේ. නිදාගන්නෙත් ඒක කොට්ටෙ පැත්තකින් තියාගෙන කියලා වැඩට ඉන්න ජේන් අම්මා මට කිව්වාම අම්මා ගැන දුකක් හිතුණා. ඒත් අනික් අතට අම්මා ගැන මොකට දුක් වෙනවද ? අම්මලා මං ගැන හොයල බලන්න පටන් ගන්නෙ මං යම්කිසි තැනකට ආවාට පස්සෙ. ඒතාක් කාලයක් මං උන්නද මළාද, කෑවාද බිව්වාද, ඉස්කෝලෙ ගියාද කියලා හොයන්න එක දූතයෙක්වත් එව්වෙ නෑ.

දැන් තමයි ගෙදරට එන දොට්ට බහින විකට මුරකාරයො දම දමා මා ගැන හොයන්නෙ. මට අම්මා එක්ක කේන්තියි. අම්මා තාත්තාව ආදරේ කළේ නැහැ. ආදරේ ගන්න සුදුසු විදියට තාත්තා හිටියෙ නැති එක වෙනම දෙයක්. පෙරදිග කාන්තාවෝ හොඳ පති භක්තියක් තියෙන උදවිය. මිනිහා මැරිච්ච ගිනිමැළේටත් පැන්න ගෑනු ඉන්දියාවෙ හිටියා. දැන් ඉන්නෙ මිනිහා මැරෙන්න කලින්ම ගිනි මැළේට තල්ලු කරලා දාන ගෑනු.

නාට්‍යයක් ලියන්න ඕන කියලා මට හිතට ආවෙ මොකක් නිසාද මන්දා. මනෝරමාගෙ රංග ශාලිකාවෙ යාළුවෙක් මනෝජ්. එයා මට අද කලාභවන ළඟදි අහම්බෙන් හම්බ වුණේ. සල්ලි ටිකක් තියෙනවනං නාට්‍යයක් කරලා දාන්න හොඳ කාලෙ බං. මනෝජ් එහෙම කිව්වෙ මගේ වාහනේට ගොඩවෙන ගමන්. "මොකෝ දැන් මනෝරමා පේන්නවත් නැත්තෙ. රටකටවත් ගිහිල්ලද". ඊළඟට එයා ඇහුවෙ හරියට දන්නෙම නෑ වගේ. ඇයි බං උඹල දන්නව ඇතිනෙ. ඒකි බැඳලනෙ හිටියෙ. මම එහෙම කිව්වාම මිනිහා අන්දමන්ද වුණා.

''මො........මොකක් ? ඇයි උඹත් එක්ක ආස්සරේ කළේ බැඳලා ඉඳිද්දීද ?''

''ඔව් බං......... මං ඒක දැනගත්තාම එයාට යහපත් පවුල් ජීවිතයක් ගෙනියන්න දීලා මං අයින් වුණා. දැන් මගේ තනි කනෙක්නෙ.''

මම එහෙම කියලා අත හෝදගත්තා. ඒත් මගේ හිතේ කහට හෝදගන්න ලේසි වුණේ නම් නෑ. කමක් නෑ. ඒක මගේ වැඩක්නෙ.

මට එක පාරටම ටෝල්ස්ටෝයි ගැන මතක් වෙනවා.

ඒ නාට්‍යයක් ලියන්න ඕනෙ කියලා හිතපු නිසාද මන්දා. ටෝල්ස්ටෝයිගෙ ජීවිතේ එක්තරා විදියක එකම ශෝක නාට්‍යයක්ම තමයි බලාගෙන ගියාම.

සිටු පවුලක ඉපදුනත් දුක් වින්දෙම ලේඛන කලාවට කැපවෙලා. ඒ එක්කම විවාහ ජීවිතෙත් අසාර්ථක කරගෙන. සිටුවරියක් එක්ක විවාහ වෙච්ච ටෝල්ස්ටෝයි සිටුවරයාට ඒ වුණත් අවුරුදු පනහකට ආසන්න කාලයක් සාමකාමී විදියට ඉන්න ඉඩක් ලැබිච්ච එක ලොකු දෙයක්.

සොන්යා කියන ටෝල්ස්ටෝයි බිරිඳ අවුරුදු 23 ක් ඇතුළත දරුවන් 13 දෙනෙක් ලැබුවාලු. ඇගේ තියුණු සූක්ෂම නුවණ තමන්ගෙ රටක් වටින ස්වාමිපුරුෂයාව තේරුම් ගන්න ඇත්තටම සැහුණා. නමුත් ප්‍රශ්නෙ පටන් ගත්තෙ ටෝල්ස්ටෝයිගෙ වෙනස් වීම තමයි. පොත් මුද්‍රණය, පිටපත් කොපි කිරීම, සම්පූර්ණ වෙළඳ කටයුතුවලට සම්බන්ධ වෙමින් අමුත්තන් පිළිගැනීම ආදියත් කරමින් සොන්යා බොහොම සාර්ථක විදියට ජීවිතේ ගතකළත් ටෝල්ස්ටෝයිගේ දර්ශනය වෙනස් වීම නිසා ඈ බොහොම අසීරුතාවයට පත් වුවා.

ටෝල්ස්ටෝයි ගෙ අලුත් ධර්මය අල්ලන්නෙ නැතිව සොන්යා රණ්ඩු අල්ලන්න ගත්තා. දුප්පත් ඇඳුම් ඇඳගෙන ගොවියො එක්ක ජීවත් වෙන්නටත්, සපත්තු හදන්ටත් පටන් ගත්තාම සෝන්යාගෙ රළුල සිත දෙදරුම් කන්න ඇති. ඒ නොවිස්සුම සැහෙන්න දුර දිග ගියා. අන්තිමට ගෙදරින් තරහ වෙලා පැනලා ගිය ටෝල්ස්ටෝයි දුම්රිය පොළකදී තම අවසන් හුස්ම හෙළුවා. සෝන්යා මානසික රෝගියකු වගේ හැසිරීම නිසා තමා ටෝල්ස්ටෝයි පැනලා ගියේ කියලා තමා කතාව තියෙන්නේ.

මම අද මගේ හිතත් එක්ක මොකද මේ තරමට ටෝල්ස්ටෝයි ගැන දොඩමලු වුණේ........ මගෙ හිත මගෙන්ම අහනවා. ඒ සමහරවිට මට ආදරය ගැන අනුරාගය ගැන හිතලා ඇතිවෙලා මොනවා හරි ලියන කියන දේකට හිත යොමු කරන්න හිතුණ නිසා වෙන්නැති. අනික ටෝල්ස්ටෝයි මම ප්‍රිය කරන මහාම ලේඛකයා. කොහොම වුණත් මනෝජ් එක්ක නාට්‍යයක් කරන



එක හුඟාක් සුන්දර අත්දැකීමක් වේවි. එතකොට සමහර විට මාව නාලනය වේවි. හැම තිස්සෙම මාව මෙහෙයවන ඉක්මන්කාර තොරතුරු හිත මෙල්ල කරන්න හොඳම ක්‍රමේ ඒක.

"පුතා ලෑස්තිවෙන්න මේ සති අන්තෙ මා එක්ක ගමනක් යන්න."

අම්මා තේ මේසෙදි එහෙම කියනකොට මට දුකත් හිතුණා. දුන් අපි ටී පොට් තියාගෙන තේ බොනවා. පුංචි කාලෙ මට මතකයි මම වාඩි වුණේම වංගෙඩිය ළඟ. වෙන වාඩිවෙන්න පුටුවක් තිබුණේ නැති නිසා. අම්මා අතට දුන් බෙලෙක් කෝප්පයට කහට ටික ටික දාගෙන යනවා. ඊළඟට සීනි නැත්ද නැත්ද බෙදනවා. අපි ඒ තේ එක බිච්චෙ අමාගෙ වගේ, ඒ තමා අපේ තිවන් පාටි එක. එහෙම වෙලාවක කාන්තා බිගෙන ආවොත් ඒ ඔක්කොම විනාසයි. නිකම් කිසිම තේරුමක් නැතිව ගෙදර ඉන්න බල්ලා බලලගෙ පටන් හැමෝටම කුණුහරුප විරුසාවකින් තෙමෙන්න වෙනවා.

"ස්.........."

"ඇයි බලා ඉන්නෙ කන්නකො ඉතිං........"

මෙහෙකාරයා බොමහාම යටහත්පහත්ව කියලා යන්න යනවා. අම්මට හිනා. "පව් පුතේ ළා ........" අම්මා එහෙම කියලා මගේ තේ එක හදන්නෙ හරිම උජාරුවෙන්.

මට ආඩම්බරයි. අඩුම ගානෙ අම්මාට මෙහෙම 'වැටිලා' ඉන්න නෙමෙයි රැකිලා ඉන්න පුළුවන් තැනක් හදල දුන්නානේ කියන සතුට මට හයියක්. මට මගේ ජීවිතේ හුඟාක් දේවල් ඇති සම්පූර්ණ කරගන්න. මේ ඔක්කොම හිතලා අන්තිමට මට එතන් වෙනවා නිසලා! නිසලායි මමයි වැඩ කරපු තැන් දුන් වෙනස් වෙලා. මම වෙනම තැනක ඉහළ අසුනක වාඩිවෙද්දී නිසලා වෙනම ප්‍රචාරක දැන්වීම් ආයතනයට බැඳුණා. නිසලාට එතැන හොඳයි.

මට ලොකුම ප්‍රශ්නයක් වෙලා තිබුණු එයාට තියන විදියට විශාල මුදලයක් තියාගෙන මොකටද මේ වැඩකරලා නැගෙන්නෙ කියලා. එයාගෙ අම්මලා මගේ විවාහ යෝජනාවට කැමති වේවිද කියලා මම ඇහුවෙ නිකමට. මේ වගේ එකටම ජීවත් වෙද්දී අහවල් දේකටද මන්දා ආයෙ කසාද කියලත් හිතුණා.

ඒත් නැවතිල්ලෙ හිතලා බලන වෙලාවෙදි මට නම් මම ගැන තමයි දුක.

නිසලා හරිම ආකර්ශනීය වස්තුවක්. රජ කුමාරවරු ඔටුනු වලට පයින් ගහන්න ඇත්තෙ නිසලා වගේ ගෑනුන් ඉදිරියෙදි වෙන්න ඇති. යාන්තම් අම්මව පොඩ්ඩක් මෙච්චල් කරගත්තා මනමාලියන් බලන්න යන කතන්දර ටිකට ටික දවසක් ඉල්ලලා.

*සගීක් උදාකර - දිනපොත*
*දිනය: 1983 මැයි 12*

මදූයි මම දූන් තනිකරම හිරකාරියෙක් වගේ වුණා. සගීක්ව දූන් මාස තුනකින්ම ඇහැට දූක්කෙ නැහැ. ආයෙත් නම් එයාට මට කතා කරන්න බැරි වෙයිද ?

හදිසියේ ගිම්හාන්ට මැලේසියා යන්න වුණේ උන්හිටි ගමන්. ඒ වෙද්දී එයාගෙ අම්මත්, අම්මගෙ අම්මාට අමාරු වෙලා මාතරට ගියිල්ලයි හිටියෙ. මට ආවා චාන්ස් එකක්. මම ඉක්මණට ගිම්හාන්ගෙ තාත්තට පිංසෙන්ඩු වුණා. මම අත්සන් කරපු නාට්‍යයෙන් මට ඉල්ලා අස්වෙන්න වත් ඉඩ දෙන්න කියලා. නිකමම නවතින එක සදාචාර සම්පන්න නැති බවට තාත්තාත් එකඟ වුණා. කොච්චර වුණත් ඒ මනුස්සයා ටිකක් හැගීම් දූනිම තියෙන මිනිහෙක්.

මම බොහොම අමාරුවෙන් සගීක් ගෙ දූන් වැඩකරන තැන නොම්මරේ හොයාගත්තා. ඒකත් අරගත්තෙ පරණම යාලුවෙකුගෙ මාර්ගයෙන්.

''මේක මං දීපු චිත්තියක් නම් කියන්නෙපා.''

එයා ඒක කිව්වෙ නම් හරියට මහා බරපතල මිනීමැරුමක් කළා වගේ මූණ කුණ්ඩ හට්ටියක් කරගෙන. එවුන් පිරිමිද මන්දා. මම ටිකක් කල්පනා කළා. ඇමතුමක් දෙන්නද ........ ගිහිල්ලම හම්බ වෙනවද ? මොකටද ඇමතුම් දෙන්නෙ. ගිහිල්ලම හම්බවෙන්නයි. අන්තිමට මම හිතාගත්තේ.

මගේ ඇස් බඩගිනි වෙලා හෙව්වේ සගීක්........
ඇස්වලට ආහාරය ඔහුගේ දූක්ම



මගේ හිත අසනීප පෙවා හෙව්වෙ සගීක්
හිතට සැනසිල්ල ඔහු විතරයි....!

මම ත්‍රීවීලර් එකක නැගලා ගිහිල්ලා සගීක්ගෙ කාර්යාලය ළඟින් බැස්සා. එනකොටම ඒකෙ පඩි පෙළ බහිමින් හිටියෙ කවුද ? දෙයියනේ......... ඒ දර්ශනෙන් මම අන්ද මන්ද වුණා. අඟල් හතරක් විතර දිග ටයිට්ස්කර්ට් එකක් ඇඳලා ඇඟට කිට් හිටියෙ තද චෙච්ච බ්ලවුස් එකක් ඇඳලා අලි කරත්ත රෝද දෙකක් වගේ කරාබු දාලා අව් කණ්ණාඩි දෙක ඔලුවට දාගත්තු කිළියක් වගේ ලස්සන රූපයක් තියෙන කෙල්ලෙක්ගෙ කරට අත දාගෙන.........

දෙවියනේ! පඩි පෙළ බහිමින් හිටියේ මගේ සගීක් උදාකර........!

ස........ගී........ක්......... මට කෑගැහුනද නැද්ද මම දන්නෙ නෑ. මුලු ගොඩනැගිල්ලම උඩට ගිහින් ආයෙ පොළවට පාත්වෙලා දඩාං ගාලා බිඳිලා ගිය සද්දෙ මට ඇහුණා. මගේ පපුව ඇතුළෙන් මොකක්දෝ වේදනාවක් සර්පයෙක් මගේ ඇඳිලා ඇවිත් මගේ ඉස්කට්ට ඇතුළෙ තියෙන මොළේට වැදුණා වගේ දූනුණා.

සගීක් මාව දූක්කා......... දෙයියනේ......... ඒ ඇස් දෙක මා දිහාට යොමුවුණා......... ඒත් දන්නේ නෑ වගේ අර ගෑනිගෙ කරට දාපු අත අරගෙන සාක්කුවට දාලා බොරුවට මොබයිල් එක ඇදගත්තා. ඒකෙ බොත්තම් ඔබ ඔබා ගිහින් ඉස්සරහ නවත්තලා තිබ්බ අලුත්ම පන්නයේ වාහනේකට ගොඩ වුණා....... දෙන්නත් එක්කම.

දෙයියනේ මගේ කකුල් හීතල වුණා.

මාව හුළඟට අහුවෙච්ච පරඬැලක් වගේ කැරකිලා ගිහිල්ලා බිම වැටෙන්න හදනකොට මම සිහිය එලවාගත්තා. අනේ මගේ බඩටයි මගේ අත ගියේ........!

*මනෝරමා නාගසේන - දිනපොත*
*දිනය: 1983. 06.06*

ජීවිතය බොහෝම සංවේදී පිහාටුවක් වගේ එකක්. මේ පිහාටුවෙ එක එක දාරවලට එක එක හැඟීම් හොඳින් ග්‍රහණය

කරගන්න පුළුවන්. භූගෝල්ම වේදනාකර දේවල් මතහැරලා යන්න
වගේම හිතට සුවයක් දෙන දේවල් ළං කරගන්න පාඩම කියා
දෙන්නේ කාලය විසින් කියලා මට හිතෙනවා.
බැහැර කළ කිසිම දෙයක් බැහැරි දේවල් වලින් ආපසු ඇදලා

ගන්න පුළුවන් විවේක බුද්ධියක් ඇති කෙනෙකුට. ජීවිතේට අද
මට කිසිම විවේකයක් නෑ. රාජකාරියේ වගකීම. මගේ පෞද්ගලික
ව්‍යාපාරවල වගකීම. මිලියන ගානක් යට කළ අලුත්ම ව්‍යාපාරයේ
වගකීම්. ඒ අතරේ ව්‍යාපාරවල රඳා පැවැත්මයි මතු දියුණුවයි
වෙනුවෙන් කෙරෙන වාණිජ ක්‍රමවේදයන්, උපදේශන සේවා,
මේ ඔක්කොම අතරේ මාව හෙම්බත් වෙලා.

මනෝජ්ට පොරොන්දු වෙච්ච නාට්‍ය පිටපත කොහොම
කරන්නද මන්දා........ හිතේ තියෙන අඳුරු අහුමුළු වලින් විංගන්න
බලාගෙන ඉන්න අතීත බලවේගවලට මොකට ඉඩ දෙනවද?

අද මම මනෝරමාව දැක්කා. එයා කසාද ගෑනියක්. එයාගෙ
මිනිහගෙ මැරයන්ගෙ තර්ජන ගර්ජන වලට බය වෙවී හැංගි
මුත්තන් කර කර ලව් කරන්න මට පිස්සුවක් නෑ.

ජීවිතේ එක කාලෙකදී කරන පිස්සු වැඩක් විතරයි ආදරය
කියන්නේ. අනුරාගය සතපවා ගැනීමේ සූක්ෂම ක්‍රමවේදයක්.
විදියට තමයි ආදරය කියන එක පාවිච්චි වෙන්නේ. කවුරුවත්
පිළිගන්න කැමති නැති වුණත් ඒක තමයි ඇත්ත! ශරීරේ ඇතුළින්
පැන නැගෙන අවශ්‍යතාවල් සපුරාලන්න ශරීරෙ අයිතිකාරයාට
සිද්ධ වෙනවා. මිනිස්සුන් ගෑනුන් තම තමන්ගෙ ශරීර කුඩුත්
එක්ක කරන්නෙ මේ ගනුදෙනුවම තමයි. පිළිගත්තත් නැතත්
ඒක තමා සම්පූර්ණ ඇත්ත.

ආහාර ගැනීම, මලපහ කිරීම, නිදාගැනීම වගේම කාම
ගනුදෙනුවත් බොහොම යාන්ත්‍රිකයි. සූක්ෂමයි. අවස්ථානුකූලයි.
නිසලා තුළ මේ යන්ත්‍රණය මට ගැලපෙන විදියට තියෙනවා.
නමුත් ආයෙත් මම ඊට වැඩි යමක් බලාපොරොත්තු වෙනවා.
ඒ මගේ ව්‍යාපාර සඳහා අවශ්‍ය මුදල් කන්දරාව!

අද හැන්දෑවේ නිසලාව ගෙදරට ඇරලවද්දී ගේට්ටුව ළඟට
ආපු මුරකාරයා දිහා මම හොඳට බැලුවා. ඒ මිනිහා මා දිහා
බැලූ විදිය මට ඇල්ලුවෙ නැති නිසා. හරියට මගේ පින්තූරයක්



අරගෙන අර නාකි ජෝඩුවට දෙන්න වගේ මිනිහා මා දිහා බැලුවෙ.

මහ ජෝඩුව මම ඈතින් විතරයි දැකලා තියෙන්නෙ. මම කැමති වුණත් ගිහිල්ලා ඒ දෙන්නට කතා කරන්න, නිසලා කියන්නෙ ඒවට තව කල් තියෙනවා. දැන්ම ඕවා කොහු කරගන්න එපා කියලා. අනේ මන්දා ගෑනුන්ගෙ ගණින් ඉස්සිලි එහෙම තමා. ලබන සතියෙ මට සිද්ධ වෙනවා ලක්ෂ පනහක් විතර නිසලාගෙන් ඉල්ලගන්න. මම දැනට ඒකට පරිසරේ සකස් කරනවා. සූක්ෂම සැලැස්මක් කියන එක ලේසි පාසු දෙයක් නොවේ. කරන කරන වැඩ කටයුතු හැම එකක්ම එකකට එකක් සම්බන්ධ නිසා දවලේ හැම කෙළවරක්ම හොඳට ශක්තිමත්ව සම්බන්ධව තිබීමයි අවශ්‍ය.

*සශික් උදාකර - දිනපොත*
*දිනය:1983 ජුනි 18*

මට අද ටිකක් අමුතු දවසක්. අද සශික්ගෙ අමුතු මූණු තුනක් විතර මම දැක්කා. හවස මම එයාට කතාකරන කොට එයා වැඩි උවමනාවකින් තොරව කතා කළේ. මොකක් හරි ප්‍රශ්නයක් එයාගෙ හිතේ තිබුණා.

අද හවස මාව හමු නො වෙන්න ප්ලෑන් එකක් තියෙන්න ඇති. මම ඒකයි බොරුවක් ගොතාගෙන එයාගෙ ඔෆිස් එකට ගියෙ. ඒත් මාව දැක්කම එයාගෙ මූණ සතුටු වුණේ නම් නෑ. බොහොම සතුටින් පිළිගත්තා. එයාට හොඳහැටි රඟපාන්න පුළුවන් වගේ.

මට ඇල්ලුවෙ නැත්තෙ අපි දෙන්නා ඔෆිස් එකෙන් එළියට එද්දි ලොබි එකේ හිටපු ගර්ල්. එයා කන්න වගේ සශික් දිහා බැලුවෙ. එයා දැක්කා විතරයි සශික්ගෙ අතත් මගේ උරහිසෙන් පහළට වැටුණා. මට ඒක හොඳටම දැනුණා. සශික් එයා එක්ක කොහේ හරි යන්න හිටියාද කියලා කවුද දන්නෙ......?

පිරිමින්ගෙ හැටි මම නොදන්නවයැ. උන්ගෙ හැම ඉරියව්වක්ම ඇල්මක් බැල්මක්ම ගැන ඔහ ඉතිහාසයක් මේ නිසලාට කියන්න පුළුවන්. දෙයියනේ ඒකිගෙ ඇස් විශාල වෙච්ච හැටි. ඇස්වලට කඳුළු ආපු හැටි. මට මහා දුකක් වගේම බයක් දැනුණා.

"කවුද සශී ඒ ගර්ල්." වාහනේ වාඩිවෙද්දි මම ඇහුවාම සශික් ගැස්සුණා.

"මොන ගර්ල්ද ?"

"අර ඉස්සරහ ලොබියෙ හිටියෙ ඔයා දන්නෙ.........?"

"මම දන්න ගර්ල් කෙනෙක් නෑ නිසා........ නිකං බොරුවට මගෙන් හරස් ප්‍රශ්න අහන් නැතිව ඉන්නවද ? මං අහනවද එහෙනං පාරේ දකින පිරිමි පෙන්න පෙන්නා ඔයාගෙන් ඒ කවුද ඒ කවුද කියලා."

ඔන්න සශික්ගෙ උත්තරේ.

මරු උත්තරේ. මගේ කටත් වැහුණා.

දූං ඉතිං දියල්ලකො උත්තර........!

කරන්න දෙයක් නැති නිසා මම මෝඩ පහේ හිනාවක් දාගෙන එයාගෙ මූණ දිහා බැලුවා.

"සොරි නිසා මට කේන්ති ගියා!"

එහෙම කියලා මගේ ඔලුවට දෙපාරක් තට්ටු කලා චමතින්. ඒක තමා එයාගෙ මැජික් තට්ටුව......... මම මෙල්ල වුණා. ඊට පස්සෙ අපි පුරුදු විනෝද සාගරේට බැස්සා. ලස්සන ෆිල්ම් එකක් බැලුවා. ඒකෙ අන්තිමට තිබුණේ පරණ පෙම්වතිය ඇවිත් අලුත් කෙල්ලට වෙඩි තියන එකක්.

අපෝ........ ඒ කතාව නිර්මාණය කරලා තියෙන විදියට ඒක හරිම ප්‍රබලව දැනුණා. අධ්‍යක්ෂගෙ දක්ෂතාවය නිසා තමයි ප්‍රේක්ෂකයා ඒ තරම් හැඟීම්බර වුණේ.

"නිසා ඔයා ඔය මොඩලිං වලට යද්දි ප්‍රවේසමෙන් යන්න ඕන........ කවුරුවත් ඔයාගෙ තනියටවත් නැනෙ......... පව් ඔයා තනියම වාහනේ අරගෙන යනවා. ඩ්‍රයිවර් කෙනෙක් ගත්තොත් නරකද බොඩිගාඩ් කමටත් එක්ක."

එන අතරෙහි සශී ඇහුවෙ හුඟාක් හැඟීම් බරව. සශික් ඇත්තටම හුඟාක් ආදරණීය හිතක් තියෙන කොල්ලෙක්. මට ලොබ හිතුණා.

"මං ආස නෑ සශී! අනික ඩ්‍රයිවර් කෙනෙක් කියන්නෙත් තවත් පිරිමියෙක්.......!"

මං එහෙම කිව්වාම සශික් හොඳටම හිනාවුණා. මමත් හිනාවුණා. මුළු වාහනේම දෙදරනතම් හිනාවුණා.



ඒ වුණත් ගෙදර ඇවිත් ඇඟපත හෝදාගෙන දුහුල් ඇඳුමක් ඇඳලා ඇඳට වැටෙද්දි මගේ හිතට ලොකු බයක් දැනුණා. මේ මහා විශාල බංගලාව මට දෙමාපිය ප්‍රවේණියෙන් ආපු එකක්.......! සශික් හිතන්නෙ එහෙමයි. අර වයසක ජෝඩුව මගේ දෙමාපියන්! සශික් හිතන්නෙ එහෙමයි.

ඒත් ඇත්තත් බොරුවත් අතරේ තියෙන්නෙ මොනතරම් කෙස්ගහක වෙනසක්ද ? මීට අවුරුදු ගණනාවකට උඩදී මම විදේශිකයෙක් එක්ක විවාහ වුණු බවක් ඔහු විසින් කලකට පෙර මිලට අරගෙන තිබුණ මේ විශාල බංගලාව මට අයිති වුණේ ඔහුගේ හදිසි මරණය නිසා බවත් සශික් දන්නෙ නැහැ. ඒ බව මට කියන්න අවස්ථාවක් එයාගෙන් ලැබුණෙත් නැහැ කිව්වොත් තමා වඩාත් නිවැරදි.

එයා මං ගැන දන්නෙ බොහොම ටිකයි. ඒත් ඒ ටිකෙන් එයා සැනසුණා මං හිතන්නෙ. මම එයා ගැන දන්නෙත් බොහොම ටික වෙන්න ඇති. ඒත් මමත් ඒ ටිකෙන් සැනසුණා නේද ? මට මගේ තර්කශ අතීතය ගැන කවදාවත් එයාට කියලා නෑ. මම ඒක කාටවත්ම කියන්න කැමති නැත්තේ ඒක රස කර කර කියන්න පුළුවන් අතීතයක් නෙමෙයි. ඇත අතීතයෙන් ඔනෑ තරම් සිද්ධි තියෙනවා. ඒ හැම එකක්ම තවත් කෙනෙකුට, දෙවැන්නෙකුට කියන්න ගියොත් ලොකු ප්‍රශ්න ඇති වෙනවා. සශික් මා ගැන දන්නෙ මේ ටික විතරයි.

ඒ මම මොඩලිං කරන ගර්ල් කෙනෙක්. එයාලගෙ ඔෆිස් එකට ආවෙ රස්සාවක් ඕනෙකමටම නෙමේ. ගෙදර නිකං ඉන්න කම්මැලිකමට. දෙමාපිය උරුමයෙන් මම විශාල මුදලයක අයිතිකාරී. එච්චරයි......... සශික් මා ගැන දන්නේ.

ආ......... තව දෙයක් එයා මා ගැන දන්නවා ඒ තමයි මං සමාජශාලා ජීවිතේට පුදුමාකාර විදියට ඇබ්බැහි වෙලා ඉඳලා එයාගෙ ආදරණීය ඉල්ලීම උඩ ඒ ජීවිතෙන් මිදිච්ච කෙනෙක් කියලා. අන්තිම එක තමා සශීක්ට මං ගැලපෙන බව නොලියා ලියූ සහතිකේ.

'නෝටි ගර්ල්' හොඳ ගර්ල් කෙනෙක් තරම් එකට මොකවද මට දෙන තෑග්ග සශික් එහෙම අහපු දවසක මට කියන්න තිබුණෙ එකම උත්තරයයි.

''දෙන්න පුළුවන් ඔක්කොම තෑගි මේ වෙද්දී ඔයාට දීලයි තියෙන්නෙ. සශික් එයාගෙ හිනා පොකුරේ (සශික්ට සිනා පොකුරක් තියෙනවා) අන්තිම අහිංසක හිනාව පෑවේ ළ වෙලාවෙ, සශික්ගෙ කඩවසම් දේහ විලාශයයි ඔය අද්භූත හිනා පොකුරයි එක්ක මේ මඟුල් සක්වලේ ඉන්න ගෑනුන්ගෙන් එයා බේරිලා ඉන්න එක මට එක වෙලාවකට පුදුමයක්.

පුදුමයක් කියලා කියන්නෙ නොදැනීමක්......... කවුද මට ඒ කතාව කිව්වෙ......... ඒක කලක් මම ආස්සරේ කරපු පණ්ඩිත පිරිමියෙක්ගෙ කතාවක්. මට හිනා.........!

*නිසලා නිරංජලා - දිනපොත*

*දිනය 1983 ජූනි 18*

දූන් නම් උදේට නැගිටින්නත් කම්මැලියි. නැගිට්ට වෙලාවෙ ඉඳලම අම්මා 'මඟුල් බෙරේ' පටන් ගන්නවා. ටික වෙලාවකතින් තාත්තත් ඒකට එකතු වෙනවා.

කපුවා ගෙනාපු අර මනමාල විස්තරේ කපුවා ගෙනාපු මේ මනමාල තෝම්බුව ... අම්මටයි තාත්තටයි දූන් වෙන වැඩක් ඇත්තෙම නැති තරම්. පවුලක එකම දරුවා වෙලා උපදින එක නම් මහාම කරුමයක්... මට සිය දහස් වෙනි වරටත් හිතෙන්න ඇති.

නිවාඩු දවසට මේ කංකරච්චලේ දෙගුණ තෙගුණ වෙනවා. මම අන්තිමට තීරණය කළේත් ආයිමත් දහම් පාසලේ උගන්වන්න යන්න කියලා. එතකොට දහමට හිත නැඹුරු වුණාම මනසට දැනෙන්නෙ පුදුම සැහැල්ලුවක්.

බෝධියේ සිහිල් සෙවණට වෙලා බෝපත් සැලෙන හැටි බලාගෙන ඉන්න භාවනාවට මම කැමතියි.

ලෝකයේ තියෙන ලස්සනම ශාක පත්‍රය බෝ කොළය වෙන්න ඇති කියලා මට හිතෙන්නේ. මැද නාරටිය සම්බන්ධ වෙච්ච නටුවෙන් එල්ලිලා ඉඳගෙන සුළඟේ හරඹ පාන්න පුළුවන් බෝ කොළේකට ම විසා වෙන මොකකටද? ඉර එළියට වගේම හඳ එළියටත් බෝ කොළවල ලස්සන හොඳට පේනවා. විවිධ රටා මවනවා.



මහා රැක හඳ පායලා තියෙන පසළොස්වක දාක ඩී දෙකට විතර අහස දිහා බැලුවාම මුළු අහසම බැබලෙන්නෙ සුදු පාටින් බව තේරෙනවා. කිරි බැබළෙන හඳපාන කියලා ඉස්සර කවියො හඳුන්වල තියෙන්නෙ මෙන්න මේ වෙලාවට පේන හඳපාන තමයි කියලා මට කවුද කිව්වෙ...

කවුද ඉතින් ධර්මෙ මිසක්. ධර්මෙට වගේ කවි පදවැල් මට නැතත් මට කවි රචනා බැරි වුණත් මගේම රචනාවල් මගේ හිතේ තියෙනවා.

ඒ රචනාවල් මගේ හිතේ ලියැවෙන්නෙ හිත පිරිසිදු වෙලා නිස්කලංක වෙච්ච වෙලාවට.

පාවෙන වලාකුළු වගේම ගලාගෙන ඇවිත් බිඳෙන මුදු රළක් වගේ මගේ හිතට මේ රචනා ලියවෙනවා.වචන අතින් දුප්පත් මම මේ රසවින්දනය වර නගා ගන්න බැරිව ගොළු වෙනවා.බිහිරි වෙනවා. ඒ වගේම අන්ධත් වෙනවා.

එතකොට මට හිතෙන්නෙ මම පංචේන්ද්‍රිය විරහිත නිකම්ම නිකම් ප්‍රාණ ප්‍රපංචයක් වගේ. හරිම අපහසුයි එතකොට. අපහසුව දැනෙන්නෙ කොහාටද කොතෙන්ටද දන්නෙ නෑ. ඒත් පුදුම අපහසුවක්. හුස්ම ගන්න බෑ. තහයෙන්වත් කටින්වත්. මේ අපහසුතාව බොහොම තදටම දැනෙද්දී තවත් පුද්ගල සම්බන්ධයක් අවශ්‍ය වෙනවා. හිතට ළඟින් ඉන්න කවුරුහරි හොයාගෙන ඒ හැඟීම් හුවමාරු කරගන්නවා.

ඒ හැම දේකටම පාලුව ඕන වෙනවා. හුදෙකලාව ඕන වෙනවා. ඒත් අතිශය හුදෙකලාව මළ පාලුවක්. ඒක හරිම අනාප්තිමත් ජීවිතයකට පාර කැපිල්ලක් කරනවා.

මිනිස් ආත්මයක් ලබා ගන්න මොන තරම් පෙරුම් පිරුමක් කරනවද කෙනෙක්. ඒත් ඒ මිනිස් ආත්මයෙන් පලක් ප්‍රයෝජනයක් ගන්නෙ කීයෙන් කී දෙනාද ? මනුස්ස ආත්මෙ ඉඳන් බලු බළල් සෙයියාවෙන් හැසිරෙන අය කොයෙක්ද ? සමහරු හරක්-මී හරක් වගේ. තව සමහරු සමනල්ලු කුරුල්ලෝ වගේ.

සියලුම අපායවල් තියෙන්නෙ මේ ලෝකෙමද කියලත් හිතෙනවා. ධර්මෙ හිටියානම් තර්ක කර කරවත් ඉන්න පුළුවන්.

"මොකෝ මේ අඹ ගහ යට ලොව් බංකුව උඩ තපස් රකිනවද ආ........."

චාපා මම ඉන්න තැනට ආවෙ එහෙම අහගෙන. මට හරි සතුටක් දැනුණා. හොඳම වෙලාවට චාපා ආවෙ.

"ඔයා දන්නවද වැඩක් අර අපේ ස්ටාෆ් එකේ ඉඳලා ට්‍රාන්ස්ෆර් වෙලා නුවරට ගිය සුජාතා ! එයාව ඩිවෝස් කළා නේ එයාගෙ හස්බන්ඩ්. සුජාතා ගේ අර ෂොප් එකේ මැනේජර් කෙනෙක් එක්ක සම්බන්ධයක් තියෙනවා කියලා. සුජාතා අහ අනේ දිවුර දිවුරා මට කිව්වේ එයාගෙ එහෙම එකක් නෑ හස්බන්ඩ්ගෙ නොමනා සම්බන්ධ කීපයක්ම තියෙනවා. ඒවා අහුවෙච්ච නිසා එයාට නිදහස ඕන වෙලා ඩිවෝස් කළා කියලා. ඒ වුණාට ඇත්තටම ඒක නෙමෙයි වෙලා තීන්නේ. මං හිතන්නේ ගෑනි වොම් පව අපිට කිව්වේ. ඊයේ අපේ මල්ලිට හම්බවෙලා ගෑනි පොළේදී අර මැනේජරයා එක්ක. දරුවන් හස්බන්ඩ් අරගෙන ගිය නිසා දැන් ගෑනි ජොලියෙ එන්ජෝයි කර කර ඉන්නවා. බලපං කවුරු විශ්වාස කරන්නද කියලා

ඒ ටික කියලා චාපා හති ඇරියේ හරියට කවුරු හරි පස්සෙන් දුවගෙන ඇවිත් එයාගෙ දිව කපා ගනීවි කියලා බයේ වගේ මට හිතා ගියා......... එයාට පුදුමයි.

"මොකෝ උඹට ඒවාට හිනා යන්නේ......... උඹ කියන්නේ සුජාතා කළ වැඩේ හරි කියලද ? ආ........."

"මං එහෙම කියන්නෙ මොකටද බං. මට හිනා ගියේ උඹ මේ හැමදාම අනුන්ගෙ චං හුං හොය හොයා පර්යේෂණයක් කර කර ඉන්නවා. නැද්ද......... උඹ මගුලක් කරගන්නේ. හැම තිස්සෙම වැරදිච්ච මගුල් ගැනම සමීක්ෂණේ කරන්නේ නැද්ද? උඹේ දෘෂ්ටි පථයට අහුවෙලා සමගියෙන් සමාදානයෙන් පවුල් කන ජෝඩුවක් නැරිය ආ........"

"අනේ ඇති ඇති නවත්තගනිං......... මේ උඹේ මනමාලයගෙ ෆොටෝ එක නාම මගේ ළඟ......... මේ.........!"

ඊළඟට චාපා මාව අවුස්සන්නට පටන් ගත්තේ හිතාගෙන ආපු විදියට වගේය.

"ශෝ බලමු.........!" මා ඉදිරියට පැනෙන්නේ ඉබේටමය.



මම පිංතූරය ඉල්ලද්දී චාපා එය රැගෙන දුවගෙන යයි. ඈ කාමරයට එමින් සිටින අම්මාගේ ඇඟේ හැපෙයි......... "නා පොඩ්ඩෙන් මගේ දත් සැට් එකත් බිම.........!"

අම්මාගේ හඬට මට හොඳටම හිනා යයි. අම්මත් දන්න විදිහේ ජීවිතේ මොන තරම් සැහැල්ලුද. මිනිසා උවමනාවෙන්ම තම පියාපත් වල බර පොදි එල්ලාගත් කුරුල්ලෙකි. මිනිසා ඇත්තටම තමන්ගේ පියාපත් වල බර පොදි එල්ලාගත් කුරුල්ලෙකි. ඒ බර පොදි මොහොතකට බිම හලා දමා ඌට නිදහසේ උඩු ගුවනේ සැරිසැරිය හැකි බව ඌම දන්නේ නෑ. එහෙම පියාඹන කොට කපාගෙන එන සද්දේ නින්නාද වෙගන එන හැටි අහද්දී ඌට මොනවද හිතෙන්නෙ.

ඌ ඒ නින්නාදෙට ඇහුම් කන් දේවි. ටිකක් නවතින්න හිතාවි. හිමන් හරිවි. ආයෙත් ඌ ඒවා අමතක කරලා අර බර පොදි ටික එල්ලාගෙන පියාඹාවි. බොහොම සීරුවෙන්......... හිත ඇඹුණත් ඌගේ පියාපත්වලට ඒ කැළඹිල්ල නොදී. මොකද අවකාශය එන්න තියෙන සමබරතාවය නැති වුණොත් ඌගේ ගමන ඇනහිටියි.

"බලාගෙන ගියාම බං අර ඉසිවරු හිටියාය කියපු පණ්ඩිතයො කියාපු දේවල් බොරු නෙමේනෙ........"

චාපා කියන්නෙ මාව අවුස්සන්නයි. මට එවිට ඇත්තටම තරහ ඇවිස්සෙයි. කියාපු දේවල් බොරු නෙමේනෙ.

"කැලේ ගහක් නහන්නෙ කැලේ ගහක්මයි. වහගන්නව කට ඔයත් ගෑනියෙක් නේද ?"

චාපා හිනාවෙන්නේ කට වහගෙනයි. ඒ අතරේ ගවුම් සාක්කුවෙන් අර ඡායාරූපය ඇදලා මට පෙන්වා දිව යයි.

බල බලා ඉන්න නම් හොඳයි ඉතිං පිරිමි පිංතූර......... මට සිතෙයි. ඒත් බල බලා ඉන්න පිංතූර විදියට කැලැන්ඩරවල ගහන්නෙම ගැහැනු රූපමයි. ඇඳුම් නැතිව සහ බාගෙට ඇඳුව ඉන්න පිංතූර. ඒකට මොන තරම් ඉල්ලුමක් තියෙනවද? බැරිවෙලාවත් ඒ වගේ පිරිමි පිංතූර ගැහුවොත් ගන්න කෙනෙක් පිස්සු කියාල හිනාවි. බලු බල්ලෙක්වත් බලන එකකුත් නෑ. ඕ මම මොනවද මේ හිත හිතා ඉන්නේ.

පුරුෂ විරෝධී ආකල්ප වලින් හිත පුරවාගෙනද ? එහෙම හිටපු මට ටිකක්වත් පිරිමියෙක් ගැන හිතන්න පුරුදු කලේ ධර්මෙ........ ධර්මෙ කොහේදෝ ඉඳන් පාවෙලා ඇවිත් කොහාටද පාවෙලා ගිය දේවතා එළියක් වගෙයි. මගේ සිතුවිලින් අර මැක්කා ගැන ලියන රචනාවක් වගේ. කොහේ ගියත් ඇවිත් ආයෙම නතරවෙන්නේ ධර්මෙ ළඟ.

අම්මලා කතා වුණා මේ අවුරුද්දෙ ඉවර වෙන්න කලින් සිද්ධ වෙන අපේ කසාදෙ ගැන. ඒ කියන්නෙ තව මාස අටයි තියෙන්නෙ. දෙයියනේ මම කොහොමද නන්නාඳුනන කෙනෙකුට භාර්යාව වෙන්නෙ. උඩ දෙවිවරු ඉන්නවනම් පහළට බැහැලා ඇවිත් බේරාගන්න මාව ! මම කියන්නෙ එච්චරයි.

මගේ දෛවය තීරණය කරන්න මට අයිතියක් නැති එක ගැන මම දුක්වෙන තරම ලියලා ඉවර කරන්න බැරි ශෝක රචනාවක් වේවි.

සහදා මුතුමාල - දිනපොත
*දිනය: 1983 ජූනි 20*

ගිම්හාන් රට ගිහිල්ලා මාසයක් ගත වුණා. මගේ අසනීප ගති මතු වෙන්න ගත්තා. හිස බරගතිය, කරකැවිල්ල, වමනය, උදාසීන ගති........ මේ ගති ලක්ෂණ මට හංගගන්නයි ඕන වුණේ. ඇත්තටම මට දවසින් දවසම ඒක අමාරු වුණා. ඒක තත්පරයක් වුණත් මහා වෙනසක් කරන්න පුළුවන් දෙයක් බව දැනගත්තෙ මේ සිදුවීමෙන් තමයි. තත්පර විනාඩිවලට එකතුවෙලා විනාඩි පැයත් එක්ක අත්වැල් බැඳගෙන පැය දවස්වලට පාවෙලා ගියා. අනේ මට බය වෙන තරමක්........ හැමදාම හීනෙනුත් බය වෙනවා. කාලය නතර කරගන්න මොකක් හරි යන්ත්‍රයක් නිපදවන්න කාටවත් බැරි වුණාද මන්දා.

මම නාන කාමරේට දුවන්න ගිහිල්ලා අතරමග පැසේජ් එකේදීම මට වමනෙ යන්න ආවා. දුවගෙන ඇවිත් මාව අල්ලගත්තා අත් දෙකකින්. මට පුදුම හිතිලා කැරකිලා ගිහිල්ලා බැලුවා. ගිම්හාන්ගෙ අම්මා !

"ඇයි දුව........!"



මට ඒ හඬ ඇසුණේ දිව්‍ය ලෝකෙකින්ද මන්දා. මම ඇස් පියාදාලන් බැලුවා.

"වමනෙ යන්න එනව නේද ? හ්ම........ ඔවා ඔහොම තමයි. අපි යමු දොස්තර ළඟට........ හොඳේ. ප්‍රවේසමෙන් ලිස්සන්නෙ නැතිව නාන කාමරේට ගිහිල්ලා එන්නකො."

දෙයියනේ මේ කතා ඔක්කොම කියන්නේ ගිම්හාන්ගේ අම්මා........! ඒ කටින් තමා ඒ මිහිරිම වචන ටික පිටවුණේ. මේ ලෝකයේ මං අහපු මිහිරිම වචන ටික දෙයියනේ........

ආරංචිය ඊට පස්සෙ තාත්තාට ගියා. මම හිතුවෙ ගෙදර මළ ගෙදරක් වෙයි කියලා. ඒත් බලන්නකො වුණේ මඟුල් ගෙදරක සතුට ගෙදර අස්සට දාපු එක. උදේම ඩොක්ටර් ළඟට ගිහිල්ලා ආවාට පස්සෙ දෙයියනේ ගෙදර මඟුල් ගෙදරක්ම තමයි. බෙර සද්ද විතරයි අඩු. අම්මයි තාත්තයි මදිවට සතුහරේ නැදෑයොත් ඔක්කොම ජයමංගල ගීත ගයනවා වගේ මට ඇසුණා. ඒ මදිවට ගිම්හාන්ට කෝල් එක්ක දෙන්න අම්මා කතා වුණා. එතකොට මාමා පැන්නා. තාත්තාත් කිව්වා එයාව 'සර්ප්‍රයිස්' කරවන්න නොකියා ඉඳිමු කියලා. ආවාම පුදුම වෙන හැටි බලාගන්න ආසාවෙ.

මට හීන් දාඩිය දැම්මා ඒ කතාව අහලා. සියල්ලම දැන් සිද්ධ වෙලා ඉවරනෙ. දැන් බලාගෙන ඉන්න ඕනෑ සිද්ධ කරපු දේවල්වල ප්‍රතිඵල ගැනයි. ඒක නිකං හරියට බෝම්බයක් පිපිරෙන කල් බලාගෙන ඉන්නව වගේ. ඇත්තටම මම මොන තරමක් බයේද හිටියෙ........ ඒත් හිතන තරම් යක්ෂයා කළු නෑ කිව්වා වගේ මට පුදුමත් එක්ක වෙච්ච දේට.

කමක් නෑ තව මාසෙකින් ගිම්හාන් එනවා. මේ සැරේ එයාට ලැබෙන්නෙ ජීවිතේටම නොලැබිච්ච 'සර්ප්‍රයිස්' එකක්. ගිම්හාන්ගෙ අම්මා උදම් අනනවා. ඒත් මේ උද්දාමය ඇත්තටම උදානයක් වට පත්වේවිද මට බය හිතෙනවා.

මනෝරමා නාගසේන - දිනපොත
*දිනය: 1983 ජූලි 18*

ජීවිතේට බොහොම තදින් ඇවිත් අවිවේකයි වැඩ නැතිව කම්මැලිකමින් හිටපු කාලෙයෙ මම කොහොම හිටියාද කියලා හිතාගන්නත් බැරි තරම්. ඒක හරියට කැම නැතිව බඩගින්නෙ හිටපු කාලෙ මතක නෑ වගේ තමා බඩගින්න මොකක්ද කියලා අමතක වෙන තරමට ඇවිත්. කෑම වැඩි වුණාම හැදෙන ලෙඩ රෝග රකුසන් වගේ වටේටම බලාගෙන ඉන්නවා. උදේට ටිකක් ඇවිදින්නත් හවසට ටිකක් පිට්ටනියෙ සෙල්ලම් කරන්නත් යොදාගන්නෙත් ඒ නිසාමයි.

ක්‍රිකට් ගහන්න නම් ඔහතරම් කට්ටිය. ඒත් ප්‍රැක්ටිස් වලින් තොරව ගහන ක්‍රිකට් අපරාදෙ. ජයනෙත්ති යි බාලසූරියයි දෙන්නත් හොඳට කඳ බඩ ආරගෙන ආපු අය නිසා එයාලගෙ ඇඟ වෙහෙසීමේ උනන්දුව වැඩියි. කසාදෙන් පස්සෙ දෙන්නම හොඳට ඇරුවා.

"නිකං මේ පිට්ටනියක් තල තලා ඉන්නවාට වඩා තරකද අර මම අරගෙන දාපු ඉඩමක් තියෙනවා ඒකෙ කුඹුරක්වත් හාන එක........"

මං එහෙම කිව්වෙ විහිලුවට වුණත් ඒකෙ ලොකු ඇත්තක් තියෙන බව මම දැනගෙන හිටියා. ඇත්තටම අපි කාය ශක්තිය යොදවලා අපේ කැලරි නිකම් ගෙවලා දානවා. ඒත් මොන විකාරද මේවා කියන්න ගියොත් මූං මට හිනා වේවි.

"එව් දැන් ඉතිං......... උඹේ කසාදෙත් ළඟයි නේ......... වයසට යන්න කලින් කුඹුර හාන එක නම් හොඳ!"

ඒ කට කැඩිච්ච කතා දැන් යාලුවන්ට හොඳට පුරුදුයි. මගේ කසාදෙ ගැන මට වඩා උන් හිතනවද මන්දා.

"උඹෙයි නිසලාගෙයි වෙඩිං එක කවද්ද බං."

එහෙම අහන වාරයක් පාසා හිත් ඩාදිය දමයි. අම්මා ගෙනෙන විවාහ යෝජනාවල් එක පැත්තකින්. නිසලා තව පැත්තකින් අම්මාට නිසලා ගැන කියන්න හිත තවම පෙළඹිලා නැත. තමුන් අම්මා නිසලාට දැකලත් තියෙන නිසා කියන්න බැරි කමකුත් නැත. නිසලාගෙ පසුබිමින් මහා නිධානයක් ඇති බව විතරක් හැමෝම දන්නා දෙයක්. නිසලාගෙ දෙමව්පියන්ගේ කැමැත්ත ලබාගන්ට මට බැරි වෙන එකක් නැති බවත්, හැමෝම දන්නා දෙයකි.



"අවුරුදු විසි පහේ පෙනුමැති කඩවසම්, පියකරු බුද්ධිමත්, උගත් නිකරු කුල කුමරු " ඒ ජයනෙත්ති මාව අඳුන්සන්නට කියන කතාය.

නිසලාත් මාත් අතර ඇති දැඩි සම්බන්ධය ඔවුන් දන්නේ නැත. නිසලාත් මාත් සාමාන්‍ය පෙම්වතුන් ලෙසත්, නොබෝ දිනකින්ම අපේ විවාහය සිදු වන්නක් ලෙසත් මිස ඉන් බැහැර කිසි දෙයක් ඔවුන් සිතනනෙ නැත.

නමුත් නිසලා වැනි කෙනෙක් සමඟ විවාහ ජීවිතය කෙබඳු වේදැයි මගේ සිතෙන් විපිලිසරයක් වැඩකරයි. අද හවස ඇය හමුවුණාම අපේ ඉදිරිය ගැනත් වැඩකටයුතු ගැනත් කතා කරන්නට අවශ්‍ය බව සිතේ ධාරණය කරගත්තේ මගේ ව්‍යාපාර කටයුතුවල ව්‍යාප්තිය ගැන කල්පනා කරමිනුයි,

*සගීත් උදාකර - දිනපොත*
*දිනය: 1983 ජූලි 17*

ස. ලි. මනෝජ්ට පොරොන්දු වෙච්ච විදියට නාට්‍ය පිටපත ලිවිල්ල පටන් ගන්න ඕනෑ. සැහෙන අදහස් කීපයක් ඇවිත් තියෙන බව හිත කියනවා. මේ කෙහෙල්මල් ව්‍යාපාරික කටයුතු නිසා මා තුළ සිටින සංවේදී නිර්මාණකාරයා මරා දමන ඒක පාපයක්. මනෝරමාව මට මතක් වෙන්නෙ එතකොට. කලාවත් එක්ක ඉන්නකොට ජීවිතේ හරි සුන්දරයි.

මනෝරමාව මතක් කරන්න මම බයයි. අපි දෙන්නා අතරේ 'සිතුවිලි කිරණ හුවමාරුව' බොහොම තදින්ම සිදුවෙන බව මම දන්නවා. ඒ දවස්වල අපි ඒක ටෙස්ට් කළා. සමහර අය අතර විතරයි මේ කිරණ හුවමාරුව හරියටම වෙන්නෙත්. එක සමාන අදහස් දරන එකිනෙකාට හුඟාක් හිතින් බැඳී ඉන්න අය අතර. ඒත් අද වෙනකොට අපි අතර කිසි බැඳීමක් නෑ. අපි අතරට ආපු නිසලා විශා මහා ප්‍රාකාරයක් බැන්දා අපි අතරේ. පුදුමාකාර විදියෙ සෞන්දර්යාත්මක සහ සම්බන්ධයක් නිසලාත් මාත් අතරේ තියෙන්නේ.

එදා මනෝරමාව අන්තිමට දැක්කෙ කවදාද ? මුළු මාස දෙකකට විතර උඩදී මගෙ හිතේ. නිසාවි මම දන්නෙ යන්තමටි.

මට උවමනා වුණේ නැහැ එයාව හමු වෙන්න. කතාකරන්න. ඒ එයාගෙ හස්බන්ඩ්ගෙ මැරඩින්ට බයේ නෙමෙයි.

මගේ හිතේ කිසිම හිස් තැනක් නැති විදියට නිසලා පිරිලා හිටිය නිසා සිත ගත දෙකම පරිපූර්ණවෙලා තියෙන්නෙ නිසලාගෙ ආදරේට. එයට වඩා පරිපූර්ණත්වයක් පිරිමියෙකුට තියෙයිද මං දන්නෙ නෑ. එයිට වඩා දෙයක් මොකටද පිරිමියෙකුට.

රුපියල් අස්සෙ මොන අලුක්කාල්ද ? ඒත් මොන කෙහෙල්මලකටද අද මට මනෝරමාව මතක් වුණේ.

* * *

මට සඟීක් ගැන මතක් වුණා. දවසේ එක දිගටම වගේ මතක් වුණා. ඒ නිසා තමයි මම එයාට ඇමතුමක් ගන්න හිතුවේ......... එතකොට වෙලාව ඊයෙ රෑ දහයට විතර ඇති.

මගේ හිත වෙව්ලුවා. අතත් වෙව්ලුවා. දෙවියනේ කාලයක් ආදරේ කරලා තවමත් මම ආදරේ කරන සඟීක්.........

මට ඔයාට කියන්න දෙයක් තියෙනවා. ඔයාට පුදුමත් හිතෙයි. එයා මගෙන් වෙන් වෙලා යන එක වළක්වාගන්නයි මට ඕන වුණේ. ඒ නිසයි මෙහෙම වුණේ. නමුත් ඔයා මගෙන් වෙන්වෙලා ගියේ පුදුම විදියට. ඒ ගැන මට දුකයි. කණගාටුයි.

ඒ හැඟීමට ඒ වචන දෙක යොදන එක වැරදියි. අසාධාරණයි. ඒ. ඒ තරම් තියුණු සියුම් හැඟීමකට සමාන කරන කොට ඒ වචන නිකම් පරඬැල් වචන.

නාට්‍ය කරන කාලේ මම හුඟක් ඉවසීම පුරුදු වුණා. හික්මීම පුරුදු වුණා. ඒක ඉබේටම ජීවිතේට ලැබෙන දේවල්. ඒ නිසාවෙන් මිස සඟීක්. මේ දුක උහුලන්න වෙන ක්‍රමයක් තියෙන එකක් නෑ. වෙන ගෑනියෙක් නම් පොළෙවෙ පස් කාවි. එදා ඔයා මාව දැකලා නොදැක්කා වගේ  වෙන ගෑනියක් එක්ක ගිහිල්ලා, වගේ වගක් නැතිව වාහනේට ගොඩවෙනවා දැක්කාම, මට ඒ ඉවසීම පුරුදු වෙලා තිබුණේ ඔයාගෙ පිනට. ඉතින් මේවා ඔක්කොම මතක් කරගෙනයි මම ඔයාට ඇමතුම ගත්තෙ. පුරුදු නොම්මර ටික මගේ ඇඟිල්ලෙන් එබෙන කොට මට මොකක්ද වගේ දැනුණා. ඒක හරි අමුත්තක්.



ඒත් සඟීක් ! රිං වුණා. රිං.........වුණා. ඔයා කෝල් එක ගත්තෙ නෑ. ඔයා ගෙදර නැතිව ඇති කියලා මට හිතන්න බෑ. එහෙනම් වෙන කවුරුහරි ෆෝන් එක ගන්නවානේ. ඔයා ඇත්තටම මගේ නොම්මරේ දැකලා තමයි නොගත්තේ. මට පුදුමයි ඔයා ගැන.

නෑ මං පුදුම වෙන්නෙ නෑ. ඔයා ගැන. ඔයා ගැන පුදුම වෙනවා නම් මං ඔයාව හඳුනාගෙන නෑ. ඔයත් මාත් දන්නෙ කොයි කාලෙ ඉඳන්ද? ඔයා අර නිමතෙකුට ආදරේ කරන ඉස්කෝලෙ කාලෙ ඉඳන්ම මේ පහුගිය අප්‍රේල් මාසය දක්වාම මාත් එක්ක ඇයි හොඳයිකම් පැවැත්තුවා. ඔයා මගේ ආදරෙන් තෘප්තිමත් කියලා ඔයා මට කිව්වා. එහෙම තෘප්තිමත් කෙනෙක් කොහොමද තවත් ගෑනියක්ව ආශ්‍රය කරන්න යන්නෙ.

ඔයා හරියට කුඩැල්ලෙක් වගෙයි සඟීක්......... එක ගෑනියෙක් අතාරින කොට තව එකියක් අල්ලා ගන්නවා. තව එකියක් අල්ලාගෙන මිස ඉන්න එකී අතාරින්නෙ නෑ. ඒත් මම ඔයාට දූත් වෛර කරන්නෙ නෑ. ඔයාට වෛර නොකර ඉන්න හේතු තියෙනවා. ඔයාට වෛර නොකර ඉන්න ලොකුම හේතුව මා ළඟ තියෙනවා.

මම එයාට පුරුදු කරන්නම්. උගන්නන්නම් ඔයාට විතරක් නෙමෙ මුළු ලෝකෙටම ආදරේ කරන්න.

*මනෝරමා නාගසේන - දිනපොත*

*දිනය:1983 ජූලි 02*

උදේ පාන්දර බොහොම පිබිදුනු මනසින් හිටිය මම මේ වෙනකොට හරියට හුළං ගිය බැලුම් බෝලයක් වගේ. මගේ ජීවිතයේ මේක එක්තරා ඉලක්කයක් වැරදුණු අවස්ථාවක්. ඇත්තටම මේ ශෝකය මම බෙදාගන්නෙ කවරු එක්කද? හොඳම වැඩේ දිනපොතේ ලියලා තියන එකද මා දන්නේ නෑ.

"අපි අද කොහේද ඩාර්ලින් යන්නේ."

හැන්දෑවේ නිසලා මගේ වාහනයට ගොඩවුණේ හරිම උණුසුම් හැඟීමෙන්.

"ලෝකෙ කොයි කොණකට හරි කමක් නෑ ඔයාට ඕන තැනකට."

මම එහෙම කිව්වෙ හිතලා මතලා නෙමෙයි කටට ආපු විදියටම ඕනැම 'පෙම්වතෙක්' කියන විදියට. ඈ මගේ උරහිස මිරිකා අල්ලාගෙන හිටියේ පුදුම ආදරේකින්.

"අපි හොටේල් එකට ගිහින් එමු." ඈ එහෙම කිව්වෙ දෛනික ගමනක් මතක් කරමින්.

"යමු......... ඊට පස්සෙ මට අද තවත් වැඩක් කරනවා."

"ඒ මොකක්ද ?" නිසලා සසල වෙච්චි ඇහුවෙ ටිකක් පුදුම වෙලා.

"මං අද ඔයාගෙ අම්මවයි තාත්තවයි හම්බ වෙලා අපේ සම්බන්ධෙට කැමැත්ත ගන්නවා."

"අ.........අද.........ඇ.........ඇයි මේ හදිසියෙ.........?"

නිසලා ගොත ගහන්න පටන් ගත්තා. "ඇත්තටම සාමාන්‍යයෙන් නම් ගෑනු ළමයෙක් මේක සතුටු වෙන අවස්ථාවක්. ඇයි ඔයා ඒක වළකන්නෙ?"

"අනේ.........එපා සකී......... එපා !" ඇගේ වැළපිල්ල මට අදහාගන්න බැරිවුණා.

"අපි යමු කාමරේට. ගිහිල්ලා කතා කරමු."

මම යෝජනා කළේ වැඩි හොඳට. වටේ පිටේ යන සෙනඟ අපේ වාහනයට එබෙන්න ගත්ත නිසා. ඒ වුණත් කාමරේදී මට අහන්න ලැබුණු දේවල් නිසා මට දුවන්න පාරවල් මදි වුණා වගේ.

නිසලාගේ අම්මයි තාත්තයි නෙමේ මේ ඉන්නේ. මේ ගේත් එයාගෙ බැඳලා හිටපු සුද්දගෙලු. ඒ සුද්දා හදිසියෙ මළාලු. සුද්දගෙ දේපළ වලින් ලංකාවෙ තියෙන මේ ගේයි තව පොඩි ඉඩමකුයි විතරලු එයාට අයිති. අනිත් දේපළ ඔක්කොනාම සුද්දගෙ කසාද ගෑනි අයිති කරගෙන තියෙන්නෙ නොසිතූ විදියට. නිසලා හඬා වැටි වැටී ඒ කතාව කියද්දී මට ඈ ගැන හිතුණේ දුකක්ද? නෑ කෝපයක් තරහක්!

"ඇයි මාව රැවැට්ටුවෙ තකතිරු ගෑනියේ?"

මගේ හිත කෑගැහුවා. මගේ හිත එහෙම කෑ ගහනකොට මගේ අත්, මගේ අත් වෙව්ලුවා. මගේ ඇඟිලි දහය පණ පොවලා ගින්නෙන් රත්වුණා වගේ දැනුනා.

මම හෝටල් කාමරයේ කවුළුව ළඟට ආවා. අහසේ හඳ



පායලා තිබුණත් මට ඒක පෙනුනෙ මොකක් වගේද? අහසේ ගහපු ගිනි මැලයක් වගේ. ගිනි මැලයක් නෙමෙ ඒක දර සැයක්. අපේ ආදරේ දර සෑය !

මගේ ව්‍යාපාරය නංවන්න හිතාගෙන ඉන්න මුදල් කන්දරාව එහෙනම් ලැබෙන්නෙ නෑ නේද ? දෙවියනේ කියලා හිතනකොට මට මොනවද නොහිතුනේ......... අවුරුදු දෙක තුනක්ම තිස්සේම මං මහා මායාවකට බරපතල විදියට අහුවෙලා හිටියා වගේ දැනුණා.

ඇදේ වැතිරිලා අඩන නිසලාගේ මේ ලෝකෙ ලස්සනක් මට පෙනුණෙ නෑ. නිකම්ම නිකම් ගෑනු ශරීරයක්......... සුවඳ ගල්වලා මෝස්තර ඇඳුම් අන්දලා හැඩ වැඩ කරන නිකම්ම නිකම් ශරීරයක්. අනිත් ගෑනුන්ට වඩා අහවල් ලස්සනක්ද මේ ගෑනිට තියෙන්නෙ.

ඔක්කොටම වඩා හපන් මේ ගෑනි මාව රවට්ටපු එක.......! මහා ධන කුවේර පවුලක එකම එක උරුමක්කාරී.......! මටයි ගහන්න ඕනැ මේකිගෙ මායම්වලට රැවටුනාට. හෙට අනිද්දා තියෙන මගේ බිස්නස් ඩීල් එකට මොකද කරන්නේ. නිකම්ම නිකම් උඩින් වැටිච්ච ගෑනියෙක් බැඳගෙන ජීවත් වෙන්න මට පිස්සුවක් නෑ. ඒ මදිවට කිසිම චාරයක් නැති ජීවිතයක්. ක්ලබ් ගානෙ කරක් ගහ ගහ ඉඳලා නාකි සුද්දෙක් බැඳගෙන හිටපු, පිරිමින්ගෙ අතින් අත ගියපු ගොමස්තඩ ගෑනියෙක්........

මගේ ඔලුව කැරකෙන්න ගත්තා. ඇයි මළ යක්ෂණියෙ මාව මේ විදියට රැවැට්ටුවෙ කියලා මට එයාගෙ ඔලුව අල්ලලා බිත්තියට ගහනවා මට පෙනුණා. ඊට පස්සෙ ඇඳ පුරාම ලේ විසිරුණා......... ටිකකින් කාකි ඇඳුම් ඇඳගත්තු කට්ටියක් ඇවිත් මාව ඇදගෙන ගිහින් වාහනේකට රිංගෙව්වා.......!

මගේ මනසට ඕනෙ අතක යන්න ඇරලා අන්තිමේදී මම ඒ කිසිම දෙයක් කරන්නෙ නැතිව නිසලා එහෙමම ඉද්දී පිටවෙලා ආවා. ආයෙ එයත් එක්ක මගේ කිසිම ගනුදෙනුවක් නෑ කියලා මම කටින් නොකිව්වට මම එයාට ඒ බව ඔප්පු වෙන්න කියලා තමයි ආවෙ........

ගොඩනගාගෙන හිටපු ලෝකයත් එක රැයින් කඩාගෙන

වැටුණම හිතට දැනෙන වේදනාවෙ දිග පළල මට හොඳටම තේරුණා.

මම ගෙදර එනකොට ඊ දෙකයි. මුරකාරකමටයි, වැඩකාර කමටයි දෙකටම ඉන්න සිරිසෝම පවා මට පෙනුනෙ යක්ෂයෙක් වගේ. ගේට්ටුව අරිනකොට මම දැක්කා සිරිසෝමගෙ යක්ෂ දත් දෙක එළියට ඇදිලා ආවා හරියට දළ පූට්ටුවෙකුගේ වගේ. සිරිසෝමගේ ඇස් ලොඩ් ඉස්සරහට නෙරලා ඇවිත් ඩාං ගාලා මගේ කාරෙකේ වින්ඩ්ස්ක්‍රීන් එකේ හැප්පුණා.

මම මාර විලාපයක් තිබ්බා! ටික වෙලාවකින් බලද්දී මම වැටිලා හිටියා වාහනේ ස්ටියරින් වීල් එක අයිනට.

''අනේ බුදු රත්තරන් පුතේ මොකද මේ උනේ.........''

ඊට පස්සෙ මට ඇහුනෙ අම්මගෙ විලාප හඬ.......! ඊට පස්සෙ කීප දෙනෙක් ඇවිත් මාව එළියට අරගෙන ඇඳේ හාන්සි කෙරෙව්වා....

''මහත්තයා හොඳටම බීලා......... මේ......... කකුලුත් වෙව්ලනවා.....'' ගෙදර වැඩ කරන පියවතී මරු විලාප තිබ්බෙ හරියට ලෝකෙ ඉන්න එකම බීපු මිනිහා මම වගේ. මගේ යාලුවෝ ඇවිත් මාව වටකරගෙන විවිධාකාර දේවල් කියලා මගේ හිත හැදුවා.

මම උන්ට විස්තරේ කිව්වා. මෙතෙක් කාලයක්ම නිසලා මාව රවට්ටලා තියෙන හැටි කිව්වාම උන්ට පුදුම හිතුණා.

පුටුවක වාඩි කරවලා මට තේ එකක් බොන්න සලස්සන ගමන් මට ජගත් කියපු කතාව හරිම පුදුම කතාවක්.........

''මචං......... උඹ මාත් එක්ක තරහ වෙන්න එපා. මේක කියනවට......... මට ඊයෙ තමා නිසලා ගැන විස්තරයක් දැනගන්න ලැබුණේ. මම ඉතා ඉක්මණින්ම උඹව හම්බ වෙලා ඒක කියන්න ඕනෑ කියලා හිතුණේ......... මචං නිසලා ටික කලකට ඉස්සර වයසක සුද්දෙක් බැඳලා ඉඳලා තියෙන්නේ. ඒ සුද්දා හිටි ගමන් මැරුණේ නිසලා දත් ඔය ඉන්න මහා විශාල බංගලාවෙදි. සුද්දගෙ කසාද ගැති ඉන්නෙ කැනඩාවෙ. විවාහ වෙච්ච දුවෙකුත් ඉන්නවා. එයාලා දත් ලෙඩක් ඇදලා තියෙන්නේ සුද්දගේ මරණය ගැන සැකයි කියලා. රහස් පොලිසියෙන් මේ දවස් වල ඒ ගැන හොයන්න වැඩ පටන් ගන්නලු ඉන්නේ. මට මේක කිව්වෙ මං අඳුනන ලෝයර් යාලුවෙක්. මචං උඹට පරිස්සම් වෙන්න කියන්නයි මට ඕන කළේ.........''

මගේ ඔක්කොම වෙරිමත හිඳිලා ගියේ පරාක්‍රම කියාපු ඒ කතාව අහලා. නව පොඩ්ඩෙන් මම මාර උගුලක වැටෙන්නේ......... බැරි වෙලාවත් මම නිසලාව බැන්දානම් වස්තු තණ්හාවට මොකද මට වෙන්නේ.........!

ජීවිතේ එක කර්කශ පරිච්ඡේදයක් විතරයි කියලා මම හිතා ගන්නවා එයින් ගියා මදෑ.........

සශීක් උදාකර - දිනපොත
දිනය: *1985 ජූලි 03*

මාස දෙක තුනක්ම යාන්තම් කණක් ඇහිලා හිටියා. ඉස්කෝලෙ විවිධ ප්‍රසංගය පිටින් දාලා......... ඒකෙ අයිටම්ස් වලට ළමයි පුහුණු කරන ඒවා වගේම පාසල් වෙලාවෙන් පස්සේ සියලුම පුහුණුකිරීම් කටයුතුවල වගකීම සම්භාරය පැවරුණේ මටයි. ප්‍රින්සිපල් ඒ වැඩවලට මාව පත් කළේ විනය කටයුතු ගැන බලා කියාගන්න මට පුළුවන් කියන විශාල විශ්වාසයෙන්. අනික මුලු ස්ටාෆ් එකෙන්ම දහම් පාසල් ගුරුවරියක් විදියට ඉරිදට වැඩ කරන්නේ මම විතරයි. ඒ නිසා ද මන්දා ප්‍රින්සිපල්ගෙ හිතේ විශාල විශ්වාසයක් ගොඩනැගිලා.

''ඔය වැඩ කටයුතු ටික ඉවර වුණු ගමන් දූ දත් විවාහ කටයුත්ත ගැන බලන්න ඕනෑ හොඳේ. ඔයා හොඳට මතක තියාගන්න දූත් බඳින වයස පහුවෙගනත් යන තරම්. දූත් ඔයාට විසිඅටත් ඉවරයි.''

අම්මගේ දේශනය මට කන්දොස්කිරියාවක් වගේ ඇහෙන්නෙ ඒක හැම තිස්සෙම ප්‍රතිරාව වෙන නිසයි. ප්‍රතිරාව නොකර කොහොමද......... මම ඉන්නෙත් කොච්චරවත් අර අම්මා කියන්න වගේ බිරී ඇතින්නක් ගානටනේ. ඒ වුණාට මේ බිරී ඇතින්නගෙ ජීවිතේ කොච්චර පරිපූර්ණද ? අවිවාහකයි කියලා තිකම් කාලා බීලා උඩ බලාගෙන කට බලියාගෙන ඉන්නෙ නැහැ. ඉස්කෝලෙදි හොඳට ඇප වෙලා කැප වෙලා දරුවන්ට උගන්නනවා. දරුවන්ගෙ පොත් ගොඩ ගෙදර උස්සන් එනවා දකිද්දී තාත්තත් කෑගහනවා.

''ඔය පංතියෙ ළමයි ඔක්කොම ඉන්නෙ අපේ දූගෙ ඔලුව උඩනෙ බලාගෙන ගියාම. ළමයෝ තමුමන්ටය කියලත් ජීවිතයක් තියෙන්න ඕනැ. දවස් පහේම ළමයි එක්ක, ඉරිදට දහම් පාසලේ. ඔයාගෙයි කියලා වැඩක් නැද්ද ළමයින්ට ප්‍රශ්න පත්තර හදනවා. ගෙදර ඇවිත් ඊළඟට උත්තර බලනවා. නිදිමරාගෙන! ඔහොම පුළුවන්ද ළමයෝ ජීවත් වෙන්න. ඉස්සෙල්ලා තමුන්ගෙ ජීවිතේ අඩිතාලම දාගන්න ඕනැ. මේ වෙනකොට ඔයා ඒක දාලා තියෙන්න ඕනැ තේරුණාද ? අපි ආවිලා සියලා වෙන්නෙ මඟ යන්න පණ නැති තරමට නාකි වුණාමද ආ.......!'

තාත්තා කියාපු අන්තිම ටිකට මට හිනා.

''ඇත්ත තමයි මේ අත් දෙක හයි හත්තිය තියෙද්දී අපට මුනුබුරෙක් වඩාගන්න අවස්ථාවක් ලැබෙන්න ඕන. තාත්තා කියන කතාව සම්පූර්ණ ඇත්ත.''

ඒ අම්මා......! අම්මා ඉතිං කවද්ද තාත්තගෙ අදහසත් අනුමත නොකර හිටියෙ. අම්මා තමයි තාත්තගෙ එහෙයියා. තාත්තටත් නරක නෑ. අම්මා වගේ 'එහෙයි භාර්යාවක්' ලබපු එක. මම හිතින් හිනනවා මමත් කවදාහරි එහෙයි භාර්යාවක් වෙයිද ? නැත්නම් මට 'එහෙම ස්වාමියෙක්' ලැබේද ? කොහොම වුණත් මේ මංගල්ල කතා දැන් කන්වල නින්නාද දිදී ඇහෙනවා. ඒක අතකට කල වයස ගෙවෙන්න කලින් ඒ කටයුතුත් කෙරෙන්න දීලා අම්මලා තාත්තලාට නිදහස් කරලා දාන එක මගේ යුතුකමක්.

නැත්නම් මට පව් සිද්ධ වෙනවා. හොඳයි ඊළඟ දහම් පාසල් වාරයේ විභාගයෙන් පස්සේ මම අම්මලා කියන දේ ගැන ටිකක් හිතලා බලන්නම්. එතකොට අඩුගානෙ මගෙ කන් දෙකටවත් සැනසිල්ලක් ලැබෙයි.

*සඳා මුතුමාල - දිනපොත*
*දිනය: 1983 ජූලි 03*

මම ලියපු අලුත්ම ලිපිය 'ලියසාර' පත්තරේ පලවෙලා ඒක දැකලා අම්මාට නම් හරි සතුටුයි. ඇත්තටම ගිම්හාන්ගෙ අම්මයි තාත්තයි මගේ හැකියාවන් හඳුනාගන්නෙ දූන් තමා කියලා මාමා



කිව්ව කතාව ඇත්ත. ගිම්හාන්ගෙ මාමාත් ඉඳල හිටලා මොකක් හරි වටිනාම කතාවක් තමයි කියන්නෙ. මට හිතුණා.

ලිපියෙ මම ලිව්වෙ ස්වාමි පුරුෂයා වෙනුවෙන් බිරිඳකගේ යුතුකම් මොනවාද කියන එක අද සමාජයට ඔබින ආකාරයට ඒක මම හරිම ලයාන්විත විදියට ලියල තියෙන බව කියවපු යාලුවො දෙතුන් දෙනෙකුත් කතාකරලා කිව්වා. මටම හිනා. ඔවා මොකටද ඔය ගුවන් විදුලි වැඩ සටහන්වලදීත් අසන්නන්ට උපදෙස් දෙන ප්‍රසිද්ධ ජනප්‍රිය කාන්තාවෝ ඉන්නෙ විවිධ කටයුතුවලට නම් දරාපු. මං වගේ පුංචි ගෑනියෙක් ඔහොම එකක් කළාම මොකද?

ඒ වගේ මගේ පටිගත කරලා තිබ්බ සිංදුව ගැනත් ගිම්හාන්ගෙ අම්මට උනන්දුවක් ඇතිවෙලා. ඒකෙ කොපි ගහන්න කියලා රෙකෝඩ් බාර් එකට යැව්වෙ එයාමයි. එයාලා අඳුනන කාගෙද මාර්ගයෙන් ඒක ගුවන් විදුලියෙ ප්‍රචාරය කරවන්න තල්ලුවක් දෙන්නම් කිව්වෙ ඒ සිංදුව සශික් ලියාපු සිංදුවක්.

පුදුමයි දෛවයෙ හැටි. සශික් ලියාපු සිංදුවක් මං ගායනා කරපු එක මාධ්‍යයෙන් ප්‍රචාරය වෙනකොට සශික් කොහේවත් මම තව කෙනෙක්වත්.

අද උදේ ඉඳන්ම ගෙදර හරිම උණුසුම්.

ගිම්හාන්ගෙ ලංකාගමනය උදේ දහයකුත් ගානට යෙදිලා තිබුණේ මගේ ඇඟ සීතල වෙලා වගේ.

කුසේ ඉන්න කළලෙටත් ඒක දැනුනද මන්දා. මාස තුනක බඩක් එක්ක මම ඉන්නවා දැකලා ගිම්හාන් 'සර්ප්‍රයිස්' වෙන හැටි අම්මා හිනාවෙවී කියන්න හිටියා. සර්ප්‍රයිස් තමයි කෙරුම්කාර පවුල්වල අලුත්ම මෝස්තරේ.

''ඇයි මේක මට කිව්වෙ නැත්තෙ කියලා මට බනිද්ද දන්නෙ නෑ.'' ගිම්හාන්ගෙ අම්මා කිව්වෙ මගේ ඔලුවත් අත ගගා. අනේ එයාගෙ කරුණාව......... මෛත්‍රිය........ යන්නම් කුසේ ඉන්න දරුවට පිං සිද්ධවෙන්න මට මේ සැළකිලි.......බැඳලා අවුරුදු කියක්ද ? හතරක්.

කොහොම කොහොම හරි උද්වේගකර අවස්ථාව උදාවුණේ කිරිබත් මේසෙ ළඟට ගිම්හාන්ව එක්කගෙන ආවෙ ගෙදරට අඩු ගමන්. මම දොර රෙද්ද අස්සෙන් බලා හිටියා. අම්මලාගෙ අතේ

නෙ තූල තියෙන්නෙ. මම රූකඩේ. ඊළඟට ගිම්හාන් රූකඩේ නැටෙව්වා. කෝ මං ගිහිල්ලා මනෝ දූව එක්කරං එන්න. එහෙම කිව්වාම ගිම්හාන් උඩ බිම බැලුවා මට පෙනුණා. මෙන්න ඊළඟට ගිම්හාන්ගෙ අම්මා ඇවිත් මාව අතින් අල්ලාගෙන එක්කරං ගියා තේ මේසෙට. ගිම්හාන්ගෙ ඇස් උඩ ගියා!

''හා........ ඇද්ද සර්ප්‍රයිස් එක........!''

මාමා කෑගැහුවා. හැමෝම අප්පුඩි ගැහුවා. ගිම්හාන් මං දිහා බැලුවා බැලිල්ලක්!

ඒ බැලුම අස්සේ මට පෙනුණා නිල් බැලුම් කොළ බැලුම් රතු බැලුම........! රතු බැලුම පුපුරලා ගියා.

''හා ........ ලැජ්ජ වෙන්න එපා. තමුන්ගෙ භාර්යාව සතුටින් පිළිගන්න.'' මාමා කෑගැහුවා හරියට කොල්ලෙක් වගේ.

ගිම්හාන් පුදුමයෙන් මගේ බඩ දිහා බලලා අත්දෙකින් මගේ උරහිස් අල්ලලා මගේ නළල සිපගත්තා. ලොකු ලොකු පවුල්වල මොනවා නැතත් හොඳ සමාජ චාරිත්තර තියෙනවා මගේ හිත කිව්වා.

''මාස තුනයි තාම........! කන්න ආස කෑම ජාති ගෙනත් දෙන්න! යන්න කැමති තැන්වල එක්කරං යන්න......! මන්න ඔයාට බාරයි. අපි මේ ටිකේ එයාව ඇහැක් වගේ බලාගත්තා.''

අම්මා කිරිබත් කෑල්ලක් බෙදන ගමන් කිව්වෙ සන්තෝසෙ උතුරලා යන කටහඬින්. පුදුමාකාර සතුටක් මුලු ගේ පුරාම මහා සද්ද හිනා........ අත්පුඩි ගැසීම........ විහිළු තහළු.

මට දෙලෝ රත් වුණේ කාමරේට ගියාමයි. මගේ උරහිස් දෙකෙන් තදින්ම අල්ලලා හොලවන ගමන් ගිම්හාන් මං දිහා බැලුවේ ගින්දර ඇස්වලට අරගෙන. දත් කුරු කන ගමන් ඔහු කිව්වෙ එකම වචනයයි. ''පරට්ටී !''

ඒ අකුරු හතර ඇතුලෙ මට නවග්‍රහ ලෝකෙම පෙනුණා......! යකඩ බෝල ........ වානේ බෝල ........ රිදී බෝල .......... රන්තරන් බෝල වගේ ඒ ග්‍රහලෝක නම්යම මගේ ඔලුව වටා කැරකුවා. ඊළඟ සැරේ ගිම්හාන්ගෙ කම්මුල් පාරෙන් මට මේ ඔක්කොම බෝල වර්ග පෙනෙයි කියලා හිතාගෙන මම ඇස් පියාගත්තා.

එනකොටම කාමරේට ආවෙ ලස්සන රිදී ඇඳුමින් සැරසිලා



රන්තරන් ඔටුන්නක් දාපු ලෝකෙම ලස්සන මූණට අරගත්තු සුරංගනාවියක්! ගිම්හාන්ගෙ අම්මා! චන්ද්‍රා වික්‍රමසුන්දර නෝනා....!

ගිම්හාන්ගෙ අත් මාව අතෑරියා.

''පුතේ මට හරිම සන්තෝෂයි, තාත්තටත් එහෙමයි. කෙල්ලව ආදරෙන් බලාගන්න ඕනෑ. අපේ පරම්පරාවට අලුතින්ම එකතු වෙන මුණුබුරු සම්පත. අයියටයි අක්කටයින් දරුවො නෑ. බැඳලා අවුරුදු අට දහය ගිහිල්ලක්! රට්ටු කිය කියා හිටියෙ අපි වඳවෙන පරම්පරාවක් කියලා. මගේ පුතා අවාසනාවන්ත නෑ පුතේ........ හම්බවෙන්න ඉන්න දරුවගෙ වාසනාවට මේ ටිකේ බිස්නසුත් පුදුම විදියට නැග්ගා........''

මම සැනසුම් සුසුමක් හෙලුවා. දරුවෝ......! උඹේ ආරක්ෂාව ඉස්තිරයි. බය නොවී හිටපන් මම මගේ දරුපැටියාට කිව්වා.''

ගිම්හාන් වේරම්බ වාතය වගේ සුසුමක් පිටකරලා එයාගෙ අම්මත් එක්ක කාමරෙන් පිටවුණා. අද දවස මගේ දෛවයට කාරුණික වුණේ ඒ විදියට.

*මනෝරමා නාගසේන - දීනපොත*
*දිනය: 1983 ජූලි 20*

කිරිල්ලියක්, සමනලියක් වගේ හිටපු මාව බර පොදි එල්ලලා බිමට ඇදල දාපු සශික් නම් මහා වන මෘගයෙක්. එදා අපි අන්තිමට හම්බ වුණු දවසෙ ඉඳන් මේ වෙනකොට මාස දෙකක් ගෙවිලා. මොන විදියකින්වත් එයා මට කතා කළේ නැහැ. මම ගත්ත කිසිම ඇමතුමකටවත්, යවපු එකම පණිවිඩයකටවත් එයාගෙ කිසිම ප්‍රතිචාරයක් නැහැ.

ආයෙත් මම ක්ලබ් පැත්තෙ යන්න හිතුවෙ මට ඉවසන්නම බැරි තරම් සිත් වේදනාව නිසා. මම කොහොමද පිස්සියක් වෙන්නේ. ඒ අතරේ ඩෙරික්ගෙ මරණය ගැන එයාගෙ වලිගේ මා පස්සෙ කවදාහරි පන්නන බව මම දැනගෙන හිටියා. දැන් ඒ දේ සිද්ධ වෙමින් පවතිනවා.

ඔක්කොටම වඩා සශික් මට කළේ මහාම අපරාධයක්. මගේ කුසට දරුවෙක් දුන්නෙ සමහරවිට මාව කසාද බැඳගැනීම ස්ථිර කරගන්න හිතාගෙන වෙන්න ඇති. ඒත් එයා කසාද බඳින්න

හිටියෙ මා නොවෙයි. මගේ ධනස්කන්ධය කියන එක මට හිතට වාවන්න බැරි දුකක්. ඕනෑම ගැනියෙකුගෙ හිත කඩා වැටෙන්නෙ එතැනින් තමයි. තමාව කිසියම් පිරිමියෙකු විසින් අවස්ථානුකූලව පරිහරණයට ගත්තා කියන හැඟීම තේරුම් ගියාට පස්සෙ ගැනු හිතක ඇතිවන කලකිරීමෙ සීමාවක් නැහැ.

ඕනෑම පිරිමියකුගෙන් පළිගන්න පුළුවන් තරමෙ අමානුෂිකත්වයක් ගොඩනැගෙන්නෙ එතකොට. පිරිමි කියන්නෙ වන සත්තු ජාතියක්. තමන්ගෙ කාමය සන්තර්පණය කරගන්න විතරක් ගැනු සතෙකුට ළංවෙන......... ඕනෑම වෙලාවක ඕනෑම තැනක......... අවසරයක් ඇත්නම් වරදේ බැඳෙන හරිම කුඩුකේඩු ජාතියක්.

සශික් මට එයාගෙ සාහිත්‍ය කෑලි උපයෝගී කරගෙන මවා පෙන්නුවේ පුදුමාකාර ප්‍රේම ධර්මයක්. ලස්සන මුහුණ, ගැනියෙක්ව වසඟයට ගන්න පුළුවන් පිබිදිච්ච ඇස්! තදට පියවෙන සිහින් තොල්. ඒ ඔක්කොටම යටින් තියෙන්නෙ එයාගෙ පාහර කුඩුකේඩු හිත .........! පළල් උරහිස් පැතලි පසු තලය සිහින් කුස පොත්ත ඒ සියල්ලම ඒ කුඩුකේඩු සිතට දාපු මායාකාරී කවර.......!

මොන ගැනිද දෙයියනේ රැවටෙන්නෙ නැත්තෙ සශික් වගේ පිරිමියෙකුට......... මං වගේ ගැනියෙක් මුළු ජීවිතේනටම දකලා නැහැ. දකින්න බලාපොරොත්තුවකුත් නෑ කියලා දිවුර දිවරා විස්සෙක් වගේ ඇදේ පෙරලිච්ච සශික්......... එයාගෙ මැජික් බලෙන් මාව මෝහනය කළා. මා ළඟ සල්ලි කන්දරාවක් නැති බව දැනගත්ත ගමන් කොහොමද එයාට ආදරේ වෙන් කරගන්න පුළුවන් වුණේ.........? මට තියෙන ලෝක පුදුමෙ ඒකයි.

මගේ ක්ලබ් ගමන එයා සහමුලින්ම නතර කරල දාපු එකට මම තරහ ගත්තෙ නැත්තෙ මං එයාට ආදරේ නිසා. එයා මගේ ආරක්ෂාව ගැන හොඳට හොයන බවත් මාව එයාටම විතරක් තියාගන්න ආත්මාර්ථකාමී බව එයා තුළ තියෙන බවත් මට දැනුනෙ ඒකෙන් තමයි.

මං මොනතරම් ආදරේද ඒ ආත්මාර්ථකාමී බවට. මං ආශ්වර්ය කළ එක පිරිමියෙකුටවත් ඕන වුණේ නැහැ මාව එයාලගෙ තනි අයිතියට තියාගන්න. මාව විනෝද භාණ්ඩයක්



කරගන්න විතරයි එයාට ඕන වුණේ. මගේ තාත්තා වගේ වයසක ඉන්න වෙරික්වත් ඕන වුණේ එයාගෙ කෝටිපති ධන සම්භාරය පාවිච්චි කරලා ජීවිතේ ජොලියෙන් ගත කරන්න විතරයි. එයා මාව රැවැට්ටුවේ එයා එයාගෙ වයිෆ්ගෙන් දික්කසාද වෙලා ඉන්නෙ කියලා. එහෙම කියලා තමයි එයා මාව කසාද බැන්දෙ. එයාගෙ මිලියන ගානක මුදලය මගේ අතේ නේද කියලා හිතනකොට මට පුදුම හිතුණා. මට හිතුනෙ මම ඇලිස් කියලා. විස්මලන්තයට ගිය ඇලිස් වගේ මම හරියට සතුටු වුණා. එයා මට කසාද යෝජනාවක් කළාම.

කසාද බැඳපු දවසෙ මේ විශාල බංගලාව මගේ නමට නෑයි ඔප්පුවකින් ලියලා එයා මාව තවත් පුදුම කළා. ඒත් නාකි සූද්දා මාව විනාශ කළා කියලා මට තේරුණේ පස්සෙ තමයි.

වෙරික් ගැන මම මොකට හිතනවද . මැරිච්ච භූත ආත්මය මා පස්සෙ පන්නාගෙන ඇවිත් කාමරයක් කාමරයක් ගානෙ මාව හොයනවා වගේ මට දැනෙනවා. සශික් ගැන ආයෙ හිතෙනවා. සශික් හරිම සූක්ෂම විදියටයි එයාගෙ බිස්නස්වලට ඕන කරන සල්ලි වරින් වර මගෙන් ගත්තෙ. ඒවා මගේ බැංකු ගිණුම් වලින් මම අරගෙන දුන්නෙ......... මම ධනවත් කෙනෙක් කියන එයාගෙ ආකල්පය පෝෂණය කරන්න. පොත්වල තියෙන සල්ලි ඔක්කොම මම ක්ලබ් යන කාලෙ හම්බ කරපුවා. කැසිනෝ වලින් මම හුඟාක් සල්ලි හම්බ කරලා තිබ්බා. හම්බ කරලා එකතු කරලා තිබ්බ ඒවයින් බාගයක් විතරම මම සශික්ගෙ ඕනෑ එපාකම් වලට එයා ඉල්ලුවාම දුන්නා. අපි දෙන්නා දෙන්නෙක් නොවේ. එක්කෙනෙක් කියලාමයි සශිකුත් එයාගෙ ආදරේ පෙන්න පෙන්නා ගස්වලින් කඩන්නා වගේ සල්ලි ඉල්ලුවේ. අතේ තියෙන සේසතම් ඉවර වෙන්න කලින් දෙයියො තමා මේ තරම්වත් මාව බේරුවේ.

ඒත් මම හිතුවෙ නැහැ කවදාවත්ම මගේ දුප්පත්කම දැනගත්තාම එයාට මාව අතාරින්න පුළුවන් වෙයි කියලා. එතනයි මට වැරදිච්ච තැන.........!

කමක් නෑ සශික් කියන්නේ මේ මහ පොළව මත තවත් එක්තරා පිරිමියෙක් විතරයි.

හෙට ඉඳන් මම තීරණය කළා ක්ලබ් යන්න. හිත තියෙනවා

මම කොහොමද තාත්තෙක් නැති දරුවෙක් එක්ක මේ ලෝකෙ ජීවත් වෙන්නෙ. මටත් වෙච්ච දේ! අම්මෙක් අප්පෙක් නෑ. සහෝදර සහෝදරියෙක් නෑ. ජීවිතේ උඩුසුළඟට ගසාගෙන යන සරුංගලයක් වගේ. ඔක්කොටම වඩා අමාරුවෙන් එකතු කරගත්තු සල්ලි වලිනුත් බාගයක් නෑ.

*නිසලා නිරංජලා - දිනපොත*
*දිනය 1983 අගෝ. 07*

අලුත් අවුරුද්දක් කියල එකක් උදාවෙලා. මම අලුත් අවුරුද්දට කැමති නැත්තෙ ඇයි කියලා හිතින්ම අහනවා.

දූවත් දූවගේ සැමියාත් කුඩා දරුවාත් ගෙදරට ඇවිත් නිසා ගේ පිරිලා. සමන්තිගෙ මූණෙ ලස්සන හරියටම පෙනෙන්නෙ කවුරුහරි ගෙදරට ආවාම නේද කියා මට සිතෙයි.

''ඔන්න තාත්තා නැකතට ලිප පත්තු කරන වෙලාවට නම් ඔකෙ අස්සට වැදිලා ඉන්න බෑ........''ඡායා දූව කියන්නේ විහිලුවටත් එක්කයි.

''මාත් මේ කල්පනා කලේ තාත්තා ලියන්න ඇබ්බැහි වුණේ පෙන්ෂන් ගියාට පස්සේ නේද කියලා. අපරාදෙ ඔය ලියන වැඩේ කලින්ම පටන් ගත්ත නම්........''

සිසිර පුතා හෙවත් මගේ බෑණන්ඩිය මා දෙස බලා කියද්දී බිරිඳ සමන්තා නව පණක් ලබා ඇගේ මනය පල කරයි.

''හා........හා........ තාත්තා ලියන වැඩේ කලින්ම පටන් ගත්තා නම් කෝ ඉතින් අද ලියන්න දෙයක් ඉතුරු වෙන්නෙ නැනෙ........''

මගේ ඉහමොළ රත්වෙයි. සමන්තා කියන්නේ අහවල් අපභ්‍රංශ කතාවක්ද ? ඒත් ඇත්ත ඒක බව මගේ හෘද සාක්‍ෂිය මට කියා දෙන්නේය. නමුත් හෘද සාක්‍ෂියට ඉඩ දී මට මගේ ආත්ම ගරුත්වය පාවා දෙන්ට පුළුවන් කමක් නැත. ඒ නිසාම මගේ මුහුණේ මොකක්දෝ සේයාවක් ඇඳෙන්නට ඉඩ හරිමි.

බලනවානම් බලන කෙනෙකුටත් දකිනවානම් දකින කෙනෙකුටත් මගේ සිත තුළ ඇති වූ ඒ නොසතුට ප්‍රදර්ශනය විය යුතුය.



''තාත්තා ඇයි........ හිත නරක් වුණාද ඒ කියූ එකට........''

අසන්නේ මගේ දූවය. ඇ සමහර වෙලාවට මගේ හිත හඳුනා ගන්නා පළමුවැනියාය.

දූව එසේ කියද්දී සමන්තා කළේ පිටුපා යන්නට ගිය එකය.

''දන්නෙ නැද්ද අම්මා කොයි වෙලේත් කරන්නේ ඇනුම් පද පාස් කරන එකනෙ. ඒකට එයා නම් නොම්මර එකේ දක්ෂියක්.''

''හා හා........ තාත්තා ඕක ගණන් ගන්න එපා. අම්මා ඔය විහිළුවට කියන්න ඇති.''

සිසිර පුතා එසේ කියමින් දරුවා රැගෙන මිදුලට ඇදෙයි.

''කිරිබත් කන්න ආසා වුණාට මොකද හරිම නිදිමතයි නැගිටීම. අද දවල්ටනේ ලිප මොලවන්න තියෙන්නේ.''

දූව අලුතින් ගෙනා මුට්ටිය ගෙන කුස්සියට යමින් කියන්නේ ලිප් ගල් තුන සඳහා ගඩොල් ටිකක් සොයා ගැනීමේ අදහසිනි.

''කොච්චර අවුරුදු වුණත් මට නම් හරි පාලුයි පුතේ අයියා ගෙදර ආවේ නැතිව........''

'එයාටත් එන්න ඕන කමක් නැතිව ඇති අම්මේ........ ඔය රට රටවල්වල ගිහිල්ලා නතර වෙන කට්ටියට සිංහල අවුරුද්ද වගේ පරණ තාලෙ චාරිත්‍ර අල්ලන්නෙත් නැතිව ඇති. උවමනාවක් තියේනම් එන්න බැරිද අම්මලා තාත්තලා බලලා යන්නත් එක්ක.''

දූව එසේ කියන විට සමන්තා තම නොක්කාඩු බැල්ම හරවන්නේ මා දෙසටය. ඒ බැල්ම දවසටම සෑහෙයි. එසේ වන්නේ ඒ බැල්ම යට ඇති පුතාගේ කසාදය පිළිබඳ අතීත ස්මරණය මා භ්‍රාන්ත කරවන නිසාද ?

නැකතට ලිප ගිනි මෙලවීමත් කිරිබත් පිසීමත් චාරිත්‍රානුකූලවම සිදුවෙයි. සිසිර පුතා ගේට්ටුව අසලට ගොස් රතිඤ්ඤා වැලක් පත්තු කර පොඩි එකෙකු සේ දිව යන හැටි බලා සිටින්නත් අපූරුය.

පොඩි දරුවා උඩ පැන පැන සිනා සෙයි.

සමන්තාට ආයෙත් පුතා මතක් වෙලාදෝ මුහුණ අඳුරු වෙලාය. මේ අඳුර නම් හැමදාම මා ලුහුබැඳ එන අඳුරක්මය.

තමන්ගේම පුතා වුණත් ඕනෑවට වඩා ඇගේ මූණේ තියාගෙන හදන එකත් එක්තරා විදියක දුර්වලකමකි. නිසි වයස ඇවිත් ආවාහ විවාහ වූ පුතුයාට තමන්ගේ පාඩුවේ තම බිරිඳ සමග ආදරයෙන් යුතුව තම පෞද්ගලික ජීවිතය ගොඩනගාගෙන යාමට ඉඩ දීම සැබෑ අම්මා කෙනෙකුගේ ඇත්තම ආදරයයි.

ලංකාවෙ අම්මලාගෙ මේ මානසිකත්වය නිසා තමයි තවමත් නැන්දා ලේලි වෛරය වගේ එච්චා පවතින්නේ. මේ ගැන කතා කරන්න ගිහින් සමන්තා බොහෝ වෙලාවලදී මා හා දබරයට ඇවිත් ඇත. ඒ නිසා ඒ මාතෘකාව මා දමා ඇත්තේ හිත්ත මාතෘකා ගණයටය. අප දෙදෙනාටම ගෝචර වන්නේ උඩින් පල්ලෙන් අසන දකින කියන සිනිබෝල මාතෘකා විතරක්ය.

ඔන්චිල්ලාවක් බැඳලා දෙන ලෙස කියමින් මිණිබිරිය අරගල කරද්දී සමන්තා ඒ සඳහා කඹයක් සෙවීමට උත්සුක වෙයි. කියන ලද කිසියම් දේකට අම්මාත් දූවත් හිනාවෙනවා ඇසෙයි. හිනාවේ කෙළවරදී සමන්තා ආයෙත් මැක්කාගේ රචනාවට බසියි.

"දූන් අද වගේ දවසක ලොකු පුතාත් එයාගෙ බබා එක්ක හිටියා නම් මෙතන මොන තරම් කලබලියක්ද ? හැබැට ........!"

ආයෙමත් තව මොකක්දෝ එකකට සිසිර පුතාත් මහා හඬින් සිනාසෙයි. මම හෙමිහිට කාමරයට පල්ලම් බසිමි. අවුරුදු නිවාඩු නිසා වැඩපලවල් ගැන සොයා බැලීම් අවශ්‍ය නැත. නිවාඩු පාඩුවේ දවස ගත කරන්නට ඉටාගෙන මම කාමරයට යන්නේ ඒ සැනසිල්ලෙනි.

පිටුපසින් ඒ සමගම මට ඇසෙන්නේ සමන්තාගේ කටහඬය.

"ඔය මං කිව්වෙ රිංගන්නෙ කාමරේටමයි."

මට අම්මාත් දූවත් ගැන පුදුම සිතෙයි. වේලාවකට හොඳටම හිත තරහ වෙන දේවල් කියාගනියි. වෙලාවකට යාප්පු වෙවී කතාකරමින් තුන්වැනි පාර්ශවයකට ඇදාස් පවරමින් සිටියි.

සමන්තා මේ වේලාවේදී නම් දූව අල්ලාගෙන මගේ වැරදි කියමින් තෘප්තිමත් වෙනවා ඇත. මට ඒව කමක් නැත. එක එක්කෙනාගේ තෘප්තියේ සීමා මායිම් ඇත්තේ එක එක තැන්වලය. ඒ මායිම් සොයායන්නට හෝ සොයාගන්නට දැන් මට උවමනාවක් නැත.



පුතාත් ලේලියත් දරුවා සමග අලුත් අවුරුද්දට ආවේ නැති එක ගැන හොඳටම නොරොක් වී සිටින්නේ සමන්තාය. ගිය අවුරුද්දේ මේ නොරෙක්වීම තිබුණේ නැත්තේ ඒ වන විට කුඩා දියණිය මාස තුනක වයසේ සිටිය නිසාය. දැන් දරුවා දක බලා ගැනීමට ඇති ආශාවත්, පුතාව දක ගැනීමේ ආශාවත් විසින් ඇ හොඳටම හෙම්බත් වී ඇති සෙයකි.

ජීවිතවල විවිධ කාල පරිච්ඡේද තිබෙනවා සේම දිනපොත්ද පිටු පෙරළී යන්නේ වසරින් වසරටය. සියලුම පිටු පෙරළී ගිය පසුගිය වසරත් කිසිම පිටුවක් පෙරළී නැති නව වසරත් දෙකම එක වගේද ?

ජීවිතයේ ඊළඟ කාර්තුවට එළැඹී ඇති වරින සිහිපය ගැන එහේ සොයා බැලීම වෙනස් වෙයි.

* * *

උදේ පාන්දර මම අවදි වුණේ පුදුමාකාර තිගැස්මකින්. වෙනදාට වඩා ඉරත් වෙනස් බව මම ජනේලෙන් දක්කා. කලින්දාම රෑ වාපා ඇවිත් මගේ කාමරයේ නතර වුණා. ඒ මට උදව් කරන්න ඕන නිසා.

දෙවියනේ අද තමා මට යෝජනා ආපු මඟුල්වලින් කැමති වෙන්න පුළුවන් යෝජනාව කළ කෙනාගේ පැමිණීමේ දිනය. 'පුංචි නෝනා අද හරිම ලස්සනයි' කියලා මෙරී කියනකොටම මම දැනගත්තා මේ ගෙදර හැමෝම දැන් ලෑස්තිවෙලා ඉන්නේ මොකටද කියලා. අලුත් බලාපොරොත්තු ලියලගෙන ලියලගෙන ගියා.

ගෙනාපු යෝජනා වලින් අපට හරියන ඒවා තෝරාගත්තට පස්සේ පිංතූර පෙන්නුවා. ඒ පිංතූර අතරින් මම කැමතියි කිවූ එක්කෙනා අද මේ එන්නේ. මට අද විතරක් අමාරුයි වගේ. උදේත්ම ආවා හිස කැක්කුමත් ඒ පාර දතත් රිදෙන්න ගත්තා. මම අම්මා ළඟට වෙලා අඬ අඬා හිටියා ටිකක් වෙලා. අම්මාට දුකත් හිතුණා. මට දුකක් නෑ. මමම හොයාගත්ත කෙනෙක් නෙමෙයිනෙ බඳින්න එන්නෙ. අපි කලුතර එයා මහරගම කොහොතරම් දුරත්ද?

තාත්තත් මං දිහා බැලුවෙ දුකින් කියලා මට හිතුණා. ඒත් එයාලගෙ බලාපොරොත්තු කන්ද දක්කම මට බයත් හිතුණා. එයාලා හැමදාම ජීවත් වෙන්නෙ නැහැනෙ. ජීවත්ව ඉන්න කාලෙදි දෙන සතුටක් විතරනෙ.

එක පාරටම වාහන සද්දයක් ආවා. වාහනෙන් බැහැලා එන කට්ටියගෙ කකුල් මට පෙනුණා උඩ තට්ටුවට. නගින සෝපාන මාලාවෙන් හැරිලා බැලුවාම, කලු සපත්තු දාපු කලිසම් කකුල් දෙකයි. නැනෙල් ඇඳපු කකුල් දෙකයි. පලල් සාරි බෝඩරයත් එක්ක කකුල් දෙකයි.

අම්මෝ මගෙ හිත ගැහෙන්න ගත්තා. චාපා ඔසරිය අන්දන කොටත් මට ඕකලයි. ටික වෙලාවකින් අම්මා ඇවිත් මාව සාලෙට එක්කරං ගියා. එයා ඉස්සරහ බුලත් හෙප්පුව අරගෙන නතර වුණා.

මගේ හිතත් එතනම නතර වුණා. චාපා ගෙනාපු පිංතූරෙ මට මතක් වුණා. පිංතූරෙට පණ ඇවිත් මා ඉදිරියෙ. ඇසිපිය හෙලන පමණින් නොවෙති දේවතා!

මට ලජ්ජාවටම හිනා ගියා. එයා හිනාවුණා යාන්තමට. ආඩම්බරකාර හීන් හිනාවක්. පුදුමාකාර මූණක්. මෑත බාගෙදි ෆිල්ම් එකකවත් දැකලා නෑ එහෙම මූණක් !

ලෝකෙ නතර වෙලා තිබිලා ආයෙත් පටන් ගත්තා. ආයෙත් නතර වුණා.

දෙවියනේ........ එයානම් මට කැමති වෙන එකක් නෑ. මම ආපහු කාමරේට වැදුනෙ චාපා මං එනකම් බලං හිටි නිසා.

''කොහොමද ........ ධර්මෙට වඩා හොඳද ?''

මොන ධර්මේද........ මෙයා ළඟදි ධර්මෙට උපමා නෑ. අනේ........ හරිම ඩීසන්ට් ලස්සනක්........ මම දැකලා නෑ ජීවිතේටම එහෙම කෙනෙක්........ඒත්........ ප්‍රශ්නෙ........ එයා මට කැමති වෙන එකක් නෑ කියන දෙගිඩියාව මගේ හිතේ.

සඳලා මුතුමාල - දිනපොත
දිනය: 1984 ජන. 16

මට අද හරි අමුතු දවසක් වුණා.



අම්මා උදෙන්ම කිරිබත් හදවලා තිබුණේ හරියට කිරිබතින් තොරව සුබ ගමනක් පිටත්වීම හොඳ නෑ කියල හිතිලද මන්දා. මාමත් උදේ කඩේ ඇරියේ නෑ. කඩේ ස්ටාෆ් එකට කියලා තිබුණ බත්තරමුල්ලෙ ෆැක්ටරි එකට ගිහිල්ලා උදව් වෙන්න කියලා.

නුගාත් පිළිවෙලවල් ගෙදර තිබුණා ඇගට නොදැනී වගේ.

''අපි අද කලුතර යන්නේ අර ළමයා බලන්න. පුතා එයාගෙ පිංතූරෙ දැක්කනේ. නුගාත් හොඳ හැදිච්ච දැරිවියක්. එයාලා හොඳ උගත් පෝසත්තු. මේ ඊයෙ පෙරේදා පෝසත් වෙච්ච කාඩ්බෝඩ් සල්ලි කාරයො නෙමෙයි. පුතාගෙ බිස්නස්වලටත් ගොඩාක් හොඳයි. කොරුණෝත් අපේ පවුල වගේ කොහු වෙච්ච පවුලකුත් නෙමෙයි. අම්මයි තාත්තයි බොහොම වැදගත් විදියට සමාජේ ජීවත් වෙනවා. ඒ දුවත් පාසල් ගුරුවරියක්. පුතා මේකට කැමති වෙනවා නම් මම හුඟක්ම කැමතියි........''

අම්මාගේ දේශනය මසිනට බොහෝ දේ මතක් කරවනු ඇති නමුත් බලන්න ගිය ගෑනු ළමයා ගැන මගේ අදහස දැනගන්නට අම්මා ඉතා ඕනෑකමින් ඇති බව මට හොඳටම තේරුණා. මෙතෙක් කතා කරන ලද කිසියම් යෝජනාවකට කැමති වීම තුළම කිසියම් ප්‍රබෝධයක් ඔවුන් තුළ ඇතිවුණා.

ගෙය පරණ කාලේ විශාල බංගලාවක්. විශාල වත්තක ගෙය පිහිටා තිබුණේ. වත්තට ඇතුළු වීමට එක විශාල යකඩ ගේට්ටුවකුත් ගෙයත් ගෙමිදුල වටකල තාප්පයට තව අලංකාර ගේට්ටුවකුත් සවිකර තිබීම තුළින් පෙන්වූ ගාම්භීරත්වය මුලින්ම හිතට ඇල්លු බව තේරුණා.

වත්ත පුරාම තිබුණේ පලතුරු ගස්. කුරුළු කිචි බිචි එමට. නාගරික පරිසරයේ හෙම්බත් වෙලා හිටිය අපට මුල් ගේට්ටුවෙන් ඇතුලට වාහනය ගන්නා විටම විශාල වෙනසක් තේරුණා.

වත්ත පල්ලෙහා විශාල මැංගුස් ගසක හිටිය වඳුරෝ මැංගුස්වල රස බලමින් අප දිහා බලා සිටියේ දත නියවමින්.

''හා........ ඔය ඉන්නෙ........ පිළිගන්න නිලධාරීයො........ හා........''

මාමා හයියෙන් හිනාවෙලා කිව්වා. ''ඉ........ මල්ලී........

කට........ ඔය කට පරිස්සම් කරගන්නවා හොඳයි තේරුණාද ? ඔනෑ එකටයි එපා එකටයි කට දාන්න එන්නෙ නැතිව. කතා කරන්න ඕන දේවල් මමයි කතා කරන්නෙ හරිද මල්ලි........ ඔයාට තියෙන්නෙ මම අවස්ථාව දුන්නාම තැනට ගැලපෙන විදියට වචනයක් දෙකක් දාන්න විතරයි........"

අම්මාගෙ දේශනය ඉස්සරහ අසුනේ සිටි මටත් රියැදුරාටත් කන්දොස්කිරියාවක් දුන්නේ පුරුදු විදියට. කපුවා නම් අම්මාගේ හැම කතාවකටම නිර්ලෝභීව හූමිටිය තිබ්බා.

මනමාලිය මා හිතුවාට වඩා පැහැදිලි රූමත් එකියක් ලජ්ජාශීලී ගතිය ඇගේ රූපෙට ආභරණයක් වගේ.

එතැන සිද්ධ වුණු කතාබස් මට හැම දෙයක්ම මතක නැත. නමුත් මාගේ සිත අතීතයටත් වර්තමානයටත් අනාගතයටත් දුව පැන ඇවිද්දා මතකයි. මගේ මතකයට කඳින්ම ඇවිත් ගිය නිම්නාටත් මනෝරමාටත් වඩා සැහෙන වෙනසක් සහදා ගේ දැක්කා. වෙනස මොකක්ද මට නොතේරේ. ඇය නිසලාට වඩා නම් හාත්පසිනම වෙනස්ය.

සැහැල්ලු කතා බහකින් අනතුරුව දිවා ආහාරයද භුක්ති විඳ අපි එන්න පිටත් වුණේ දාහක් වැඩ ගැන වට්ටෝරුව අම්මා කීවාට පස්සේය.

සහදාගේ අම්මත් තාත්තාත් දෙන්නාම හොඳ වැදගත් අයය.

"දැක්කා නේද මහ දෙන්නා හරිම ගාම්භීර වැදගත් ජෝඩුවක්." කපු මහත්තයා උදම් අනමින් කීවේය.

"ඒ ගැනු ළමයා අපේ බේබි මහත්තයාට පංකාදු පහයි. මට නම් මේක ස්ථිරයි."

"ඉස්තිර කරන්න හාම අපේ ළමයා වචනයක් දුන්නාද නැතේ. ඒ ළමයා වචනයක් දුන්නාද නැතේ........තේගිරිස් නිකම් උඩ පනින්නෙ නැතිව ඉන්නකො........"

අම්මා ගේ කට සැරය.

"පුතා මට ඉතිං අද හෙටම කියන්න මේ ගැන කල්පනා කරලා බලලා. මං දන්නවා පුතාට වරදින්නෙ නෑ කියලා........ සල්ලිය බාගෙට වැදගත්කමයි ගාම්භීර කමයි එකතු වෙන්නෙ කලාතුරකින් පුතේ."



"අක්කේ ඔය කට තියවිල්ල නතර කරගන්නකෝ. පුතා කල්පනා කරලා උත්තරේ කියාවි. නළලෙන් නම් පත්තු වෙන්නේ කොළ ලයිට් එකක් !"

මාමා අප සැම සිනා සයුරේ ගිල්වූයේය.

සගික් උදාකර - දිනපොත
දිනය: 1984 ජන. 17

ඉර හඳ අතරේ කාලය බොහෝ මස් ගෙවී ගිහිල්ලාය. සහදාගේ සහ මගේ විවාහය කෙරී දැන් දසවසරකුත් ගෙවිලාය. මේ දසවසරට මම මොනතරම් වියපත් මිනිහෙක් වෙලා දැයි මටම සිතේ.

ව්‍යාපාර කටයුතුවල සීඝ්‍ර දියුණුවක් එක්කම මම සැහෙන කාර්යබහුල මනුස්සයෙක් වුණේ යන්ත්‍රානුසාරයෙන් වගේ.

මනෝජ්ට නාට්‍ය පිටපතක් ලියලා දීලා ඒක නිෂ්පාදනයට සල්ලි ටිකක් දීමමට තවත් සතුට ගෙන දුන් කාරණයක්. මනෝජ් ඒක හොඳ ප්‍රචාරක වැඩසටහනක් දීලා ලංකාව පුරාම අරං ගියා. තවත් නාට්‍යයක් ලියන්න තියෙන ඉල්ලීම් වැඩිවෙද්දීම මගේ දෛනික වැඩවලටත් කාලය මදි වෙන්න ගත්තා.

සහදා සමඟ ජීවිතය........!

මුල් අවුරුද්දේම බිමල් පුතා ලැබීමත් ඊට අවුරුදු දෙකකට පසුව ඡායා දුව ලැබීමත් අපේ ජීවිතවලට නව අරුතක් ගෙන ආවා. සහදා මුළු ජීවිත කාලය පුරාම මා දිහා බැලුවේ කුහුල් ඇසින් බව මට තේරුණා. ඇතැම් වීට ඈ ඇගේ යෙහෙළියකට වුණ දේ මට කියයි. ඇගේ යෙහෙළියක ගේ සැමියා ඇය රවටාලූ හැටින් වරෙක ඇය මට කියයි. ගෙදරටම වී සිටින නිසා සිතුව අවුල් වෙනවා ඇතැයි මට සිතුණි. "පරණ නැදෑයින් මිතුරින් අමතක කරන්න කියලා මම කිව්වෙ නැහැනෙ. ටිකක් එහාට ආස්සරේ කළාට මට කමක් නැහැ" මා කී විට ඇය හිනැහුය.

මම ඇයට නිදහස ඕනෑ තරම් දීලා ඇත. අවසර නම් පිටවෙලා යන්නත් මගේ නිවසේ දොරවල් ගේට්ටු ඇරිලා ඇත. නමුත් ඈ කවදාවත් මා හැර ගියේ නැත. මා සහ කළ පෙර ජීවිතයට වඩා සහදා සමඟ ජීවිතය අප්‍රියකර එකක් වීද ?

මම මගෙන්ම අසමි.

සහද්‍රා මාව ඉතා තියුණු පරීක්ෂණයට ලක් කරමින් සිටිනවා දකිම මා කෝප කරවන දෙයක් විණි. විවාහයෙන් අවුරුදු පහකට පස්සේ දවසක අපූරු දෙයක් සිදු විය.

ඒ මනෝරමා ගේ හමුවීමයි. මා ලොකු පුතාව ළදරු පාසලට ඇරලවා පාර පනිද්දී මනෝරමා කුඩා දියණියක් සමග පාරේ එමින් සිටියි. නොදක්කා සේ අහක බලාගන්නට මට අවශ්‍ය වුවත් එය වැළකන්නට ඇය සමත් වුණා.

"''සශික්........ මාව අඳුනන්න බැරිද ?''

ඇගේ ඇස් මා වෙත යොමු වුණේ මගේ ඇස්වලට හැංගෙන්න තැනක් නැති කරමින්.

''අනේ සශික්........! මම මනෝරමා........ ඔයාට අඳුරගන්න බැරිද ?''

ආයෙත් ඇය ඇහුවෙ බැගෑපත් විදියට. මගේ සිත වසර පහළොවක විතර අතීතයට ගියා. කවදූරටත් රඟපෑම් කොහොම කරන්නද ?

''මනෝරමා........ මට ඔයාව අඳුනාගන්න බැරි වුණා.'' ඊළඟට මම වටපිට බැලුවා.

''කෝ ඔයාගෙ හස්බන්ඩ්?''

''ගිම්හාන්........ එයා ඔය ඉන්නේ. මං ආවා දුව ඉස්කොලෙට දාලා යන්න........''

''පයින්ම ?''

''ඔව්. මම බස් එකෙන් ආවෙ එයා වාහනෙත් අරන් නුවරඑළියෙ ගියා වත්තට........''

මම මොහොතක් කල්පනා කළා. පිට පාරෙම යනවද? ඇයව අඩු ගානෙ පාසලටවත් ඇරලවා යාම මිනිස්කම.

''තගින්න මම ඔයාලව ඉස්කෝලෙට දාන්නම්........''

මම එසේ කියා බැලුවේ දියණිය දෙසය. ඒ කුඩා දියණිය අපේ බිමල් පුතාගෙම ඇස්වලින් මා දෙස බලයි.

''ගු........මෝ අ........අන්කල් බිමල්.''

දියණිය මාදෙස බලා සිනා පෑවාය. ඈ පාන්නේ මගේ ජායා දියණියගේ සිනාවේ ඡේයාව.



බාලිකා විද්‍යාලය අසලින් දුව බැස්ස වූ පසුව මනෝරමා මා දෙස බලා පෑවේ අහිංසක සිනාවකි. ඒ සිනාවේ දහසක් කතා තිබුණි. ඉතිහාස කතා සාහිත්‍යකතා අපේ ප්‍රේමයේ.

උදෑසන මා නිවසින් පිටවූයේ සිත නරක්කරගෙනය. ඒ සහද්‍රාගේ ඇනුම් පදයක් නිසාය. ඇනුම් පදවලින් මා පෙලා විඳවන එක ඇයගේ විනෝදාංශයක් බවට පත්වෙලා හමාරය.

''හගින්න මනෝරමා........ මොනව හරි බීලාම යමු........ මං ඔයාව ඩ්‍රොප් කරන්නම් හෝල්ට් එකට........''

මනෝරමා කිසි කතාවක් නැතිව ඉදිරිපෙළ අසුනට නැංගාය.

''මට එදා ඔයා හමුවුණ වෙලාවෙ ඔයා මාව දකලා දක්කෙ නැති විදියට ගිය එක ගැන මම හරියට දුක් වුණා........''

අවුරුදු විසිපහේදී මා දුටු මනෝරමාගේත් අවුරුදු පහළොවකට විතර පස්සෙ මා දකින මනෝරමාගේත් වෙනස මගේ ඇස්වලින්ද හදවතින්ද මනින්නේ අවන් හලේදී මුණට මුහ වාඩිවී සිසිල් බීම තොල ගාන මොහොතේ! ඇගේ ඇස්වල තද කලු පැහැය අව පැහැ වෙලාය. ව්‍යාකූල කොණ්ඩය අවුවෙලා වගේ පෙනෙයි. කන් දෙක දෙපැත්තෙන් සුදු කෙස් ගස් දෙක තුනක්ම මතුවෙලාය.

''ඉතින්........ මනෝ කොහොමද ඔයාගේ ජීවිතේ?''

ඇය බිම බලාගනියි. මට අවට බැලෙයි. අවන්හලේ හැඩිපුර කිසිවෙකු නැත. ඒත් අඳුනන කෙනෙකු අප දුටුවොත් නැවතත් වරපුරුෂ වාර්තා නිසා ගිම්හාන්ගෙන් ඇයට කරදර පැමිණෙනවා ඇත.

''මගේ ජීවිතේ ගැන අමුතුවෙන් යමක් කියන්න දෙයක් නෑ සශි.'' ඇය නොසන්සුන් වෙයි.

''සොරි........ මට එහෙම කියැවුණාට.''

''නෑ........ කමක් නෑ මනෝ ඔයා කියන්නකෝ........''

''මට තියෙන්නෙ නම්ට කසාදයක්. මගේ කලා කටයුතු එක්කෝම නවත්තන්න වුණා. මාව ගිරකාරියක් කළා. එයා මට මොන තරම් ද්වේශ කරනවාද කිව්වොත් මාව ඩිවෝස් කරන්නෙත් නැහැ. ඩිවෝස් එක දෙනවානම් අඩු ගානෙ මට රස්සාවක් කරලා හරි මේ දරුවන් එක්ක ජීවත් වෙන්න පුළුවන්.

කීයක් හරි හම්බකරගන්න රස්සාවකට යන්න මට බැරිකමක් නැහැ........"

"ඉතිං ඩිවෝස් වුණොත් දරුවා අයිති වෙන්නෙ එයාට නේද ?" මනෝරමා දිග සුසුමක් හෙළයි.

හරියට ඒ හුස්මට වෙට්ටම තිබෙන පුටු මේස පෙරලිලා යනවා වාගේය. ඇය ඊළඟට මා දෙස කෙලින්ම බලයි. ඇගේ වම් අත මගේ දකුණු පිටි අල්ල මත තැබෙයි.

"මම එදා ඔයාගෙ ඔෆිස් එකට ඔයාව හම්බ වෙන්න ආවෙ නිකමට හරි ඔයාට මේක කියලා තියන්නයි........ මේ දරුවා ඔයාගෙ දරුව සඟී........!"

මනෝරමා හඬන්නට පටන් ගනියි.

වහාම අසුනින් නැගී සිටින්නේ මාදැයි මාවත් දන්නේ නැති තරම් ! "මොනවා........!"

මා ඉදිරිපිට ලෝකයෙන් මහා පදාසයක් කඩා වැටෙනවා මට ඇසෙයි. මේ මොන විකාර කතාවක්ද ?

ආයෙත් මනෝරමා නිහඬව කඳුළු පිසියි.

"නෑ........සඟී........ගිම්හාන් දරුවෙක් ලබන්න පුළුවන් පිරිමියෙක් නෙමේ! එයා දුර්වලයෙක්. ඒක දන්නෙ අපි දෙන්නා විතරයි. ලෝක ලජ්ජාවට මම ඒක කාටවත් කිව්වෙ නෑ. මේ දරුවා එයාගෙ කියලා එයාට පිළිගන්න වුණේ ඒ ලජ්ජාව නිසයි.

"මේ දරුවාට එයා තඹ සතේක ආදරයක් නෑ. බොරුවට අම්මලා තාත්තලාට පේන්න රඟපානවා. මේ දරුවා පව් සඟී........වෙන පුංචි දරුවන්ට වගේ තාත්තා කෙනෙකුගෙ ආදරයක්........ හුරතලයක් මොකවත් නෑ......!"

මගේ හිස අවුල්වෙන තරම් විය. එහෙනම් මගේ බිමල් පුතාගේ ඇස්වලින් මදෙස බලා මගේ ජායා දුවගේ සිනාවෙන් සිනාසුණේ........ මගේම දුවෙක්......!

"මම ඔයාට මගේ ෂොප් එකක නොම්මරේ දෙන්නම් මනෝ........ ඒකට ඔයා කතා කරන්න. ඕන. අඟහරුවාදා අටත් දොළහත් අතරේ විතරයි. අපි යමු දූන්........"

මනෝරමාට බස් නැවතුමට ඇරලවා මා වාහනය ක්‍රියාත්මක කරද්දී ඈ කවුළුවෙන් බලා යමක් කියනවා මට යාන්තමට ඇසුණි. "මං තවමත් ඔයාට ආදරෙයි සඟී........"

ජීවිතය යනු කොළඳ දෙයක්දැයි මා දන්නේ නැත. ආදරය



යනු බොරුවක් දැයි මා දන්නේ නැත. ආදරය විදීමකි. විදවීමෙන් කෙරෙන විදීමක් යැයි හෝ විදවීමෙන් විඳින විදීමක් දැයි මට තේරුම් ගන්නට බැරිය. නමුත් ආදරය නොකර කෙනෙකුට ජීවත් වන්නට හැකිද යන ප්‍රශ්නයට උත්තර කාටවත් දිය නොහැක. මේ ලෝකයේ ජීවත් වන හැම දෙනාම පෘතග්ජන පුද්ගලයෙක් නිසා එය පැවසීම උගහටය.

එක වරම සියල්ලම හිස් විගෙන යනු මට දැනෙයි. මුලු මහත් ලෝකයම හිස් වෙයි. මගේ කාමරයද හිස් වෙයි. මගේ ලියන කාමරයෙන් මිදී අපගේ නිදන කාමරයට යද්දී ඒ හිස් බව මට වඩාත් ප්‍රත්‍යක්ෂ වෙයි. අපේ නිදන කාමරය සඟදාගේත් මගේත් නිදන කාමරය නොයෙක් දේවල් කතාකරන කාමරයකි. අද උදෑසනද පෙරදා රාත්‍රියේද ඒ සීතල යුද්ධයේ නිශබ්දතාවය මා පෙලා දමා තිබිණි.

සඟදා ඇගේ ඇස්වලට පලිඟු කණ්ණාඩි සවිකරගෙනය. ඒ කණ්ණාඩියෙන් ඈ මගේ හදවත පිරික්සා බලන්නට උත්සාහ කරයි. ඒ ආදරයෙන් නොවේ. සැකයෙනි. ද්වේශයෙනි.

"ඔය පාර පුතාට ශිෂ්‍යත්ව පංතිවලට දාන්න තියෙනවා. ඔයා දන්නවද දූත් පංතියෙ ඔක්කොම ළමයි යනවා ටියුෂන්. අපේ එක්කෙනා විතරක් නොයවා ඉන්නෙ ඇයි කියලා ටීචර් මගෙන් අහලා එවලා තිබුණා."

"හරි ඉතිං දාමු ටියුෂන්. ඔයා බලන්න පංතියක්. නැත්නම් මම බලාගෙන එන්නම්."

අප අතර දෙබස්වල කිසිදු දයාන්විත ගතියක් නැත. ඒ දස අවුරුදු කටුක පවුල් ජීවිතයේ ප්‍රතිඵලයක නොදකිමි. කොහොම වුණත් මීට අවුරුදු පහකට පෙරදී සිදුවූ මනෝරමාගේ හදිසි හමුවීම මගේ චර්යා රටාවේ වෙනසක් සිදු කරන්නට ඇත. ඒ පැහැදිලි වෙනස සඟදා දුටුවාදැයි සැකයකි.

*සඟීත් උදාකර - දිනමෙන*
*දිනය: 1995 ජන. 30*

පුතා ශිෂ්‍යත්ව පංතියෙන් අරගෙන එන්න සිදුව වුණේ මටයි. සඟීත් අවුට්ස්ටේෂන් ගිය නිසා ගෙදර අයත් වාහනෙත් ඩ්‍රයිවර් එක්කයි ගියේ. පුතාව අරගෙන වාහනේට නගිනකොටම අනෙක් පංතියට යන ළමයි එක්කරං එන අම්මලා අතරේ

එක්කෙනෙක් අපේ වාහනේ දිහා බැලුවේ අමුතු විදියට.

පස්ස හැරිලත් එයා නොම්මරේ දිහා බැලුවා. ඒ කවුද? තරුණ ගෑනු කෙනෙක්. ලස්සන කෙනෙක්. මට මුලින් හිතුනෙ මගේ යාලුවෙක්ද කියලා. පරණ ස්ටාෆ් එකක හිටිය. නමුත් ඒ මාව දන්න කවුරුවත් නෙමෙයි.

'කවුද නෝනා බැලුවේ.........?'' ඩ්‍රයිවර් අහනකොට මට ලජ්ජාත් හිතුණා.

''මං බැලුවෙ මගෙ යාලුවෙක්ද කියලා. අර පොඩි දරුවෙක් එක්ක අර රතු බෝල බෝල සූට් එකක් ඇඳපු දරුවෙක් එක්ක යන නෝනා.''

ඩ්‍රයිවර් මං කියපු දිහාට හැරිලා බැලුවාම එක පාරටම එයාගෙ මූණ වෙනස් වෙනවා මට පෙනුණා.

''ඇයි ඩ්‍රයිවර් දන්නවද එයා.........''

මම ඇහුවේ නිකමට වගේ කියලා පෙන්නුවා. ඩ්‍රයිවර් නෑහුනා වගේ අහක බලාගෙන වාහනේ පදවනවා. ආයෙ ඒක හාරා අවුස්සන එක මගේ තත්වෙට හොඳ මදි. ඒත් මගෙ හිත ඇතුලෙ මොකක් හරි සැකයක් වැඩ කළා. එක දවසක් අඟහරුවාදා දවසක සගික්ට යන්න වුණා අපේ ෂොප් එකක නඩුවකට. එදාත් කවුද ගර්ල් කෙනෙක් ෂොප් එකේ නොම්මරේට කතා කළා. මම හෙලෝ කීවාම ඉක්මනටම තිබ්බා. මට මේ වැඩවලින් ටික ටික සැක සහිත ගති එකතු වෙන්න ගත්තා. වැඩියක්ම දුක එහෙම දෙයක් ගැන ඇහුවාම සගික්ට හරියටම කේන්ති යනවා ඒකයි.

''ඉන්න ඒ ගර්ල් කෝල් කළාම ඔයා ගත්තාට එයා එහෙන් තිබ්බට මම මොනවා කරන්නද ? ඒක මට කියන්නෙ මේක හරි වැඩක්නෙ......... එහෙනම් ඔයා හැමදාම ෂොප් එකට ගිහිල්ලා චෙක්කරලා බලන්නකෝ මට කෝල් එනවද කියලා ගෑනුන් ගෙනේ ඔය විදියෙ පහත් වට්ටි අම්මලා වගේ ඔයා හිතන්න පුරුදු වෙන්න එපා නරිද ?''

''ඒක තමා වැඩක්නෙ ඔයාට ඔය වගේ දෙයක් වුණානම් ඔයා මගෙන් අහන්නෙ නැද්ද ? ඒ කවුද කතා කළේ කියලා. එච්චරටවත් සම්බන්ධයක් තියෙන්න බැරිද ගෙදර ගෑනියි මිනිහයි අතරෙ.........''



''ඔයාගෙ කට වැඩියි.........දැන් හොඳටෝම සඟදා......... මං හිතාගෙන හිටියෙ ඔයා හරි ඩීසන්ට් ගර්ල් කෙනෙක් කියලා. මං දන්නෙ නැනෙ ඔයා මේ ගමේ ගොඩේ වට්ටි අම්මල ගෙදිනැන්දල වගේ හිතන පතන කෙනෙක් කියලා.''

සගින් මට ඒ විදියට බැණගෙන බැණගෙන යනකොට මට මගේ අම්මලා තාත්තලා මතක් වුණා. අනේ ඒ අය මොන තරම් නම්බුකාර වැදගත් මිනිස්සුද ? මේ විදියට එක එක වර්ගවල මිනිස්සුන්ගෙ නම් කියලා මට බනින්න එන්නෙ......... මටත් ටික ටික ආරංචියි එයාලගෙ ඉතිහාසෙ ගැන. මට ඒවා කිව්වෙ මගේ යාලුවෙක්. එයාලගෙ පහත් ජන්ම ගති වහගන්න තමයි මට එහෙම කතා කරන්නෙ.

ඒ වෙනකොට මට කට පියාගෙන ඉඳලාම ඇති වෙලයි තිබුණේ. එයා කියන ඇනුම් පද ඉවසගෙන ජීවත් වීම තුළ මට කිසිම සහනයක් ලැබුණේ නැහැ. කරබාගෙන ඉන්න ඉන්න බලුවටම දැන සෝදන සමාජයක් තමා අද අප වටා තියෙන්නෙ. මා තුළ සිටි ශක්තිවන්තිය නැඟී සිටියා.

''එක එක වර්ගවල මිනිස්සු ගැන කියලා මට අපහාස කරන්නෙ .........? අපිත් හිතුවෙ ඔයා ඩීසන්ට් කෙනෙක් කියලා තමයි. මොනතරම් පුරුද්ද ඉස්මතු කරන්න හැදුවත් ජන්මෙ අත් අරින්න බෑ කිව්වෙ ඒකට වෙන්න ඇති .''

සගික් දණ්ඩෙන් පහර ලත් නාගයෙක් වගේ මොහොතක් බලා සිට පිටවෙලා ගියා. ඇත්තටම මම ඒ වකාට කිව්වෙ නැතිනම් හොඳයි කියලා මටම හිතෙනකොට මම ප්‍රමාද වැඩියි මට හිතෙන්නෙ. ඒත් මම මොනව කරන්නද මටත් ඕන වුණේ එයාගෙ කැරැට්ටුව ගැන ටිකක් මාත් දන්නවා කියලා කියන්න විතරයි.

සගික්ගෙ ඇස්වල දල්වුණේ මහා ක්‍රෝධයක්.........!

සගීකුයි එයාගෙ අම්මයි මහා ලොකු වලව් මානයක් මවාගෙන අපට පෙන්නුවාට එයාලා අන්ත දුප්පත් වෙලා ඉඳලා උඩට මතු වෙච්ච අය බව බැඳලා අවුරුදු දෙක තුනක් යනකොට තමා ආරංචි වුණේ. අනේ මගේ තාත්තා ඒ ගැන මොන තරම් දුක් වුණාද. පසු තැවුනාද. ඒ හිතේ අමාරුවටමයි තාත්තා අසනීප වුණේත්.

ඊළඟ අලුත් අවුරුද්ද වෙද්දි තාත්තා මේ ලෝකෙනුත් වෙන්වෙලා ගියේ. මේ සිද්ධ වෙච්ච දේ ගැන හිතේ අමාරුවෙන්ම බව පස්සෙයි මට අම්මගෙන් දැනගන්න ලැබුණේ.

දුප්පත්කම පැත්තක තියමු. ඒක අමතක කරලා දාමු. මේ මනුස්සයා චරිතෙ අහින් ගන්නම දෙයක් නැති කෙනෙක් කියලා දැනගත්තාම තමා තාත්තා හුඟාක් දුක් වුණේ.

"එයා ආස්සරේ කරපු කවුද ගෑනියෙක් පිස්සු හැදිලා පිස්සුවෙන් වගේ ඇවිත් වලච්ච ඉස්සරහා කෑමොර තිබ්බා දුවේ. තාත්තට එදා රෑ තමා පපුවෙ අමාරුව හොඳටම උග්‍ර වුණේ........"

"තමුන්ගෙ එකම දරුවා නෝබිනා මිනිහෙකුට දීග දුන්නා කියලා හිතෙනකොට කාටද මොන දෙමව්පියාටද දුවේ හිත හදාගන්න පුළුවන් වෙන්නේ.......?"

ඒ දවස්වල අම්මා මට එහෙම කියලා එච්චත් මම කලබල කරන්නෙ නැතිව හිටියෙ දරුවො දෙන්නා ගැන හිතලා.

අතීතයේදි මොනවා කළත් බැන්දට පස්සේ එයාගෙ නරක පුරුදු අත ඇරලා ඉඳීවි කියලා මගේ හිත මට කිව්වා. ඒ තරමටම හික්මවාගන්න හිතක් මට තිබුණෙ. මම දහම් පාසල් ඇඳුරේ හිටිය නිසා දහම් දැනීමක් ඇතිව හිටිය නිසා වෙන්න ඇති. නැත්නම් මේ ලෝකෙ ගෑනියෙක් ඉවසනෙ නෑ. ඒ වගේ රැවටිල්ලක් කරලා තමුන්ගෙ මිනිහා තමුන්ව කසාද බැන්දෙ කියලා දැනගත්තම.

සශික් දරුවො දෙන්නට ආදරෙයි. ඒත් මට ඒ ආදරේ ගැනත් අවිශ්වාස හිතෙන්න ගත්තා. මම ගෙදර නැති වෙලාවට එයාලව බලාගන්න ගමෙන් නැන්දා කෙනෙක් ගෙනාවෙ ඒ නිසයි. නැන්දා හැකම අමතක කරලා තමුන්ගෙ කැමැත්තෙන්ම වැඩකාරියෙක් විදියට අපේ ගෙදර වැඩ කළා. ඇයට හොඳ පඩියක් ගෙව්වේ එයාගේ සේවය මහා මෙරක් තරමට වටිනා නිසයි. සෝමම්මා අපේ ගෙදර ස්ථිර පදිංචිකාරියක් වුණේ ඒ විදියට.

අද දවසම හරිම නුසල දවසක්. මට නොයෙක් දේවල් මතක් වෙනවා. අපරාදෙ මම මේ වගේ මනුස්සයෙක් එක්ක දීග ආවෙ



නැතිව තනියම ජීවත් වුණානම් මොනතරම් හොඳද කියලා මට හිතෙනවා. ඒත් ඒ එක්කම පුතාගෙයි දුවගෙයි මූණු දෙක දැක්කාම මට මුලු ලෝකෙම කරදර දුක් දොම්නස් අමතක වෙනවා.

අද පුතාගෙ එකොළොස් වැනි උපන් දින උත්සවේ. බොහොම ජයට ඒ උත්සවේ තිබුණේ අපේ ගෙදරමයි. උත්සවේට ඇවිත් හිටිය ලංකාවෙ නම් දරන ව්‍යාපාරිකයො. දේශපාලකයො ඉදිරියේදි සශික් තරම් කරුණාවන්ත ආදරවන්ත ස්වාමියෙක් තවත් නැහැ.

ඇවිල්ලා හිටපු අපේ වැදගත් වලව්කාර නෑදෑ සනුහරේ ඉදිරියේදී සශික් තරම් වැදගත් ආචාරශීලී තාත්තා කෙනෙක් මේ මුළු ලෝකෙවත් නැති තරම්.

*සඳා මුතුමාල - දිනපොත*
*දිනය: 1995 ජන. 26*

අද මට හුඟාක්ම සතුටු දවසක්. ශිම්හාන් මාස තුනකට රට ගියා. මොකක්ද වාණිජ සම්මන්ත්‍රණයකටත් එක්කයි. එයාගෙ හාදයෙකුගෙ මඟුල් ගෙදරකුයි තව කරුණු ගොඩකුයි එක්ක.

සතියකට දවසක් විතර සශික් කොහොම හරි ඇඩ්ත් මාව හම්බ වෙන එක කිසි කෙනෙක් දන්නේ නැති වුනත් මට ටිකක් බයත් හිතෙනවා. මට සශික්ගෙ ඩ්‍රයිවර් ටිකක් සැකයි. මිනිහට තියෙන්නෙ උකුස්සෙකුගෙ ඇස්. බල්ලෙකුගෙ ඉව. මං එහෙම කිව්වාම සශික්ට හිනා.

සශික්ට ගෙදර හුඟාක් ප්‍රශ්න බව ඇහුවාම මට දුක හිතුණා. එයාට එයාගෙ වයිෆ් සලකන්නෙම නැතිලු. ගෙදට ගියාම අඩු ගානෙ තේ එකක්වත් දෙන්නෙ නැති වයිෆ් කෙනෙක් ගෙන් මොකක්ද ඇති වැඩේ. සශික් වගේ මිනිහෙක් එක්ක සතුටෙන් ඉන්න බැරිකම ඒ ගෑනිගෙ කාලකණ්ණිකම, පව්කාරකම.

මට සශික්ව නීතියෙන් බැඳගන්න තිබුණා නම් මම දනී එයාට සලකන විදිය. සශික් පුංචි කාලේ හුඟාක් දුක් විඳපු කෙනෙක්. එයා මට ඒ අතීතෙ කියලා තිබුණා. එයා විඳපු දුක්වල හැටියට එයාගෙ දරුවො දෙන්නා විඳින සැප දැක්කාම හිතට හරි සතුටුයි කියලා සශික් කියනකොට එයාට ඇඬුණා.

අනේ පව් සශික් මොන තරම් නම් සංවේදී පිරිමියෙක්ද? ශිමිහාන් වගේ කාඩබෝඩ් පිරිමියෙක් එක්ක හිටපු කෙනෙක්ට තමා සශික් වගේ පිරිමියෙකුගෙ අගේ දන්නෙ.

දුවව බාලිකාවට ඇරලලා මම කෙලින්ම පුරුදු බස් නැවතුමට ඇවිත් සශික්ගෙ වාහනේට ගොඩවුණේ හරිම හිතේ සැහැල්ලුවෙන්. හරියට හුඟාක්ම තරුණ කාලෙදි වගේ. ඒ දවස්වල මගේ නාට්‍ය බලන්න සශික් යාලුවෙක් එක්ක එන හැටි මට තාම මතකයි.

සශික් තාමත් එදා වගේමයි. එදාටත් වඩා ලස්සනයි. මූණ කට පිරිලා පිං පාටයි. සුඛෝපභෝගී පෙනුමකුයි ඇවිත් වඩාත්ම වැදගත් පෙනුමක් දෙන්නේ.

''මොකද බලන්නේ.......?''

සශික් මගෙන් ඇහුවෙ එයාගෙ වමතින් මගේ ඔළුවට අර මැජික් තට්ටුව දමන ගමන්.

මට හොඳටම හිනා.

''ඇයි මොකද හිනාවෙන්නෙ........''

සශික් තොල්පොටවල් තද කරගෙන තලු පාට එහෙත් දැම්මා.

''අවුරුදු පහළොවක් දාසයක් ගිහිල්ලත් ඔයාගෙ මැජික් තට්ටුවේ මැජික් බලේ අඩුවෙලා නෑ නේද ?''

''ආ........ඔය්........ඔය්........ මගේ මැජික් බලේ තාම අඩුවෙලා නෑ හෑ හා........!''

අපේ සහද්‍රාට නොතේරුණාට ඔයාට ඒක තේරෙන එක ලොකු දෙයක් ආ........''

''ඇත්තට සහද්‍රාට ඔයාගෙ මැජික් බලේ තේරිලා නැද්ද හා.......!''

මමත් විහිලුවට බැස්සේ සශික්ගෙ කටින්ම යමක් අල්ලා ගන්න.

'මොන මැජික්ද ඒ ගෙදර ගේට්ටුවෙන් ඇතුල්වෙලා දොරකඩින් ඇතුල් වෙනකොටම මගේ මැජික් බලේ කැලේ........!''

''එයා මූණ එල්ලගෙන ඉස්සරහට ඇවිත් එයාගෙ ඇස්වලින් මගේ මූණට රෝව් ගහනකොට මගේ මැජික් බලේ



කැලේ........හා හා........''

''එයා ඒ තරමටම නපුරුද සශී........ ඔයා වගේ කෙනෙකුට ඒ විදියට සලකන්න........''

''නපුරුදත් අහනවා. බලන්න මහා සල්ලි කන්දරාවක් වියදම් කරලා මාලිගාවක් වගේ ගෙයක් හැදුවෙ. ඒ ගෙදර ඇතුළෙ පුංචි පැල්පතක තියෙන සතුටවත් නෑ. අතික එයාගෙ වලව් මානෙ ඉහට ගැහුවාම ඊට වඩා දෙයක් තවත් නෑ. එයාගෙ අම්මා තමා පරණ වලව්වෙ ඉඳගෙන දෝනියන්දුව කුලප්පු කරන්නෙ ටෙලිෆෝන් කර කර දූකයො. එව එවා මට නම් ඒ ගැනි පේන්න බෑ.

ඒ ගෑනි අපේ අම්මත් එක්ක නිතරම වලි දාගන්නවා. ටෙලිෆෝන් එකෙන් ඒක මහාම කංකරච්චලයක්. මම අම්මා බලන්න අපේ මහගෙදර ගියාම ඔවා කියවනවා මගේ කණ පිරෙන්න. පිස්සුත් හැදෙනවා. මේ ගෑනුන්ට සම්ගියෙන් ඉන්න හැටි දෙයියො කියලා දීලා සැති හැටි, ගෑනු හරිම පවුකාරයි.''

''ඇත්තට.......... ගෑනු පව්කාර නම් මාත් පවුකාරද සශික්........''

''ඔයා හරිම පිංකාර ගෑනියක් මනෝ........ ඔයා මේ මට සලකන විදියට ඔයාට මහා පිනක්. වෙන ගෑනියෙක් මෙහෙම කරයිද? තමන්ව අතෑරලා වෙන ගෑනියෙක් එක්ක ගිය පෙම්වතාට මෙහෙම සලකන ගෑනියෙක් ගැන මට නම් හිතාගන්නත් බෑ.''

සශික් මාව උණුස්ම විදියට වැළඳගනිමින් කිව්වෙ හෝටලේ කාමරේට ඇතුල්වෙන ගමන්. අපේ කුලී දිව්‍යලෝකෙ සුන්දර නිමේශය......... අපිට කල්පයක් වටිනවා.

''මනෝජ්ට අර නාට්‍ය පිටපත ලියල දුන්නාට පස්සෙම මේ අවුරුදු ගානටම ඔයා මොකවත් කළේ නෑ නේද සශික්.......''

මම කිව්වෙ නිර්මාණ කිරීමේ අගය මතක් කරලා දෙන්න.

''මට පොතක් ලියන්න ඕනෑකම තියෙනවා මනෝ. ඒත් ඒකට තවම මට මානසිකත්වය හදාගන්න බැරිවුණා. මට හොඳ යාලුවෙක් අහුවුණා. හොඳ කරුණු කාරණා දන්න උගත්කමක් තියෙන ව්‍යාපාර ඥානය පැත්තෙන් ඉහළටම ගිය කෙනෙක්

මිනිහට කරුණු තියෙනවා ලියන විදිය දන්නෙ නෑ........ මම බැලුවෙ විෂයට අදාළව පොතක් කරන්න........"

"ඒක හොඳයි සඟී........දැන් බලන්න මම මගේ ලෝකෙ කටයුතු වලින් ඉදිරියට ආවේ සියලුම බාධාවල් ගැහැට දුක් කන්දරාවල් එක්ක. මට නාට්‍ය ජීවිතය තහනම් කළා. මාව ගෙදරට කොටු කළා. නමුත් මම ගෙයි බිත්ති හතර ඇතුලෙ ඉඳගෙන මාධ්‍යවලට ලියන්න ගත්තා. දැන් මටය කියලා රසික පිරිසක් ඉන්නවා. මම දැන් තෘප්තිමත්. ඒකම ජීවත්වෙන්න හොඳ පන්නරයක්........"

අපි දෙන්නා එකතු වුණාම මුලු ලෝකෙම පිරිලා වගේ දැනෙන්නෙ. දුව ඉස්කොලෙන් පස්සෙ පංතියට අරගෙන යන වැඩේ මගේ යාලුවා සුරංගි බාරගත් එක ලොකු දෙයක්. එතකොට එයාගෙ දුවත් එක්ක පංති අරගෙන යන්න පොරොන්දු වුණා.

දවස හුගාක්ම සතුටින් ගතකරලා සවස පහ වෙනකොට මාව ශිෂ්‍යත්ව පංතිය ළඟින් බස්සලා සඟික් ඉගිල්ලිලා ගියේ කුරුල්ලෙක් වගේ.

ජීවිතේ මොන තරම් නිදහස්ද ? මොන තරම් සැහැල්ලුද !

ආදරය ඇත්නම් ජීවිතය පිරිලා.

ගිම්හාන් - ගිම්හාන් ගෙ අම්මා. කවුරුවත් මට මතක් වෙන්නෙ නෑ සඟික් එක්ක හිටපු පැය කීපයෙදි. පව් සඟික්. එයාට ආදරේ අවශ්‍යයි. ආදරේ 'ගින්දර රස්නෙන්ම' ඔන කෙනෙක් සඟික්. එයාගෙ ආදරනීය කසාද බිරින්දෑ ඒක තේරුම් ගන්නෙ නැති වුනත් මම ඒක දන්නවා සහසුද්දෙන්ම.

*මනෝරමා නාගසේන - දිනපොත*

*දිනය: 1995 පෙබ. 05*

සඟික්ට අද නුවර යන්න තියෙනවා කියලා පුතාව ඉස්කොලෙට දාන එක බාර දුන්නා ඩ්‍රයිවර්ට. ඉස්කොලෙ ඇරුණට පස්සෙ එයාට කෑම ටික දීලා ශිෂ්‍යත්ව පංතියට දාන්න මං ගියේ දුවව සෝමම්මගෙ බාරේ තියලා.

ශිෂ්‍යත්ව පංතියට පුතාව දැම්මට පස්සෙ මට හිතුණා ෂොපින් යන්න. සෑහෙන දවසකින් ගියේ නැති නිසාත්, දුවගේ උපන් දිනය



ළඟ ළඟ නිසාත් මට හිතුණා ෂොපිං ටික ඉවර කරගන්න. ඒ ටික ඉවර කරලා හවස පුතාගේ ශිෂ්‍යත්ව පංතියට එද්දී එකපාරටම අපේ වාහනේ විජේරාම හංදියෙන් හරවනකොටම සඟික්ගෙ වගේ වාහනයක් එතැනින් පියඹං වෙලා ගියා. ඒකෙ නොම්මර වල මුල විතරයි දැක්කෙ.ඒ තරමට වේගෙන් ඒක ඉගිල්ලුනා.

"ඩ්‍රයිවර් අර ගියෙ සඟික් මහත්තයාගෙ වාහනේ නේද ?"

මම ඇහුවෙ කෑගහලා ඩ්‍රයිවර් එක පාරටම ගැස්සුණා. ඒ ගැස්සිල්ල මට කිව්වෙ ඩ්‍රයිවර් ඒක දැක්කා කියන එක.

"........මො........මො........ කෝ මැඩම් වාහනේ ?"

"සඟික් මහත්තයගෙ වාහනේ අර රවුන්ඩබවුට් එකෙන් දාලා ගියා නේද ඩ්‍රයිවර්."

"අනේ දැක්කෙ නෑ මැඩම්. මං මේ ඇඟට එන ත්‍රිවිලර්කාරයට ලිහින් බැණ බැනයි හිටියෙ. අද සර් නුවර යනවා කිව්වා නේද?"

මම ඊට පස්සෙ කතා කළේ නෑ. ශිෂ්‍යත්ව පංතිය ළඟින් බැහැලා පුතා එනකම් ඉන්නකොට මම දැක්කා අර එදා දැකපු ගෑනු කෙනා එයාගෙ ළමයත් ඒක ඇවිත් ගේට්ටුවට එලියෙන් තිබුන වාහනේකට ගොඩවුණා.ඒ වාහනේ හිටියෙ එයාගෙ තාත්තා වගේ කෙනෙක්. පුංචි ළමයා ඉස්සරහා සීට් එකට ගොඩවුණේ ඕයා කියාගෙන. මේ ගෑනිගෙ මූණ මගේ හිතේ පුදුම විදියට හොල්මන් කරනවා. මම එයාව දැකලත් තියෙනවා වගේ මතකයි. මොකක් හරි නාට්‍යයක හරි නාට්‍යයක කටවුට් එකක හරි එයා හිටියා වෙන්න ඇති. හැබැයි ඉස්සර.

හරි නේන්නම්........ ඉස්සරම කාලෙ ධර්මෙ මට ගෙනැත් දුන්නු නාට්‍ය සුවනියර් එකක මුල පිටේ තිබුනෙ ඔය මූණ........ මට ඒ ඇස් දෙක අමුතු නිසා මතක හිටියා හොඳට........

වාහනේ අපේ ගෙදර ගේට්ටුවෙන් ඇතුල් කරද්දී මම බැලුවෙ සඟික්ගෙ වාහනේ තියේද කියලා........ නෑ........!

එහෙනම් මට වැරදීමක් වුණාද? මම හිතුවා ඒත් ඒ සිතිවිල්ල වැඩි වෙලාවක් ජීවත් වුණේ නෑ.

පෝටිකෝව යටට ආපු සෝමම්මා කියූ වචනවලින්.

"මහත්තයා ඇඩිල්ලා තව කොහේද ඩිනර් එකකට යන්න තියෙනවා කියලා ගියේ. තේ එකක් බොන්න හිටියෙත් නෑ. අපේ

කරලා තිබ්බ ඇඳුමකුත් වාහනේ එල්ලගෙන ඔය ගියේ."

ඩ්‍රයිවර් මගෙ මූන බැලුවා. එහෙනම් සගික් ශිෂ්‍යත්ව පංතිය පැන්නෙ ඉඳන් ගිය කතාව හරි. මගේ හිතලුව හරි. මට හිතෙන දෙයක් කවදාවත් වරදින්න විදියක් නෑ.

"ඩිනර් එකකට මෙච්චර කලින් යනවද සෝමම්මෙ තාම හයයිනෙ."

"නෝනා........ ඉස්සෙල්ලා රැස්වීමක් තියෙනවලු. ඊට පස්සෙලු ඩිනර් එක !"

මම හෙමිහිට අපේ කාමරේට ගියේ කාන්දමකින් වගේ. සගික් උදේ ඇඳන් ගිය ඇඳුම් නිදන ඇඳ මත හැවක් වගේම ගලවලා දාලා. මම කමිසය අත් දෙකට ගත්තෙ විමසිල්ලෙන්. බොත්තම් කාස අස්සෙ දුවච්ච ගෑනු කෙස්ගස් නෙමේ මට බලන්න ඕන වුණේ.

මම ඒ කමිසෙ එක්ක කතා කළා. මට කියන්න හිත් පිත් නැති රෙදිවලින් මහපු සිල්ක් සහ කපු මිශ්‍රන කමිසය! ඔබ වඩාගෙන හිටිය පපුව අයිතිකාර මහත්තයා අද දවසේ කළ කී දේ මට කියන්න.

සාමාන්‍යයෙන් විලවුන් නොගල්වන සගිත් ඔඩිකොලොන් ටිකක් විතරයි දාගන්නේ. ඒත් ගෑනු විලවුන් සුවඳක් මට ඒ කමිසයෙන් ආවෙ. පිළිකුල් හිතිලා මම වීසි කළා ඒ කමිසය. මට මහා දුකක් එක්කම තාත්තා මතක් වුණා.

මම වාපාට කෝල් එකක් අරගෙන මගේ හිතේ දුක ඔක්කෝම එයාට කිව්වා. නැත්නම් මාව පිස්සියක් වෙනවා.........!

හොඳ වෙලාවට වාපාත් ගෙදර හිටියා. වාපයි එයාගෙ මහත්තයයි ඉන්නෙ හරිම සතුටින්. මට ලජ්ජත් හිතුණා සගික්ගෙ වැඩ ගැන මගේ හිතේ සැක ගැන එයාට කියනකොට එයාට හරිම පුදුමයි. එයා මගෙන් ඇහුවෙ මේ තරම් මානසිකව පහත් තත්වෙකට මම වැටුනෙ කවද ඉඳන්ද කියලා.

තමුන්ගෙ සැමියා ගැන හැම වෙලේම සැකෙන් හිතන ගැනියෙක් කොයි වෙලෙත් ඉන්නෙ ඒ සැකේට පණ පොවා ගන්න යමක් සොයමින්ලු. ඒ ඇද වැටිච්ච මානසික තත්වෙන් ගොඩ එන්න විදියක් නැතිව දවසින් දවසම ඒ ගෑනි පාතාලෙටම බහිනවලු මානසික මට්ටමේ පැත්තෙන්!



මට හරි දුක හිතුණේ වාපා වගේ මගෙ හොඳම යාලුවෙක් මම ගැන එහෙම කියපු එකට.

"මම හිතන්නේ නිකරුණේ සැක කරනවා නම් ඕය චෝදනා මට හරි. ඒත් ඒවා මට යම් යම් දේවල් සොයාගෙන ඒ මත තබා සැක කරන්නේ ඔයා හිතන විදියෙ හණමිටි කාලෙන් හිතන කෙනෙක් නම් මම මෙලහකටත් දීගෙ අත ඇරලත් හිඳිල්ලා. ඒ නිසා ඔයා මට මගේ හොඳම යාලුවා විදියට කියන්නෙ මාව මුළුමනින්ම පහළට දාලා සැක කරන්න එපා...!

මම රිසීවරය තිබ්බෙ කේන්තියෙන්. ඊට පස්සෙ දහපාරක් විතර ෆෝන් එක රිං වුණත් මම නෙමෙයි ගත්තෙ. මට හරිම කලකිරීමක් ඇතිවුණා. වාපායි අම්මයි එකතු වෙලා සගිත්ගෙ හිංසුර පෙන්න පෙන්න මාව උසිගැන්නූ විදිය මම මතක් කරගෙන හිත දැඩි කරගත්තා.

ඒ ආරවුලෙන් හිත පීඩා කරගෙන පැයක් ගියේ නෑ මෙන්න වාපා එයාගෙ මහත්තයා එක්ක ඇවිත්. ගේට්ටුව ළඟ වාහනයක් දකලා මුරකාරයා එතැනට දුවද්දි තමයි මමත් දැක්කෙ එවෙලෙ ඒ ගතත් පනු වෙලා.

වාපා මාව දැක්ක ගමන් බදාගත්තා. මට ඇඬුණා. හොඳටෝම ඇඬුණා.

කෙල්ල කාලෙදිවත් මම මෙහෙම ඇඬිල්ලක් අඬලා නැති විත්තිය වාපා දන්නවා මේ වගේ දේවල්වලට.

"මට සමාවෙන්න සහද්‍රා........ මම හිතලා නෙමෙයි ඒ ටික කිව්වෙ. ඒත් මට සගික් ඒ විදියෙ කෙනෙක් කියලා හිතාගන්න බෑ. ඕනම කෙනෙකුට ඒක හිතෙනවා. ඒ තරමට එයා සමාජශීලී පුද්ගලයෙක්. හැමදෙනා එක්කම කතාබස් කරන තමුන්ගෙ භාර්යාවගෙ ගුණ ගායනා කරන සමාජයේ විවිධ වැඩවලට උදව් උපකාර කරන කෙනෙක් එයා."

"කෝ දැන් සගික් ඔෆිස් එකේද? ඔය රැස්වීම තියෙන්නෙ?" එයාගෙ මහත්තයා ජයේන්ද්‍ර ඇහුවේ කුතුහලයෙන්.

"රැස්වීම කිව්වට කොහේ එකක්ද කියලා අපි දන්නෙ නෑ ජයේන්ද්‍ර එයාගෙ ඔෆිස් එකකද, වැඩ කරන තැනක තියෙන රැස්වීමක්ද කියලා."

මම එහෙම කියද්දි සෝමම්මා දරුවො දෙන්නත් එක්ක එතනට ආවෙ එයාලටත් එක්ක කෑම හදන්නද අහගෙන.

"අනේ එපා අම්මේ කෑම හදලා මේසෙටත් බෙදලා තියලා තමයි කෝල් එක ආවාම ආවෙ."

චාපයි ජයේන්ද්‍රයි හොඳටම හිනා වෙවී කිව්වෙ.

"ඉතිං මං කෝල් කරාට මොකද මෙහාට දුවගෙන ආවෙ කෑමත් නොකා !"

මම කිව්වෙ බොරුවට හිනාවෙවී දුක යටපත් කරගෙන.

"අනේ දරුවො දෙන්නා හරිම හුරතල් අනේ හරි ස්වීට්........"

එයාලා ළඟට ආපු දරුවො හුරතල් කරමින් තියහකොට පුතා ඔලුව හරවලා මා දිහායි බැලුවෙ.

"අපේ තාත්ති නමයි නෝටි........හැමදාම ගෙදර නෑ........"

"නෑ පුතේ තාත්ති ඔයා නිදියන්න කලින් ඒවි.........."

සෝමම්මා උත්තර දුන්නෙ මා වෙනුවට.

"හැමදාම එයා එන්නෙ මෙයාලා නිදාගත්තාට පස්සෙනෙ. උදේට දකින්නෙත් සමහර දාට විතරයි. ඉස්කෝලෙට ඇරලන්නෙත් දැන් ඩ්‍රයිවර් නේ."

"අපිත් ටිකක් හොයලා බලන්නම්කො. ඔයා කියූ දේ ගැන. හිතට කරදර නොගෙන එතෙක් ඉන්නකො."

යන්න පිටත් වෙලා ජයේන්ද්‍ර එහෙම කියද්දි මට දුකයි. දුකක් කියන්නෙ සහෝදර සහෝදරියක් නැතිව මම මොන තරම් අසරණද කියලා මතක් වුණේ එතකොට.

කමක් නෑ දැන් තනියෙන් දුක් උහුලගෙන ඉන්න ඕන නැහැ. ඒ දෙන්නත් ඒ ගැන බලනවනේ. මට ඒක ලොකු නිදහසක්. දැන් මම අලුත් පුරුද්දක් පුරුදු වුණා. ගෙදරට එන කෝල් ගැන හොඳට සැලකිලිමත් වෙනවා. සශික්ට එන කෝල්වලදී එයා අහන අයගෙ විස්තර ටික ගන්න පුරුදු වුණා. කතා කරන්නෙ කොහෙන්ද කවුද කින්ද මන්ද කියලා. ඒත් ඒ වැඩේ හරිගියෙ නැත්තෙ දන්නෙම නැතිව මගේ ඇඟට කඩා පැන්නාම.

"සහලා ඔයා බලු වැඩ කරන්න එපා. මීට පස්සේ ඔයා මහ නුගත් ගොඩේ අම්මණ්ඩියෙක් වගේ හැසිරෙන්නෙ........"

මම කරමින් සිටිය වැඩය අතහැර ඔහු දිහා බැලුවෙ පුදුමයෙන්.

"ගෙදරට කතා කරන හැම එක්කෙනාගෙම තෝම්බුව අහන්න ඔයාට පිස්සුද ඇත්තට. මගේ යාලුවො, ක්ලයන්ට්ස්ලා මට හිනාවෙනවා මම ඉන්නෙ ගෙදරකද පොලිසියකද කියලා."

"ඒක හරි කතාවක්නෙ ගෙදරට කෝල් කරන අයගෙ විස්තර ඇහුවම ඔයාට ඒකෙන් අපහාසයක් වෙනවද ?

"ඒක තමයි මෝඩ කම කියන්නෙ. ඔයා ඉගෙනගත්ත ගෑනියෙක් වෙලත් මෙහෙම මරිමෝඩ නනකිරු වැඩ කරන එක ඔයා හිතන්නෙ නම්බුකාරයි කියලද ? "

"ඒක වෙන්න ඇති අර බුක්ෂොප් එකට අඟහරුවාදාට කතා කරන ගෑනි විස්තර ඇහුවාම අර තරම් ගොත ගැහුවෙ. ඔයාට මේ ඒකෙ තරහ තමයි පිටකරගන්න ඕන වුණේ......... මට තේරෙනවා මහ ලොකුවට පිරුවට ඇඳගෙන පේ වෙනවා උපාසක බළල්ලු වගේ. ගෙදර ගෑනි ගැන දරුවො ගැන හොයන්න වෙලාවක් නෑ........"

ඒ කියූ දේට උත්තරේ වුණේ සශික් පුටුවකට පයින් ගහලා ගිහින් කාරෙකට නැගිලා යන්න ගිය එක.

ඒ දේ වුණෙත් හැන්දෑවක. ඉස්කෝලේ උගන්නලා ඇවිත් ගෙදර දරුවන්ගෙ අඩුපාඩු හොයලා එයාලව සතුටු කරලා ටිකක් ඉඳලා තමයි මම මගේ ඉස්කෝලෙ වැඩ ගැන බලා කියාගන්නෙ. ඉතින් එහෙම වෙලාවක ඔලුව කීරි ගැහෙන මේ වගේ රණ්ඩු දබර ඇති වුණාම මට හරිම අමාරුයි හිත හදාගන්න.

රණ්ඩු වෙලා පුරුදු අයට රණ්ඩු නොවී ඉන්න බැරිව ඇති. ඒකයි මොකක් හරි දෙයක් පටලවාගෙන ඇඟේ ලේ රත්කර ගන්න එන්නෙ.

දෙයියනේ ඇයි මම සශික්ව කසාද බැන්දෙ ? ඇයි මට චාපාට වගේ හස්බන්ඩ් කෙනෙක් ලැබුණේ නැත්තෙ. මම හැමදාම පසුතැවෙනවා. විවාහ ජීවිතයක් කියලා දෙයක් මට නෑ.

සහලා මුණසිංහ - දිනමිණ

දිනය: 1995 පෙබ. 10

සගීක් උදාකර දූන් අමුතුම මිනිහෙක් වෙලා. ගෙදරින් ගෝදි දාගෙන ගිනි වළලු පිටකර ගෙනයි එන්නෙ මාව හම්බවෙන්න. මට ඉතිං තියෙන්නෙ ඒ ගින්දර නිවන එක තමයි. ඒක මගේ රාජකාරිය වෙලා. ඒත් මේ රාජකාරිය කී දවසක් කරන්නද?

''හිස ගිනි ගත්තෙකු එගිනි නිවස ලෙස.........''

මම හෙමිහිට ගායනා කරනවා සගීක්ගෙ තරහා මූණ දකලා. එතකොට එයා හිනාවෙනවා, මල් වට්ටියක් වගේ. මට නම් තේරෙන්නෙ නෑ මෙච්චර ලාමක සිතක් තියෙන කෙනෙක් එක්ක අර සහද්‍රා කියන ගෑනි රණ්ඩු වෙන්නෙ කොහොමද කියලා.

''මම ඔයාගෙන් එක ප්‍රශ්නයක් අහනවා ඔයා ඒකට අවංකව මට උත්තර දෙන්න ඕනෑ.''

'දවසක් ප්‍රේමයෙන් හිත සුන්දර වෙලා තිබිලා තිබුන වෙලාවක මම එහෙම කිව්වෙ සගීක් ගෙ හිත අවුස්ස ගන්න.

''අර ඒ කාලෙ ඔයා මාත් එක්ක යාලු වෙලා ඉදලා එකපාරටම මාව අතෑරලා එල්ලගත්ත සක්කරවට්ටම කවුද?''

සගීක් කපටියා. කම්මුල වල ගස්සලා උඩ බලලා හෙමින් කතා කරලා.

''එයා ක්ලබ් ගර්ල් කෙනෙක්. මොකටද ඔයා එයා ගැන අහන්නෙ?''

''නෑ ඉතිං මම දැනගන්න ඇහුවෙ......... එච්චර ආදරෙන් හිටපු මගේ ආදරේ එපා කරවලා ඔයාව ඇදගත්ත ගෑනි කවුද කියලා මට දැනගන්න ඕන වෙලා තිබුණේ.........''

''ඉතිං......... තව මොනවද අහන්නෙ......... ඔයා දන්නවනෙ මං හරිම දුප්පත් ළමා කාලයක් උරුම වෙච්ච මිනිහෙක්. මගේ අම්මයි තාත්තයි අතරෙ රණ්ඩු නිසාම මම හැදුනෙ වැඩුනෙ මුරණ්ඩු විදියට. මට ආදරය කියන එක හිතාගන්න බැරි දෙයක්. විශ්වාස කරන්නත් බැරි දෙයක්.''

''ඒ වුණාට මාත් එක්ක ආදරෙන් ඉන්න කාලෙ ඔයා කිව්වෙ මං නිසා තමයි ඔයා ආදරේ අඳුනාගත්තෙ කියලා. ඔයා ඇයි ඒ වගේ බොරු කතා කියලා එහෙනම් මාව රැවැට්ටුවෙ?''

''රැවැට්ටුවෙ.....? රැවැට්ටුවෙ කවුද ඔයාද මමද. බැඳපු මිනිහගෙ මුද්ද ගලවල දාලා ඇවිත් මාත් එක්ක ලව් කළා. මට



දැනුවුණේ පස්සෙ ඒවා හොඳ නැඩද .........''

සගීක් නැගිට්ටෙ කේන්තියෙන්. ''දන්නෙ මට තේරෙන්නෙ සගීක්ට කේන්ති ගියාම නයෙක් වගේ......... ඉසේ කෙසුත් කෙලින් වෙන තරම්......... බුදු අම්මේ.........''

මම ඉක්මනටම සගීක් ළඟට ගිහිල්ලා එයාව හෙලෙව්වා ගහක් වගේ. එයාගෙ ඇස් මා දිහාට හැරුණා.

''පෑරෙන කුවාල උඩ පැන පැන පාරන්න එපා මනෝ...''

''මම ඔය පාර ඔයාට තරහා ගියාම තෙත රෝනියක් ගෙනත් දානවා හොඳේ. ඒක පැගුනාම ඔයාගෙ තරහ ඇරෙයිනේ.''

ඒ කතාවට සගීක්ට හොඳටම හිනා ගියා. මම හොඳිහපු විදිහට එයා ඇඳේ පෙරලි පෙරලී හිනාවෙලා මාවත් එයාගෙ සෙල්ලමට හවුල් කරගත්තා. මටත් මොකද තරහා තිවුනා නම් ඒ මදෑ.

''නැලෙන යකඩ උඩ පැන පැන තලන්නෙ ඇයි අනේ''

ඒ කතාවට සගීක් ආයෙත් හිනාවුණා හොඳටම. එදා හැන්දෑ වරුවම අපි හුඟාක් සතුටින්...!

ගිම්හාන්ව පංතියෙන් දුවව අරගෙන යන එකත් තාත්තට පවරලා මම ගෙදරින් පිටවුණේ නාට්‍ය වැඩමුළුවකට නුවර යනවා කියලා ගෙදරට බොරු කියලා.

ගෙදරට කියන්නෙ ගෙදර ඉන්නෙ ගිම්හාන්ගෙ තාත්තයි වැඩ කරන දෙන්නයි විතරයිනෙ. ගිම්හාන්ගෙ අම්මා දූත් මා පස්සෙ එලව එලවා කොටු කරන්න එන්නෙ නෑ. කොහොම හරි එයාට මිණිබිරියක් ලැබුණානෙ. ඒකෙ ජොලිය තාම භුක්ති විඳිනවා.

එයාලගෙ කාඩ්බෝඩ් පුතාට ළමයි ලැබුනේ කොහොමද කියලා තාම එයාලවත් දන්නෙ නෑ. කොහොම වුණත් දූත් මගේ ඔලුවෙ එක දෙයක් වැඩ කරනවා. කොහොම හරි ගිම්හාන් ගෙන් දික්කසාද වෙලා වත්දියකුත් අරගෙන ඊට පස්සෙ සගීක්ව බඳින එක.

සගීක්ව බඳින එක ලේසි නෑනෑ. ඉස්සෙල්ලා එයාව විවෝස් කරගන්න එපායැ.

මම හවස සශික්ලාගෙ ගෙදරට කතා කළා.

"හෙලෝ........"

"හෙලෝ කවුද කතාකරන්නෙ......?"

"ආ මම මේ සශික් ගෙ යාලුවෙක් කතා කළේ නැද්ද සශික් ගෙදර........"

"ඔය කතාකරන එක්කෙනාගෙ නම කියනවද ?"

"ඇයි ඔයා පොලිසියෙන්ද......?"

"අනේ මෙන්න මේ යනවා ගෑනියෙ යන්න. ආපු අතක් බලාගෙන."

"යන්න ? එහෙම යන්නෙ කොහොමද ගෑනියෙ........ මම සශික්ගෙ බිස්නස් පාට්නර් කෙනෙක්. දන්නවද ? කතාකරන හැටි කලින්ම ඉගෙන ගන්නවා නම් හොඳයි."

"ආ........ බිස්නස් පාට්නර්........ හිතාගන්න පුළුවන් නොමමරේ මොකක්ද කියලා." එයා ෆෝන් එක දමලා ගැහුවෙ ඒ විදියට.

මටත් තරහ නැගී ආවා. හොඳ වැඩක් කරන්න පුළුවන්. ඩිවෝස් කරලා දාන්න සශික්ව කැමති කරවාගන්න මට බැරිවෙන එකක් නෑ. නයාට ගහලයි මිසිස් උදාකර පොල්ල වරද්ද ගත්තෙ. හරි බලමු. මේ මනෝරමා හොඳට හොඳයි. නරකටත් එච්චරම හොඳ කෙනෙක් නම් නෙමේ.

*මනෝරමා නාගසේන - දින පොත*

*දිනය: 1985 පෙබ. 15*

අද ඉස්කෝලෙට ආවා චාපා. මට පුදුම හිතුණ ඇයි ආවෙ කියලත්. එයා දන් වෙන ඉස්කෝලෙක වැඩ කරන නිසා අපි නිතර හමුවෙන්නෙ නැති වුණාට හිතේ බැඳීම අඩු වුණේ නෑ.

"ඔයා සශිත් ගැන සැක කරපු එක සාධාරණයි සඟුා........ අපේ ජයන්තු සොයලා බලලා ටිකක් එයා ගැන.

අම්මෝ එයා අත්තිමට කැරිඹින් කරල තියෙන ඒෆයාර් එක ක්ලබ් යන ගෑනියක්. ඒ ගෑනිගෙත් මෙයා සේසතම සූරාගෙන පස්සෙ අතෑරලා. ඒ ගෑනිට ඒකෙන්ම පිස්සුත් හැදිලා. ඒ මදිවට ඒ ගෑනිට විරුද්ධව නඩුවකුත් පවලැව්ලා කලින් බැඳලා හිටපු



ව්‍යසක සුද්දාගෙ මරණේට. ඒ මරණය සිද්ධ කරලා තියෙන්නෙ ඒ ගෑනි කියලා තමයි කියන්නෙ........"

"දෙයියනේ ඔයා ඔය ඇත්තමද කියන්නේ චාපා........? මම මොන තරම් ප්‍රෝඩාවකද ජීවත් වුණේ."

"මම හිතන්නේ ඔය කතන්දර සේරම මුතුමාල අංකල්ට ආරංචිවෙලා තියෙනවා. ඒ හිතේ අමාරුව උහුලාගන්න බැරිව තමයි එයා මේ ලෝකෙ අතෑරලා ගිහිල්ලා තියෙන්නේ........"

ඈ එහෙම කියද්දී මට ආයෙමත් තාත්තව මතක් වුණා. ඇත්තටම තාත්තා හොඳ ඕසන්ට් ගතිගුණ තියෙන නියම මහත්මයෙක්. ඇත්තටම එයා දැනගත්ත සිද්ධිය අම්මටවත් කිව්වෙ නැතිව හිතින් වේදනා විඳ විඳම ඉන්න ඇති. ඒකෙන්ම තමා එයාගෙ මරණය සිද්ධ වෙන්න ඇත්තෙත්.

*සඟුා මුතුමාල - දිනපොත*

*දිනය: 1995 පෙබ. 15*

'හිස ගිනි ගත්තකු එගිනි නිවන ලෙස' කතන්දරේ කොහොම වුණත් මනෝරමාත් එක්ක මේ සෙල්ලම එච්චර හොඳ සෙල්ලමක් විදියට මට හිතන්න බෑ. ආයෙත් ගිම්හාත් එයාගෙ වර පුරුෂ කල්ලිය යෙදෙව්වොත් කෙළින්ම මම මාට්ටු වෙනවා.

අනික අපේ පුතාගේ ශිෂ්‍යත්ව පංතියටම මනෝරමා එයාගෙ දුවවත් දාගෙන ඉන්න එක ලොකු ප්‍රශ්නයක්. කොයි වෙලේක හරි බෝම්බයක් පුපුරා යාමක් සිද්ධ වෙයි. මනෝරමාට ඕන වෙලා තියෙන්නෙ අපේ කුඩුව පුපුරවා හරින්න තමයි මට පේන විදියට. කොහේද මොනම විදියකින්වත් සඟුාව ෂේප් එකේ තියාගන්න ලැබෙන්නෙ නැති හැටි. එයා හැම තිස්සෙම ඉන්නෙ අර කවුද වගේ බෙලිකටුමල්ල පොළොවෙ ගහන්න බලාගෙනමයි. මට දරුවෝ එක්ක ගැවසෙන්නත් වෙලාවක් නැති බව ඇත්ත. ඒත් මම එයාලට කෑම බීමෙන්, ඇඳුම් පිටුම්, සෙල්ලම්බඩු එවයින් අඩුවක් කරලා නෑ. කිසිම දේකින් අඩුවක් කරලා නැහැ. පුතයි දුවයි එක්ක මට ගැවසෙන්න තියෙන බොහොමයක් අවස්ථාවල් සඟුා මග අරවනවා කියලා මට හිතෙනවා. ඇයි මම ආදරේ

නැද්ද මගේ දරුවන්ට. මට අයිතියක් නැද්ද මගේ දරුවන්ට ආදරේ කරන්න.

මම අත්විඳපු දුක් කන්දරාවේ හැටියට මගේ දුවයි පුතයි මොනතරම් වාසනාවන්තද? ඉතින් එයාලට ඒ අවස්ථාව උදාකරල දීපු එකම මම කරපු යහපත් දෙයක් නොවෙයිද ? ඇයි මම කරන කිසිම වැඩක හොඳක් නොදකින්නේ. ඒක සහද්‍රාගේ ජන්ම ගතියද්ද? සැක නොකළ යුතු තැනදී මාව සැක කරන සහද්‍රා සැක කළ යුතු තැනදී එළව එළවා සැක කරනවා. එයාගේ ඒ ජන්ම ගතියේ තියෙන අශෝභන බව එයාට තේරුමක් නැහැ, එයාගෙ අම්මට තේරුමකුත් නැහැ.

සහද්‍රා කරන්නේ හිතේ හැටියට මා එක්ක රණ්ඩු ඇල්ලීම විතරයි. නිදන කාමරයේදී අපි දෙන්නා හැමදාමත්ම දෙන්නෙක්ම විතරයි. සහද්‍රා මාව පිළිකුල් කරනවා. පිළිකුල් කරන බව එළිපිටම මට පෙන්වනවා. ඇ මාව තවදුරටත් තල්ලු කරනවා මනෝරමා ළඟට. මනෝරමා අර හිර ගෙදරින් පිටවෙලා ඇවිත් කොහොම හරි මාව බලාපොරොත්තුවෙන් දෑත් විදහාගෙන ඉන්නවා. ඇයට මා හැර වෙනත් ලෝකයක් නැහැ.

ඇය මට කරදර කරන්නෙත් නැහැ. දරුවා ගැන කිය කියා ඕනෑනම් පළිගන්න තිබුණා. ඇ කවදාවත් ඒ වැඩේට දරුවා යොදවා ගන්නේ නැහැ. මනෝරමා දරුවා ලවා මට වෛර කෙරෙව්වෙත් නැහැ. එතැනදී මනෝරමාගෙ මම දකින්නෙ ශ්‍රේෂ්ඨ ගතිගුණයක්. බොහොමයක් ගැහැනුන්ට ඔහොම ඉවසන්න බැහැ. මම හිතන්නෙ නාට්‍ය ජීවිතයෙන් එයා ලබපු පරිචය තමා ඒක. තමා ඉන්නා තැන ඉඳන් අඩි කීපයක් උස වේදිකාවක් උඩට නැඟුන නාට්‍යකාරයො සාමාන්‍ය කෙනෙක් දන්න දනිල්ලට වඩා යමක් දන්නවා. කවියාත් එහෙමයි. සාමාන්‍ය ඇහැක් නොදකින අදෘශ්‍යමාන දේවල් කවි ඇසට අහුවෙනවා. මනෝරමා කොහොම හරි මගේ ජීවිතය ඇ වෙනුවෙන්ම කැප කරවාගන්න හදන ගතියක් මට පේනවා. ඇ ඒකට කවදාහරි අර අදිවි කියලා මට හිතිලා තිබුණා.

ඇ හුඟාක් උත්සාහ කරනවා මගේ කුලගෙදර බිඳ හෙලන්න. මට ඒක තේරුණ දා මම බිය වුණා. ගිම්හාන් ලංකාවට එන



දවස වැඩි ඈතක නැහැ කියලා මනෝ කිව්වා. ඒක අතකට ඒක හොඳයි. මට ජීවිතාන්තය දක්වාම මනෝව බැඳලා ඉන්න උවමනාවක් නැහැ. මම ඇයගෙ අවශ්‍යතාවයක් සැපිරුවා. ඇ මගේ අවශ්‍යතාවයන් සැපිරුවා එච්චරයි. අනිත් එක හැඟී හැඟී ආදරේ කරන්න ගිහිල්ලා මං ගොඩනගාගෙන තියෙන සමාජ මුහුණුවරට හානි කරන්න මට ඕනෑ කමක් නෑ.

මනෝට ඕනෑ පුදුමාකාර විදියෙ බැඳීමකින් බැඳිලා ඉඳගෙන එයාගෙ මුළු ජීවිතේම මා වටා ගොඩනගා ගන්න. හැබැයි මට එහෙම උවමනාවක් නැහැ. කාගෙවත් ගැතියෙක්ගෙ අතකොළුවක් වෙන්න මට අවශ්‍යතාවයක් නැහැ.මට ඕනෑ තරම් මුදල් තියෙනවා. ප්‍රසිද්ධිය තියෙනවා. පිරිස් බලය තියෙනවා. මනෝරමා මගෙන් අනවශ්‍ය විදියට පවුල් ජීවිතය ගැන අහනවා. අතීතය ගැන හාරා අවුස්සනවා. තිසලා ගැන එයාට දැනගන්න හොඳටම ඕනෑ කරලා තියෙනවා. ඒ ගැන මට හිත බිඳිලයි තියෙන්නෙ මනෝ ගැන.

*සශීක් උදාකර - දිනපොත*
*දිනය 1995 මාර්තු 04*

මගේ ජීවිතේ බිමටම සමතලා වෙන්න හදවනවද මන්දා. ගිම්හාන් නිසා කළකිරිලා තිබුණු ජීවිතය මම කොහොම හරි ඉවසා දරාගෙන අවුරුදු පහක් ජීවත් වුණා. මට ආයෙත් සශික්ව හමු වුයේ අවුරුදු පහක විශාල දඬුවම් කාලයකට පස්සේ. හරිම පුදුමයි ඒක. දෛවය හරිම පුදුමයි. සශික්ව මට දෙවැනි පාරට හමුවෙලා දැන් අවුරුදු හයක් විතර ගතවුණා දැනුනෙම නැතිව. මේ කාලය අතරතුරේ ගිම්හාන් නම් හරිම වැඩ බහුලයි. මාස තුනෙන් තුනට වගේ රට යනවා. සමහරක කාලවල මාස තුන හතර රට ඉන්නවා.

අපි අතර පවුල් ජීවිතයක් ඇත්තෙම නැහැ. එයා ගත කරන අපිස් ජීවිතය ගැන මට තේරුමකුත් නැහැ. ගැමි පිස්සෙකි යාලුවො පිරිවරාගෙන එහාට මෙහාට යනවා හරියට සිකියුරිටි ගාඩ්ලා එක්ක යන ඇමති කෙනෙක් වගේ. එහෙම ගිහිල්ලා ගිහිල්ලා වෙන්න ඇති එයාට දේශපාලන පිස්සුවකුත් ඉහට ගැහුණෙ.

එයාගෙ මාමා පළාත් සභා මන්ත්‍රී පදවියක බැබලෙන කෙනෙක්. මොකක් හරි බලවේගයක් නිසා එයා ඒ පදවිය ලැබුණා කියලා ඒ දවස්වල ගිම්හාන්ගෙ අම්මාත් කිය කියා හිටියෙ. ගිම්හාන්ගෙ තාත්තට නම් දේශපාලන උණ තිබුණේ නැහැ. ගිම්හාන් දේශපාලනේට එන්න හදන එකත් එයා සැලකුවෙ ඉසරදයක් වගේ.

"පිස්සුවකට මන්දා පාට පොකුරක් බෙදාගෙන ඊට පස්සෙ ගහ මරාගෙන උස් තැන්වලට යනවා. අහජරාව තමයි දේශපාලන ජීවිතේ. එකෙක්වත් ගමට රටට සේවයක් කරනවද ? ඔයාගෙ ඔය මලයා වුනත් බලන්න මොනවද කරන්නෙ කියලා." මාමා එසේ කියයි.

"එහෙම කියන්න එපා අපේ මලයා ඔහේ පඹයෙක් වගේ ඉන්න එක ඇත්ත. ඒත් හැම කෙනාම එහෙම නැහැනෙ. ඔය ඔහු තරම් පිරිසිදු අත් තියෙන මැති ඇමති වරු ඉන්නෙ. එහෙම කතා කරන්න එපා."

"කාගෙත් අත් පිරිසුදුයි ඉතිං සබන් හරි හැන්ඩ් වොෂ් දාලා හරි සෝදාගත්තාම......... හෑ හා........."

ගිම්හාන්ගේ තාත්තා දේශපාලනේ දකින්නේ ඒ විදියට. මට නම් ඔය කොයි එකත් එකයි. ගිම්හාන් දේශාපලනයෙන් ඉදිරියට ගිහිල්ලා යම් තනතුරක ඉන්නවානම් ඉතිං මටත් හොඳයි. මම එයාගෙ නිල භාර්යාව නිසා. ජෝඩු දාලා යන එනවා. දවල්ට ජෝඩු දාලා ගිහිල්ලා රෑට ඔහේ කාමර දෙකට වෙලා නිදාග න්නා එකනෙ. රඟපාන්නත් දන්නා නිසා මට ඕක ඔය තරම් දෙයක් නෙමෙයි.

කොහොමත් ගිම්හාන්ගෙ කාමරේට වෙලා බූකවාගෙන ඉන්නවාට වඩා දුවගෙ කාමරේ ඉන්න එක මට සතුටක්. ඒ ළමයා හරි ප්‍රිය එක හොඳයි. නැත්නම් මගේ ජීවිතේට මොකක් වෙයිද හිතන්න බැහැ. ඒත් මට දැන් දුව ගැන බයකුත් හිතෙනවා. දුවට දැන් වයස දාහතක් විතර වෙනවා. එයා ලොකු ළමයෙක්. ලොකු දුවකගෙ වගකීම වගේම භාරදූර කම රැඳිල තියෙන්නෙ තාත්තලා අතේ. ඒත් මගේ අහිංසක කෙල්ලගෙ වගකීම දරන්න කවුද ඉන්නෙ. එයාට ඉන්නෙ එයාගෙ අම්මා විතරයි. ආච්චිලා



කියලාත් ඉන්නවා තමයි. ඒත් හරියට බර කරට ගන්න කෙනෙක් නැහැ.

එහෙම හිතනකොට මට විශාල බයක් දැනෙනවා දූ ගැන. දූගෙ හැබෑ තාත්තා සශික් දිවාකර කියලා මම කොහොමද කටක් ඇරලා කියන්නෙ. ඒ ළමයා මට සාප කරාවි.

මේ ගිම්හාන්ගෙ මිර උගුලෙ මම අහුවුණේ නැත්නම් දැනටත් මම සතුටින් මගේ නාට්‍ය ජීවිතයවත් කරගෙන ඉන්නවානේ.

"මොකද උඹ තිම බල බලා."

ගිම්හාන් කෑම මේසෙදී මගෙන් ඇහුවෙ අමුතු විදියට.

"හරියට ආයෙ ඊට පස්සෙ ළමයෙක් එහෙම හදාගන්නෙ නැද්ද ?" කියලා අහන්න වගේ. මට ටිකක් විතර ලජ්ජාවක් ඇති වුණා.

"මම මේ කල්පනා කළේ දූගෙ විභාගෙත් ළඟයි. අමතර පංති යවන්න ගියාම හරි කරදරයි නිසා ගෙදරට ගෙනැල්ලා උගන්වන්න........"

දෙවියනේ එහෙම කියනකොට ගිම්හාන්ගෙ මූණ අඳුරු වුණා. එයා දූවට ආදරේ නැහැ. ආදරේ වෙන්නෙ පිට අය ළඟදි විතරයි. එයා හැසිරෙන්නෙ කුලී තාත්තා කෙනෙක් වගේ. ඒකෙ වරදක් කියන්නත් බැනෙ. හොඳ වෙලාවට කෑම මේසෙට අම්මා ආවා.

"දූට උගන්නන්න හොඳ ටීචර් කෙනෙක් හොයලා ගෙදරට ගෙන්නන එක හොඳයි මාත් මේ කියන්න හිටියෙ.හොඳට ඇහැට කනට පේන දරුවියක් ඔය පාර තොටේ ටියුෂන් වලට යවන්න බෑ දැන් කාලෙ."

අම්මාගේ තීරණය අවසාන තීරණය බව මාත් දන්නවා.

"අම්මා කැමැති දෙයක් කරන්න."

ගිම්හාන් කරබාගෙන කෑම කන්න පටන් ගත්තා "හොඳ පුතා" වාගෙ. කොහොමත් එයාටත් හොඳට රඟපෑම පුළුවන්. තව ඉදිරියෙදිත් ඒ රංගනය පුගුණ කරගන්නත් වෙනවනෙ දේශපාලනේට ගියාම.

කොහොම හරි කෑම මේසෙ ජවනිකාව ඒ විදියට හොඳ අතට හැරිලා ගලා ගියා. හැමදාම දවසේ කොතැනක හරි තැනක්

තියෙනවා ඒ වගේ සාමකාමී සහජීවන තත්වයක් පෙන්නුම් කරන. ඒ නිසාවෙන් මේ යුග ජීවිතේ සමබර වෙවී යනවා. මිසක් ඇත්තටම මම දන්නවා අපි දෙන්නට දෙන්නා - ගිම්හාන්ට මනෝරමා නයාට අඳුකොල වගේ.

මට උවමනා කරලා තිබුණා කොහොම හරි සශික්ව අර යක්ෂනියගෙන් ගලවගෙන අපි එකට ජීවිතයක් අරඹන්න. ඒත් දැන් ඒක අසීරුයි වගේ. දැන් ගිම්හාන් වටා දේශපාලන බලයක සෙවනැලි කැරකෙන වෙලාව. දැන් ගමේ රටේ අවධානය එයා දිහා යොමු වෙන වෙලාව. අනිවාර්යයෙන්ම ඒ ගොදුරු සොයන ඇස්වලට මාත් දුවත් ඉලක්ක වෙනවාමයි. ඒ නිසා මගේ 'සමාජයේ හැසිරීම' පරිස්සමින් කරගෙන යා යුතුයි කියලා හිතෙනවා.

ඒත් මට මොනම විදියකින්වත් සශික්ව හමුනොවී ඉන්න බැහැ කියලා හිතෙනවා. ආයෙත් මම පසුබානවා. ඒ සමහරවිට අපි දැන් තරුණ වයස පසු කරගෙන යන නිසා වෙන්න ඇති. වයස හතළිහට වගේ එනකොට මොකක් හරි මානසික විපර්යාසයක් වෙනවද මන්දා. කොහොම වුණත් සශික්ව මට අයිති කරගන්න බැරි වෙයි. ඒත් මට පැත්තකින් ඉඳගෙන හරි ඔයාට ආදරේ කරන්න බැරිකමක් නැහැ.

මනෝරමා නාගසේන - දිනපොත

දිනය: 2000 ජූන 22

අද තිබුණු විවාහ උත්සවේ පුදුමාකාර වියදම් උත්සවයක්. මට පේන හැටියට අනවශ්‍ය වියදම් ගොඩක්. හරියට ලස්සනම විවාහ උත්සවය තෝරන තරගෙකට ඉදිරිපත් කරපු එකක් වගේ. පෝරුව උඩ පෝරුව වගේට මල් ගොමු ගොමු. මේස උඩ හැම දිසි තියන්නත් බැරි තරමට මල් පඳුරු පඳුරු. විචිත්‍රවර්ණ වැඩියි මං හිතන්නෙ. මම සශික් එක්ක ළං ළංවෙලා ගමන් කරන කොට හිතුණා මම මේ නාට්‍යයක වගේ රඟපානවද කියලා. අනිත් අයට පේන්න සශික් බොරුවට මා දිහාට නැමිලා කතා කරනකොටමයි එයාගෙ සුවඳ දැනුනා. මම විවාහ වෙච්ච මුල් කාලෙදී එයාට මොන තරම් ආදරේ කළාද ? මට දැනුණේ මුළු



ලෝකෙන්ම ලසස්න වගේම ගුණයහපත් ස්වාමියා ලබන්න මම වාසනාවන්ත වුණා කියලා. නමුත් ඒවා හීන...!

හරියට පුංචි කාලෙදී උඩ යවපු සබන් බෝල වගේ. සබන් බෝල වලට නියමිත පාටක් නෑ. එක එක තැන්වලදී ඒවා එක එක පාට ගැනෙනවා. ඒ වගේම නිමේෂයකින් බිඳිලා යනවා.

"ආ......... මරු ජෝඩුව......... මට නම් තේරෙන්නෙ මේ දෙන්නා කියලා මෙතන මනමාල ජෝඩුව........!"

සශික්ගෙ ව්‍යාපාරික මිත්‍රයෙක් ඇවිත් අපට අතට අත දීලා විෂ් කරා. සශික් සතුටින් හිනාවෙලා මගේ උරහිසටත් අතක් තිබ්බා. දෙයියනේ කොච්චර කාලෙකට පස්සෙද මගේ උරහිසටවත් සශික් අතක් තිබ්බෙ.

ඇවිල්ලා ඉන්න ජෝඩුත් හරිම සතුටින් හිනාවෙනවා. කතා කරනවා. කැගහනවා. එයාලත් ගෙදරදී කොහොම ඉන්නවාද කියලා කවුද ඉතිං දන්නෙ. හැම ජෝඩුවකගෙම පස්සෙන් ගිහිල්ලා එයාලගෙ නිදන කාමරේට ඇතුල් වෙන්න ඕනෑ ඇත්ත ඇති හැටියෙන්ම දැනගන්න.

"මොකද සශික්.....! වයිෆ්ට වයසට යන්න දෙන්නෙම නැද්ද ආ......... තාම නිකං දහඅටේ විස්සෙ කෙල්ල වගේනෙ හෑ හා........."

සශික්ගෙ ධන කුවේර මිත්‍රයෙක් ආයෙත් මට විහිළු කළා.

"මෙ යනවා යන්න උඹලට මගේ වයිෆ් විතරද පේන්නෙ........ ඕය තව ඉන්නෙ......... පලයල්ලකො අර සාගරයගෙ වයිෆුත් ඉන්නෙ."

සශික් හිනාවෙවී පෙන්නුවේ එයාගෙ යාලුවෙකුගෙ තරබාරු තෝනා කෙනෙක්. ඒ මනුස්සයා පුටුවෙන් නැගිටගන්න බැරි තරම් මහතයි. පිරිමියා ඉඳි කටුවක් වගේ. හොඳට මී විතත් පදම් වෙලා බඹරා වගේ කැරකෙනවා.

හැමෝම රසවත් වෙනවා ඒ රංගනවලින්.

එක පාරටම කවුදෝ කෙනෙක් ඇවිත් සශික්ගෙ තණට කෙදිරුවා මං බලාගෙන. ශාලාවේ ඈතම කෙළවරක ලස්සනට ඇඳගත්තු ජෝඩුවක්......... පැහැදිලිව පෙනෙන්නෙ නෑ ඈත හිටිය නිසා. ඒ නිසා සශික්ගෙ උකුසු ඇස් ඒ දිහාට යොමු වෙලා තිබුණා. ඒ නිසා

මමත් බැලුවා. ටික වේලාවකින් පිරිමි අය මධුවිතට එකතු වෙලා පොකුරු ගැහෙද්දි එක් එක් ගෑනු අයත් කල්ලි ගැහිලා කතා බස් පටන් ගත්තා, මට මං අඳුනන කිසි කෙනෙක් එතැන නෑ. ඔහේ බලාගෙන හිටියා. එකපාරටම ලස්සනට ඇඳගත්තු කෙනෙක් මගේ මේසෙට ආවා. ඒ ඇස් බැල්ම මට පුරුදුයි වගේ.

"හෙලෝ........"

"හෙලෝ........"

"මේ සගීක්ගෙ වයිෆ් නේද? මම මිසිස් අලහප්පෙරුම. මගේ හස්බන්ඩ් ගිම්හාන් ඔයාගෙ හස්බන්ඩ්ගෙ යාලුවෙක්. .......!"

හරිම ලස්සන ගෑනියක්. වයස මගේ වයසටම වගේ. කොල් උල්කර කර කරන කතා ලතාව. පපුවෙ බාගයක්ම එළියෙ. සාරියත් ඉඟටියෙන් පල්ලෙහා උකුල හරියෙන් තමා ඇඳලා තිබුණේ. මට ලජ්ජත් හිතුණා. මෙහෙම හැට්ටයක් ඇඳගෙන කොහොමද පිරිමි එක්ක කතා කරන්නෙ. ඒත් එයාට ගානක් නෑ. හිනාවෙද්දි කතා කරද්දි ඇඟපත ඔක්කොම හෙලවෙනවා. එයාගේ නම 'මනෝ' කිව්වා. මම හෙමිහිට සගීක් කොහෙද බැලුවා. එයා මෝස්තරකාර ගෑනු පිරිමි කල්ලියක් එක්ක කදේ වැටිලා ඉන්නවා පෙනුනා. මට නම් තේරුණේ 'මනෝ' විකාරයක් වගේ. ඉහළ සමාජ තලවල විලාසිතා කියන්නේ නිර්වස්තරේටද? වැඩිපුර තැන ඒකට වගේ.

දවසක් වාපා මාත් එක්ක කියලා හිනාවුණා මතකයි. කොහොම වුණත් මඟුල් උත්සවේ ජයට කෙරුණා. මගේ හිතත් අවදි වෙලා වගේ තිබුණේ ඒ පැය කිපය ඇතුලත. ඒත් ගෙදරට ගිහින් වාහනෙන් බැස්සා විතරයි මගේ හිතෙන් හුළං බැස්සා වගේ මට දැනුනෙ........ ජීවිතේ හැම තිස්සෙම පිබිදිලා තියෙනවානම්, මොනතරම් ආස්වාදයක්ද. ජීවත් වෙනවා කියන එක. මට එහෙම හිතුනෙ සමහර විට සමගියෙන් ජීවත් වෙන අම්මලා තාත්තලා දූලා පුතාලා දකලා වෙන්න ඇති. දරුවො දෙන්නා දැන් ටිකක් තාත්තා එක්ක එකතුයි. ඒක එක අතකට සැනසීමක්.

වෙනදා වගේ නැතිව එයාලගෙ ඉස්කෝලෙ සමිති සමාගම් වලටත් ඉඳලා හිටලා හරි සගීක් සම්බන්ධ වෙන්න පුරුදු වුණා.



ඒකත් හිතට ටිකකට හරි සැනසිල්ලක්. ඒත් අද දවස හරිම වෙහෙසකරයි. මට අර 'මනෝ' කියන ගෑනිගෙ ඇස් දෙක මහ ය මැද්දෙදිත් මැවිලා පෙනුන වගේ. පස්සෙන්දා උදේ වෙනකොට මට ඒක ඉවසන්නම බැරිව ගියා.

"මට ඊයෙ හම්බ වුණා ඔයාගෙ හොඳ යාලුවෙක්ගෙ වයිෆ් කෙනෙක්." මම සගීක්ට කිව්වෙ උදේ තේ එක බොන වෙලාවෙ.

එයා දැම්මෙ බහුශ්‍රැත බැල්මක්. ඒක ටිකක් ගාම්භීරයි. ඒත් මේ දැන් ඔය ගාම්භීරකම් වලට දැවටෙන රැවටෙන කෙනෙක් නෙමෙයි.

"කවුද ........?"

"ගිම්හාන්........ ගිම්හාන් අලහප්පෙරුම........ මිනිහා මාර බිස්නස් කාරයෙක් නේද ........?"

බලා ඉඳිද්දීම සගීක්ගෙ මූණ අමුතු වුණා. පුදුම විදියෙ මාංශ පේශී චලනයක්. මට ඒක හරි විනෝදයි. මොකද මට තේරිලයි තිබ්බෙ අර ගෑනිගෙ මොකක් හරි හොරයක් ඇති කියලා.

"කවුද........ ඒ මිනිහා........ මං අඳුනන්නේ නෑ........"

"නෑ........! වෙන්න බෑ, එයාගෙ වයිෆ් තමයි කිව්වෙ එයාගෙ හස්බන්ඩ් ඔයාගෙ හොඳ යාලුවෙක් කියලා. එයා එයාව මට ඉන්ට්‍රොඩියුස් කරලා දුන්නෙ එහෙම. ඒ වයිෆ්ගෙ නම මනෝ........!"

ගැස්සුනෙ නැතෑ සගීක් හයියෙන්ම ඒ නම ඇහුවාම පුදුමයි ඔච්චර ගැස්සෙන්න හේතුවක් නෑනෙ. නෑ නෑ මනෝ මාත් එක්ක කතා කර කර ඉන්න වෙලාවෙ සගීක් හිටියෙ වෙනම කල්ලියක් එක්ක හොඳටම විනෝද වෙවී. කෑ ගගහා ඒකයි එයා මේ සීන් එක දැකලා නැත්තේ.

"මට අද වැඩ ගොඩක් තියෙනවා කතා කර කර ඉන්න වෙලාවක් නෑ.'

සගීක් නැගිටලා ගියා මිසක් මගෙන් ඇහුවෙ නෑ මම අද ඉස්කෝලෙ යන්නෙ නැද්ද කියලවත්.

ඇත්තටම පුදුම පිරිමියෙක්. මේ වගේ ස්වාමිපුරුෂයො පොල්පිති වලින් කපාගන්න පුළුවන්. හොඳයි අනෙක් මට මනෝව හම්බවෙයිනෙ කොහේදි හරි. ඒකත් එකටම ඒ දවස්වල

මට පුතාගෙ ශිෂ්‍යත්ව පංතියේදී හම්බ වුණෙත් ඔය ගැනිම තමයි.

ඒ ගැනිට තියෙන්නෙ නාග කන්‍යාවකගෙ වගේ ඇස් දෙකක්. ඒ ඇස් දෙකෙන් පිරිමින්ගෙ හදවතට දෂ්ට කරල සිහි මූර්ජා කරවනවා ඇති. හ්ම්......... බලමු.

*සහද්‍රා මුතුමාල - දිනපොත*
*දිනය: 2000 මාර්තු 28*

ජීවිතේ මට දැන් අලුතෙන් විඳින්න ඕනෑ වෙලා කියලා මගේ යටි සිත කොඳුරනවා. එදා වෙඩිං පාටි එකේදී බිස්නස් කාරයෝ අස්සෙ අර යකා ගිම්හාන් කොහෙන් මතුවුණාද මන්දා ගැනිත් එක්ක. අනික මනෝට පිස්සුද ගිහිල්ලා මගේ ගැනි එක්ක කළේ දාගෙන ඉන්න. හොඳ වැඩක් කරන්නම් මනෝට එයා හරකවා වැඩියි.

ආදරේ හුගක් නැවුමට යොවුන්ව තමයි දුනෙන්න ඕන. තරබාරු වෙච්ච ඇඟපතින්, කොන්ඵලි වැටෙන ඇස් වලින් බලමින් දෙතොල් පහළට එල්ලෙමින් හිනාවෙමින් ආදරේ ගැන මොන කතාද ? ආදරයේ පියාපත් හැමදාම තරුණයි.

ආදරයේ ඇස් හැමදාම නිල්පාට. යටට ගිලිල බොර වෙච්ච ඇස්වලින් ආදරේ හොයන්න තරම් මස්තබාල්දු මිනිහෙක්ද මං. වෙඩිං එකේ ඩාන්ස් කරන්න ආපු කණ්ඩායම අතරේ හිටපු ක්ලබ් ගර්ල් සමනලියක් වගේ මගේ හිත සැහැල්ලුවෙන් පිරෙව්වා. එයා ඩාන්ස් කරන ක්ලබ් එකට මම යන්න ඕන මගේ හිත කිව්වා. ඒත් මගේ ව්‍යාපාරික වැඩ, දෛනික වැඩ කටයුතු ......... ඒ ඔක්කොම අතරේ මම හිරවෙලා. මේ ජීවිතේ ඇතුලේ මට කිසිම නිවනක් නෑ. මට ඉගිල්ලිලා පාවෙලා යන්න ඇත්නම් මීට වඩා යහපත් සැහැල්ලු ලෝකෙකට මොන තරම් නම් සැපක්ද ?

මනෝ සමග කතා කරාම මම ආන්සර් නොකළේ හිතේ කේන්තියට. ඇයි එයා මගෙ කවුද එයාගෙ ඔඩර්ස් වලට බයවෙන්න. ඒ වුණාට හිතුවා වගේම ගැනි ආවා මාව හොයාගෙන. ගැනිගෙ දැන් තියෙන ලස්සනක් නෑ. මූන පුරා



උලප්පු පාට වල ලස්සන විතරයි.මට දැන් එයාගෙ කිසි ලස්සනක් පේන්න නෑ. 'මැයටද මා අන්ධ වුණේ' කියලා පද පෙළියක් කරන්න මට ඕන වුණා.

"ඇයි මම කෝල් කරාම උත්තර දුන්නෙ නැත්තෙ .....?"

කෙලින්ම ඇහුවෙ ඒ ප්‍රශ්නෙ. මට දෙන්න උත්තර නෑ. ඒත් මම හිනයි ධෛර්යය ගත්තා.

"මම වැඩ ගොඩක හිටියෙ මනෝ. ඔයා මෙහෙම මෙහාට ඇවිත් කැගහලා මාව නැති කරලා දානවා හෙම නෙවෙයි."

"මොනවද ඔයාගෙ නැති කරන්නෙ! මමයි ඔය කතාව කියන්න ඕනෑ......... ලොකු සර්......... මම නම් දැන් නැත්තටම නැතිවෙලා."

මේ බහින්බස් වීම සිද්ධ වෙන්නේ පොත් සාප්පුවේ ආලින්ද කොටසේ නිසා මට කලබල වෙන්න දෙයක් නැත.

"ඔයා මොන එහෙකටද ගිහිල්ලා මගේ නෝනව හමුවුණේ? අශේලගෙ මඟුල් ගෙදරදී. හරි හපන් කමක්නෙ කරලා තියෙන්නේ........."

"අපෝ නෝනට හරි ගවුරවේ නේද ? අනේ ඔයාගෙ නෝනා........."

"මගෙ වයිෆ්ට එහෙම තව එක වචනයක් කියන්න එන්නෙ නෑ. මගේ නෝනා ගෞරව කරන්න ඕන ගැනියක් තමයි. ඔහෙලා වගේ එක එක අතින් අතට පාවෙන සරුංගල නෙමෙයි........."

"සගික්.........!"

මනෝ එකවරම පැනලා මගේ කම්මුලට පාරක් ගසද්දී මට කරකියාගන්න දෙයක් නැතිවුණා. මට හොඳටම කේන්ති ගියා.

"බැහැපිය බැල්ලි දොට්ට.........!"

එහෙම කියලා ඒ කම්මුල් පාර ගැහැව්වෙ මොකද කියලා මම දන්නෙ නෑ. ඒ හඬය ඉවර වෙනකොටම තමයි කවුද කට්ටියක් සාප්පුවට ආවෙ. මනෝරමා හෙමිහිට පසුබැහැලා ගිහිල්ලා ත්‍රීරෝද රථයක් නවත්ත ගන්නවා මම දැක්කා. ආයෙ මට එයා ඕනෑ නෑ......... ඕනෙම නෑ ! මගේ යටි සිත මොර දුන්නා.

නයාට ගහලා පොල්ල වරද්ද ගත්තා වෙන්න පුළුවන් ඒත්

මට බෑ නයි හූරහල් කර කර ඉන්න නම්......... වරදින්න හරි හරියන්න හරි පොලු පාරක් දෙන්න ඕනැ. ඊට පස්සෙ තමයි ඊළඟට වෙන දේවල් ගැන කල්පනා කරන්නේ.

සගික් උදාකර - දිනපොත

දිනය 2002 ඔක් 04

මම ගෙදර ඇවිත් හුඟාක් දුරට පසුතැවුණා. මට හිතා ගන්න බැරි වුණා මම සගික්ට කම්මුල් පාරක් ගැහුවේ ඇයි කියලා. ඇයි එයා එයාගෙ මහ ලොකු ගෑනිගෙ වරුණාව කිය කියා මාව පාච්චල් කළේ......... ජීවිතයේ කී කාලයක් තිස්සේ එයා මාව සෙල්ලම් බඩුවක් කරගෙන හිටියද ?

ඉස්කෝලෙන් අස්වෙන්න ඔන්න මෙන්න කාලෙදි නිමනා එක්ක තියෙන සම්බන්ධෙ අඩු ලුහුඬු කම් මගෙන් පිරිමසා ගත්තා. ඊට පස්සෙ කාලයක් නිමනා කසාද බැන්දට පස්සෙ මට වහ වැටි ගෙන මා මත්තෙම ජීවිතේ ගත කළා......... එහෙම කාලයක් ගිහිල්ලා වනවර ක්ලබ් ගෑනියෙකුට අහුවෙලා හිටියා. ඊට පස්සෙ ඒක අතෑරලා හොඳ මුදලයක් එක්ක ගෑනියෙක් කසාද බැන්ද. කසාදෙට අවුරුදු පහකට විතර පස්සේ ආයෙත් මාව සෙල්ලමක් කර ගත්තා. ඒ විදියට දෙයියනේ අවුරුදු විස්සකට වැඩි කාලයක් මම මිනිහගෙ අනියම් භාර්යාව විදියට හිටියා. මට ඒවට ලැබුණු දේ මොනවාද ? වෙන ගෑනු නම් අනියම් සැමියාව හූරන් කනවා. මට ලැබුණේ මේ සදලි දුව විතරයි. ඒ දරුවටත් කිසිම ආදරයක් නැති ගහක් ගලක් වගේ මිනිහා දැන් සමහර විට සූදනා වෙන්න හිතලා ඇති. දැන් එයාගෙ දරුවොත් ලොකු නිසා අර අග බිසව සතුටු කරන්න. හොඳයි මං බලන්නම්කො. මම ඇහැ ගහගෙන තමයි ඉන්නෙ ඔයා දිනාට තේරුණාද සගික්......... !

මම එළුව එළවා පළි ගන්න නාගයෙක් වගේ කෙනෙක්...!

මනෝරමා නාගසේන -දිනපොත

දිනය 2000 අප්‍රේල් 02

ජීවිතේ හැම කෙනෙකුටම එක එක පරිච්ඡේද තියෙනවා.



අපි කරන්නේ ඒ එක එක පරිච්ඡේද ගත කරන එකයි. ලියැවිලා තියෙන විදියට මම කියවපු පොතක කවුදෝ එහෙම ලියලා තිබුණා මතකයි. කවුරු වුණත් ඒ ලියලා තිබුණේ සම්පූර්ණ ඇත්ත කියලා මට හිතෙනවා. මගේ ජීවිතේ තවත් කාල සීමාවක් ඉවර වුණා. බලාගෙන ගියාම මගේ ජීවිතේ විශාලම වැප්ප් එක ඇතිවුණේ මනෝරමාට.

ප්‍රථම භාගය සහ ද්විතීය භාගය විදියට ආයෙ ඒකෙ තෘතීය භාගය නම් එන එකක් නෑ. ස්ථිරයි. මිනිහෙකුට දෙයක් එපා වෙන දවසක් එනවා එහෙම ආ යුතුයි.

දැන් අපි තරුණ විය ඉක්මවලා දරුවො තරුණයි. ඒත් මට තීතාගන්න බැරි හිත වයසට යන්නෙ නැත්තෙ ඇයි කියලා.

අද ක්ලබ් එකේදි මට හමුවුණේ කවුද ?

අසේලගෙ දුගෙ වෙඩින් එකේදි මට මුණගැහුණු ගර්ල්. ඈ දුටු ගමන්ම මට මොකක් හෝ ඈත වෘතාන්තයක් මතක් වුණා වගේ. ඇත්තටම මට ඕන වුණේ ඒ ළමයා එක්ක ටිකක් කතා කරන්නයි. මට මගේ යාලුවොත් විහිළු කළා මොකක්ද මේ වෙන්න යන්නේ කියලා. එයාලට ගානක් නෑ. උණුත් බොහොම සල්ලිකාර සෙල්ලක්කාරයෝ. සිල් අරගෙන ඉන්න එවුන් අතේ ඇඟිලි වලින් ගනින්න පුළුවන්. හොඳට කන බොන විනෝද වෙන ඒ සමාජේ මම විතරක් ආයෙ මොනව පෙරුම් පුරන්නද?

මේ දවස්වල මම වෙනදාට වැඩියෙන් සහදාට කරුණාවන්ත වෙනවා කියලා මට හිතෙනවා. මනෝරමා විවිධාකාරයෙන් ඇවිත් අපේ කුටුම්භය දෙදරවන්න උත්සාහයක් ගනීවි කියලා මට නිකමට හිතිලා තියෙනවා. එහෙම මට හිතෙන්නෙත් එයා වරින් වර කීප වතාවක්ම ගෙදරට කෝල් අරගෙන තිබුණු නිසා.

සහදා කොහොම වෙතත් මගේ පුතාටයි දුවටයි මේවා දැනගන්න තියන්න මට අවශ්‍ය නෑ. උසස් පෙළ සමත් වෙලා දැන් බැංකුවක වැඩ කරන පුතා ඒ අංශෙන් ඉහළට ඉගෙන ගන්න කෙනෙක්. මම එයාලට අවශ්‍ය මුදල් හැම පහසුකමක්ම සපයන හොඳ තාත්තා කෙනෙක්. පුංචි කාලෙට වඩා දැන් දෙන්නා මට ටිකක් සමීප ගතියක් දක්වීම මට ඇත්තටම ගෙදර ජීවිතය සතුටක් කරන දෙයක් වෙලා.

ඇඳුම් පැළඳුම් වලට, කෑම බීම වලට වෙනත් විනෝද ගමන් බිමන් වලට තමුන්ගේ බිරිඳටයි දරුවන්ටයි ලෝබ නැතිව වියදම් කරන සැමියෙක්. තාත්තා කෙනෙක් විදියට මට හොඳ ප්‍රශංසාවක් ලැබෙද්දි ආයෙ මොකට පසුතැවෙනවද මං.

අද බුක්ෂොප් එකේදි මට හම්බ වුණු පරණ යාලුවෙක් සමරෙ. සමරෙ කිව්ව දේකින් මගේ හිත සසල වුණා.

''මචං උඹ අර ඉස්සර යාලුවෙලා හිටපු නිසලා අර සුද්දගෙ කේස් එකෙන් අනියම් වැරදිකාරියක් වෙලා උඹ දන්නවාද ඒකි අවුරුදු බර ගානකට හිරේ ගිහිල්ලා.

මට ඒක ඇහුවාම පුදුම හිතුණා. පිළියන්දල පැත්තෙ අර මහා විශාල බංගලාව, ඒකෙ ගොළු මුරකාරය, අම්මයි තාත්තයි විදියට හඳුන්නලා දීපු වයසක ජෝඩුව, මට ඒ ඔක්කොම චිත්‍රපටියකින් වගේ මැවෙන්න ගත්තා.

නිසලා එහෙනම් සුද්දා මරපු මිනීමරු ගෑනියෙක්! මගේ ඇඟ සීතල වෙලා ගියා. පුදුමාකාර තැතිගැන්මක් ජීවිතේ ගැන මොන තරම් රැවටිල්ලක්ද නිසලා මට කළේ. මම බොහොම කැමැත්තෙන්ම නිසලාට අහුවුණා නේද කියලා හිතෙනකොට තමා තේරෙන්නෙ මම මොන තරම් මෝඩද කියලා. හොඳ වෙලාවට ඒ පාශයෙන් මිදිලා මට සහදා වගේ කෙනෙක් එක්ක විවාහ වෙන්න ලැබුණේ.

හවස මනෝජ්ව හමුවෙලා එයාගෙ වදේට නාට්‍යයක් බලන්න ගියා. මනෝජ්ට තවත් නාට්‍යයක් කරන්න හිතිලා වගෙයි.මං හිතන්නෙ මිනිහා දක්ෂයා වුණාට අතේ සල්ලි නෑ ඒකයි ප්‍රශ්නෙ.

''ගිය සැරේ උඹ මට කරවලා දීපු නාට්‍ය සම්මානෙට නොමිනේට් වුණා. මට ඒක ලොකු හයියක් වුණා.''

මනෝජ් එහෙම කියනකොට මට තේරුණා එයාගෙ ඊළඟ නාට්‍යයට ඒක ඉලක්කයක් කියලා.

''මේ අවුරුද්දෙත් එකක් කරපං ඉතිං මං ස්පොන්සර් කරන්නම්.''

දුප්පත් නාට්‍යකාරයාගෙ මූණේ මල් හතක් පිපුනා. මට හරි සන්තෝසයි. ඉතිං අපි පොදි ගහන සල්ලි මොකටද? මේ වගේ



දේවල් වලට වියදම් කරන සල්ලි කවදාවත් අපතේ යන්නෙ නෑ මට හිතුණා.

''මට හොඳ ස්ක්‍රිප්ට් එකක් තියෙනවා බං මං ඉක්මනට වැඩේ පටන් ගන්නම්........''

මනෝජ් මගෙන් සමුගත්තේ පස්වනක් ප්‍රීතියෙන්. පව් ඌට කන්න අඳින්න ඕනත් නෑ. පවුල් පන්සල් වෙන්න ඕනත් නෑ. නාට්‍ය කලාවම තමා එකම හාප්පිය.

නාට්‍ය ගැන මතක් වෙනකොට මම මනෝරමාව මතක් වෙනවා. ආයෙත් මතක් කරන්නත් හොඳ නෑ. නාග කතාව. මට එයා තීන්ත වෙලා තියෙන්නෙ. ඒත් එයාගෙන් ඉගෙන ගන්න දේවල් ගොඩාක් තියෙනව. ඒ දේවල් තුළ ජීවිතේ මොකක් හරි දර්ශනයක් තියෙනවාය කියා හිතෙනවා.

අද හවස ක්ලබ් එකට ගියාම මට අර කෙල්ලව මුණ ගැහෙයි. මා එක්ක කතාබහ කරන්න ඇගේ විශේෂ කැමැත්තක් තියෙන බව පේනවා. මයිකල් මට විහිළු කළේ ඒපාර උඹ මොකාවද එන්න හදන්නෙ කියලා.

*සශික් උදාකර - දිනපොත*
*දිනය: 2007 නොවැ. 04*

මහා අසනි වරුසාවක් වැස්සා,
මහා චණ්ඩ මාරුතයක් හැමුවා
මහා හඬින් මහ පොළව කම්පිත වුණා.

ඒ සශික්ගෙයි මගෙයි සම්බන්ධෙ ඉවර වුණ දවසයි. අපි දෙන්නාගෙන් දෙන්නට ලැබිච්ච තෑගි, කම්මුල් පාරවල් දෙකක් විතරයි! මොනතරම් ලස්සන ආදරයක්. මොනතරම් අශෝභන විදියට කෙළවර වුණාද ? මට ඒ ගැන හරිම වේදනාවයි. නමුත් ඒ වේදනාව සශික්ට නම් කවදාවත් දැනෙන එකක් නෑ. පිරිමි අයට වේදනාව කියන දේ දැනෙන්නෙ නැති හැකියෙත් එනවයි.

පිරිමි මහ කපටි ජාතිය. විඳවන්නෙත නැතිවම විඳවන බව පෙන්නන්න' පුළුවන් ජාතියක්. ඒ ඔක්කොම

ගැහියෙක්ගෙ හිත සතු කරගන්නකම විතරයි. හිතට යම්තම ඇතුල් වෙලා ඒ ඉඩ ප්‍රමාණයෙන් මුළු ශරීරෙටම ඇතුල් වෙන හැටි උන් දන්නවා.

මගේ යාලුවො කීප දෙනෙකුටම මේ දේවල් වුණාට මම හිතුවෙ නැහැ මටත් ඒ ටික වෙයි කියලා. ඒත් දන්නෙම නැතිව මටත් වුණේ ඒ ටික විතරයි.

මට පුදුමෙ තියෙන්නෙ මම දෙවැනි පාරටත් එයාට අහුවෙලා නිකම්ම සවුත්තු වෙච්ච එක. ඒ සමහර විට ශිම්හාන්ගෙ දුර්වලකම් නිසාම මා තුළ ඒ පෙළඹවීම ඇතිවෙන්න ඇති.

මේ වගේ පිරිමි ශරීර තියෙන පඹයො මොකටද බැඳලා ඉවරවෙලා ගෑනු අමාරුවෙ දාන්නෙ. බඳින්නෙ නැතිව හිටියා නම් ඉවරනෙ. බොරුවට ලෝක මාන්නෙට රටටම කියලා ලොකු ලොක්කො ගෙනැත් අත්සන් කරවනව සාක්ෂියට.

ඔක්කොම එකතු වෙලා බාල් දාලා, සාජ්ජ දාලා, තවලා කරලා යනවා. හනිමූන් ගත කරන්න ගියාම තමයි තරු පේන්නෙ.

මහ ලොකුවට මගේ කේන්දරෙත් බලලා ගලපලා තමයි කරලා දුන්නෙ මේ කසාදේ. කේන්දරේ අරහෙන් මෙහෙන් සක්ක දාලා ගන්න ඇති ගැලපෙන විදියට. නැත්නම් මේ බැඳපු දා ඉඳන්ම මූන බලන්න බැරි විදියෙ ලෙඩක් හැදේවියැ.

මේවා කාට කාටත් හොඳ පාඩම්. මගේ දූවට නම් ඒ වගේ වැරදීමක් වෙන්න මම ඉඩ තියන්නෙ නෑ.

ශිම්හාන්ගෙන් මට ලැබෙන්නෙ කෑම බීම, ඉඳුම් හිටුම්, සල්ලි බාගෙ අහට පයට වැඩකාරියෝ සහ මගේ අහිංසක දූවට නමට විතරක් දීපු 'තාත්තාකම' විතරයි.

ඒත් මදෑ. අනික් ගෑනුන්ට මෙහෙමවත් නැතිව ඇති. ගෑනු පව්. ඔය මූනවල් පාට කරගෙන විච්චූර්ණයෙන් ඇඳලා එළියට බැස්සට හිත් ඇතුලේ මහා ගිනි ගොඩවල් පත්තු වෙන්නෙ. ඒවා අවට ලෝකෙට පේන්නෙ නෑ. කාටවත් දකින්නත් බෑ.

ගෑනුන්ගෙ ඇඟවල් වල තියෙන අගර දඟරයි ලාලිත්‍යයයි දකින පිරිමි ඇස්වලට ගෑනු හිත් අස්සෙ කැකෑරෙන දඟලන වේදනාවල් පේන්නෙ නෑ. ඒකයි වෙන්නෙ. පිරිමි, දන්න නැම



මායමක්ම දාලා ගෑනුන්ව තමන්ගෙ වසඟයට අරගෙන තමන්ගෙ ආශාවල් පිරිමහගන්නවා. මෝඩ ගෑනු කරන්නෙ ඒ රැවටිලිවලට කොහොම හරි අහුවෙන එක තමයි. කොහොම හරි දන්න මායම් හැටහතරම දාලා පිරිමින්ගෙ මායා දැලට අහුවෙලා මිරිකිලා ඉන්න තමා ගෑනුන්ටත් ඕනෑ. ඒ රැවටිලා ඉන්න තාක් කල් කිසිම ගැහියෙක් හිතන්නෙ නෑ තමන් මේ වැටිලා ඉන්නෙ මොන තරම් උගුලකද කියලා. ඒක තමයි ගෑනු කම කියන්නේ...!

මිනිස්සු බාඳුරා මලට දොස් කියනවා බඹරු වැහුවාම පෙති ඇකිලිලා ගොදුරු කරගන්නවා කියලා. බඹරු මලේ රොන හින්දනේ එහෙම වෙන්නේ. බාඳුරා මල බලෙන්ම බඹරු අරගෙන තුරුල් කරගන්නෙ නැහැ. සොබාදහමත් නිර්මාණය වෙලා තියෙන්නෙ ගෑනුන්ටම දොස් පවරන්න පුළුවන් විදියෙ වරෙන්තුවක් නිකුත් කරගෙන. ඒවා එහෙම තමයි.

ශිම්හාන්ගෙ සමාජ ජීවිතයේ ප්‍රගතිය උදෙසා දැන් එයා දැවැන්ත ව්‍යාපාරයක් පටන් අරන්. ඡන්ද ඉල්ලීම සඳහා මූලික වාතාවරණය සකස් කරගෙනයි යන්නෙ. දැන් මටත් ටිකක් කරුණාවන්තයි. ඒ අතරේ දූගේ අමතර විෂයයන් වලට ටියුෂන් දෙන්න ගුරුවරයෙක් මට සොයා ගන්න ලැබුණේ මගේ නෑදෑයෙකුගෙ මාර්ගයෙන්.

බැලූ බැල්මටම මම එයා දැක්කෙ කවුරු වගේද? සයික් වගේ මගේ හිත ගැස්සුණේ ඒකයි. අද එයා මෙහෙට එන හතර වැනි දවස. බොහොම ප්‍රිය මනාප ගුරුවරයෙක්. හොඳට භාෂා ඥානය තියෙනවලු. දූ කරන භාෂා විෂයයන් එයා උගන්නනකොට අහන් ඉන්නත් ආසයි. මටත් ඉතිං ගෙදර වෙන වැඩක් නැහෙ.

මමත් අසලක ඉඳගෙන ඒ පාඩම්වලට ඇහුම්කන් දෙනවා. දැන් මගේ ලෝකෙ රැව් පිළිරැව් දෙන හඬක් වෙලා ඒක. විවිධ භාෂාවලින් ඇහෙන ඒ හඬ මම මගේ මනෝ ලෝකයට කාවද්දා ගන්නවා.

දැන් අපි දැඩිමෙති වෙච්ච හිත් තියෙන වගකීම් බර කරට ගත්තු වියපත් මිනිස්සු. භෞතික ලෝකයෙන් ඔබ්බට මානසික ලෝකෙකුත් ඒත් අපිට තියෙනවා.

මනෝරමා නාගසේන - දිනමිණ
දිනය: 2007 අප්‍රේල් 01

පුංචි සුරංගනාවිව මම දකින්නේ රාත්‍රී සමාජශාලාවේ පුංචි අඳුරු අහුමුල්ලක. ඇත්තටම ඈ මාව බලාපොරොත්තුවෙන හිටියේ. ලාපාට කහ එළියට ඈත බිත්තියකට වැටිච්ච රතු පාට ආලෝක ධාරාවෙන් මට මවා දුන්නේ නුවර යුගයේ අපූරු චිත්‍රයක්.

මම ගියේ මගේ යාලුවෙක් දූලාප් එක්ක. එයාට හිතා ගන්න බැරිවුණා ඒ කෙල්ල දකලා වයසින් නම් මගෙන් බාගයක් ඇති, මං දන්නවා දූලාප් හිතපු දේ. නමුත් මට වුවමනා වූයේ ඒ කෙල්ල එක්ක කතාබස් කරන්න වං හුං දැනගන්න. හරිම ආකර්ශනීය ගතියක් තිබුණේ. කෙල්ලගෙ නම නිරූපා. නමටම හරියන රූපෙ මට නිකමට හිතුණා. ඒත් මම මොනවත් කිව්වෙ නැහැ. මං දන්නවා හුඟාක් සල්ලි තියෙන පිරිමින්ට මේ වගේ කෙල්ලො අන්ධයි කියලා.

හිතේ හැටියට සැප විඳගෙන ජීවත් වීම විතරක් එකම අභිලාෂය කරගත් කෙනෙක් සල්ලිකාර පිරිමියෙක්ව ඇසුරු කරන්න කැමති වෙන එය අරුමයක් නොවෙයි.

"මට කියන්න ඇයි ඔයාට මට කතා කරන්න ඕන කිව්වෙ........"

නැටුමට යන්න කලින් මම ඇගෙන් ඇහුවෙ මගේ කුතුහලය නැති කරගන්න හිතාගෙන. ඇගේ ඇස් බෝනික්කියක ගේ වගේ. තොල්, මූණ කට වාන්තු කරලා. එයාට වහ වැටෙන්නෙ නැති කොල්ලෙක් නම් ඉන්නවා.ද මේ ක්ලබ් එකේ. කොහොම බේරිලා ඉන්නවද මන්දා.

"මිස්ටර් එන්න මට කතාකරන්න ආසා හිතුණා."

ඈ කිව්වෙ බියර් වීදුරුවක් පුරවමින්.

"මටත් ඒකම තමයි හිතුනේ."

මාත් ඈ කළ දේම කළා.

"චියර්ස්........"

සංගීත රාවය විහිදී ගියා හරියට හදපානේ පිනිකැට හැලෙනව වගේ. ශාලාව අඩ අඳුරුයි. බඳින් බඳ දවටෙමින් ගැහැනුත් පිරිමින් රංගනයේ යෙදෙනවා.

"ඔයා ඇයි මෙහෙම තැනක ඉන්නේ?" මගේ ප්‍රශ්නෙට ඈ හිනාවුණා.



"මිස්ටර්........ ඇයි එහෙනම් මෙහෙම තැනකට එන්නේ_"

ඇගේ ප්‍රශ්නෙ කෙලින්ම ඇහුවා.

"සතුට සොයගෙන........"

"මමත්........" ඈ කිව්වා.

දූලාප් කොහෙන්දෝ කැරකිලා ඇවිත් මා දිහාව රැව් ඇහැක් දාලා යනවා මම දැක්කා. කොච්චර යාලුවා වුණත් එයාටත් මහා සැකයක් මේක. හිත්වල හැටි තමයි. හරියට මම මේ බාල් අපරාධයක් කරන්න යනවා වගේ. එයාලා කරන වැඩ ගැන අපි ඉතින් ඇඟිලි ගහන්නෙ නැහැනේ. ගෑනු අංශයත් එක්ක මොනතරම් හුටපට තියෙන කෙනෙක්ද එයා.

"ඔයා ගෙ ගම කොහෙද ?"

"මගේ ගම නේද? හරිම අමාරු ප්‍රශ්නයක් තමයි මිස්ටර් ඇහුවෙ."

"ඒක කොහොමද ඉතිං අමාරු ප්‍රශ්නයක් වෙන්නෙ?......ඕනෑම කෙනෙකුට නම වගේම උපන් ගමකුත් තියෙනවනේ........"

ඇගේ අදහස් වල ඇති මේ අමුතු ගතිය නිසාම නොවේද මා ඇයට ආකර්ශනය වන්නේත් ඈ ගැන සොයා බැලීමේ කුතුහලයට බඳුන් වන්නේත්.

"හොඳයි ඔයා දැන් මෙතෙන්ට ආවෙ ප්‍රශ්න අහන්නද හා........?" ඈ ඊළඟට හිනාවක් පෑයි.

"මට ඩාන්සිං ෆ්ලෝ එකට යන්නත් තියෙනවා. මම යන්නද එහෙනම්." ඈ එකවරම නැඟී සිටිමින් කියද්දී මට පුදුමය.

කෙලවර මේසයක සිටි තරුණයෙක් ඈ ළඟට ඇවිත් ආචාර කර ඈ සමඟ රඟන්නට පටන් ගත්තේ ඊළඟ නිමේෂයේදීය.

ඈ විදුලියක් සේ රඟන අපූරුව! ඔහු සමඟ පැගී පැගී රඟන අපූරුව මා සිත විදුලියක් අවුලුවයි. ඒ කෝපයක්ද?, කණස්සල්ලක්ද? ඇත්තටම ඔහු ඇගේ පෙම්වතාද නැත්නම් මේ සමාජ ශාලාවේ නටන ඇය වගේම කෙනෙක්ද? කුමුරු වුණේ, ඈ නටන අපූරුව. නැටුමේ තියෙන පැහීම. ඔහුගේ ඇස් වල දිලිසුම පළිඟු සේමය.

මොහොතකින් දූලාප් ඇවිත් මගේ දණැහ මිදු දමයි. මා හිනැස්සී ඇහැරුණොත් බඳුය. මෙතෙක් ලෝකයේ තිබිම නම්දයක්

මට නැහුණා වගේය. ඇසුණේ ඈ සිනිඳු ලෙසින් පාද තමා රඟන රැඟුමේ හඬ පමණි. තාද නූපා තබ තබා.........

"මොකද දූහැන බිඳුනද......... කෙල්ල මොකද කිව්වෙ ?"

"ඔය නටන්න ගියෙ......... හරිම දක්ෂ කෙල්ලක් නේ බලපං නටන හැටි."

දුලාප් ව්‍යාජ සිනාවක් මුවට නඟාගෙන මගේ පිටට තට්ටු කරයි.

"උඹ හොඳටම දූපනෙ වැටිල වගෙයි. ඒකි දක්ෂ කෙල්ලක් තමයි හැම දේටම........."

"හා...."

"ඔව් පට්ට වයසක ඉන්න දේශපාලනඥයෙකුගෙත් කෙළි බඩුවක් ඒකි."

"න් නෑ කවුද ඒකි! කොහේද ඉන්නෙ.........?"

"මොකද උඹට ඔච්චර හදිසියක් ඒකි ගැන, ආ........"

නැවතත් ඔහු අසන්නේ ඔලොක්කුවටය. මෙවර ඔහු සමඟ තවත් තරුණ වයසේ ගැටයෙකුත් එකතු වෙලාය. ඔහුත් බිස්නස් ෆීල්ඩ් එකේ කප්පිත්තෙකුගේ පුත්‍රයෙකි.

"මට දැනගන්න ඕන වුණාම ඕනෑ කෙනෙක් ගැන මම හොයනවා. උඹ දන්නවානෙ මම යම් යම් චරිත අධ්‍යයනය කරන බව. මම පොත් ලියන කෙනෙක් බව........."

"හෝ......... හෝ......... මේ ඒකයි. ඒක මිසක්......... මං හිතුවා මේ.........ෂා මං හිතපු හැටි වැරදියි උඹ ගැන එහෙනං සොරි......... මචං........."

"නෑ නෑ......... සොරියක් ඕනෙමත් නෑ. උඹ ඒ හිතාගෙන හිටිය විදියටම හිතාගෙන හිටපං මට ඒකට කමක් නෑ."

ඊළඟට අපි තුන්දෙනාම රවුම මේසයක වාඩිවෙලාය. පුංචි සුරංගනාවි තවමත් දීර්ඝ රංගනයේය. පැමිණ සිටින බොහෝ දෙනා බලා සිටින්නේ ඈ දිහාම මිස වෙන දෙයක් දෙස නොවේ.

"ඒකි.........ගෙ අම්මත් ක්ලබ් ඩාන්සර් කෙනෙක්ලු. මචං මීට අවුරුදු විස්සකට විතර එහාදි ගෝල්ඩන් ක්ලබ් එකේ ඉඳපු හොඳ ෆේමස් කෙනෙක්. ඒකි සුද්දෙක් බැඳලා ඊට පස්සේ........"



දුලාප් ආයෙත් මීවින පුරවාගනියි. දැන් මගේ ඉහ මොල රත්වෙයි. මේ මා දකින්නේ කුමක්ද ? නෑ සුද්දො බැඳපු ක්ලබ් ගර්ල්ස්ලා ඕන තරම් ඉන්නෙනේ......... මම මොකටද කලබල වෙන්නෙ.

"පුරවාගනිං බං ඕක...... මොකද උඹට වෙලා තියෙන්නේ..?"

"ආ......... හරි......... හරි තියාපං ඉතිං ඉතිරි හරිය........"

"ඒ නාකි සුද්දයි මෙකියි අලි බංගලාවක ඉඳලා තියෙන්නේ තනිව තනියම. එක පාරටම ඒ සුද්දා හදිසියේ මැරිලා. ඒ අතරේ මේකී නටන්න පුලුවන් ඔක්කොම නාඩගං කර කර ඉඳලා රස්සාවකට ගිහිල්ලා. පස්සේ එතන බොස් කෙනෙක් අල්ලගෙන ලව් එකක් පටන් අරන්. ඊට පස්සෙ ඒකි ක්ලබ්ං ගිහින් නෑ........ ඒ අරයා එක්ක ඉඳලා ඉඳලා ලිවිං ටුගෙදර කේස් එකක්. ඒ අතරේ ඒ මිනිහා මේකිට දරුවෙකුත් දීලා පැනලා ගිහිල්ලා. වෙන ගෑනියෙක් බැඳලා. මේකිට පිස්සු හැදිලා ඉඳලා. ඒ මදිවට අර නඩුවටත් පැටලිලා දරුවත් ඔය කොහේදිද හම්බ වෙලා වෙන කවුදෝ කෙනෙක් හදන්න අරගෙන තියෙන්නෙ. ගෑනි ඊට පස්සෙ අවුරුදු බර ගානකට හිරේ තැපලා......... එහේදි මැරිලා මං හිතන්නෙ........."

"ඒ කිව්වෙ මේ කෙල්ලගෙ අම්මද ?"

"ඔව් බං......... මං මුලටම කිව්ව දේ උඹ අන්තිමටත් අහනව. ඇත්තට උඹට දූන් ඉඳන්ම වැඩිවෙලාද ආ........."

දුලාප් එසේ අසන විට අනෙක් සගයාද සිනාසෙයි. දැන් ඉතින් මට එතැන සිටිය නොහැකිය. පුංචි සුරංගනාවිය මාව ඇරලූයේ මහාම මහා පැසෙන නරකාදියකටය.

අදින් මතු කවරදාකවත් ඒ ක්ලබ් එකට නොඑන්නට ඉටාගෙන පිටවී ආවේ හිතේ ආවේගයෙනි. මම මොන කෙහෙල්මලකට ඒ කෙල්ල එක්ක කතාවට වැටෙන්නට ගියාද? ඒ අනිවාර්යයෙන්ම මට දාව නිසලාට උපන් දරුවා බව මට පසක් වී හමාරය. එයින් පසුව දින දෙක තුනක් මා ගත කළේ අසනීප ගතියෙනි.

"ඇයි ඔයා අද යන්නෙ නැද්ද?"

බිරිඳ අසද්දී මම යන්නමට සිනාසුනෙමි. ඈ මදෙස බලා සිටියේ අනුකම්පාවෙනි.

"මට ටිකක් ඇඟට හරි නෑ සහද්‍රා, මම ඉන්න ඕනෙ විවේකයෙන්........"

"අපි ඩොක්ටර් කෙනෙක් ගාවට බෙහෙත් ටිකක් ගන්න යමු එහෙනම්."

සහද්‍රා නැවත කියා එයින් නොනැවතී ඈ රිදූරාටද කතා කරයි. වෛද්‍යවරයා ළඟට මා රැගෙන යාමට උත්සුක වූයේ ඇයයි. වෙදකම සේම හෙදකමද මැනවින් ඉටුකරන සහද්‍රා ගැන අද මට පුදුම හිතුණි.

සශික් උදාකර - දිනපොත
දිනය: 2007 මැයි 04

* * *

"මොකක්ද අම්මෙ අම්මට මේ වෙලා තියෙන්නේ අම්මා හැම තිස්සෙම හිතාගෙන ඉන්නේ අම්මා හිතන දේ හරියි කියලා........"

"මමයි ඒ ටික කියන්න ඕනෙ. ඔයා තමයි කොයි වෙලෙත් පළි ගහ ගහා තමුන් කියන දේ ඔප්පු කර කර මට පළිගහන්න එන්නෙ."

"හරි වැරැද්දෙ හැටි එහෙම තමයි. අම්මට තාත්තට වුණත් මම කියන්නෙ ඇත්ත. ඇත්ත කතා කරන්න ඕනෑ........"

"උඹ ඇත්ත කතා කරපං. උඹේ ගෙදරට ගිහින් වහලෙ උඩ දෙක වෙන්න මෙතන කෑගහන්නෙ....! මිනිස්සු හිතයි මෙතන රණ්ඩු කරනවා කියලා බූදලේ බෙදා ගන්න බැරිව."

"හා........ බූදලේ බෙදාගන්න බැරිව........ නල්ල මලේ බූදල් බෙදිල්ලක් නෙ කරල දුන්නෙ........ පුතාට තමයි හොඳ හරිය........"

"නෑ ගහන්නෙ නැතිව ඉන්න ඡායා. ලජ්ජා නැද්ද මෙතන වටිටි අම්මලා වගේ කෑගහන්න. අවට ඔක්කොම මිනිස්සු නිදි සද්දෙ හොඳට ඇහෙනවා රෑට."

"නිදිනම් ඉතිං කොහොමද ඇහෙන්නෙ........ අනේ අම්මෙ ඔය පුහු තර්ක නැතිව නිකම් ඉන්න. අම්මට හොඳයි අම්මගෙ



අදහස් ප්‍රකාශ කරන්න. හැම තිස්සෙම පක්ෂග්‍රාහී වැඩ අම්මගෙ තියෙන්නෙ........"

"තමුන්ගෙ එක්කුස උපන් අයියට විරුද්ධෙන් ඔහොම කතා කියන්න එපා ළමයො........ ලජ්ජා නැද්ද ?"

"නෑ මට ලජ්ජා නැද්ද කියලා අහන්නෙ අම්මටයි ලජ්ජා නැත්තෙ. අම්මගෙ නම දාන්න තිබුණේ අහංගම ලියනගේ සමන්තා ජයසිංහ නෙමේ බක පණ්ඩිතලාගේ සමන්තා ජයසිංහ..."

"උඹ කවුද දෙමව්පියන්ගෙ වාසගම් වෙනස් කරන්න! ඔන්න කට පියාගෙන ඉන්නයි කිව්වෙ."

අම්මාගේත් දුවගේත් වාග් සංග්‍රාමයක් ඇරඹිලා ඇත. මා කාමරයෙන් එළියට ආවේ කෑම සඳහාය. නමුත් මොහොතකට තලින් දිව ගාගෙන හිටිය අම්මාත් දුවත් දැන් ගහමරා ගනිති. අම්මලා දුවලා මෙහෙම නම් නැන්දම්මලා ලේලිලා කොහොමට ඇත්ද? මම කල්පනා කරන විට ඒ සම්බන්ධව දෙබසකුත් ඇසෙයි.

"බලාගෙන ගියාම නැන්දම්මා හොඳයි! අම්මට වඩා එයා මෙච්චර නපුරු නෑ අම්ම වගේ........"

"තමන්ව කුසෙන් වදපු අම්මා එක්ක බැණ අඬ ගහගෙන ඒ අම්මට පලිච්චි කරන ගෑනියෙක් කවදාහරි මට්ටු වෙන්නෙ තමුන්ගෙ ලේලිගෙන්! අන්න ඒක විතරක් හොඳින් මතක තියා ගන්නවා."

බිරිඳ කී ඒ වදනින් කිපුණු දුව මේසය මත තිබූ බත්දෙසියක් පොළොවේ ගසන විශාල ශබ්දය දස අතටම පැතිරුණි. මා එතැනට ගියේ එය ඉවසන්නම බැරිවය.

"ඔන්න බලන්න දෝණියන්දැගේ හපන්කම........හරි මෝඩ ගෑනියෙක් වුණාට බීපු මිනිහා වගේ තරහා ගියාම........"

"ඔවා ඉතිං ඔයාගෙම වරද........ පොඩි කාලේ ඉඳලා දඬුවම් කරන්න මට ඉඩ දුන්නෙ නැහැනෙ. දැන් ඉතිං විඳවන්න........"

මා කීවේ එපමණකි. දුව කෙළින් වී ඉදිරියට ආවේ අභීත යෙනි.

"මොකක්ද තාත්තා ඒ කතාව. තාත්තා නම් අනුවණ විදියට මෙ අපිව හදන්න ආවෙ........ අනේ මගෙ කට....!"

සමන්තා කට ඇරගෙන බලා සිටියේ දුව ඒ වචන ටික මුදාහැර කාමරයට ඇතුල් වන වේගය ගැන පුදුම වෙමිනි.

"සිසිර........ සිසිර........ ලෑස්තිවෙන්න අපි යන්න. මොකක්ද අනේ මේ දවල් නින්ද?"

හැන්දෑවේ හොඳ නින්දක සිටින තම සැමියාටද කෑ ගසන ඇය ඉන් නොනැවතී දරුවා ද අඩ නින්දෙන් පුබුදුවයි.

"මේ මොකද මේ........ හදිසියේ........ ඇයි අපි හෙටනෙ යන්න හිටියෙ........"

"හෙට නෙමෙයි අපි දැන්ම යන්න ඕනෙ........මට තව මොහොතක් ඉන්න බෑ මේ අම්මත් එක්ක ඉන්නවට වඩා හොඳයි නැන්දම්මා එක්ක ඉන්න එක. අපි දැන්ම යං ඔයාලගෙ ගෙදර........ හෙට නෙවෙයි ........ දැන්........"

"මේ ළමයා........ ඒ මොන එකක්ද අවුරුද්දට ගෙදර ඇවිත් ඔහොම තරහ වෙලා යන්න අද නවම දාසයයි නේ. දාහත අපි කැලණිත් ගිහිල්ලානෙ යනවාය කිව්වෙ."

මා කතා කළේ බැරිම තැනය. නමුත් දුවගේ කට නවතින්නේ නැත. සිසිර පුතා කර කියා ගත හැකි දෙයක් නැතිව අන්ද මන්ද වෙලාය.

"එයාගෙ හැටි ඔහොම තමයි තාත්තා ගණන් ගන්න එපා. එහේදිත් ඔහොම තමයි. මා එක්ක රණ්ඩු වෙන්නෙත්........"

සිසිර පුතා එළියට ඇවිත් අප දෙදෙනාට පවසන්නේ හිතේ අමාරුවෙනි. කෙසේ හෝ හවස හත වෙන විට අලුත් අවුරුද්ද වෙනුවෙන් අපේ ගෙදර පැමිණ සිටි දුවත් බෑණාත් දරුවාත් වාහනයට නැග ගිහිල්ලාත් ඉවරය.

"නොද්දකින් විතරක් ඔය ළමයා ගේ හැසිරීම බලන්න පොඩි කාලෙ වගේමයි තාමත් කිසිම මවුවත් කමක් නෑ අම්ම කෙනෙක් වුණාට........"

"ඔයාගෙ වරද තමයි එයාගෙ කටට අවවුවක් නොකර හිටියා........ හරියයි හරියයි කියලා. ඔය හරි ගිහිල්ලා තියෙන්නේ අර දරුවා හොඳ නිසා හොඳයි. නැත්නම් ඔය කසාදෙත් මෙලහට"

"අර නුගේගොඩ ගේ පුතා තමට ලියල දීපු එකට තමා



එයාගෙ ඕය ඔරොප්පුව. ඕක හිතේ තියාගෙන තමා කොයි වෙලේත් ඇදේට කතා කරන්නෙ........"

"ඒක හරි වැඩක්නෙ. ඒක නැතත් එයාටත් ගේකුඩ් කවෙකුයි ලියල දුන්නෙ........ අපි ඕනැවට වඩා ළමයින්ට සැලකුවා. ඒක තමයි මේ ප්‍රශ්න මට පේන විදියට."

"ඉවි හොඳට කමේ ඔය........ පුතාගෙ කරගන්න ඕය ඉංගල්ලෙ කරගන්න දුන්නෙ නැහැ. ඔයා මැද්දට පැහල ඒක විනාශ කරලා දැම්මා........ ඕක නිසා තමයි කොල්ලා මේ ගම රටත් දාලා ගිහිල්ලා ඉන්නේ. දෙයියනේ අම්මා අප්පාවත් බලන්න එනෙනෙ නැතිව........ මට උහුලන්න බැරි ඒකමයි........ මේ ඔක්කොම ඔයාගෙ වැරදි !"

දැන් සමන්තා කෝපයෙන් ද ශෝකයෙන්ද බෙරිහන් දෙන්නට පටන් අරගෙනය. එක අරෝවක් ඉවත් වෙන විට තව අරෝවක් ගොඩ නාගා ගන්නට ගැනියෙකුට ඇති දක්ෂතාවය !

දැන් ඉතින් මේ කන්දොස්කිරියාවෙන්ම ඉන්නවා මිසක් වෙන කරන්ඩ දෙයක් ඉතිරි වෙලා නැත.

"මදයි දූලා අවුරුද්දට ගෙදර ආවා අන්තිමට අම්මත් එක්ක රණ්ඩු වෙලා තමයි යන්න ගියෙ. දන්න අහන කෙනෙකුට මේවා හොඳ ප්‍රවෘත්ති"

මා කීයේ සමන්තාගේ කට වහන්නටය.

"මේවා ප්‍රවෘත්ති....? හරිනම්........ මේවා ද ප්‍රවෘත්ති. ලෝකයාට ඕනෑ තරම් ප්‍රවෘත්ති තිබුණ මේ ගෙදර මම ඉවසාගෙන හිටියේ නැත්නම්........ වෙන ගෑනියෙක් නම් ඔය අපේ දූ වාගේ කෙනෙක් නම් මේවා දමලා ගහලා ගෙදර ගිහිල්ලා නුගක් කල්........!" සමන්තා ගර්ජනා කරයි. ඇගේ ඒ ගර්ජනාවෙන් පසු මට කියන්නට කිසිම දෙයක් ඉතිරි වී නැත. මේ මහා ගෘහය තුළ අප දෙදෙනාත් මෙහෙකරුවන් දෙදෙනාත් බල්ලාත් බළලාත් වෙන වෙනම තනිවෙච්ච ප්‍රාණීන්ය. හිතට මහා කණස්සල්ලක් දනෙන විට මම කාමරයට වදිමි. හෙට දිනයේ එළියට බැස ව්‍යාපාර කටයුතු ගැන සොයාබලන්නට යා යුතුය.

මා නැවත කාමරයට වැදී දිනපොත් කොල ටික පෙරළුවත්ගේ හිතේ කිසිම ඒකාග්‍රතාවයක් නැතිවය.

* * *

අද ඔෆිස් එකේදිත් ගිටියෙ හිත බොහොම සසල වෙලා. හරියට හිත වටේට කැලි කැලි කඩලා කවුරුහරි කඩතොලු කරලාවත්ද කියලා මට හිතුනා.

වරින් වර මිත්‍රයො ටික කෝල් කර කර ක්ලබ් යන එක ගැන මතක් කළා. ඒකෙ තියෙන උත්සවේ ගැන කිය කියා. ඒත් මට කිසිම අදහසක් නෑ එතනට යන්න.

ආයෙමත් ඒ පරිසරයටවත් යාගන්න හිතෙන්නෙ නැති විදියට මගේ හිත ගලක්ම වුණා. මට සිද්ධ වුණා බොරු තොගයක් කියලා ඒවායින් එක එක වෙන්ඩ වහලා දාන්ඩ. ඒත් මම කිසිම කෙනෙකුට මගේ රහස කිව්වෙ නැහැ. ඒක තවදුරටත් නොදන්නා එක මොන තරම් දෙයක්ද.

මම මගේ හිත ගැන ටිකක් ගවේෂණය කළා. හිත කැලඹිලා කැලඹිලා සප්ත මහා සාගරේ වගේ. සහද්‍රා ගත කරන ආගමික ජීවිතේ ගැන මට කල්පනා වෙනවා. උදේ හවස බුදුන් වඳින, බුද්ධ පූජාව තියන පෝයට පන්සල් යන මියගිය ඥාතීන් සිහිපත් කරලා දානමානාදිය දෙන ඇයගේ ආගමික පැවැත්ම හරිම සන්සුන් නේද කියලා හිතෙනවා.

ඇයි මට බැරි වුණේ එහෙම ආගමානුකූල ජීවිතයක් ගත කරන්න. මගේ ගෙදර එහෙම වාතාවරණයක් තිබුණේම නැහැ. දන්න කාලෙකවත්ත් බුද්ධ රූපයක් ගෙදර නැහැ.

සීවලී හාමුදුරුවන්ගේ රූපෙ විතරයි තිබුණේ! ඒකත් ආවේ අම්මා ඉස්සර කාලේ එල්ලපු එකක්ලු. තාත්තා දවසක් බීගෙන ඇවිත් කුස්සියට ගිහිල්ලා කන්න දෙයක් නෑ කියලා හට්ටි මුට්ටි පෙරලලා ඇවිත් අරගල කරනකොට ඒ පිංතූරෙත් බිඳුණා කියලයි අම්මා කිව්වෙ. බිඳුන නෙමෙ බිඳින්න ඇති.

සීවලී පිංතූරෙ බිඳිච්ච දවසෙ අම්මා මරු විකල්ලෙන් වගේ තාත්තාට බැන්නා මට මතකයි. 'මේ කරපු පාප කර්මෙට තමුසෙට මේ ආත්මෙදී නම් බඩගින්නට දෙයක් කන්න හම්බවෙන එකක් නැහැ. පාරක් පාරක් ගානෙ හිඟා කකා තමයි ජීවිතේ ගත කරන්න වෙන්නෙ...''

අම්මගෙ ඒ කීම හරියනවා කියලා මට හිතුණා. පස්සෙ කාලෙක ආරංචි වුණා තාත්තා හිඟා කකා පාරවල් අයිත්වල



වැටිලා ඉන්නවා කියලා. දනටත් එයා කොහෙ හරි ඇති. දෙස් දෙවොල් තිය තියා. මිනිස්සු කියනවා ඇති පුතා ලස්සෙට කොඩිය දාගෙන ඉන්නවා තාත්තා මෙහේ හිඟා කනවා කියලා.

මිනිස්සු එහෙම කියන බව මම දන්නවා. ගෙදර ගියාම අම්මා ඔය විස්තර ඔක්කොම මට කියද්දි මගේ ඔලුව විකල් වෙනවා.

''පුතා දන්නවද තාත්තට ගැනු ගිටියා රට පුරාම. ඒවයෙ ප්‍රතිඵල තමා ඔය. ආරංචි ආවා සමාජ රෝගයක් හදාගෙන ඉස්පිරිතාලවලත් හිටියා කියලා. දැන් ඔය අන්තිම ප්‍රතිඵලේ ඇවිත් තියෙන්නෙ හිඟමනට වැටිලා බස් හෝල්ට් ගානෙ පදිංචි වෙලා ඉන්නෙ. මරු විකල්ලෙන් නිර්වස්ත්‍රෙන් තමාලු දවස ගත කරන්නෙ.''

අම්මා දැන් සුවපහසු ජීවිතයකට හුරු වෙලා වැඩකාරයොත් තියාගෙන හොඳ මන්දිරයක ජීවත් වෙද්දි තාත්තාට එහෙම ඉරණමක් අත්වූයේ කාගෙ වරදින්ද........තමුන්ගෙම වරදින්.......

තාත්තගෙ ලොකු පුතා මිනී මරලා හිරේ ලගින්නෙ කාගේ වරදින්ද තමුන්ගේම වරදින්. ඒත් මට ඒ වැරදීම වුණේ නැත්තෙ මම මොළේ කල්පනා කරලා වැඩ කළ නිසාත්, මාත්සිය නොබලා ඉගෙනගත් නිසාත් කියලා අම්මා අදටත් උදම් අනනවා නැදෑයොත් එක්ක.

ඒත් අම්මෙ අම්මා දන්නෙ නැති වුණාට මටත් ජීවිතේ වැරදුනා. ඒ වැරදිච්ච තැන් මම කාටවත් කියන්නෙ නෑ. කිය කියා උදම් අනන්න පුළුවන් වැරදි නෙමේ මම කරලා තියෙන්නේ. සහද්‍රාගෙ තාත්තා අකාලයේ මැරුණේ මගේ ඒ කල්ක්‍රියාවල් නිසා කියලා එයාගෙ අම්මා කියනකොට අම්මා ඒවා පිළිගත්තේ නෑ. මම දන්නවා අම්මාට අම්මාගෙ පුතා පේන්නෙ බෝධිසත්වයෙක් වගේ. ඒක අම්මලාගේ ගතිය.උනගපුළුවාගේ දරුවා උාට මැණිකක්ලු.

අද කුරුණෑගල අලුත් සාප්පුවෙ ආදායම් වාර්තාව ආවා. මට පුදුම හිතුණා මේ තරම් ආශ්චර්යයක්. සාප්පුව නොදුම් දියුණු වෙලා.

සගීත් උදාකර - දිනපොත
දිනය: 2008 ජනවාරි 01

අද මට ටිකක් විතර පුදුම දවසක්. දුවගේ කාමරේ අස් කරද්දී මට හම්බ වුණා ඇය පාවිච්චි කරපු උසස් පෙළ සිංහල පොතක්. නිකමට මම ඒක පෙරලගෙන පෙරලගෙන යනකොට තිබුණා මීමන ප්‍රේමතිලකගෙ කවියක්.

මගේ හිත ඩක් ගාලා නතර වුණා. මට මේ කවියාගේ කවිපොතක් දුන්නේ කවුද......... හොඳ බැණුමකුත් එක්ක තමයි ඒ කවි පොත මට දුන්නෙ.

"නිකං පඹයෙක් වගේ ඉන්නෙ නැතිව ටිකක් සාහිත්‍ය වගේ දෙයක් රස විඳින්න ඉගෙන ගන්න මෝඩියෙ........"

එහෙම කියලා ඒ කවිපොත මට දුන්නේ කවුද සගීත්.........

මට එදා නම් තරහ ගියා මට කරපු පාච්චලේට. මම ඉතිං කවි රස විඳින්න දන්නෙ නැති එක ඇත්ත. ඒත් පඹයෙක් නෙවිගෙන. ඒත් දැන්නම් මට ටිකක් කලා කෘතියක් ගැන වුණත් තේරෙනවා. ඒ කාලයාගේ ඇවෑමෙන් මම ටිකක් පොත් කියවන්න හුරු වුණු නිසා වෙන්න ඇති. අම්මෝ දැන් ඉතිං අවුරුදු කීයක්ද ? දැන් අපේ දරුවෝ උස් මහත් වෙලා අපි වයසට යාගෙන යනවා.ඒත් හිත් නාම වයසට ගිහිල්ලා නෑ වගේ......... ඒ කාලේ ඇති වූ හැඟීම් නාම මතකයෙ තියෙනවා. ඒවා පොඩ්ඩක්වත් එහා මෙහා වෙලා නැහැ. ඒත් වෙනස්. අපි දැන් ඒ බැඳීම්වල ඇලිලා ගැලිලා නැති එක විතරයි. හැම පෝයටම පන්සලට ගිහිල්ලා අපි බණක් අහනවා. ඒ තුළින් ලැබෙන සිත් සැනසිල්ල අප්‍රමාණයි. පෝයදාට හරි වෙන දවසකට හරි ටීවී එකේ හොඳ බණක් යනවා නම් අහන එක පුරුද්දක්. දුවයි පුතයි නම් එච්චර ඒවට නැහැ.

මට දුව ගැන තමයි බයක් හිතෙන්නෙ. මගේ තරුණ කාලය මට මතක් වෙනවා. මට බයෙන් බයෙන් ආදර සම්බන්ධයක පැටලෙව්ව හැටි. ඒව පස්සෙ ඒ සම්බන්ධෙ දිගටම ගෙන යන්න බැරිව සගීත් ගෙන් බැණුම් අහපු හැටි.

බැරි වෙලාවත් සගීත් ගෙ තියෙන දඟකාර කමයි සැරපරුෂ කමයි ඒ එක්කම කියන පරාජිත අනුකම්පා සහගත කමයි එක්ක මට මොනවා හරි වරදක් වුණානම් එයාගෙන්. එහෙම හිතනකොට තමා මට දූ ගැන බය හිතෙන්නෙ. අද ඒ කාලෙ වගේ නෙමෙයි. අද හැම තැනකම කොල්ලන් - කෙල්ලන්ට නොමග යන ඉනිමං



බැඳලා ඕන තරම. සගීත් වගේ අදහස් තියෙන කොල්ලෙකුට අද වගේ පහසුකම් තිබුණා නම් ආදරේ කරන්න. මම හිතාගන්නත් බෑ! මට දුව ගැන බය හිතෙන්නෙනම ඒකයි.

රෑ නිදාගන්න ගියාමත් මම හැමදාම පසිඳුගෙ කනට කොඳුරලා කියන්නෙ දූ ගැන බයයි කියලා. එයා කියන්නෙ අපි හැමදාම ළමය ගැන සෙවිල්ලෙන් ඉන්නවා නම් කිසි ප්‍රශ්නයක් නෑ කියලා. මොන බොරුද දැන් මම ගැන අම්මයි තාත්තයි මොන තරමට සෙවිල්ලෙන්ද හිටියෙ. ඒත් මම කොල්ලෙක් එක්ක සම්බන්ධ වුණේ. එයා එක්ක ඉඳහිටලා හරි හරි තනිපංගලමේ ඇවිදින්න ගියේ. දැන් ළමයින්ට දෙයියනේ මොන තරම් පහසුකම්ද?

හැම එක්කෙනාගෙම අතේ මොබයිල්. ඕවයේ කෙටි පණිවිඩ යවාගන්න බැරිද ඕන තරම්. හරියට දලකින් හුළං ඔදිනවා වගේ දැන් කාලෙ කෙල්ලන්ගෙ ආදරේ මුර කරන එක. මේ බය නිසාම මම හැම වෙලේම දූවට කියනවා කැම්පස් එකේදි වුණත් යාලුවෙන්න කවුරුහරි ඉන්නවානම් මට කියන්න කියලා. එයා හිනාවුණා.

පව්......... එච්චරටම සැක කරන්නෙ කොහොමද දරුවන්ව. අපේ කාලෙට වඩා එයාලගෙ කාලෙ විවෘතයි. විනෝදකාමියි. කොහොම වුණත් ගෑනු ළමයකු ළඟ තිබිය යුතු රැකගත යුතු දේ මොනවද කියලා මම දූට කියලා දුන්නා. මම ඒවා කියලා දුන්නෙ කවුරුත් නැති වෙලාවක කාමරේ තනියෙන් ඉඳිද්දී.

දූට හොඳටම හිනා මං ඒක කියාපු විදියට.

"අනේ මන්දා අම්මේ අම්මත් කියන දේවල්. නැන්දම්මලාට පිස්සු නැද්ද අනේ කාගෙවත් රෙදි බලන්න එන්න. ඒක තමයි නොදියුණු පුරුද්දක්නෙ. තමන්ගෙ පුතාගෙයි ලේලිගෙයි පෞද්ගලික දෙයක්නෙ. නැන්දම්මා මොකටද ඒවා චෙක් කරන්න යන්නෙ.

දූටයි මටයි දෙන්නටම හිනා. අපි හිනාව නවත්තන්නෙ පසිඳු කාමරේට ආවට පස්සෙයි.

"තාත්ති මං යනවා ගුඩ් නයිට්" කියලා දූ එයාගෙ කාමරේට දුවලා ගියා.

"අපේ දූ නම් හරිම පණ්ඩිතයි අනේ........" මම කිව්වෙ හිනාව ගිලගන්න ගමන්.

"ඔව් ඉතිං අම්මා වගේම නැතෑ........"

පසිඳු කිව්වෙ උජාරුවෙන් වගේ කොහොම වුණත් මගෙ දූට සගික් වගේ කොල්ලෙක් නම් හම්බවෙන්න එපා-එපාමයි.

*නිම්නා සමෝදයා - දිනපොත*

*දිනය: 2008 ජන. 01*

අපේ ගෙදර දැන් හැම තිස්සෙම එක එක පාටි. ලන්ච් කියයි, ඩිනර් කියයි, ටී පාටි කියයි ඒ හින්දද කොහෙද දැන් මට කිසිම දෙයක් ගැන හිත හිත ඉන්නවත් වෙලාවක් නෑ. මම පොත් කියවන්න ආසා බව දැකලා දූගෙ සර් නවල්ස් කීපයක්ම ගෙනැත් දුන්නා. මම ඒවා වතුර වගේ කියවාගෙන ගියා.

මට ඕන වතුරට වඩා වැඩියමක් තියෙන නවකතා කියලා මම සර්ට කිව්වා. පුලුවන් තරම් පරිවර්තන කෘති කියවන්න පුරුදු වෙන්න කියලා එයා උපදෙසුත් දුන්නා. කතාව නම් ඇත්ත. ගිම්හාන්ලා වගේ අය නම් කවදාවත් පොතක පතක ගීතයක කවියක නාට්‍යයක රසය මොකක්ද කියලා මේ ආත්මෙදි දන්නෙ නෑ. එහා ආත්මෙදිවත් දැනගන්න එකක් නෑ ඔය කියන විදියට.

එයාට ඉතිං ඔය මීටිං තිය තියා කතා පවත්නවලා ඡන්දෙ ඉල්ලා ගත්තොතිං එච්චරයි. බලමුකො දිනුවොත් ගමට රටට වැඩ කරයිද කියලා. දූනට නම් පට්ටංදරේ එහෙම තමයි. ගිම්හාන්ගෙ වටේට ඉන්න යාලුවො රොත්ත නම් මට නම් සතකට විශ්වාස නැහැ. තරුණ කාලෙදි වගේම දැනටත් එයාගෙ සහපිරිවර වැඩියි.

ගිම්හාන්ගෙ අම්මාගෙ මහ ලොකු පම්පෝරියක් තියෙනවා පුතා ගැන. එයා ඒක කිව්වෙ දූගෙ සර් මට පොත් ගෙනැත් දීපු දිහාවෙ රවා ඇහැ දාගෙන ඉඳලා. ඔය වයසට එහෙම අබූත කල්පනාවක් මොනව හරි එන්න නැතැයි නොකිව්වට.

"දේශපාලනේ කරලා කොච්චර ඉහළට ගියත් දූටනම් කවදාවත් එයා ගැන බයවෙන්න දෙයක් නෑ. එයා කවදාවත් ඔය



ගෑනු පරාණවලට වහ වැටිලා නම් කැත කරගන්න කෙනෙක් නෙවෙයිනේ........"

'නොවෙන්නම් නොවෙන්නම් අනේ මගේ කට....!' එහෙම කිව්වෙ මගේ කට නෙමේ හිත ........! මටම හිනා.

මට දැන් තියෙන ලොකුම බය තමා සඳලි දුවගෙ අනාගතය. කොච්චර ඉගෙන ගත්තත් උගත්කම තිබුණත් ආදරේදි හැම කෙල්ලම මෝඩයි. මගේ හිත වුණත් මොන තරම් බොළඳද? මම මොනතරම් ඇලීම් බැඳීම් ඇති කරගත්තද? හොඳට සිංදු කියන ගායකයන්ට හොඳට රඟපාන නළුවන්ට මම කොච්චර ආදරේ කළාද? බැරි වෙලාවත් ඒ කෙනෙක් මට ඇහැලුම් කෑවා නම් මම ජීවිතෙත් පූජා කරලයි පස්ස බලන්නෙ. ඒ තරම් මානසික වාතාවරණයක මං හිටියෙ. සගික්ට මම හොඳම හොඳ පෙම්වතියක් වුණේ මගේ තියෙන මේ රැඩිකල් ගතිය හින්දයි. ඒත් දෙවියනේ දූ සඳලිත් එහෙම වුණොත්?

මට සඳලි ගැන බයයි. අද කාලෙ හරිම අමුතු කාලයක්. ඒ කාලෙ වෙලත් බැඳපු මිනිහගෙ මුද්ද හංගලා ගිහිල්ලා පෙම්වතා එක්ක විනෝද වුණු මම, දැන් මේ දශක දෙකකට විතර පස්සෙ මගෙ දූගෙ වයසේ කෙල්ලො මොනව නොකරයිද ?

ඒත් මට සඳලි දුවට තරකක් වෙනවා නම් දකින්න බෑ. එයාට තාත්තගෙයි අම්මගෙයි දෙන්නගෙම ආදරේ දෙන්නෙ මමයි. ඒ නිසා එයා නිසා අයත් වෙන දුකක් වුණත් විඳින්න ඉන්නෙ තනි මම විතරමයි.

"මොනවද අම්මා ඔය තරම් කල්පනා කර කර කුරුලු ගාන්නේ. " සඳලි දූ අසයි. මට දෙන්න උත්තර නැහැ.

"මං කල්පනා කළේ දූගෙ අනාගතේ ගැන."

"බය වෙන්න එපා අම්මා........ මං හොඳට ඉගෙන ගන්නවා. මොනව කළත්."

"මොනව කළත් කිව්වේ ?"

"අම්ම දන්නවනේ මට කොලු යාලුවො ගොඩක් ඉන්නවා. උන් හම්බවෙනවා කතාබස් කරනවා. ෆෝන් කරනවා. ඒත් මම ඒ කාටවත් බය නෑ. ඒ කාටවත් බෑ මාව නම්මන්න."

"දූ ඔය කියන කතාවලට මට බයත් හිතෙනවා. අම්මට ඇහුණොත් බය නෙමෙයි කලන්තෙත් දාවි"

මම කියන්නෙ තිගැස්සෙමින්. ගිම්හාන්ගෙ අම්මා පත්තරේ බලමින් සිට උපැස් යුවළ නළලට අරගෙන බැලුවේ කියන දේ පැහැදිලිව ඇසුණේ නැති නිසාය. මම දුවට ඇසින් සන් කළේ කතාව නවතාගන්නටය. නමුත් දුව කළේ ඊට වෙනස් ප්‍රතිචාරයක් දක්වීමය.

"ආච්චි දන්නවද වැඩක් මට ඉන්නෙ ගෑනු යාලුවන්ට වඩා පිරිමි යාලුවොයි. ඒක හොඳයි නේද ආච්චි. මැරි කරන්න ඉස්සෙල්ලා අඩුම ගානේ පිරිමි සත්වයා කවුරු වගේද මොන වගේ ගතිගුණද තියෙන්නෙ කියලා බලාගන්න පුළුවන්නේ."

ගිම්හාන්ගේ අම්මා ගේ අතින් පත්තරේ බිම වැටුණා. දත් සෙට් එක දාපු කට ඇරුණා. දකුණු අත දකුණු කම්මුලේ වැතිරුණා.........

"විවරං දෙවියනේ.......!"

"මම දන්නෙ නෑ මේ ළමයට තියෙන්නෙ කාගෙ ගතිගුණද කියලා. තාත්තගෙද අම්මගෙද ........ ගෑනු ළමිස්සියෙක් කියන කතාවක්ද මේ."

ඈ පුපුර පුපුරා ගෙට යන්නට නැගිටිද්දී මට සැනසුම් පදයක් ගායනා කරන්නට සිදුවෙයි.

"එයාගෙ විහිළු අම්මා ඕවා ගණන් ගන්න එපා.......!"

සඳලි දුව ආචාර පෙළපාලියක් වගේ අත් හා කකුල් එහා මෙහා කරමින් කාමරයට යන්නේ ගිනාව සඟවාගෙනය. එවිටම ගිම්හාන් ඇතුළු පිරිමි කණ්ඩායමක් ආලින්දයට ප්‍රවේශ වනවා දුටු නිසා මටද සිදුවූයේ කාමරයට රිංගන්නටය.

සඳලි ඇත්තට කවුරු වගේ හැදේවිද මගේ සිත බියවෙයි. තාත්තා වගේ හැදුනොත්.......? අම්මා වගේ හැදුනොත්.......?

දෙදෙනාගේම ගතිගුණ එක්වෙලා හැදුනොත්.... විනාශයි!

දෙවියනේ මේ දරුවට අවවාදයක්වත් දෙන්න කවුද ඉන්නේ. අවවාද දෙන කෙනෙක් තුලියට තමයි ගන්න වෙන්නේ.....! ආ....... නෑ....... සර්ට කිව්වොත් මොකද?

සර්ජැත් අපි වගේ තලත්තෑනි වයසක කෙනෙක් නිසා සර්ට පුළුවන්වෙයි අපේ සඳලි දූට අවවාදයක් දෙන්න........

මොන විකාරයක්ද ? ගිම්හාන්ගෙ අම්මත් එක්ක මුකුත්ම



කරන්න බැහැ. හැමදේම බලාගෙන ඉන්නවා. සජීවීවම හැම එකේම විස්තරේ එයාට ඕනෑ. පුදුම මාධ්‍ය කවුළුවක්.

සඳලි ගැන මහා බරක් මගේ හිස මතට කාන්දු වෙයි. ඒ බර තින්දෙද්දිවත් බිම තියන්ට බැරි තරමට බරට දැනෙයි.

මනෝරමා නාගසේන - දිනපොත

දිනය: 2008 ජන 03

හොඳටම ඇඳිරි වැටිලාත් පුතා ගෙදර ඇවිත් නැති එක ගැන මගේ හිතට කරදරය. දරුවන් ගැන නිදහස් සිතින් සිතිය හැකි වන්නේ ඔවුන් කිරි දරුවන් සේ සිටින කාලයේදී විතරක් බැයි කවුදෝ කියා තිබෙනු මත මතකය.

"දැන් කාලයේ අසන්නට ලැබෙන ආරංචි වල හැටියට අපි පුතයි දුවයි ගැන මීට වඩා සෙවිල්ලෙන් ඉන්න ඕන......."

සහද්‍රා එසේ කීවේ පුවත්පතක තිබූ පත්තර ප්‍රවෘත්තියක් පදනම් කරගෙනය. ප්‍රේමය නිසා දිවි නසාගැනීම්, ප්‍රේමය නිසා මිනී මරාගැනීම, වස බීම, එල්ලීම් අනන්තවත් සිදු වෙයි. ඒත් එදාට වඩා අද වැඩිවේගයෙන් එය පවතී.

"මම පුතා ගැන සෙවිල්ලෙන් ඉන්නම්. ඔයා දූව ගැන වැඩිපුර සොයා බලන්න........ මීක නම් හොඳ කාලයක් නෙවෙයි ඇත්තටම........"

මා සහද්‍රාට කීවේ මාතින්ද ඉටු විය යුතු යුතුකම් සම්භාරය මතක් කරගෙනය. සහද්‍රා මාදෙස බැලුවේ විදහාගත් ඇසිනි. මේ යුතුකම මීට කලින් මතක් වුණා නම් කොච්චර හොඳදැයි යන යටි අරුත ඒ විදහාගත් බැල්ම තුළ කියෙව්වෙමි.

"ඇත්තම කියනවානම් පුතා ගැන දැන් හොඳටම හොයන්න වෙලා තියෙන්නෙ සගික්.......!"

ඈය එසේ කියන විට කලබල නොවී ඉන්නට බැරි විය. ජීවිතේ මට සිදුවූ පටලැවිල්ල මගේ පුතාට සිදු විය යුතු නැත. ඇත්තටම ඔහු දූලි රැවුල වැවී තරුණයෙකු සේ පෙනෙන්නට පටන් ගත්දා සිට මේ සිතිවිල්ල මට කරදර කළා මතක ඇත.

"බැංකුවෙ ජොබ් එක ලැබුණාට පස්සේ පුතා ටිකක් වෙනස්....... වෙනදා වගේ කතාබහක් නෑ...... කොහොම නැතින් එක්ක විහිළු කරන්නේවත් නැති තරම්."

"එයාට මොකක්හරි වැඩ කරන තැන ප්‍රශ්නයක් ඇති. ඉන්න මම එතැන මැනේජර්ට කතාකරන බලන්නම්........"

"එපා........ එපා........එහෙම කරන්නෙ නැතිව අපි හිමීට හොයලා බලමු........ පුතා වැඩට ගිහිල්ලත් දැන් අවුරුද්දක් වෙනවනේ........"

සභද්‍රා ගේ ඉරියව් වල විදියට නම් දැන් පුතාගේ වෙනස සිදුව ඇත්තේ කලක සිටය. මගේ ව්‍යාපාරික කටයුතු කීපයක්ම අතපසු කරගෙන දැන් මා තකහනියක්ම මේ වැඩයට ඇඟිලි ගැසිය යුතුද? මම දෙවනුව කල්පනා කරමි. පිරිමි ළමයකුගේ සම්බන්ධයකදී ඕනැවට වඩා කලබල වී ක්‍රියා කළ යුතු නැත. ඒවා ඇති වී නැති වී යන දේවල්ය. නමුත් මොකක් හෝ බාධකයක් ඒ ගැන ඇති වුවහොත් ඔහු එම සම්බන්ධය කීයටවත් අත අරින්නේ නැත. ඒ පිරිමිකමේ හැටිය.

මම මගේ අදහස සභද්‍රාට පැහැදිලි කර දුනිමි. ඇය සැනසුම් සුසුමක් හෙලනවා මට දැනුනි. එයින් ලැබුණේ ඇයගේ එකඟතාවයේ සංඥාවයි.

කෙසේ වෙතත් දුව ගැන නම් සොයා බැලිය යුතු යැයි මම ඇයට කීවේ ඉතාම හෙමින්ය. ඒ වන විටත් දුව අප දෙස බලමින් එහා මෙහා ගමන් කරමින් සිටිය බැවිනි.

මට මනෝරමා මතක් වෙයි. ඒ එක්කම නිමනාත් මතක් වෙයි. දෙදෙනා පරස්පර විරෝධී චරිත දෙකකි. දුව කෙබඳු චරිතයක් වෙයිද ? නිමනා වගේ අහිංසක වුවත් මනෝරමා වගේ දඩබ්බර වුවත් ඒ අන්ත දෙකම එතරම් හොඳ නොවේ.

ඒ අන්ත ගැන දැන් මා කල්පනා කරන්නේ ඇයි. මේ අන්ත මට මුලින් නොපෙනුනේ මගේ ඇස් අන්තගාමී වූ නිසාද? නැත්නම් මට හරිවැරදි පෙන්වා දෙන්ට කෙනෙක් නොසිටි නිසාද9 ?

*සශීක් උදාකර - දිනපොත*
*දිනය: 2008 මැයි 07*

දශ අට අවුරුද්දක්ම හිරබත් කමින් හිටිය මම අද හිරු එළිය දිහා බලාගෙන සිටිමි. මට ඉන්නට තැනක් නැත. යන්නට තැනක්



නැත. උන්මත්තක ස්ත්‍රියක ලෙස මහ පාර අයින්වල වැටී ජීවත් වුණු මා හට විඳින්නට හැකි හැම දුක් ගැහැටක්ම ලැබුණි.

පදික වේදිකාවල රාත්‍රී කාලයේදී නිදාගන්නට ජඩ පිරිමින්ගේ නින්දිත ගොදුර බවට පත්විමි. ඒ පිරිමි හිගන කල්ලියේ අයමය. අසූචි ගොඩේ නළියන පණු ගොඩක් සේ මේ රංගනය නිමා කරන්නේ කවදාද ? කවදාවත්ම දැන් නම් මට මේ අසූචි ගොඩින් නික්මිය නොහැකි වනු ඇත.

හිසේ තද රිදුමක් සමඟ මට එකවරම මතක් වන්නේ මගේම ලෙයින් මසින් සැදූ මගේ දියණියයි. දෙවියනේ මගේ දුව........ මගේ දුව කොහේද ? මට කෑ ගැසෙයි. මම කෑගසමින් පාරක් පාරක් ගානේ දුවමි. සිග්නල් ලයිට් අසල නතර කර ඇති දැවැන්ත මෝටර් රථ දකින විට මට අතීතය මතක් වෙයි. මෙවැනි මෝටර් රථවල මා කොතෙක් නම් ගිහින් ඇත්ද ? සුඛෝපභෝගී අලංකාර දිව්‍ය රථ, අලංකාර දිව්‍ය විමන් වැනි හෝටල්........ එවැනි තැනක සිට දවසැරිය මා අද මේ ගෙවන්නේ කිනම් කරුමයක්ද ?

දරුවකු මගේ බඩට ආවේ කෙසේද? කාගෙන්ද? සුද්දා මළ පසු........ අතීතය මහා කුණු කන්දරාවකි. සත්‍ය සොයන්න ඒවා ඇවිස්සිය යුතුය. මා විවාහ කරගෙන සිටි වයසක සුද්දා ඔහු කෝටිපතියෙකි. ජීවිතයේ විඳින්න පුළුවන් උපරිම සතුට භෞතිකව මම ඔහු නිසා වින්දෙමි. ඇතැම් නිවාඩුවල පිට රට පවා සංචාරය සඳහා ඔහු මා රැගෙන ගියේය. මගේ හිස නැවත හිරි වැටී යයි.

ඒ ජීවිතයේ එක්තරා කාල පරිච්ඡේදයකි. දැන් ඒ කාල චකවානුව ගෙවිලා හමාරය. වයසක ධනවත් කාන්තාවකගේ කරුණාව නිසා අද මම ඇයගේ ගෙදර නතර වී ඇගේ තනි නොතනියට සිටින්නට හැකිවී තිබීම පවා වෙලාවේ හැටියට මොනතරම් දෙයක්ද?

ඇය මට හමු වූයේ පල්ලිය අසලදීය. පල්ලිය අසල සිටි හිගන කල්ලිය සමඟ සිටි මා ගැන ඇ කීප වතාවක්ම විමසුම් ඇසින් බලනවා මට තේරී තිබුණි. අන්තිමේදී එක් අඟහරුවාදා දවසක ශාන්ත ජුඩ්ගේ පූජාව දවසක ඇය මට කතාකර වතගොත විමසුවාය.

යන්න එන්නට තැනක් නැතිව මෙසේ වැටී සිටිනැයි කීවෙමි. මගේ සැමියා මා හැරදමා ගිය බවත් කී විට ඇට මා ගැන අනුකම්පා සිතුණි. හොඳ කල්කිරියාවෙන් ඉන්නට හැකි නම් පමණක් ඈ සමග එන මෙන් ඈ මට කීවාය.

පිරිමින් සමග සම්බන්ධතා නම් නැවත කිසි දිනක පවත්වන්නට මට උවමනාවක් නැත. මට මාගේ දියණිය කාට දුන්නා දැයි මතකයක් නැති නිසා විශාල දුකක් දැනෙයි. ඒ දියණිය මට දුන් තාත්තා මට මතක් වෙයි.

සශික්.......! ඔහු මට මවා දුන් මහා සුරපුරට සිදුවූයේ කුමක්ද? මා විශාල ධනස්කන්ධයක අයිතිකාරිය යැයි සිතා ගෙන මගේ ආදරය සමග ඔහු අපූරුවට සෙල්ලම් කළේය. ඒ යුගය නම් මට කවදාවත්ම හිතන්නට බැරි තරම් මහා ස්වප්න මායා ජාලයකි. මා එහි සදාකාලික සිරකාරියකි. ඒ ආශ්චර්ය සිදු කළ සශික්....! ඔව් එය ඔහුගේ නමය, මගේ ලෝකයේ සර්ව බලධාරී දෙවියකු ලෙස මම විශ්වාස කළ කෙනෙක්..!

ඔහු හමුවීමෙන් පස්සේ මම මගේ ජීවිතය වෙනස් කරගත්තා. බහු පුරුෂ සේවනය ජීවිතයේ අති සාමාන්‍ය සිද්ධියක් ලෙස සලකා සිටි මට ඔහුගේ ඇසුරට වැටුණු පසු කිසිම පිරිමියකු දෙස බලන්නට තරමවත් උවමනාවක් තිබුණේ නැත. ඒ පිරිමියෙකු වශයෙන් ඔහු තුළ ඇති පරිපූර්ණත්වය හෝ මොකක් හෝ මට වචනවලින් කියන්නට බැරි හැඟීමක්ය. ඔහු වගේ ආදරය හරියටම හඳුනන පිරිමියෙක් ළඟදී ගැහුන්ට වෙන අතක් බලාගත හැකි වන්නේ නැත.

මා සිතා සිටියේ ඔහු සමග හැමදාම එක්ව වසන්නටය. නමුත් ඔහු මගේ දෙමාපියන් හමුවී කතා බස් කොට මාව කසාද බැඳගත යුතු යැයි කියද්දී මා සැලුනා මතකය. මගේ සියලු ප්‍රෝඩාවල් එළිවුණි. සශික් මා නොසිතූ තරම් සාහසික විදියට මගෙන් පලා ගියේය. ඔහු විසින් සූක්ෂම උපක්‍රමයක් ලෙස ඔහුගේ දරුවෙකු ද මා තුළ පිළිසිඳවා තිබුණේ කසාදය උදෙසා බව මට තේරුණි.

කිසිම විදියකින් හිතාගන්නට බැරි විදියට ඉතාම අමානුෂික විදියට ඔහු මා මගහැර ගියා. මගේ පොත්වල තිබූ මුදල්



සන්දරාව මා ඔහුට වියදම් කළා. බැංකුවල තිබුණු මගේ මිළුම් වලවත් අයිතිය තහවුරු කරන්ට අද මා ළඟ කිසි දෙයක් නැත. මා අමු පිස්සියක් වී ඒ සියල්ලම ගිනිබත් කර දමා ඇත. මාද වාහනයකට හෝ පැනලා දිවි තොර කරගන්නට හැදුවා මට යන්තමට මතකයක් ඇත.

ඒ අස්සේ පැටලී ආ සුද්දාගේ නඩුව මගේ ජීවිතයම මට අහිමි කෙරෙව්වා මතකය. සුද්දා විවාපත් වී සිටි සුද්දිය ලංකාවට ඇවිත් මා නැත්තටම නැති කර හපයක් කර දමා පිටවෙලා යන්න ගියා. මට අන්තිමට මගේ දරුවාත් නැත. ඈ ඉන්නා තැනක් මා දන්නේ නෑ.

කොහේ හිටියත් ඈ හොඳින් ඉඳීවි. අනේ ඈ හොඳට ඉගෙන ගනීවි.අම්මා වගේ ක්ලබ් ගානේ යන එකක් නෑ! අම්මා වගේ පිරිමින්ට අහුවෙලා අතින් අත යන එකක් නෑ!

ඈ ඉන්නා තැනක කීකරුව හැදිලා හොඳට ඉගෙන ගනීවි. මට ආව කොහේදි හරි ගම්බ වේවි. මම හොඳටම අමාරුවෙන් ඉස්පිරිතාලෙකට යනවා. මට කාත් කවුරුවත් නෑ. තනියම වැටිලා ඉන්නවා. විශාල ලයිට් ගහපු කාමරේක මම ඇඳක් උඩ පණ අදිනවා.

''කෝ........ මේ ලෙඩාගෙ බාරකාරයො. කවුරුවත් නැද්ද........'' ලස්සන හීනි කටහඬක් ඇහෙනවා. හරියට සිංදුවක් වගේ........ මම දෙපැත්තට ඔලුව වනනවා. මට කාත් කවුරුවත් නෑ. ඉස්සර නම් හිටියා. මගේ හිත කියනවා. ඉස්සර මාව අයිතිකරගන්න ගොඩාක් අය හිටියා. සමහරු මාව අයිති කරගන්න රණ්ඩු වුණා. ගහගත්තා. ගුටි ඇනගත්තා. ඒ ඔක්කොම ඉවර වෙලා. පිරිමි යතුරු වලට පොරකනවා. උඩ පැනලා අල්ල ගන්න. මගේ කාමරේ යතුර අයිති එක්කෙනා හුරේ දමා උඩ පැන්නා. ඒ වගේ කාලයක්.

අද මා දිහා බලන කෙනෙකුත් නෑ.

''ඇයි බැඳල නැද්ද?'' ආයෙත් හීන් හඬ ඇහෙනවා.

මම දෙපැත්තට ඔලුව වනනවා. ඒත් මගේ හිත කතා කරනවා. අනේ හැම දෙනාටම බැඳිලා තමා හිටියේ. ඒත් කවුරුවත් මාව තමුන්ටය කියලා බැඳ ගත්තේ නම් නෑ. හැමෝටම

තම නමන්ගෙ කියලා නෝනලා ළමයි හිටියා. මං හිටියෙ ඒ නෝනලාගෙ අඩුලුහුඬු කම් පුරවලා ඒ මහත්තුරු සතුටු කරන්න විතරයි.

ඒත් අන්තිමටම එක්කෙනෙකුට මම බැඳුණා. එයාටත් ඕන වුණා මාව බැඳගන්න. ඒත් ඒකට ගිහින් මම පොදි බැඳගෙන හිටිය බොරු පොදි බිඳ වැටුණා. චිංචි මානවිකාවගෙ බොරු දරුපොදිය වගේ අනේ මගේ බොරු ගොඩ කඩා වැටුණා. එයාට මාව එපා වුණා! හොඳටම පිළිකුල් වුණා. ඒ පිළිකුල් වුණේ මවාගත්ත බොරු නිසා නම් නොවේ. මගේ පසුබිමින් කිසිම සල්ලි කන්දරාවක් නොතිබුණ නිසා. එයාට මාව නිකම්ම හිස් තැනක් වුණා.

අනේ මම මේ මොනවද හිතන්නේ. ගිලන් ඇඳ උඩ මම....... ආයෙමත් අර ලස්සන හීන් කටහඬ ඇහුණා.

"මොනවද මේ අම්මට දැනට තියෙන අමාරු.......?"

මගේ වේලිච්ච තොල් පොටවල් වෙව්ලනවා. දැනට තියෙන අමාරු ? මගේ හිත විතරක් ආයෙත් කතා කරනවා. අනේ ඉස්සර තිබුණු අමාරුව තමා ජීවත් වෙන්න තියෙන අමාරුව. ඒ අමාරුව නැති කරගන්න ගිහින් තමා එක එක අමාරු තියෙන පිරිමින්ට පිහිට වෙන්න වුණේ.

මම 'රත්තරන් පාට සමනලයෙක්' වගේ කියල උන් කිව්වා.

මම 'මිහිබට සුරංගනාවියක්' කියලා සමහරු කිව්වා.

මම 'සුරබි ධේනුවක්' කියලා කියපු අයත් හිටියා. එයාලගෙ නෝනලා එක්ක ඉඳිද්දි නොලබපු දියුණුවක් දැන් ලැබිලා තියෙන නිසා මම නම් සුරබි ධේනුවක් කියලා කිව්වා.

මගේ ඇස්වලට, නහයට, තොල්වලට, බෙල්ලට, පපුවට, ඉණට, උකුලට, නාභියට විවිධ උපමා ඒ අය කිව්වා. ඒත් දෙවියනේ එකෙක්වත් මගේ හිත දැක්කෙ නෑ. රෑට එයාලගෙ කාමාවේගවලින් මාව මිරිකලා හපයක් කරලා දාලා උදේ පිටවෙලා ගියා. ආයෙමත් හැන්දෑ වෙනකොට ඒ හපේට අමාව පිරිලා උන්ව සනසන්න බැඳිලාම හිටියා. ඒ විදියෙ විශාල ඉල්ලුමක් තිබුණ මගේ නැටුමටත්....... නලියන ගිනි සිළුව.......



තාවල් ක්ලබ් එකේ 'නලියන ගිනිසිළුව' කිව්වාම මාව නොදන්නා කෙනෙක් නෑ.......?

එනකොට මට කිසි අමාරුවක් නෑ. මං ඉපදිලා ඉන්නේ නටන්නමයි. මම නටන දිහා බලා හිටියෙ කොල්ලො වගේම හැත්තෑව පිරිච්ච නාකියොත් කිව්වා. ඔක්කොම වයසක අය. මා එක්ක නටද්දි තිරිහන් වෙනවාය කියන එක තමා මට [illegible] හැදින්වීමේ පාඨය වුණේ. අනේ එහෙම කාලයක්. කිසි අමාරුවක් තිබ්බෙ නෑ. කිසිම සල්ලි අමාරුවක් තිබ්බෙත් නෑ. මම එහෙම ගිහින් හිතාගෙන අර හීන් කටහඬ ආපු ඉසව්වට මූණ උස්සනවා. අනේ ස්ටෙතස්කෝප් එකක් දමා ගෙන ඒ ඉන්නේ කවුද. ඒ මගේ දුව........ දෙයියනේ....... මගේ දොස්තර දුව.....!

මේ විකාර රූප මගේ හිතේ මැවෙන එක වළක්වන්න මම දැන් ජීවිතේට මුහුණ දෙන්න ඕනෑ කර තියෙනවා.

ඩොරින් නෝනා පල්ලියට යන්න යන්න ලෑස්ති වෙලා ඩ්‍රයිවර්ට කතා කරන සද්දෙ. මම ඉක්මනට ඇගේ තේ එක අරගෙන යනවා.

*නිසලා නිරංජලා - දිනපොත*

*දිනය: 2008 මැයි 18*

"මොකක්ද පුතේ මේ වෙලා තියෙන්නෙ ? කීයටද දැන් ඔයා මේ ගෙදර එන්නෙ.......?"

සහද්‍රා කෑ ගසන හඬ මට ඇසෙයි. මම වෙලාව බලමි. වෙලාව රාත්‍රි එකොළහ හමාර.......!

"මට වැඩ අම්මා ! කෑ ගහන්නේ නැතිව ඉන්නකෝ. මිනිස් වෙලාවෙන් පස්සෙ මම ඕටී කරනවා අම්මා දන්නවානේ......ඇයි මේ නිකම් දොස් කියන්නේ ....... ආ......."

උණුසුම් බහින්බස් වීම ඉහළටම නැගගෙන එද්දී බලා ඉන්නම බැරි තැන මම කාමරයෙන් එළියට ආවෙමි.

"ආ ....... මොකද පුතා....... මේ තරම් රෑ වෙලා......"

ඒ අසද්දී බිමල් පුතා හිටි පිළිමයක් සේ නතර වුණි. නමුත් මුහුණේ දෑස් ජීවමානව දිදුලයි.

''ඇ වෙලා........? නෑ එච්චර........ මම ගියා යාලුවෙක් හම්බවෙන්න ඒකයි.......!''

ඔහු කිසිම ගණනකට නොගෙන එසේ කීවේය. කලිසම සාක්කුවට අතක් දමාගෙන එතැනින් නික්මෙන්ට තැදුවේය.

''එහෙනම් මට කිව්වෙ ඕ ටී කළා කියලා........ ඇයි පුතේ මේ බොරු කියන්නේ.......?''

සහද්‍රා කෑගැහැව්වේ නො ඉවසිල්ලෙනි.

''එහෙම තමයි අම්මා මගේ උත්තර........ ඒ ඒ අයට සුදුසු විදියට තමයි මම උත්තර දෙන්නෙ........දන්නවානේ මම නීතිය හදාරපු කෙනෙක්.'' ඔහු මගේ ඉවසීමේ සීමාව නැත්තටම නැති කළේය. පෙනේද එයාගෙ කට.......!

''ඔහොම ඉන්නවා.......! මොනවද එක එක්කෙනාට එක එක උත්තර.......!''

'තාත්තා දන්නවා ඇතිනෙ........ ඒ කාලෙ තාත්තා පරක්කු වෙලා ඇවිත් අම්මට දීපු උත්තර........ ඒ වගේ තමයි''

මගේ ඉහමොළ රත්වෙලාය. ඌරගේ මාළු උගේ ඇඟේම තියා කපන්ට අපේ පුතා පටන් අරගෙනය. තාම මේ පටන් ගැනීම පමණක්ය.

සහද්‍රා මවෙත හෙලාපු බැල්ම මට ඇති කර වූයේ ලජ්ජාවකි. මා කරබාගෙන කාමරයට වැදුනේ ඒ නිසාය. සියොළඟම මහා ගින්නකින් දැවෙනවා සේය. ඒ ගින්න ඉහ මොළ දක්වා නැඟී එයි. ඒ ගින්නෙන් ස්නායු අණු පිලිස්සී යයි.

වයර් පිලිස්සෙන ගඳක් සේ දැනේ........ඇත්තටම මම රොබෝ මිනිහෙක්ද ? මා වැඩ කරන්නේ සූක්ෂම යන්ත්‍රයකින්ද? මට සිතක් නැද්ද? මට කයක් නැද්ද? මා පුරුෂ අංගුවක් පමණක්ද? එසේ නම් මට පාවෙලා හෝ යා හැක.

පසුදිනට නියමිත දහසක් වැඩ අමතක කර පුතාගේ යම් සම්බන්ධයක් ඇත්නම් ඒ ගැන සොයා බැලීමට යොදවන්ට ඉටාගතිමි.

*සයික් දිවාකර - දිනපොත*
*දිනය: 2008 ජූනි 08*



මම කාමරයට වැදුනේ හිතේ උපන් විශාල කළකිරීමකින්. මේ මහා කළකිරීම මගේ හිතට ඇතුළු වුණේ කවදා ඉඳන් දැයි මා දන්නේ නැත. මගේ යාලුවන් කියනා විදියට අපි ඉන්නේ සුර මැඳුරක! අපි විඳින්නේ සුර සැප! අපි හරිම වාසනාවන්තයි.

කෑම බීමෙන් හිඟයක් නෑ ඒනෑම කෑමක්, ඕනෑම බීමක් ඉතු සැණින් අත ළඟට ගෙන්න ගන්න පුළුවන්. ඕනෑම ඇඳුමක්, ඕනෑම මෝස්තරයක් අඳින්න පුළුවන්. ඒ නිදහසටත් වාරනයක් නෑ. ඕනෑම වෙලාවක නිදාගන්න පුළුවන්. ඕනෑම වෙලාවක අවදි වෙලා ඉන්නත් පුළුවන්.

ඒත් අපිට තියෙන ඒ භෞතික සැපත් එක්ක අධ්‍යාත්මයට සුවයක් ලැබුණද කියලා හිතෙනවා.

අම්මා හැම තිස්සෙම සෙවනැල්ල වගේ පසුපසින්ම ඉන්නවා. කෑවද පුතේ බීවද පුතේ....... නිදාගත්තවද පුතේ...... කිය කියා. ඒත් තාත්තා කෙනෙක් අපට හිටියෙ නෑ.

තාත්තා ගැන කතා කරන්නවත් අම්මා ඉඩ දුන්නේ නැහැ. අපේ පුංචි ලෝකෙට තාත්තා අපූරු සත්වයෙක් විදියටයි අම්මා හඳුන්වලා දීලා තිබුණේ.

අම්මා තාත්තා ගැන එච්චර පැහැදීමක් තිබුණෙ නැති විත්තිය තේරුණා. අම්මා හැම තිස්සෙම, තාත්තා ගැන තරහ හිතකින් හිතපු බව අපට තේරුණා. තාත්තා එක්ක මූණ දීලා කතා කළේ නැහැ. තාත්තාට කතා කරන්න ඕන වෙලා නැගී අඩන කොට අම්මා එයාව සැනසුවේ මොකක් හරි වෙන දෙයක් කියලා.

අම්මා එහෙම හැසිරුණේ ඇයි කියලා අපට ප්‍රශ්නයක් වුණා. නමුත් ටික ටික ලොකු වෙද්දී අවට අයගෙන් අපේ යාලුවන්ගෙන් ආරංචි වුණා එයාලගෙ ගෙවල්වල අය කතා වෙන දේවල් වලින් අපි දැනගත්තා තාත්තා සෙල්ලක්කාර ජීවිතයක් ගත කරන කෙනෙක් කියලා.

ඒත් ගෙදර වියදම් අපිට ඕන කරන හැම දෙයක්ම එන්නෙ තාත්තාගෙ සල්ලිවලින් බව අපට තේරුණා. තාත්තා අඩුවක් නැතුව අපිට සලකනවා. දවසක් මම බාත්රූම් එකේ ඉඳන් එළියට එනකොට එහා පැත්තෙ තාත්තා කාත් එක්ක හරි කතා කරනවා

ඇහුණා. අම්මා එක්ක නම් නොවන බව දැනගෙන හිටිය. ඒ නිසා පුංචිකමට කුතුහලය අවුස්සාගෙන අහගෙන හිටියා.

"බබාලට අයිස්ක්‍රීම් ඕනනම් අයිස්ක්‍රීම් ගේන්න සෝමම්මා කඩෙන්. කිසිම අඩුවක් කරන්න එපා කෑමෙන් බීමෙන් වත්, මොකකින්වත්. එයාලා මට ආදරේ වෙන්නෙ නැත්තෙ නෝනා මං ගැන එයාලගෙ හිතේ තරහ ඇති කරලා තියෙන නිසා.

මෙතන සල්ලි තියෙනවා සෝමම්මා ඕනෑම දෙයක් එයාලට අරගෙන දෙන්න......."

පුදුමයි ඒ කතා කළේ තාත්තා සෝමම්මා එක්ක. මට එදා තාත්තා ගැන දුක හිතුණා. දුවගෙන ගිහිල්ලා තාත්තාව බදාගෙන කරේ නගින්න තරමට හිතුණා.

"මං අද තාත්ති එක්ක කතා කරනවා. එයා එනකම් ඉඳලා......." අම්මට කිව්වාම අම්මා මා දිහා තරවටු බැල්මෙන් බැලුවේ.

"ඔයාලට මම ටයිම් ටේබල් හදල දීල තියෙන්නේ ඒ අනුව වැඩ කරන්න. රෑ වෙනකම් තාත්තා එනකම් ඉඳලා නිදියන්න ගියොත් ඔයාලට ඉස්කෝලෙ යන්නත් බැරිවෙයි වෙලාවට. ඒ නිසා මං කියන විදියට කරන්නෝන."

අම්මා එහෙම කීවම අපිට ඊට ඉහළින් දෙයක් කරන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. මොකද කොයි වෙලාවෙත් ඉස්කෝලෙ ඇරිලා ආවට පස්සෙ අපේ ඇස්මායිමේ හිටියෙ අම්මා. අනෙක දන්න කාලෙ හිටන් අම්මා නිදාගත්තෙ අපි දෙන්නගෙ කාමරේමයි.

අම්මයි නංගියි එක ඇඳක. මං එක ඇඳක. ආයෙ තව ටිකක් ලොකු කාලෙ වෙද්දි මට ගෑනු කාමරේක ඉන්න බෑ කියල මට කිව්වම අම්මා හිනාවෙලා මට වෙනම කාමරයක් හදලා දුන්නා.

තාත්තා ගැන අහපු මඩ ප්‍රචාර සමහරවිට තාත්තාගේ බිස්නස් දියුණුවට ඊරිසියා අය පතුරන කතා වෙන්නත් බැරි නැහැ කියලා මාමා කෙනෙක් ඇවිත් අම්මා එක්ක කියනවා මං අහගෙන. ඒත් අම්මා කවමදාවත් ඒවා පිළිගත්තෙ නෑ. අම්මා කාත් එක්ක හරි එකතුවෙලා තාත්තට බණිනවා ඒත් මං කවදාවත්



අහල නෑ. මට අම්මා ගැන ගෞරවයක් ඇතිවුණේ ඒවයින්.

මට මගේ නිදහස ඕනෙ කාලේ ඇවිත්. මම මොකටද හිර කූඩුවක ඉන්නේ. යොවුන් වයස සමනල වයසක්ලු. සමනලයො ගමනේදි මගේ හිත ගියා කෙනෙකුට. පුදුමාකාර විදියට. ඒ වලක්වන්න සක්කරයටවත් බෑ.......! ඇ කවුද මම දන්නෙ නෑ. මාත් එක්ක ගොඩාක් යාලුවුණ අමන්ත. අමන්ත දවසක් මාව එක්කරං ගියා දිව්‍යලෝකෙකට....... එයා කොලේජ් එකේ පරණ යාලුවෙක්.

ඒක අමුතුම ලෝකයක්. දවස් ගාණක්ම මග තොටදී දැක්ක 'ගර්ල්' එතන ඉන්නවා. දැකලා මට පුදුම හිතුණා. ඈ හරියට විදුලිය වගේ. අයියෝ එහෙම නැට්ල්ලක්...!

මම අමන්තට කිව්ව එයාව මට අඳුන්නලා දෙන්න කියලා. අපි එකිනෙකා මූණට මූණ හමුවුණේ එතකොට. දෙවියනේ මං මෙච්චර කාලයක් හිටියෙ මේ ලෝකෙද? මම මොනවද කළේ? ඒ කිසිම දෙයක් මට මතක නෑ. මම ගල් ගැහුණා විතරයි. පිච්චි පිච්චි තිබුණු මගේ හිත සීතල කුටීරයකට ඇතුල්වුණා වගේ.

*බිමල් උදාකර - දිනපොත*

*දිනය: 2008 ජූනි 02*

මගේ පුතා ගැන මට ඇතිවෙලා තියෙන්නෙ පුදුමාකාර බයක්. එයාගෙ කේන්දරේ බැලුවාම දැනට සති දෙක තුනකට කලින්, කියලා තිබුණා සෙනසුරු ඒරාෂ්ටකයක් කියලා.

හැකි හැම වෙලාවකම මම දරුවො දෙන්නත් කතාකරගෙන ගියා බෝධි පූජාවට. දූ නම් කොහෙත්ම කැමති නෑ පන්සල් යන්න. එයාට තාත්තගෙ ආරෙ කියලත් හිතෙනවා. පන්සල් යාමත්, මල් පහන් පූජා කිරීමත් බුදුන් වැඳීමත් මොනවත් එයාගෙ නෑ. ලොකු ලොකු ඉස්කෝලවලට දාලා ඉගැන්නුවාට වැඩක් නෑ ධර්මඥානය යම්තමටවත් නැත්නම්. කාට කියන්නද? සෝමම්මා එක්ක මගේ වැඩේ මේවා ගැන කියවන එක විතරයි.

සෝමම්මා දන්නවා අපේ පවුල්වල තියෙන ප්‍රශ්න. මොන සැප තිබුණත් මම ඉන්නේ හිතේ දුකින් බව. සෝමම්මා දන්නවා

කවදාවත්ම විවාහ ජීවිතයක් ගැන අත්දැකීම නැති සෝමම්මා හිතින් හිතනවා ඇති ඒ තනිකඩ ජීවිතේ මොන තරම් සැපක්ද කියලා.

වයසට යනකොට ලෙඩට දුකට තනියට බලන්න කෙනෙක් නැතිකම ඇරෙන්න ඒකෙ ඇති දෙයක් නෑ.

පුතා හරිම කීකරු දරුවෙක්. නිවිච්ච දරුවෙක්. මට උන්හිටි ගමන් දරාගන්න බෑ එයාගෙ මුරණ්ඩු හැසිරීම්. තාත්තා ගැන නොයෙක් දේවල් කොලෙප් එකේදි ආරංචි වුණාම එයා ගෙදර එන්නෙ යකා වගේ. ඒත් පස්සෙ පස්සෙ එයාටම තේරුම් ගියා ඒවාට මට පලිගහලා වැඩක් නෑ කියන එක.

"අම්මා ඕවට කතාකරන්න. කර බාගෙන ඉන්න එපා. ඔය කර නොගෙන හිටපු නිසා තමයි තාත්තා මෙච්චර දුවන්නෙ. මුලින්ම ඕක විසඳාගත්තා නම් හරි." දුවත් මට කියන්න ගත්තා.

ගෙදරට එන එක එක කෝල්වලට උත්තර දෙන්න ගිහින් මගේ ඔලුව පිස්සු හැදිලා මොන තරම් අසීරුවෙන්ද මම හිටියෙ. ඉස්කෝලෙ උගන්නන එක නිසා විතරයි මානසිකව සැහැසිල්ලක් ලැබුණෙ. සගීත්ගෙ කල්කිරියාවල් නිසා කළකිරිච්ච මගේ හිත දවසින් දවසම වෙලිලා කරවෙච්ච පරඬැලක් වාගේ වුණා. ජීවිතේ සතුටක් කියලා කිසිම දෙයක් තිබුණෙ නෑ. දරුවො දෙන්න ලොකු මහත් වෙනකොට තමා මගේ හිත ටිකක්වත් සැහැසිල්ලක් ලැබුණෙ. දුවට වඩා පුතා ගතිගුණ අතින් හරි වාසනාවන්ත දරුවෙක්. හුඟක් වෙලාවට එයා තාත්තා නිසා පෑරිලා තියෙන මගේ හිත හදන්න උත්සාහ කළා.

උසස් පෙළ සමත් වෙලා ඉද්දිදි සගීත් තමයි පුතාට බැංකුවෙ රස්සාව අල්ලලා දුන්නෙ.

"තාත්තා නිසා අපට සමාජයෙන් සිද්ධ වෙන ලජ්ජාවල් ගැන පසුතැවෙන්නෙ නැතිව අම්මෙ ඇයි එයා අපි වෙනුවෙන් යුතුකම් ඉටු කරනව නේද කියලාවත් අඩුගානෙ සැනසෙමු අම්මෙ. නිතරම එයා ගැන ක්‍රෝධයෙන් වෛරයෙන් හිත හිතා ඉන්න එපා. එයාට උනත් මෛත්‍රී කරන්න අම්මා. එතකොට එයාට ඔය අනිසි ජීවිතයෙන් මිදිලා හොඳින් ජීවත් වෙන්න



සොවක් පෑදේවි. එයා පෙර කරපු කර්මයක විපාකයක් අම්මා ඔය. ඒකයි ඔය වගේ කල්කිරියාවල් ඇතිවෙන්නෙ. ඒ වෙනුවෙන් ගැලවෙන්න අම්මට පුළුවන් එයාට උදව් කරන්න.

කවදාවත් එයාව පටලම තල්ලු කරන්නෙ නැතුව අම්මා අම්මගෙ චිත්ත බලෙන් එයාව ගොඩගන්න උත්සාහ කරන්න අම්මෙ."

දවසක් දාක පුතා මගේ කාමරේට ඇවිත් ඇඳ උඩ වාඩිවෙලා සිව්වේ හරියට බණක් කියනවා වගේ.එවෙලෙ දුව හොඳටම නිදි. මම සගීත් සම්බන්ධ කවුද ගෑනියෙකුගෙ කෝල් එකක් ඇවිත් හොඳටම ඔලුව හරක් වෙලා අඩ අඩා ඉද්දිදි තමා පුතා ඇවිත් ඒ විදියට මාව සැනසෙව්වෙ.

ඇත්තටම හාමුදුරු නමක් දේශනා කරපු බණක් වගේ මගේ හිතේ පතුලටම පුතා කී දේ කා වැදුණා.

එදා ඉඳන් තමා මම සගීත් ගැන තිබුණ මගේ මානසික ප්‍රතික්ෂේපයේ ආතතිය දුරු කරගත්තේ. එයා දක්කාම එයාගෙ මූණ දිහා එක කඳුරු විදියට බලන එක මගේ නැතිවුණා එදා ඉඳන්. ඇත්තටම මට මහා මානසික සුවයක් දැනෙන්න ගත්තා.

සගීත්ට ඒ සියලුම පෙර පව් වලින් අත් මිදෙන්න පුළුවන් වේවා කියන ප්‍රාර්ථනය මම මගේ සිතේ පදිංචි කෙරෙව්වා. එදා මට හිතුණෙ මේ මගේ පුතා නෙමෙයි මගේ තාත්තා කියලා දණ ගහලා වඳින්න තරම් හිතුණා. මට හරිම ලෙංගතු හිතුණා පුතා ගැන. අනේ මේ කර අඩු උස් මහත් වෙලා මට ඇද උඩ බලලා මූණ බලන්න වෙලා තියෙන මේ දරුවා ඊයෙ පෙරේදා මගේ අතේ නැළවෙච්ච පුංචි කොලුපැටියා නේද කියලා පුදුම ආදරයක් මට ඇතිවුණා. සමහර වෙලාවට එයා තාත්තා ඉදිරියේදී දඩබ්බර විදියට හැසිරුණාට තාත්තා එක්ක ගෙදරදී ටිකක් මූණ දීලා කතා කරන්න පුරුදු වුණා. දුවත් ඒ විදියට ටික ටික නැඹුරු වුණා. ඒ විදියට මගේ හිත හදන්නත් විශාල ශක්තියක් ලැබුණා. ඒ විදියට මගේ හිත හදන්නත් විශාල ශක්තියක් ගැහුණා. ඒ විදියට මට ඇතෙක් වගේ හිටිය මගේ පුතාගේ මේ අලුත් හැසිරීම මට හරිම මානසික වදයක්.

අනේ මගේ රත්තරන් පුතේ ඇයි මයාට 'පරණ හිටපු හොඳ පුතා' වෙන්න බැරි.......

[illegible]
[illegible]

වැඩපලවල්වලට ගිහින් ඒවායේ වැඩ ටිකක් බලාකියාගෙන මම රාජකාරියෙන් මිදිලා කලින් ගෙදර ආවෙ මනෝජ් අලුතින් කරන්න යන නාට්‍යය පිටපත කියවලා බලන්නත් එක්ක.

කාමරයට වැදිලා ඉන්නෙ නැතිව පැති ආලින්දය කෙළවර පුටුවට ආවෙ පරිසරයත් විඳිමින් ඒ කාරියෙ නිරත වෙන්නයි.

"අම්මෙ මේ....... ඔන්න මම නොකිව්වයි කියන්න එපා ඔන්න....... තාත්තට කියන්න මගේ වැඩ ගැන සොයන්න එක එක වර පුරුෂයො එවන්න එපා කියලා හරිද ?"

මම දැන් පොඩි ළමයෙක් නෙමෙයි. පොත්ත බඩෙක් නෙවෙයි. රස්සාවක් කරන උගත් කමක් තියෙන, ලොකු මිනිහෙක්...! මටය කියල මගේ නිදහසක් තියෙන්න ඕනෑ. සමාජෙට බැහැලා මම මිනිස්සු ආස්සරේ කරන්න ඕනෑ. ඇයි මට ඒකට ඉඩක් නැත්තෙ ......."

"මොකද මොකද ළමයා මේ කෑ ගහන්නේ....... ඇයි මෙ....... ඔයාට පුතේ දැන් නම හරිම අපල කාලයක් ලබලා තියෙන්නේ......."

සහද්‍රාගේ හඬ පුතාගේ හඬත් සමගම මට ඇසෙයි.

"අපල කාලයක්.......? නෑ අම්මෙ දැන් තමයි මගේ අපල කාලෙ ගෙවෙන්න ගත්තෙ දන්නවද ? මෙච්චර කාලයක් තිස්සෙ වැටිල තිබ්බව මහා අපල බන්ධනයෙන් මිදෙන්නයි අම්මෙ මම යන්නෙ. අම්මා සතුටු වෙන්න ඒකට! ඒත් තාත්තට කියන්න මා ගැන හොයා බලන්න එක එකා එවලා මාව පාච්චල් කරන්න යන්න එපා කියලා....... මම ඔය මදි පුංචි කම් ඉවසන මිනිහෙක් නෙවෙයි. අම්මා වගේ බාල්දු වෙවී ඉන්න මට බෑ. මම කතා කරන්නෙ ෆේස් ටු ෆේස්....... මගේ නෑනෙ ඔය හැංගි හොරා වැඩ......."

බිමල් පුතා ගුගුරමින් පැති ආලින්දය පැත්තට ආවේ මා එතන ඉන්නවා දැකලා බව මට තේරුණා. කියවමින් සිටි පිටපතෙන් මොහොතක් දෑස් ඉවත් කළ මට පෙනුණේ අදහා ගන්නට බැරි භීෂණයෙන් සිටි පුතාය!

ඔහුගේ කම්සය ඉණෙන් එළියට ඇවිත් ඇත. කොලරය



හරියට කවුරුන් හෝ ඇද ඇලා වගේය. හිසේ කෙස් කෙළින් වෙලා වගේ පෙනෙන තරමට මුහුණ බියකරු වෙලාය.

මුහුණ දෙපසම ඩහදියෙන් තෙත් වෙලා දිළිසෙයි. ඔහු පැමිණ ඇත්තේ බීමතින්ද ? මගේ සිත ගැස්සුණි.

පසෙකට වී සහද්‍රා හඬනවා පෙනුණි. මම වහා නැඟී සිටියෙමි.

"පුතා.......!"

ඔහු මදක් හැරී බැලුවේය. සිංහබාහු නාට්‍යයේ සිංහයා සමඟ සටනට එන සිංහබාහු සේ ඔහු මදෙස බැලුවේය.

"මොකද මේ ගෝරනාඩුව....... පුතා....... ලැජ්ජා නැද්ද කෑ ගහන්න අවට ගෙවල්වල මිනිස්සු ඉන්නව නේද ?"

"හා....... තාත්තෙ ....... ඔයාට දැන්ද මතක් වෙන්නෙ....... අවට ගෙවල්වල මිනිස්සු ඉන්නවා කියලා? ඒ විතරක්ද ඒ මිනිස්සුන්ට කන් තියෙනවා කියලා....... ඒ මදිවට ඒ මිනිස්සුන්ට ඇසුත් තියෙනවා කියලා....... ඈ? හා හා....... හා....... එයාලට කටවලුත් තියෙන්නෙ.......?"

'ඔයා හිතනවාද තාත්තෙ ඔයා කියපු කරපු දේවල් වලට එයාලා ඒ ඔක්කොම වහගෙන හිටියා කියලා....... හා....... ඒකට කමක් නෑ මා ගැන සොයන්න එක එක හාල්පාරුවො එවලා මට ලජ්ජා කරන්න එපා තාත්තෙ ....... මම කිරි බොන කොලු පැටියෙක් නෙමෙයි......."

ඔහු එසේ කියා යන්නට ගියේ තමන්ගේ කාමරයට වන්නට ඇත. ඒ නිසා මට යමක් කියන්නට ලැබුණේ නැත. අනික ඔහු සිටින්නේ බීමතින් නම් ඔහුට දැන් කතා කර පලක් නැත

මොහොතකින් මා වෙතට ආවේ සහද්‍රාය. ඈ හොඳටම කැළඹිලාය. .දෑස් බියපත් වෙලාය.

"පුතා බීලා කවදාවත් නැතිව....... දෙයියනේ....... අනේ මට මගේ පුතා බේරල දෙන්න.....!'

"කලබල වෙන්න එපා. මම පස්සෙ කතා කරන්නම් එයාට. එයාගෙ වැඩේ ගැන හොයන්න එක යවලා තියෙන්නෙ. එයාට ඕන ඕන විදිහට මඩේ එරෙන්න දෙන්න බැහැ......"

සහද්‍රා, කඳුළු පිසිමින් ගෙතුලට යන්නේ කිසිත් නොකියමිනි.

සහද්‍රා දුකෙන් කැළඹිලාය. එය එසේ වීම අරුමයක් ඇත්තටම නොවේ. පුතා යනු ඇගේ ජීවිතයමය. ඈ මට වඩා ආදරය කළේද ආදරය කරන්නේද පුතාට බව මම දන්නෙමි. ඇගේ සිත බිඳිලාය. ඒ බිඳ වැටීම සුලු පටු බිඳ වැටීමක් නොවේ.

මම කාමරයට වැදුනේ කවදාවත්ම නැති බරක් මගේ හිස මත තබාගෙනය.

සශික් උදාකර - දින පොත
දිනය:........

දවසින් දවසම පුතාගෙයි මගෙයි ඈත්වීම සිද්ධ වීගෙන යනවා කියලා මට හිතෙනවා. දුවත් කැම්පස් එකට තේරුණා. සශිකුත් ඉතින් රාජකාරියට යනවා. අනිත් වෙලාවල කරන්නෙ කාමරයට වැදිගෙන ඉන්න එක. මට හරි පාළුවක් දැනෙනවා. හරියට මගේ අතක් පයක් කැඩුණ වගේ. ඇයි මට මෙහෙම වෙන්නෙ. කවදාහරි පුතා මගෙන් වෙන් වෙලා යන යථාර්ථය මට තේරුම ගන්න බැරි කමද ? මගේ ඒ අධි තෘෂ්ණාව මට පාලනය කරගන්න බැරි කමද මේ ඔක්කොටම මුල !

සශික් එක දිගටම පුතාගෙ සම්බන්ධයක් තියේද කියන එක හොයා බලනවා. ඒ නිසාම තමයි පුතා හරි තරහින් ඉන්නෙ. හැමදාම ඇවිත් තාත්තට ඇණුම්පද කියන එක තමා එයාගෙ වැඩේ. මට නම් මේ සිංහබාහු හටන එපා වෙලා. දුවත් බොහෝ වෙලාවකට කරන්නෙ මාත් එක්ක රණ්ඩු වෙන එක. එයාගෙ නපුරු ගති කොහෙන් මතු වුණාද මන්දා........ දුව නම් එයාගෙ නපුරු දුෂ්ට ගති වලටම ඇරිලා! මගේ හිත නතර වෙන්නේ පුතා ළඟ විතරමයි. පුතා මට ඉන්නවා නම් මට සශික් ඕනත් නැහැ. දුව ඕනත් නැති තරම්. එහෙම හිතන එක හොඳ මදි තමා ඒත් මම දන්නෙ නෑ මට හිතෙන විදිය හරිද කියලා.

කොහොම වුණත් සශික්ට අද දැනගන්න ලැබෙයි පුතාගෙ මේ විපර්යාසෙ මොකක්ද කියලා. එක අතකට දූන් ඉතින් පුතා කසාදයක් කරගන්න ඕන කාලෙ ඉස්සරහට එන්නෙ. එතකොටත්



මට වෙන්වෙන්න වෙනවා නේද කියලා හිතෙනකොට ඒක දුක නම් වාවාගන්න ටිකක් අමාරු වෙනවා. මොකද පුතා විතරයි හරියට මාව තේරුම් ගන්න කෙනෙක් හැටියට මම සලකන්නෙ. දුවවත් හරිහැටි කරුණාවන්තව හිතන අසත්පුරුෂ ගති නැති කෙනෙක් වුනා නම්, මට මේවා මේ තරමට දැනෙන එකක් නැහැ. කොයි වෙලෙත් එල්ලි එල්ලී හිතට වද දෙන දෙයක් වගේ කටුවක් වගේම එල්ලී දුක් දෙන හැඟීම්වලින් මිදිලා මම කවදද හිත එකලාසයක් කරගෙන ජීවත් වෙන්නේ කියන එක හිතා බලන්න ඕන දෙයක්.

පුතා උදේන්ම ගෙදරින් ගියෙත් ඒ තරමට හිත හොඳකින් නෙමෙයි. තාත්ත එක්ක තියෙන සිංහබාහු හටන මා දක්වාත් පැතිරෙනවා වගේ. බත් එක බැඳලා අතට දුන්නම හිනාවෙලා 'පින්සිදු වේවා' කියලා විහිළු කරන පුතා දැන් කියන්නේ ''එහෙම තියන්න අම්මා මම ගන්නම්'' කියලා විතරයි. ඒ මදිවට කඩිමුඩියේ 'අද නම් පරක්කු වෙලා අම්මා' කියලා ෆෝන් එකත් කණේ ගහගෙන දුවනවා මිසක් වෙනදා වගේ වැඳලාවත් යන්නේ නැහැ. ඒ වගේ පුංචි පුංචි දේවල් වලින් හිත පාරාගන්න කොට හිත පාරාගන්න ඇත්තටම ඕනෑ දෙයක් ආවොත් නොදැනෙන තරමටම හිත නිර්වින්දනය වෙයි කියලා මට හිතෙනවා.

සහද්‍රා මුතුමාල - දින පොත
දිනය: 2008 ජූනි 04

දුව එක්ක ඉන්ටර්විව් එකකට යන්න වුණේ බම්බලපිටිය පැත්තෙ ඔෆිස් එකකට. ඒ ගමන යන්න වුනේ අපේ ගෙදර වාහනේකින්. එකපාරටම දුව බඩගිනියි කිව්ව නිසා නිකමට නතර කළා ජයසරා කැෆේ එක ළඟ.

මම එනකොට දැක්ක දර්ශනයෙන් මාව උඩ විසි වෙලා බිම වැටුණා. සශික් පේමන්ට් එක දිගේ ඇවිදගෙන ගියේ හරියටම කාගෙ හරි ඔත්තුවක් හොයන්න වගේ. මට වාහනෙ ඇතුළෙ කලුකළ වීදුරුවෙන් බලාගෙන හිටිය මේ ඇත්තටම ඉස්සර හිටිය සශික්මද කියලා. කනාව ඇත්ත. සශික් වයසට ගිහිල්ලත්

නෑ. අපි ඉපදිලා ඉන්නව හරියට වයසට යන්නම වගේ. සශික්ලා
වගේ අය දැක්කම වයසත් පැනලා යනව වගේ.

මොකක්දෝ ලොකු මුවමනාවකට එයා මූණත් බැරෑරුම්
කරගෙන ගියේ. මම ඉක්මනටම වාහනේ දොර ඇරගෙන
කහින්න වගේ අභිනයක් පෑවා. එයා බලයි කියලා. මොන.......
පාරේ ගිය අනිත් අය කිප දෙනෙක්ම බැලුවා සශික් උපාසක
උන්නැහේ නෙමෙයි ඇහැක්වත් ඇරලා බැලුවේ. දූන් එයා
ගෑනු දිහා බලන්නෙ නැතුව ඇති. ගෑනි එයාව ගානට හදාගෙන
ඇති. නහය විදලා කණ අඹරවලා නළලට තොත්තුවක් දූන්නාම
ඉතිං ගෑනියෙකුට පුළුවන් පිම්පිරියෙකුගෙ සර්වාංගයම සලිත
කරවන්න.

අනේ අනේ සශික් ඔයාට ගිය කල්! කොරවක්කෙක් වගේ
බෙල්ල ඉස්සර කර අඩියෙන් අඩිය බර කරමින් ගිය කොරවක්
ගමනට මට නම් හිනා.

'හෙලෝ.......''මම එහෙම කිව්වෙ එයාගෙ අවධානයවත්
මා දිහාට යොමුකරවා ගන්න. මොන හැරිලාවත් බැලුවේ නැහැ.
දූන් නම් මට ආයෙත් හිතෙනවා එයාගෙ පස්සෙන් වැටීගෙන
යන්න. ලජ්ජාවක් ගැන මං මොකට හිතනවද ? කෙස් පැහිලත්
ලව් කරනවා කියලා දැක්ක කෙනෙකුට හිත ඉරිසියා කරවාගන්න
දෙන්නත් හිතට ආසාවක් තියෙනවා.

දූන් මම ගත කරන්නෙ හරිම අබබ්බ ජීවිතයක්නෙ. දුව -
සශික් ගෙ දුව - සඳලිගෙ අනාගතයම මගේ අනාගතය කියල
නේ මම හිතාගෙන ඉන්නේ. ගිම්හාන් එයාගෙ සුපුරුදු තනිකඩ
ජීවිතේ ගත කරනවා. මට ඉතිං සදාකාලයටම තනි යහනේම
තමයි.

සඳලිගෙ සර් එක්ක පුංචි පහේ මානසික බැඳීමක් ඇති
කරගත්තත් ඒක අධ්‍යාත්මික තත්වෙට ආවේ නෑ. මොකද අපි
කොච්චර උත්සාහ කළත් උගුරට හොරා බේත් කන්න අපේ හිත්
කැමති නැති නිසා.

මගේ අධ්‍යාත්මයේ කොණක තාමත් සශික් වැඩ ඉන්නා
නිසා වෙන්න ඇති. වෙන කෙනෙක් දිහා නෙවේ වෙනකෙනෙක්
කෙරේ බලන්න වත් ඇලෙන්නවත් බැරි.

දීග දෙන වයසෙ දරුවොත් ඉඳිද්දී මේ මොන විකාර



නහාද කියලා කෙනෙක් සිතාවි. නමුත් සමහරක් ගෑනුන්ට වගේ
එක්කොම ගෑනුන්ට ප්‍රේමාසක්ත හැඟීම් එකවරම විනිර්මුක්ත
කරලා දාන්න බෑ. කලාතුරකින්වත් මම වගේ ගෑනියෙකුත්
ඉන්නවා. හිතේ ඔය කියන පෙම්බරිත බව හිඳිලා යන්නේ නැති.
තවේ කෙළ හිඳෙනවා වගේ ආදරේ හින්ද ගන්න පුළුවන්ද මං
අහන්නෙ. අර සර් කාරයාට මගේ හිතේ අධ්‍යාත්මික කියලා
බැඳීමක් වත් ඇති වෙනවා නම් හොඳයි කියලා මට හිතුනේ
කාරණා කීපයක් ඇතිව.

මොකද මං ටිකක් සර් ගැන උනන්දු වෙනකොට
ගිම්හාන්ගෙ අම්මත් මං ගැන උනන්දු වෙනවා. එයාගෙ රබර්
ඇස් උදෙන්ම අවදි වෙනවා. එයාගෙ චරියාවල් දැකලා හිත යටින්
හිනාවෙන්න පුළුවන් කියලා හිතුණා. ඔහේ නිකන් ඉන්න එකේ
එහෙමවත් මානසික සතුටක් විඳින්න හිතෙන එක මනුස්ස කම
නේ. නැත්තං ඉතිං අපි සත්තු නේ.

ගිම්හාන්ලා වගේ අය ධනයෙන් තත්වයෙන් බලයෙන්
සතුටු වෙනවා. ගෙවල්වල ගෑනු යකාට ගියත් උන්ට ගානක්
නෑ. හුඟාක් පිරිමි මධුසමය වෙනකම් විතරයි පිරිමියෙක් විදියට
ඉන්නේ කියලා මට කිව්වේ මගේ පරණ යාලුවෙක් උමයංග
නා. උමයංගනා ගෙ හස්බන්ඩ්ට ඊශ්වරයා කියලා ස්ටාෆ් එකේ
අනෙක් අය විහිළු කරනකොට උමාට හරිම කේන්තියි. දවසක්
මම පුද්ගලිකව එයාගෙන් ඇහුවාම ඒකට හේතුව එතකොට
තමයි එයා අර අපභ්‍රංශෙ කිව්වේ.

එදා මට තේරුණා මට විතරක් නෙමෙ මේ ප්‍රශ්නෙ
හැමෝටම තියෙනවා කියලා. හැම ගෑනියෙක්ම සතුටින් නෑ
කියන එක දූන්නම් මම හොඳාකාරවම දන්නවා.

පිරිමි නම් ගෙදරින් නොලැබෙන දෙයක් කොහේදී හරි
මොන විදියෙන් හරි ලබාගන්නවා. ගෑනු අර දුකේම පැහී
පැහී ඉඳලා බූරු දෙන්නු වගේ වලපල්ලට යනවා. ඕක තමා
ගෑනුන්ගෙයි පිරිමින්ගෙයි අතරෙ වෙනස. කලාතුරකින් අඹු
සැමියො දෙන්නෙක් තමා ගෘහ ජීවිතේ රසය ඇත්තටම භුක්ති
විඳින්නේ.

වාහනේ එක තැනක නවත්තලා පණ යනකං හොය හොයා ඔය සගික් දිවිවෙන් ඒ වගේ සතුටක් විඳින්න වෙන්න ඇති. මං එහෙම හිත හිතා ඉන්න කොට ආයෙත් මට සගික්ව පෙනුණා. එතකොටම ඩ්‍රයිවර් කෑම අරගෙන ආවා. දුව හිටියෙ මොකක්ද නවල් එකක් කියවමින් නිසා එයා දන්නෙ නෑ සිතින් මම මොන තරම් දිසාවල්වල ගියාද කියලාවත්.

මොකෝ අර රාහුල කුමාරයට යසෝදරාව කිව්වා වගේ 'ඒසහි තුසිහජ්තා නරසීහෝ' කියලා සඳලිව සගික්ගෙ පස්සෙන් යවන්නයැ.

''මොකද අම්මෙ කලබල වෙච්ච ගමන් ?'' සඳලි ඇහුවෙ මගේ කැළඹිල්ල දකලා.

''නෑ දුවේ මේ යන එන සෙනඟ ගොඩේ මම දන්නා මගේ ස්ටාෆ් යාලුවෙක් වගේ කෙනෙක් පාස් වෙනවා. මගේ ස්ටාෆ් හිටපු හොඳම යාලුවෙක්.''

''ඉතිං අම්මෙ යන්නකො....... ටිකක් ගිහිල්ලා කතා කරලා එන්නකො.......''

දෙයියනේ මං බය වෙච්ච බයවිල්ලක්. යසට තියෙයි. එයාට කතා කරන්න ගිහිල්ලා සවුත්තු වෙන්න වුණොත්.

''ඔන්න ඔහෙ ඕන නෑ'' කියලා මම ඩ්‍රයිවර් ගෙනාපු කෑම පාර්සල් ලිහා ගත්තෙ 'හා යං අපි' කියලා එයාට කියන ගමන්.

මට එක දිගටම ගෙදර ඇවිල්ලත් සගික්ගෙ ගැන මතක් වුණා. ඇයි දෙයියනේ මට එයාව පෙන්නුම් කළේ. අර තරම් සෙනඟක් අස්සෙ වුණත් මට එයාව පේන්න තරම් මගේ ඇස් තියුණු වුණේ කොහොමද මමවත් දන්නෙ නෑ. ඒවා තමයි දෛවය දෙන දඬුවම්! දෛව දඬුවම්! සගික් ඔය ආයෙත් ගෑනියෙක් පස්සෙන් වෙන්න ඇති පන්නාගෙන ගියෙ. ඔන්න බලන්න මූනෙ ලස්සන තාමත් එහෙමමයි. කොච්චර හිත කැත වුණත්.......!

*මනෝරමා නාගසේන - දිනපොත*

*දිනය: 2008 ජුනි 05*



දෙවියනේ හොයාගෙන හොයාගෙන ගිහිල්ලා හතර වැනි දවසෙ තමයි මට හරිම හෝඩුවාව දැනගන්න ලැබුණේ. බැංකුවෙන් හතරට පිටත් වෙන බිමල් යන්නෙ යාලුවකුගේ බෝඩිමට. එතැනදි නාලා ඇඳුම් මාරු කරගෙන ඒ යාලුවාගෙ වාහනයෙන්ම යන්නෙ ක්ලබ් එකට.

එයා යාලුවෙලා ඉන්නෙ ක්ලබ් එකට එන ගර්ල් කෙනෙක් එක්කය කියලා දැනගත්තාම මගෙ හිත නොසන්සුන් වුණා. ඒක මට අන්දකීමෙන්ම ලැබිච්ච දේවල් උඩ ඇතිවෙච්ච සිතිවිල්ලක්. ඊළඟට මට දැනගන්න ඕන වුණේ ඒ ගර්ල් කවුද කියන එක. ලොකු සල්ලිකාර පවුලක සෙල්ලක්කාර ළමයෙක් කොහොමටවත් අපිට ගැලපෙන්නෙ නෑ කියලා සහද්‍රා කියාවි. එයා කෑ ගහවි.

'කවුරුහරි උරවත්‍රමාලයක් පුතාගෙ කරේ එල්ලෙයිද බයයි.' එහෙම කිය කියා ඉන්න සහද්‍රා හොඳටම කලබල වේවි කියලා මට හිතුණා. මගේ යාලුවෙක් කොහොම හරි එයාගෙ හිතවත් කෙනෙක්ගෙ මාර්ගයෙන් මගේ පුතාගෙ ගර්ල් ෆ්‍රෙන්ඩ් කවුද කියල හොයාගෙන තිබුණා.'

ලෝකය රවුම්ද කියලා මට හිතුණා! රතු පාට රවුම් රවුම් ගිනි බෝල මගේ ඇස් වලින් පිටවුණු නිසා. මහ පොළව හැම තැනම ඩෝං ගාලා පිපිරුණා කියලා මට හිතුණා. මගේ හිත සීසී කඩ පපුරලා ගිය නිසා!

ජීවිතේ හරිම ගින්දරක් කියලා මට හිතුණා. මගේ හිතෙයි ඇඟෙයි පුරාම ගිනිජාලාවක් වෙලිලා ගිය නිසා! මොබයිල් එකකට අරගෙන සමරේ ඒ කෙල්ලගෙ පිංතූරේ මට ගෙනැවිත් පෙන්නුවා!

දෙයියනේ ඒ වෙන කවුරුවත් නෙමේ නිරූපා! දුලාප්ලා දැන් මාස කීපෙකට කලින් මට හොයලා ගෙනත් දුන්නු වංශ එක්ක බලනකොකට ඒ නිසලාගේ දුව.ඒ කියන්නේ මට ආව නිසලාට උපන් දුව!

ලෝකෙ කොතනින් කඩා වැටුණද කියලා මට හිතාගන්න බැරි වුණා. පිස්සෙක් වගේ මම ඔලුව ගහගත්තෙ මේසෙට. මගේ යාලුවොත් බය වුණා. එයාලා හිතුවෙ මම අප්සට් යන්න ඇත්තේ

ටික කලකටක පෙර මට ඉන්ටරෙස්ටඩ් වෙලා හිටපු ගර්ල් එයා නිසා කියලා. ඒත් කටක් ඇරලා කොහොම කියන්නද මේකෙ තියෙන රහස....... මම ගෙදර ආවෙ යකෙක් වගේ

මගේ කාමරේ දොර වහගෙන මට පැයක් විතර ඉන්න වුණා. කැරකිලා කැරකිලා නතර වුණාම කන් දෙක ඇතුලෙන් හෝ හෝ ගගා කැරකෙනවා වගේ මට පුදුම අපහසුතාවයක් ඇවේ. සහද්‍රා ඇවිත් හත්වෙනි පාරටත් දොරට ගහනකොටයි මම දොර ඇරියේ.

"ඔයා හොයාගත්තද පුතා ගැන.......?"

ඇය ඇහුවෙ කටහඬ වෙව්ලමින් අඬලද කොහෙද. ඇස් රතුවෙලා තියෙනවා මට හදිසියට දූක්කෙ සැහෙන කාලෙකට පස්සෙ මම මගේ බිරිඳගෙ ඇස් දිහා කෙලින් බැලුවෙ......."

"පුතා යාලුවෙලා ඉන්නවා ක්ලබ් ගර්ල් කෙනෙක් එක්ක...... ඒකට මට කොහෙත්ම ඉඩ දෙන්න බෑ !"

මං කෑගැහුවෙ අඩි පොළොවේ ගසමින්. සහද්‍රා කෑගැසුවා...... බයටද තරහටද දුකටද මං දන්නෙ නෑ.

ඊට පස්සෙ අපි දෙන්නම ටික වෙලාවක් නිශ්ශබ්දයි. ඒ නිහඬ බව තුළ අපි යුද්ධෙට අවශ්‍ය ආයුධ එක්රැස් කරගත්තා. ආයුධ එකතු කළේ අපි දෙන්නා අතරෙ සටනකට නෙවෙයි. පුතාගෙ සම්බන්ධෙට විරුද්ධව අපි දෙන්නම ඒකපාක්ෂික වෙච්ච අවස්ථාවක්.

"කීයටවත් මට කැමතිවෙන්න බෑ පුතා මේ වගේ ගෑනියෙක් බඳිනවට. මම වහ ටිකක් කාලා මැරෙනවා. විළිසංගෙ නැති ගෑනියෙක් බැඳලා මගේ කොල්ලා විනාශ වෙන්න මට ඉඩ දෙන්න බෑ......."

සහද්‍රා මන්තරයක් සේ මතුරන ඒ ජපකිරිල්ල මගේ හිත ඇතුළේද ජප කෙරෙයි. මා අකමැති වන්නේ ඒ හේතුවට යටින් ඇති ප්‍රධානතම හේතුව නිසා බව සහද්‍රා දන්නේ නැත. දන්නේ නම් මේ පියස්ස යට පුපුරා යන අපේ යුග දිවි බෝම්බයේ කැලිවත් දකින්නට හැකිවන්නේ නැත. ජීවිතයේ උද්වේගකරම අවස්ථාව උදා වූයේ ඊට පැය කීපයකට පස්සේ.



වෙලාව එකොළහමාරය. කෑම මේසය සකස් කර සෝමවිමං නිදාගන්න ගිහිල්ලාත් ඉවරය. සහද්‍රාවත් මාවත් කෑම කෑවේ නැත. එකවරම විදුලි එළියක් ජනෙල් වීදුරු මත පතිත වෙද්දී සාලයේ පුටුවක නිදි කිරමින් සිටි සහද්‍රා එකවරම කෑ ගැසුවාය.

"ඔය එන්නේ.......!"

මා හෙමිහිට කාමරයට රිංගුවේ සහද්‍රාට අතින් සන් කරමින්. ඊට පස්සේ විදුලි සීණුව නාද වුණා. සහද්‍රා දොර අරිනවා ඇසුණි.

"කොහෙද පුතේ මෙච්චර වෙලා යන්නේ....... දැන් බලන්න වෙලාව කීයද කියලා. අපිට හිත්වලට නිදහසක් නැද්ද පුතේ......"

"අපිට ? හා හා....... හා....... අම්මේ කවද ඉඳන්ද අම්මා "අපි" වුණේ. ආ....... හැමදාම 'මම' නේද තිබුණේ. දැන් විතරක් මොකද කොහොමද 'අපි' වුණේ. මොකක්ද ඒකෙ තියෙන රහස.......ආ......."

මම දොර අසලටම වී ඒ දෙබස ශ්‍රවණය කළෙමි.

"මේ පුතේ මම එකක් කියන්නම්. ඔය එක එක නැට්ටිච්චියො නම් කරේ දාගන්න හිතන්න එපා. ඔයාගෙ කසාදයක් වෙනවා නම් ඒක පිළිවෙලට වැදගත් කමට කෙරෙන්න ඕන පුතේ......."

"හෝව්....... පොඩ්ඩක් ඉන්න අම්මේ අම්මට කවුද කිව්වෙ මම නැට්ටිච්චියක් එල්ලාගන්න යනවා කියලා ආ...... ඇයි අම්මා ඔය විදියට හිතන්නේ......."

ඊළඟට නිශ්ශබ්දතාවයක් සහද්‍රාට කට වසාගන්ට සිදුවෙලාය.

"මම දන්නවා අම්මාට මේ විස්තර හොයලා දුන්නේ තාත්තා. එයාට දූන් වෙන රාජකාරි නැනේ. මං ගැන ඔත්තු බලන්න. එයාගෙ ඔත්තු බලන්න තමා කිසි කෙනෙක් හිටියෙ නැත්තෙ හොඳ වෙලාවට. දූන් එයා සූදාන වෙලා මගේ ඔත්තු බලාගෙන ඇවිත් අම්මට කියනවා. ඒවා හරි අසාධාරණ වැඩ......"

"එහෙම කතාකරන්න එපා. ඇත්ත නේද පුතා යාලුවෙලා ඉන්නෙ නැට්ටිච්චියෙක් එක්කය කියන කතාව බොරු නෙවෙයිනෙ." සහද්‍රා එසේ ඇසුවේ තර්ජනාත්මක ස්වරයෙනි.

''ඔව් ! එයා ඩාන්සිං කරන කෙනෙක් තමයි. එහෙම වුණු පලියට එයාට අපහාස කරන්න අම්මට අයිතියක් නෑ ! අම්මෙ එන්න එපා මගේ ජීවිතේට මේ විදියට ඇඟිලි ගහන්න........ මං හැමදාම අම්මගෙ තුරුලෙ ඉන්න තොත්ත බබෙක් කියලා හිතුවද? අනික් එක අම්මා දනගන්න මගේ හොර හොයන්න එන්න එපා මීට පස්සෙ. අන්න තාත්තව උසි ගන්නලා එක එකා එවන්න එපා මීට පස්සෙ. අන්න අද මම තාත්තගෙ චක්ගෝලයෙකුට හොඳ මට්ටුවක් කෙරෙව්වා ක්ලබ් එක අස්සෙ බොරු පාට් දාන්න ආපු........''

ඒ මොහොතේම මගේ ජංගම දුරකථනයට ඇමතුමක් ආවේ එක් මිත්‍රයෙකුගෙනි. ක්ලබ් එකේ ඇතිවූ ගුටිකෙලියක් නිසා එක් අයෙක් රෝහල්ගත කළ බව එයින් කියැවුණි.

''ඔයාගෙ පුතාට පාතාලෙ කන්ටැක්ට්සුත් තියෙනවා නේද මිනිහා තමා වැඩේ කරවලා තියෙන්නෙ අපේ එකාට........''

ඒ වදන් වලින් නම් මට ඉවසීමෙ සීමාව පන්නානු බැරි බවට සංඥාව ලැබුණාක් බඳු විය. මා කෝපයෙන් එළියට තල්ලු වූයේ ඉබේටමය.

''හා....... අන්න අර එවාපු තාත්තගෙ ගෝලයාට අපේ මිනිහෙක් වැඩක් දීලා''

''මොකක් කිව්වා.......!''

''ඇයි තාත්තට පුදුමද........ධර්ම චක්කරේ දාපු පුතා දැන් චණ්ඩියාද කියලා එහෙම නෑ තාත්තේ. මම කාටවත් හිංසාවක් කරන කෙනෙක් නෙමෙ. මැන් ඇවිල්ලා මගේ යාලුවෙකුට පාට් එකක් ආලා.......''

''කට වහපං........ඔලමොට්ටලයා........මහ ලොකු චණ්ඩියා දැන් බජාර් එකත් එක්ක වගේ ආස්සරේ. උඹට ඉගැන්නුවේ මේකටද අන්න අර කවුද නැට්ටිච්චියෙක්ව කරේ එල්ලගන්න යන්නේ වහාම නවත්වනවා හොඳයි ඒ සම්බන්ධෙ......!''

ඒ කතාවෙන් පුතා ඉදිරියට ආවේ සිංහබාහු වගේමය.

''මොනවා මට ආයෙත් කිව්වානම් තාත්තා ඒ කතාව. ඔයාට මම තාත්තා කියලා කියන්න වටින්නේ නෑ. එහෙනම් ඔයා කරලා තියෙන ඒවා ඇහුවාම. ඒවායින් එන ලෝකාපවාද ඔක්කෝම



අපි වින්ද........ඉස්කෝලෙදි ලජ්ජාවට මම කොල්ලන්ට ගහලත් තියෙනවා. ඔය විදියෙ ඒවා ගැන මට කියන්න ඇවිත්........ මම විවර්ලගෙන් ගුටි කාලා තියෙනවා. ඒ කොල්ලන්ට ගහන්න ගිය එකෙන්. අපේ අම්ම කන්නෙ බොන්නෙ නැතිව දවස් ගණන් ඉඳල තියෙනවා ඔයාගෙ වැඩ නිසා........ එහෙව් ඔයාද දැන් මට මේ මගේ සම්බන්ධෙට කවුව ගහන්න එන්නෙ........?''

ඔහු මට ගහන්න වාගේ පැන්න විට සහද්‍රා වහා පැන පුතාව අල්ලා ගත්තාය. පුතා ඇගේ අතද ගසා දම්මේ බැණ වදිමින්.

''අනේ යන්න අම්මෙ යන්න. අම්මටත් දැන් මුල මතක නෑ මෙයා ලවා මගේ වැරදි හොයවලා ඒවා හඟිස්සවලා''

''කට වහගනිං පුතා........මේ ඔක්කොම උඹගෙම හොඳට තමා කියන්නේ. මෙච්චර දුරට ඉගෙන ගෙන කොහේවත් යන වල් ගෑනියෙක් කරේ එල්ලා ගන්නෙ මොන පිස්සුවටද? මේ ලෝකෙ වෙන ගෑනු හිටියෙම නැද්ද උඹට........''

සහද්‍රාගේ කටහඬ එසේ උස්ව ඇසෙද්දී ඈට ඇඬුම ආවේය. ඈ ඉන්පසු ඉකිබිඳින්නට පටන් ගත් විට බිමල් මා දෙස බැලුවේ රවාගෙනය. මේ තරම් රෞද්‍ර වේශයක් ගන්නට ඔහුට ආවේ කොහෙන් හයියක්ද ? පිටස්තර ගැහැනියක් නිසා තමාගේ දෙමාපියන්ට රැවිලි ගෙරවිලි කරන්න ආපු හයිය ඔහුට දුන්නේ අර නැට්ටිච්චියද?

බිමල්ගේ ඇස් මගේ ඇස්වල එකට පැටලී ටික වෙලාවක් තිබෙන්නට ඇත. ඒ ඇස් හතර නොයෙක් දේ කතා කරන්නටත් ඇත.

''තාත්තට හොඳයි නොගැලපෙන දේවල් කරන්න. ඒවා කරන්නෙ හැංගි හොරා. මම කරන්නෙ එළිපිට....... නොගැලපුනත් ගැලපුනත් එළිපිට........ මගේ රහසක් නෑ......!''

සිංහබාහු එසේ කියයි

සිංහයා එවිට මෙසේ කියයි.

''තාත්තා කරපු දේ පුතා නොකළොත් නොවටිනෙ පුතා තමයි. හරි! පුතා ඒ දේ කළා. උඹ මගේ පුතා නිසා. ඒත් මං අකමැති වෙන්නෙ ඒකි නැට්ටිච්චියක් වුණු නිසාවත් උඹ තරම් උගත් කමක් නැති නිසාවත්, ධනයෙන් බලයෙන් අඩු නිසාවත් නෙමෙයි.''

මම මොන කටකින් කියන්නද ඒකි මගේම දරුවෙක් කියලා! සිංහයාගේ ඇස් වලින් කඳුළු වැගිරෙයි. ඒත් සිංහබාහුගේ ඇස්වලට කරුණාවන්ත කම ගොඩවදින්නේ නැත. ඔහු කඩුව අතට ගෙන එහෙ මෙහෙ වනා සිංහයා ළඟට කිට්ටු වෙයි. තව මොහොතකින් සිංහයා මරා දමෙනු ඇත.

''ඕව කමක් නෑ පුතේ මාව මරා දමන්න....... ඒත් මට උඹව මැරෙනවා දකින්න බෑ !''

සිංහයා ගර්ජනා කරයි. පුතාට හිතෙන්නේ ඔහු වෙත කඩා පනින්නට දත් විළිස්සනවා කියායි. යුධ ප්‍රකාශ කරනවා කියායි. සිංහබාහු වහාම කඩුව ඇදගෙන සිංහයාගේ ඉස් කට්ටට මහා පහරක් ගසා දෙබෑ කරන්නට හදයි.

එවිටම සුප්පා දේවිය මැද්දට පනියි. සිංහබාහුගේ කඩු පහරින් මැරී වැටෙන්නේ සුප්පා දේවියයි. සිංහයාට සහ සිංහබාහුට මැදිව මරණයෙන් වන්දි ගෙවන්නේ ඇයයි. තාත්තා සහ පුතා අතර සටනින් මැරී වැටෙන්නේ අම්මාය !

රාත්‍රී දෙකේ කණිසම නාද වෙද්දී රඟහලෙන් සියල්ලෝම නික්ම ගොහිල්ලාය. හිසට දැනෙන බර හිත මනම පතිත වෙයි.

ජීවිතය සම්බන්ධ විශාල ප්‍රශ්නයක් ඉතිරිව ඇත. එය කෙසේ විසඳේවි දැයි දෙයියෝත් දන්නේ නැත. අද මේ වන විට සිතිය හැක්කේ එපමණකි.

සශික් උදාකර - දින පොත
දිනය 2008 ජූනි 09

මගේ ජීවිතයේ මට මුහුණ පාන්නට ලැබුණු බිහිසුණුම අවස්ථාව අද මම අත්වින්දා වගේ දැනෙන්නේ. ඇහේ මූසලේ තියාගෙන හදාපු දරුවන් ලොකු මහත්වෙලා ඇවිත් දෙමව්පියන්ගෙ මූණ කට සම්තලා කරන්න වගේ ඇස් නෙරවාගෙන කෑගහගෙන එනකොට මොනවාද හිතට නොසිතෙන්නෙ දෙවියනේ.

සශික් තාත්තා කෙනෙක් විදියට පුතාගෙ ප්‍රශ්නෙ දිහා බලන්නෙ. කොච්චර වුණත් පුතා අමාරුවෙ වැටෙනවට අකැමැත්ත තමා එයාගෙ මූළු හැසිරීම තුළ මම දක්කෙ. ඒ අකමැත්ත මට හයියක්.

තමන් අමාරුවේ වැටුණට තමන්ගේ දරුවෙක් ඒ අමාරුවේ



වැටිලා ඉන්නවා දකින්න තාත්තා කෙනෙකුගේ තියෙන අකමැත්ත තුළ ගොඩාක් කතන්දර තියෙනවා. කොහොම වුණත් සශික්ගේ අකැමැත්ත ගැන මම අවංකවම ස්තුතිවන්ත වෙනවා. ඔය වගේ ගැනියෙක් මගේ ලේලි කරගන්න මට නම් කිසිම උවමනාවක් නෑ. මට ඒක නම් කොහෙත්ම ඉවසන්න පුලුවන් දෙයක් වෙන්නෙ නෑ.

අනේ මම මොන තරම් හීන මැව්වද හොඳ ගුණ ධර්ම තියෙන මගේ පුතා කවදහරි මනුස්සකම තියෙන උසස් උගත් ගෑනියක්ව මේ ගෙදරට ගෙන ඒම ගැන. ඒත් මගේ පුතාගේ නිබඳ ගතිගුණ ධර්මත් සූරාගෙන කන කෙනෙක් තමා එයාට අහුවෙලා ඉන්නේ. ඒකනේ මේ විකේම එයාගෙ හැසිරීම—— මේ තරම් අමුතු වුණේ. අනේ වෙනදා මගේ හැම දුකටම මගේ හිත හද හදා හිටපු පුතා.......

එයාට මේ මොන කොඩිවිනයක්ද වුණේ. ඉනා බේතක්වත් කවලද කියලත් හිතෙනවා. මම මේ ගැන මගේ යෙහෙළියොත් එක්ක කතාකරන කම් ඉවසුමක් නෑ....... මට පිස්සු නොහැදී හිටියොත් හොඳටම ඇති වෙන දෙයක් මට බලාපොරොත්තු වෙන් බෑ! හෙට දවස නිකම්ම නිකම් බොල් හීනයක් වගේ හිත පාරනවා. නින්දක් අහලකට ආවේම නෑ. ඉස්සර දවසක තාත්තා ගෙදර නොආපු දවසට ඔලුව කැක්කුම හැදිලා. ඇඳ වියලේ ඔලුව තියාගෙන ඉන්නකොට ඇවිත් මගේ ඔලුව අතගගා මාව සනසාපු මගේ පුතා! මගෙන් පුතාව වෙන් කළ විලවේශය මොකක් වුණත් මම සාප කරනවා. මගේ පුතාගෙයි මගෙයි ආදරේ දෙකඩ කරන්න කවුද මැදට පැනල ආපු යකානී——

මුලු ලෝකෙම වුණත් මේ අත් දෙකෙන් මිරිකල දාන්න පුළුවන් කියලා මගේ හිත කියනවා. ඒ තරමට ආවේගය වැඩියි. ඒ ආවේගයට මම කැමති නෑ. ඒක මගේ හිතට ඔරොත්තු දෙන්නෙ නෑ. පුතේ වැඩි දවසක් යන්න කලින් මම ළඟට එයි!

සඳලා මුතුමාලා - දින පොත
දිනය 2008 ජූනි 08——

දැන් නම් මට කොහෙත්ම අර නරකාදියෙ ඉන්න හිතෙන්නෙම නෑ. දෙපැත්තට වෙලා යුද්ධ ප්‍රකාශ කර කර හිටපු දෙන්නා මගේ ප්‍රශ්නෙදි මට විරුද්ධව කැරලි ගහන්න අරන්.

පෙරදා රෑ සිද්ධ වෙච්ච සිද්ධිය මට දුකට හේතුවක්. මම සමහර විට කැත බලු පුතෙක් වගේ මගේ කට පාවිච්චි කරන්න ඇති. ඒත් මම කියන්න ඕන දේ කිව්වා මගෙ හිතේ!....... ඒවා මූණට කියන්න ඕන වචන.

නිරූපා ඊයෙ මට මූණ ගැහිච්ච වෙලාවෙ එයා හරිම දුකින් හිටියෙ, හරි පව්! නැතිබැරි කමට ක්ලබ් එකක රස්සාවක් කරන්න ආවා කියලා. ලස්සනට ඇන්ද පැළැන්දා කියලා එයා වල් ගෑනියෙක් වෙන්නෙ කොහොමද. එයාට කවුදෝ කල්ලියක් දුරකථන ඇමතුම දීලා තර්ජනය කරලාලු. මට කොහොමටවත් නිරූව අමතක කරන්න බෑ. දැන්නම් කීයටවත් මම ඒක කරන්නෙත් නෑ. වැඩේ තියෙන්නෙ තාම හරියකට තනි පංගලමේ මූණ ගැහෙන්නවත් අවස්ථාවක් ලැබුණෙ නැහැ. බාහිර බලපෑම එකවිට එක ඇවිල්ලත් ඉවරයි.

මූණ බලලා කතා කරලා හිනාවෙලා වෙන්වුණු අපි දෙන්නව දැන් බාහිර බලපෑම විසින්ම පෙම්වතුන් බවට පත් කරවමින් සිටිනවා. මෙච්චර කාලයක් මම ජීවත් වුණ ලෝකෙ මොකක්ද ? නිරූගෙ එක බැල්මක මගේ ජීවිතයේ හැරවුම ලක්ෂ්‍යය තියෙනවා. ඒ හැරවුම් ලක්ෂ්‍යයෙන් හැරෙන ඕනෑම දිහාවකදී ලැබෙන ගැරහුම අවමන් ඔක්කොම විඳගන්න මේ බිමල් සූදානම්.

මේ ලෝකෙ අහිංසකම සත්වයෝ තමයි පෙම්වතුන් කියන්නේ. තම තමන්ගේ ලෝකවල තනිවෙලා අනාගතේ ගැන හීන මව මවා ඉන්න අදියර කෙනෙකුගේ ජීවිතයේ සුන්දරම අවදිය කියල මට හිතෙනවා.

නිරූ මගේ ප්‍රථම ප්‍රේමය....... ඒ නිසා එය මට අමුතුයි. විශේෂයි. මේ නිරූගේ ප්‍රථම ප්‍රේමය නොවෙන්න පුළුවන්. ඉතින් මට මොකද ? නොඉඳුල් කුළුදුල් ආදරවල් හොය හොයා ආල වනේ දෙවනත් කරන්න මට බැරි කමක් නෑ.



ජීවිතයේ එක්තරා මොහොතක එක්තරා දවසක අපට අප මූණගැහුනා. හිත් කතා කළා. ඊට කලින් ඇස් කතා කළා. මූණට මූණ බලාගෙන ඉඳලා දවස් ගාණක් ගියාට පස්සෙයි කතා කරන්න අවස්ථාව ආවේ. හොඳට තේරුණා අපි දෙන්නා එකිනෙකාට පැහෙන අදහස් තියෙනවා කියලා. සිංහල ද දෙමළ ද කතෝලික ද බෞද්ධ ද කියලා ප්‍රශ්න අපේ තිබුණෙ නැහැ. ආදරේ භාෂාවෙන් අපි කතා කළා. ආදරේ ආගමෙන් සැදැහැවත් වුණා. එපමණයි.

මුළු ලෝකයම දැන් අව් මුගුරු අමෝරාගෙන එනවා. කවු කිණිසි අඩ අඳුරේ දිලිසෙනවා. නිරූ ඔයා හුඟක් පරෙස්සම් වෙන්න ඕන. වන මුරුගයො වගේ මිනිස්සුන්ගෙන්....... ඔයාට හුඟාක් කරදර සිද්ධ වෙයි. ඔයා මගේ ආරක්ෂාවෙ සෙවනට එනකම් ඔයාට ආරක්ෂා වෙන්න වෙයි. මම ඔයාට මේවා කියන්නේ මගේ හදවතින්මයි. ආදරේටයි. එහෙව් මගේ සිත මගේම අම්මත් තාත්තත් තුවාල කළා. ඔයාට අපහාස කළා. අවමන් කළා. ඒත් ඔයා මේ මුකුත්ම දන්නෙ නැනෙ. ඒකයි මට දුක. මම උන් හිටි ගමන් නිරූට ටෙලිෆෝන් කරනවා

"හෙලෝ නිරූ....... කොහේද ඉන්නේ......."

"තාම ක්ලබ් එකේ....... බිමා....... අපේ රස්සාවනේ ඩාලිං"

කමක් නෑ නිරූ මට ඔයාව විශ්වාසයි. ඒක තමා ආදරේ කියන්නේ. පෙම් ලෝකේ වස විෂ නෑ. අමා සුව විතරයි. සැනසුම පමණයි. හෙට අපි ටිකක් කලින් හමුවෙනවා නිරූ.

*බිමල් උදාකර - දිනපොත*
*දිනය: 2008 ජූනි 12*

නිරූ කියනවානම් මට ගම රට ඔක්කොම අතෑරලා යන්න පුළුවන්. නටන එක එයාගෙ රස්සාව වුණාට තුන්කලා හිතන තරම් මට්ටමේ එකියක් නෙමේ එයා.

හැමෝම එක්ක නැටුවා කියලා එයාට ලේබල් ගහන එක හරිම අසාධාරණයි. මේවා කියන්නේ කාටද ඉතිං. [illegible]

තියෙන ලෝකෙ රටේ පිළිගැනීම තියෙන අය වුණත් ඉන්නේ නාම දහඅටවැනි සියවසේ වගේ. පව් නිරූගෙ අම්මත් තාත්තත් දෙන්නම නෑ කිව්වා. එයා ඉන්නෙ එයාගෙ මාමා කෙනෙක් ළඟ නැවතිලා. පව් එයාගෙ ජීවිතේ. සැප විඳිනවා වගේ පෙනුණත් තරයේම දුක වළඳන ජීවිතයක්.

කවුරු මොනවා කිවත් මං ඔයාට ද්‍රෝහි වෙන්නෙ නෑ නිරූ........ ඔයා බලාගෙන ඉන්න මේ කොල්ලා උඩුගුවනේ හරි ඔයාව හොයාගෙන එනවා. මට තවත් තේරුම් නෑ ඇයි මට ගහන්න පැනපු එකට. මම එයාට මොන වරදක් කළාටද ඇත්තට එහෙම දේවල් කරන්නෙ. රහස් පොලිසිය වගේ හොය හොයා පස්සෙන් පන්නලා අන්තිමට අම්මවත් උසිගන්නපු එක මට ප්‍රහේළිකාවක්.

බලමු. දෙකෙන් එකක් වෙයි. බැරිම වුණොත් මම ගෙදරින් පිටවෙලා යනවා. එතකොට ඉවරනෙ. ඒ දෙන්නට මාව පේන්නෙ මහා අපරාධ කාරයෙක් වගේ. නංගිත් ඊට එහා. එයා කැම්පස් ඉඳන් මට කෝල් කර කර බණ දෙසන්න එන්නේ. එයා එහේ ඉඳන් සම්පූර්ණ නිදහස විඳ විඳ හොඳට එන්ජෝයි කරනවා. අම්මාට ඒවා පේන්නෙ නෑ.

*බිමල් උදාකර - දිනපොත*
*දිනය: 2008 ජූනි 13*

අද මම සමරසිංහ එක්ක එකතු වෙලා අලුත්ම වැඩපිළිවෙළක් සකස් කළා. දවසට පස් පැරයක් කෙල්ලට තර්ජනය කරනවා. ඒ කෙරෙන්නෙ අමුතුම විදියකින්. කිසිම විදියකින් පාතාලෙටත් දැනගන්න බැරි විදියටයි සියල්ල ප්ලෑන් කෙරෙන්නේ. මොකක්ද ඉතිං සල්ලි ටිකක් අත හොල්ලලා වියදම් කළාම ඕනෑම විදියෙ ප්ලෑන් ගහන්න පුළුවන්. එකම බය තියෙන්නෙ බිමල් පුතා ගෙ පාතාලෙ කට්ටියයි. නමුත් මේ දේවල් නොකරම බැහැ. කල්යල් බලලා මේ දේවල් නොකළොත් කොල්ලා අනතුරේ.

*සයිත් උදාකර -දිනපොත*
*දිනය: 2008 ජූනි 14*



"පුතා මේ ඔයාට හොඳින් කියන්නෙ ඔය සම්බන්ධෙ නතර කරලා දාන්න පුතා...! ඔයාට ඕන ඔයාගෙ අම්මගේ මළමිනිය දකින්නද ?"

මම උදේ පුතාට කෑගැහුවෙ උහුලන්නම බැරි තැනය.

"පිස්සු කතා කියන්න එපා අම්මෙ ගොඩේ ගෑනු වගේ තමන්ගෙ පුතා කව්රු හරි එක්ක ප්‍රේම සම්බන්ධයක් ඇති කරගත්තා කියලා තමන්ගෙ මළමිනිය පුතාට පෙන්නන්න එන්නෙ අන්තිම නූගත් ගෑනු නෙ අම්මෙ......... අම්ම වාගේ උගත් ගුරුවරියක් ඇයි ඒ වගේ කතා කියන්නෙ. අම්මලා බාල පරම්පරාවලට කියලා දුන්නෙ ඔවද අම්මෙ........"

"ඔය තර්ක වලින් මට වැඩක් නෑ පුතේ......... අපේ පවුල්වලට ගැලපෙන කෙල්ලක් හොයාගන්න. එතකොට ඒක කරල දෙන්නම්. ඔය වගේ මූණේ දැලිගෑවෙන දේවල් මොකට කරනවද? ඇයි පුතේ අපෙන් මෙහෙම පළි ගන්නෙ?"

මා කී එබසට පුතා කිපී ඉදිරියට ආවේ ක්ෂණයකිනි.

"මෙහෙම පළි ගන්නෙ..........? ඒක මම තමයි අහන්න ඕනෙ අම්මේ.......... ඇයි අපෙන් මෙහෙම පළි ගන්නෙ.........? අම්මලා දැනගන්න අපිට ගල් ගහන ගහන වාරයක් පාසා අපි ශක්තිමත් වෙනවා. අපිට අපිව අත අරින්න බෑ කියන එක අපට මතක් කරලා දෙන්නේ ඔයගොල්ලෝ! අහිංසක අපිට ගහන ගල්මුල් තමයි. කඩු කිණිසි පාරවල් වලින් අපේ ඇඟවල් තුවාල වෙන්න වෙන්න ඒ ලේ බහින්නෙ අපේ හිත් වලට. ඒ ලේ වලින් අපි තවත් බැඳෙනවා.......... ඒක වෙනස් කරන්න කාටවත් බෑ.........!"

පුතාගේ ආවේගශීලී කතා විලාශය එන්න එන්නම වේගවත් වුණා. එතැනට සයිත් ආවේ ඒ වෙලාවේ.

තාත්තා දක්ක ගමන් පුතාගේ මූණේ ඇඳිච්ච උපහාස හිනාව මට මැවිලා පේනවා. ඒක හරිම භයානක හිනාවක් වගේ හිනාවක්. පුංචි කාලෙ පුතා නින්දෙන් හිනාවෙන කොටත් මට මුලින්ම හිතුනෙ බය හැඟීමක්.

"මේ සම්බන්ධෙ නම් ඔයාට නවත්තන්නම වෙනව පුතා. මම මේ අවසාන වතාවටයි කියන්නේ. ආයෙ පැරයක් මට මේක

කියන්න ඉඩ තියන්න එපා. ඔයා කැමතිද ඔයාගෙ අම්මාගෙ ජීවිතේ නැති වෙනවා දකින්න. එහෙනම 'ඕක කරගන්න. තේරුණාද ? ඔයාට ඊට පස්සෙ මමත් නෑ.........''

සශික් කිවෙ හුඟාක් සැර පරුෂ විදියට, ඒත් බිමල් පුතා ටිකක්වත් ඒක ගණන් ගත්තෙ නෑ.

''තාත්තා කොච්චර හැදුවත් මේ ප්‍රශ්නෙදි අම්මාව ප්‍රාණ ඇපකාරියෙක් කරන්න ඒක කවදාවත් කරන්න බෑ තාත්තා. ඒක වෙනසක් නෑ. ඒක වාග්මය ප්‍රයෝගයක් විතරයි. තාත්තා කොච්චර දත කෑවත් මම මේ මඟුල කරගන්නවාමයි.........''

පුතා එහෙම ගුගුරද්දී තාත්තත් ගුගුරලා යන්න ගියා. මේ හැම ගිගුරුමක්ම අසනි වරුසාවක්ම දනෙන්නේ හැඟෙන්නේ මටමයි නේද කියලා මම දුක් වුණා.

මට බිමල් ගැන මහා දුකක් ඇති වුණා. තාත්තා ගියාට පස්සේ බිමල් මගෙ දෙපා ළඟ වැටිලා අඬන්න ගත්තා. පස්සෙන්දත් කෑමක් බීමක් ගත්තෙත් නෑ. ඇඳ උඩ වැටිලා ඔහේ මලම්ණිය වගේ හිටියා. පුතා මට එහෙම ඉන්න ගමන් බොහෝ කාරණා කිව්වා. මටත් හිතුණා ඒවා අහලා මොකටද අපි මේ තරමට මේකට විරුද්ධ වෙන්නේ කියලා. දුප්පත්කමට ක්ලබ එකක නටන කෙල්ලව වෙන රැකියාවකට දම්මම ප්‍රශ්නෙ ඉවරයි. බැන්දට පස්සෙ රස්සාවකට නොගිල්ලම ඉන්නත් කෙල්ල කැමති නම් ප්‍රශ්නෙ සහමුලින්ම ඉවරයි.

අම්ම තාත්තා නැති එක ප්‍රශ්නයක් කරගන්න එක සශික්ට වටින්නෙ නැහැ. එයාටත් ඒ අත්දැකීම තියෙන නිසා. ඇත්තටම මට හිතුණ මොකටද අපි මේ තරමට මාරාන්තික විදියට විරුද්ධ වෙන්නෙ කියලා.

පස්සෙන්දා මම මේ අදහස් සශික්ට කියලා එයාටත් මේකට කැමැත්ත දෙන්න කියලා ඉල්ලා හිටියා. සශික් මා එක්ක පුදුම විදියට රණ්ඩු වුණා. ඒ රණ්ඩුව හොඳටම දික්ගැස්සුණා. මට ජීවිතය එපා වෙන තරමේ මහා ගෝරනාඩුවක් ඒක. මම ඒක මතක් කරන්නවත් සතුටු නෑ.

වායුගෝලයට මුදාහැරෙන වචන ආයේ ගොනු කරලා



කටින්ම ගිලගන්න බැහැ. ඒවයින් තුවාල වෙච්ච හිත් ආයෙ කවදාවත්ම සුව වෙන්නෙත් නැහැ. මගේ කොල්ලා හොයා නොබී මැරිලා යනවා බලාගෙන ඉන්න මට බෑ. මගේ කොල්ලා වෙනුවෙන් මට සශික්ට විරුධ වෙන්න බැරි කමක් නෑ.

සහන්‍රා මුනුමාල - දිනපොත
දිනය: 2008 ජුනි 20

බිමල් පුතා හොයා නොබී පැත්ත වැටිලා හිටියත් මම කොහොමද මේ මඟුලට කැමති වෙන්නෙ. ඒත් දෙයියනේ මම කොහොම ද ඒක කාටහරි පහදල දෙන්නෙ. හැමෝම හිතන්නෙ මම මහා රාක්ෂ මුරුගයෙක් කියලා. වන සීපාවෙක් කියලා. හැමෝම ගන්නෙ බිමල් පුතාගෙ පැත්ත. කමක් නෑ මම දන්නවා මම කරන්නෙ මොකක්ද කියලා. බිමල් මුරණ්ඩු වැඩියි. ඒ මුරණ්ඩු බව ඇති කරන්න එයාගෙ අම්මත් උදව් වුණා. නොදැනුවත්වම වුණත්.

සහන්‍රාත් මේ කෙල්ලට අකමැති වෙලා ඉඳලා එක පාරටම පුතාගෙ පැත්ත ගත්තෙ මට රිද්දන්න......... මට රිද්දවලා එයාගෙ අතීත හිත් වේදනාවල් වල පළිය අමු අමුවේම ගන්න කමක් නෑ සහන්‍රා මට කමක් නෑ. ඔයාගෙ කැමැත්තක්.

සශික් උදාකර - දින පොත
දිනය: 2008 ජුනි 21

මට හරිම හිසරදයක් උදේ ඉඳන් එක එක්කෙනා මට තර්ජනය කරනවා බිමල් එක්ක තියෙන සම්බන්ධය නවත්තන්න කියලා. කෙනෙක් කතා කරලා මගෙ මූණට ඇසිඩ් ගහනවා කියලත් තර්ජනය කළේ. මේක හරිම වැඩක්නෙ.....! අපි තවම හරියට එෆෙයාර් එකක් පටන් ගත්තෙත් නෑ. මුලු රටම කැළඹිලා මාර වැඩේ.

මම කෝල් කරලා බිමල්ට කිව්වා. බිමල් බය වෙලා මම වෙනස් වේවි කියලා වෙන්න ඇති. බිමල් හරියට මම හිතුවාට වඩා බොහොම අහිංසක, ලාමක. ඒ.ටී. කෙනෙක්. නැතුයි

ඔය විදියට ජීවත් වෙන්න අමාරු වෙයි. අනික එයා කියනවා මැරිකරලා ඊට පස්සෙ මගේ ජොබ් එකෙන් අයින් වෙන්න කියලා.

ඒ මොන විකාරයක්ද ......... සමාජ ආශ්‍රයෙන් අයින් වෙලා හිරකාරියක් වගේ එයාගෙ මූණම බලාගෙන ඉන්න මට බැහැ. මට කොහොම වුණත් බිමල් එක්ක එෆෙයාර් එකක් ඇතිකර ගත්තොත් නම් කරදරයි වගේ.

බිමල් හොඳ කොල්ලෙක්......... මම එයාට කැමති! ඒත් මෙච්චර වලි ගෝරි අස්සෙ නිකම් අර මොන්ටේගුලාගෙයි කැපියුලට්ලාගෙයි සටන් ඇවිලිච්ච අස්සෙ රෝමියෝ ජුලියට්ලා ලව් කළා වගේ මට නම් බෑ ෆුල් සීරියස් වෙන්න. මම දන්නෙ නෑ මොනවා කරන්නද කියලා. ඒ අස්සෙ දැන් දවස් දෙකක් තිස්සෙම බිමල් නොකා නොබී ඉන්නවලු ඇඳේ වැටිල. බිමල්ට පිස්සුද ඇත්තට. එයා මට පැනල යන්න කතා කරනව. පැනලා ගිහිල්ලත් ආයෙ ඉතින් හිටපු හිටපු තැන්වලට ඇවිදගෙනම තමා එන්න වෙන්නෙ ගිය පයින්ම. ඒකෙ මොන අරුමයක්ද ?

බිමල් නිකම්ම ප්‍රේමාතුරයෙක් වෙලා. මං කැමති නෑ බිමල් ඒ විදියෙ කෙනෙක් වෙනවට......... එතකොට මට කරදරයි. අනේ මන්දා.

*නිරූපා පියුමලී - දිනපොත*
*දිනය: 2008 ජූනි 22*

අද හුඟාක් අමුතුම දවසක්. ඉර පායන වෙලාවටත් ඉර පායන්න හිතලවත් නැති මුස්පේන්තු දවසක්. දවස් දෙකක් තිස්සේ නොකා නොබී ඉඳලා මම කාමරයෙන් එළියට ආවේ මට ඔනෑ කරන මානසික ජවය එන්නත් කරගන්න. මම හිතාපු විදියටම අම්මත් තාත්තත් එක්ක රණ්ඩු කරගත්තා. පැය බාගයක් විතර ඒ රණ්ඩුව ගියා. අම්මා මගේ පැත්තටයි හිටියෙ. අම්මා රණ්ඩු කළේ තාත්තත් එක්ක මේ කසාදෙට කැමති වෙන්න කියලා.

අම්මත් හරියට සාක්කුව වැඩිකරලා දුන්නම අනිත් පැත්තට හැරෙන තාලෙ නීතිඥයෙක් වගේ. කවුරු කවුරුත් තම තමන්ගේ වාසියට නම්බුවට තමයි ඔක්කොම වැඩ.

මහා යුද්ධයකින් පස්සෙ තාත්තාගේ කටින් මට උවමනා කරපු වචන ටික එළියට ආවා.

''අපි කියන විදියට ඉන්න බැරිනම් බැහැලා පලයං එළියට......... පව් නොදී......!''

මම මගේ කාමරයට ගිහින් ඇඳුම් ටික පොදි බැඳගෙන එළියට අඩිය තිබ්බෙ කටදාවත් නැති තරමේ ආවේගයකින්. මොන සක්කරයා එපා කිව්වත් මම නිරූපව බඳිනවාමයි කියන අධිෂ්ඨානෙන්. නිරූපා ළඟට ගියේ එක පිම්මට. මට වාහනයෙන් ගියාද නැත්නම් වාහනය මාව දාලා තනියෙන් ගියාද කියලාවත් මට තිච්චියක් වුණේ නැහැ.

ක්ලබ් එකට ගිහිල්ලා නිරූපාව හම්බ වුණාම එයාට පුදුම හිතුණා.

''නිරූ තිවාඩු දාලා එන්න යන්න අපි දැන් බඳිනවා.........!''

මම එහෙම කිව්වාම නිරූ ඇස් උඩට ගත්තා. අඬන්න ගත්තා. දැන් මොහොතකට කලිනුත් ආපු මරණීය දුරකතන තර්ජනයක් ගැන කියවන්න ගත්තා. කොහොම හරි පැය බාගයක් විතර තර්ක කළා ඒ ගැන. අන්තිමට මම එයාට හොඳටම බැණ වැදිලා පිටත් වෙලා ආවා......... අනුරාධපුරේට......... මගේ යාලුවෙකුගේ ගෙදරට.........

මට හරිම කළකිරීමක් ඇතිවෙලා තිබුණේ. මට මගේ අම්මත් තාත්තත් නැතිවුණා......... ආදරය කරපු කෙල්ලත් බයගැන්නීම වලට බයේ නැතිවුණා. ජීවිතේ ගැන තිබ්බ අන්තිම ආසාවත් නැතිවෙලා මම ළඟදී දවසක පාවෙලා පාවෙලා යාවි නොවේද හරි.

*බිමල් උදාකර - දිනපොත*
*දිනය: 2008 ජූනි 23*

තුන්වැනි ලෝක මහා සංග්‍රාමය නිවස ඇතුළේම පටන් ගැනුනේ බිමල් ඕටවෙලා ගියාට පස්සේ. ඇත්තටම ගෙදර

හිටපු එකම පුතා බෑග් එකත් කරේ එල්ලාගෙන තරහින් ගුගුරලා පිටවෙලා යන දර්ශනය හීනක් පපුවක් ඇති දෙමාපියෙකුට උහුලන්න අමාරුයි. ඒ එක්කම ක්ලබ් එකේ කෙනෙක්ව මම කියලා තිබ්බෙ නිරූපා පිටවෙලා යනවද බලන්නයි.

නමුත් ආපු ආරංචියෙ හැටියට මගේ හිත මහා අස්වැසිල්ලක් ලැබුවා. 'පැය බාගයක් විතර තර්ක කරලා දෙන්නා රණ්ඩුවෙලා කොල්ලා යන්න ගියා. කෙල්ල යන්න බෑ කිව්වා.' ඒක තමයි වාර්තාව.

ඒ වාර්තාව මම මෙතෙක් අහපු හොඳම වාර්තාව වෙන්න ඇති. සහද්‍රා නම් බලාපොරොත්තු වුණේ බිමල් කෙල්ලත් එක්ක පැනලා යන්න ඇති කියලා. එයාට ජංගම හිතාගන්න දීලා මම නිහඬවුණේ දෙබසින් දුක වැඩිවෙන හින්දමයි.

පුතා ගෙදරින් ගිය එක ඒ ඩිංගට වටපිට ආරංචි වෙලා තිබුණා. ඒ එන ඇමතුම්වලට උත්තර දෙන එක මහාම විධාවක්. ඒ නිසා දුරකථන වයරය ගලවලා දමලා එහෙම දුරකතනය පවා ක්‍රියා විරහිත කරගත්තේ ඇමතුම් වලින් බේරෙන්නම බැරි තැන.

ඒ ක්‍රියාවට නම් සහද්‍රා ඉක්මණින්ම එකග වුණා! මොකද රිසිවරය කනේ තියාගෙන අඬලම දුක කියවලම ඉවරයක් නැති බව එයාටම තේරුම් ගියා.

අද පුතා ගිය දවස හරියට ගෙදර මළගෙදර වගේ. ගෙදර බතක් ඉදුනේ නෑ. කේතලයක් රත්වුණේ නැහැ. කන්න බොන්න උවමනාවක් නැති අපිට අහල පහල ගෙවල් දෙක තුනකින්ම කෑම තේ එහෙම ලැබුණා. ඇත්තටම ඒ වගේ මනුස්සකම් වුණත් උහුලගන්න අමාරු තරමට අපි හෙම්බත් වෙලා හිටියෙ.

කැම්පස් එකේ ඉන්න දුවත් මේ ආරංචියෙන් සසල වෙලා. අයියා ගෙදරින් යන්න ගියා කියන දේට වඩා අයියා අර ගෑනු ළමයා එක්ක පැනලා යන්න ඇති කියන උපකල්පනය ඇගේ හිතට වද දෙන්න ඇති.

අද දවස පුදුම දවසක්. මේක දීර්ඝ රාත්‍රියක්. විශාල ගහක් වවලා ඒ ගහ මගේ අතින්ම කපලා බිම හෙලුවා වගේ හැඟීමක්



මට ඇති වුණේ. සහද්‍රා මා දිහා බැලුවෙ එයාට තිබුණු එකම වස්තුව උදුරලා අරගෙන හොරුන්ට විකුණ කරපු නක්කඩියෙක් දිහා බලන ගානට.

සගීත් උදාකර - දිනපොත
දිනය: 2008 ජූනි 23

සගීත්ගෙ පුදුම මානසිකත්වය නිසා තමයි මට මගේ පුතා නැති වුණේ. පුතා නැතිවීම තුළින් සගීත් තෙරේ ඇතිවෙන කෝපය වෛරයක් වගේ වෙයිද කියලා මට බයයි. නමුත් නෑ පුතාගෙ කෙල්ලට අපි අපහාස කළ දුක එක්කම තරහ එයාට ගෙදරින් පිටවෙලා යන්නට පන්නරය ලබා දෙන්න ඇති. ඒක දැනගත්ත දා ඉඳන්ම ඒකට විරුද්ධකම් පාන්නෙ නැතිව අපි හිටියා නම් සමහරවිට මෙච්චර ඉක්මනට මේ දේවල් සිද්ධ වෙන්නෙ නැතිව තියෙන්න හොඳටම ඉඩකඩ තිබුණා කියලා මට දැනෙනවා හිතෙනවා.

අද රාත්‍රිය කොහොම ගතවේවිද මන්දා. හෙට දුව එන බව ෆෝන් කරලා කිව්වා. නැත්නම් මට පිස්සුත් හැදේවි.

සහද්‍රා ශ්‍රීකුමාල - දිනපොත
දිනය: 2008 ජූනි 24

කාලය හරිම ඉක්මණට ගත වෙච්ච හැටි. පුතා ගියාට පස්සෙ මේ වෙනකොට ඉරවල් එක්දාස් පන්සිය පනහක් පායලා බැහැලා ගිහිල්ලා ඉවරයි.

ගෙදරින් ගිහිල්ලා දවස් හතකට විතර පස්සේ සහද්‍රා නමට පුංචි කොල කැල්ලක් ලැබුණේ 'මා ගැන හොයන්න එපා මං හොඳින් ඉන්නවා' කියලයි. ඒ අම්මාගේ හිත සනසන්න පුතාගේ හිතේ පුංචි හරි කැමැත්තක් තිබුණු නිසා කියල මට තේරුණා.

සහද්‍රාටත් ඒ තුණ්ඩු කැල්ල මහමෙරක් වගේ වුණා. පුතා ගිහින් අවුරුද්දු දෙකකට පස්සේ විතර අපිට දුවගේ විවාහ කටයුතු ඉවර කරන්න පුළුවන් වුණා. ඒ වාගේ උත්සවේදී වත් ගෙට පුතා

දකගන්න ලැබුණේ නැහැ. එයා අපෙ ජීවිතේටම අපිව බලන්න එන්නෙ නෑ කියලා අපි හිත හදාගත්තා. සිංහබාහු පලා ගියා ගියාමයි ආපෙ ආවෙ නෑ. සිංහයාට තිබුණ එකම සතුට ඔහු පලා ගියේ තනියම නිසයි. නමුත් අද ආපු ලියුම......... ඒ කියන්නෙ පුතා ගිහිල්ලා අවුරුදු හතර හමාරකට විතර පස්සෙ ආපු ලියුම අපිට දෙවියො එවපු ලියුමක්ද කියලා හිතෙන තරම්!

සහදා දූමග් මඟුල් ගෙදරදී වත් මෙහෙම හිනාවෙනවා මම දැක්කෙ නැහැ. ඒ ලියුමෙ තිබුණේ,

''මම විවාහ වුණා. අද මගේ බිරිඳට පුතෙක් ලැබුණා. මම නව මාස දෙකකින් විතර ගෙදර ඇවිත් යන්න එන්නම්.'' සහදා අත ගෙවෙනකම්ම ඒ ලියුම කියව කියවා අතගෑවා. මටත් හරිම දුකයි පුදුමයි.

පුංචි මුණුබුරා ගැන කියව කියවා සහදා නෑදෑයින්ට කතා කළා. මුළු ගේම එකම මඟුල් ගෙදරක් වුණා.........!

අද රෑ මගේ ඇඳ ළඟ සමන්තා තෙත ගෝනියක් තියලා තිබුණා !

සශික් උදාකර - දිනපොත
දිනය: 2012 සැප්. 20

ජීවිතේ ලස්සනම දවසකට තමයි අද නම් ඉර පෑව්වේ. දෙයියො අපට කරුණාවන්ත විදියට දෛවය වෙනස් කළා.......... මට නම් හරිම පුදුමයි. මම ජීවත් වෙනවා කියලා දැනෙන්න ගත්තා. මේ දවස් ටිකේ බිබී හිටපු බෙහෙත් ගොඩ දැන් මට ඕන නෑ කියලා හිතෙන තරමට මහා සුවයක් දැනුණා. ඒක හරියට කැකෑරී කැකෑරී තිබ්බ මොළය බෙහෙත් වතුරක දම්මා වගේ පුදුම සැහැල්ලුවක්. මීටපස්සේ අපිට නෑදෑයින්ගේ මඟුල් ගෙවල්වල යන්නට බැරිකමක් නැහැ.

''තාමත් පුතා ගිහිල්ලලු නේද ආරංචියක් නැද්ද ?'' එහෙම අහපු කටවල්වලට දෙන්න උත්තර දැන් අප ළඟ තියෙනවා.

''පුතා ලියුම් එවලා තිබුණා. බැඳලනෙ දැන් එයාගෙ චූටි පුතා එක්ක ළඟදීම දවසක ඇවිල්ලා යන්න ඒවි. එයා රට ඉන්නෙ.....''

ඒ උත්තරය අපේ ආඩම්බර උත්තරය වෙයි. ඒ උත්තරෙන්



සමහරුන්ගේ මූණු බෙරි වෙන හැටිත් පුදුමයි. එයාල වැඩියෙන්ම සතුටු අපේ සතුට දකින්න නොවේ. දුක දකින්නයි.

සශික් සතුට වැඩිකමට පුංචි එකෙක් වගේ නැ නටමින් සිංදු කෑලි කියමින් එහෙ මෙහෙ යයි. එයා ඇඳ ළඟින් තෙත ගෝනියක් දමමෙ නින්දෙනුත් ඇවිදින එක හොඳටම පුවර් නිසා.

සහදා මුතුමාල - දිනපොත
දිනය: 2012 සැප්. 20

මම අද අපේ වත්තෙ පිහිණුම් තටාකය ළඟට වෙලා කල්පනා කර කර හිටියෙ ජීවිතේ ගැන. ජීවිතේට කියන්න තියෙන්නෙ ඒක හරිම ආශ්චර්යමත් දෙයක්. අද අපේ දරුවො විවාහ වෙලා. එයාලා බොහෝ වෙලාවට ලංකාවෙත් නෑ. එක්කෙනෙක් ඕස්ට්‍රේලියාවේ, දෙවැන්නා ඇමෙරිකාවෙ. නිවාඩුවලට තමයි ගෙදර එන්නෙ. ඒ එනකම් අපි කරන්නෙ හීන බලන එක. ඒ හීන හරිම ලස්සනයි. මට මතක් වෙන්නෙ හීන ගැන කියනකොට සශික් ගෙ කතා. හීන වලට පාට ගොඩයි. හැඩ ගොඩයි. ඒවා එක කාලවල එක එක හැඩේටයි එන්නේ. හරියට විවිධ ප්‍රමාණේ සබන් බෝල වගේ. හරියටම හිතුවොත් හීන වල හැඩේ හදාගන්නෙ හීන දකින අයමයි.

හීනවලට පාට දෙන්නෙත් හීන දකින අයමයි. ඒවා සශික් ගෙ පණ්ඩිත කතා. අනේ මට තාමත් ඒවා මතක් වෙන හැටි.

නිමනා සමෝදයා - දිනපොත
දිනය: 2012 සැප්. 10

සමාජ සේවෙ කියන එකත් ලේසි පාඩු දෙයක් නෙමේ. අපේ මන්ත්‍රී තුමාගෙ පාක්ෂිකයන්ගෙ වැඩේ වැඩ නොයාගෙන එන එක. ගිම්හාන් අලහප්පෙරුම දැන් බොහොම ජනප්‍රිය චරිතයක් වෙලා. පාරවල් හදවනවා, කාණු කප්පනවා, [illegible] හදන්න යෝජනා ක්‍රම ගේනවා. නගර පිරිසිදු කරන්න බෙදුම මර්ධනය කරන්න නවීන විධික්‍රම හොයනවා. එයා දැන් හරිම කඩිසර චරිතයක්. මම ඉතිං මන්ත්‍රී භාර්යාව විදියට පුළුවන් විදියට

එයාගෙ උත්සව වලදී ලස්සනට ඇඳ පැළඳගෙන එයාගෙ වම පැත්තෙන් යන එක තමා මට කරන්න තියෙන්නෙ. අද හරිම විශේෂ දවසක්. සඳලි දූගෙ විවාහ උත්සවේ. කොළඹ මහ හෝටලේ අද දේශපාලන බලවතුන්ගෙන් ඇලලුණා. දූ පෝරුවට නග්ගන්න ගිම්හාන් එයාගෙ අතින් අල්ලද්දී මට එක පාරටම මතක් වුණේ සශික්ව. එයා අතින් කෙරෙන්න ඕන යුතුකමක් නේ මෙ ගිම්හාන් අතින් කෙරෙන්නෙ. යුතුකම් වගකීම් හරිම පුදුම දේවල්. ඒවා ගෙ බර තියෙන්නෙ හිතට ගන්නා තරමටයි. ගිම්හාන් හිතේ කිසිම බරක් නැතිව දූවව පෝරුවට නැංගෙව්වා. දූගෙ අනෙක් පසින් පෝරුවට නැංග මනමාලයා රටම දන්නා ගායන ශිල්පියෙක්. ඒ තමා අද මංගල උත්සවේ දේශපාලකයො සහ කලාකරුවන්ගෙ සුහද හමුවක් වුණේ. මටත් ආඩම්බරයි දූ ජනප්‍රිය කෙනෙක්ව බැඳපු එක නෙමෙ! මගේ දූ වාසනාවන්ත නිසා. තාත්තලා නැති වෙන ළමයින්ට සිද්ධ වෙන දේ මගෙ දූට වුණේ නැත්තෙ පූරුවෙ වාසනාවක් නිසා. කිසිම හිතක් පපුවක් නැති විදියට මාව දාලා අර නැට්ටිච්චියක් එක්ක ගිය සශික්ට ඒ පව් පලදෙන්න ඇති. කෙහොමත් දිට්ඨධම්ම වේදනීය කම්ම එහෙම තමයි. මගෙ දූගෙ පූරුවෙ වාසනාව නිසා මම ගොඩ ගියා. ඒ වගේම එයාගෙ "නිති පොතේ" තාත්තත් ගොඩ ගියා.

මනෝරමා නාගසේන - දිනපොත

දිනය: 2012 සැප්. 2 0

නෝනත් එක්ක අද මාත් පල්ලියට ගියා. අද පල්ලියෙ ලොකු විවාහ උත්සවයක්. ලස්සන මනමාලියෙක්. හරිම ලස්සන මනමාලයෙක් එක්ක. මගේ ඇස්වලට කඳුළු ආවා. අනේ මගෙ දූවත් මේ වයසෙම වගේ ඇති නේද කියලා. එයා දැන් බැඳලද......... මම දන්නෙ නෑ.

අර මනමාලිගෙ තාත්තා දේශපාලන බලවතෙක් කියලා නෝනා කිව්වා. හරි ජනප්‍රිය කට්ටිය මහා රාශියක් එතැන. හරිම ලස්සන වෙඩිං එකක්. මට මනමාලිගෙ අම්මා දිහා බැලුනා. එයාගෙ මූණ හඳක් වගේ බැබලෙනවා. එයත් හරිම ලස්සන



කෙනෙක්......... මගේ වයසෙම වගේ ඇති. ඒත් මං තරම් වයසට ගිහිල්ලා වැහැරිලා දුර්වර්ණ වෙලා නැහැ. පුහු කාන්තාවන්ගෙ තියෙන දිදුලන ඔපේ ඇ ළඟ තියෙනවා. ඔය ඔපේ මා ළඟත් තිබුණෙන්. එතකොට මය ජනප්‍රිය කට්ටිය ඔක්කොම වගේ මා වටෙත් හිටියා. අද මං නිකම්ම හපයක් වගේනෙ. සශික් උදාකර මාව හපයක් කරලා පාරට දැම්මා. මං මොකටද දැන් එයා ගැන මතක් කරන්නෙ......... මාත් අපේ ස්වාමිදූව වගේ අතීතෙ මතක් නොකර ඉන්න උත්සාහ ගන්න ඕනෑ. අතීතය කියන්නෙ දුක පිරිච්ච ගිනි ගොඩක්. අලුයට තමා ගිනි පුපුරු තියෙන්නෙ. ඒ ගිනි පුපුරු වලට කටින් පිඹින එක නතර කරන්නනයි අපි කරන්න ඕනෑ. ඒත් ඉතිං මම වගේ අයට අනාගතයකුත් නැති නිසා අතීතෙට පිඹ පිඹ ඉන්න එකයි ඒකෙන් තැව් තැව් පොඩි සුවයක් ලබාගන්න එකයි විතරයි කරන්න ඉතිරි වෙලා තියෙන්නෙ.

නිසලා නිරංපලා (දිනපොත)

2012 සැප්. 20

මගේ සුපුරුදු දෛනික ජීවිතේ දැන් මට තිත්ත වෙගෙන යනවා. මට වෙලාවකට හිතෙනවා දැනට අවුරුදු ගාණකට ඉස්සර අර දවසේ බිමල් එක්ක පැනලා ගියානම් ඉවරයි කියලා. එහෙනම් මට මේ කරදරකාරි ක්ලබ් ජීවිතේ ඉවරයක් කරන්න තිබුණා. කොල්ලන්ගෙන් බේරෙන්න පුළුවන්. හැට හැත්තෑව පැනපු නාකි මනමාලයින්ගෙන් නේ බේරෙන්න බැරි......... බලාගෙන ගියාම මේක මහ පව්කාර ජීවිතයක්. බිමල් මගෙන් ගිය දවස්වලදීම මට ආදරේ කරන්න ආපු ජීවන් මහාම බොරු කාරයෙක්. මට බිමල්ගෙ අගේ තේරුණේ එතකොටයි. බිමල් හොඳ මහත්මා ගතිගුණ තියෙන පිරිමියෙක්. ජීවන් මහාම බලු මිනිහෙක්. එහෙම තමයි දෙයක් අහිමි වෙන්න ඕන දේක වටිනාකම දැනෙන්නෙ.

මෙලහට බිමල් බැඳලා දරුවොත් ඇති. මම තාම මෙහෙ අතින් අත පාවෙවී ඉන්නවා.

මට අම්මෙක් අප්පෙක් නෑ. වෙන අයට අප්පා නැතත් මෙලොවට බිහිකරපු අම්මාවත් ඉන්නවා. මගේ අම්මට වෙච්ච

දෙයක් නෑ. සමහරු කියනවා එයා හිරේ ගියාලු. සමහරු කියනවා එයා පිස්සන් කොටුවෙලු. ඒ කොහොම වුණත් මට මේ ජීවිතෙන් මිදිලා යන්නයි දැන් ඕන වෙලා තියෙන්නේ. බිමල්ව බඳින්න එපා කියලා මට ආපු තර්ජනාත්මක බලවේග මොකක්ද කියලා මම අදටත් කල්පනා කරනවා. බිමල් වගේ කෙනෙක් ආයෙ මට හම්බ වුණොත් මොන තර්ජනේ ආවත් මම බඳිනවා.

බැඳලා මේ අභිගුණ්ඨික ජීවිතෙන් අත මිදෙනවා.

නිරූපා පියුමලී - දිනපොත

2012 මැයි. 20

දවසම නිකම් හොල්මන් වගේ. මගේ කල්පනාවලියේ එක එක පුන්චුන් පාවෙනවා වගේ දැනෙනවා. විශ්ව ශක්තියට එකතු වෙච්ච කිරණ වැඩ කරනවාද මන්දා.

මට අද එක දිගටම මගේ අතීතය මතක් වුණා. අතීතය මහා කැලෑවක කැලෑගත කරන්න මට ඕනෑ. සද්දන්ත වලක් කපලා ඒ වලේ මගෙ අතීතය මම වළලනවා. පස් ගෙනත් පුරවලා ඒ වළ වහලා දානවා.

මතකයෙ වැසි වැටිලා කුණාටු අල්ලලා ගං වතුර ආවත් ඒ අතීතය හෙළවෙන එකක් නෑ. මං එහෙම හිතනවා. ඒත් එකපාරටම පොළව යට ඒ අතීතය පුපුරනවා. පුපුරලා හැම තැනම කෑලි විසිර යනවා. අතීතය එකම ගිනි ජාලාවක් වෙලා මාව පිච්චෙනවා මට තේරෙනවා. මම හයියෙන් කෑ ගහනවා.

මා ළඟට කවුදෝ දුවගෙන එනවා මට ඇහෙනවා. කරකැවෙන හිස මොහොතකට වත්තම් කරගෙන මම අවට බලන්නේ හරිම අසරණවයි.

ඔව් ඇය එනවා. මහා ගිනි කන්දකට සීතල දිය ඇල්ලක් හැරෙව්වා වගේ ඇය එනවා. ඒ මුහුණ මගේ මූණට නැඹුරු වෙනවා ඔව්......... ඒ ඇය ......... ඇය......... තමා.

මගේ ඇස් වල කඳුළු පිරෙනවා. සට සට ගාලා ඒවා බිමට වැටෙනවා. ඒ කඳුළු බර වැඩියි. ඒ ඒවා ඝණත්වයෙන් වැඩි නිසා. මුළු ලෝකෙම මට ගරහාවි. සල්ලාලයෙක්.........



සෙල්ලක්කාරයෙක් කියලා කියාවි. එතකොට මගේ හිත ඇතුලෙ පැහෙනවා මහා දුකක්. ඒ දුක් දුවගේ සාන්ද්‍රනය වැඩියි. ඒ සාන්ද්‍රනය වැඩි නිසා තමයි කඳුළු කැටත් ගල්ගෙඩි වගේ බර වෙන්නෙ. මේක ලෝකයාට තේරෙන එකක් නෑ කවදාවත්ම.

සශීක් උදාකර - දිනපොත

2012 සැප්. 20

ජීවිතේ ගතවෙලා යන ඉක්මණ දැක්කම පුදුම හිතෙනවා. දුව අවුරුද්දට ඇවිත් බොරුවට හිතුම්ම මාත් එක්ක රණ්ඩුවක් හදාගෙන ඇවිලිලා ගියා. ඒක එයාගෙ හැටි. මගේ එයා එක්ක තරහක් නෑ. හරියට තරහ නොවී මේ ගෙදරින් යන්න බෑ වගේ තමා එයා උවමනාවෙන් රණ්ඩු නිර්මාණය කරන්නේ.

බිමල් පුතාටයි ඡායා දුවටයි දෙන්නටම එක වගේ ආදරෙයි. ඒත් දුවට තේරුමක් නෑ ඒ ආදරේ රැකෙන විදියට කතා කරන්න. කටට එන එන හැම දේම කියලා දාලා එයා හිත නිදහස් කරගන්නවා. අනිත් අයගේ හිත් ඇතුලෙ එයා අවුලපු ගින්දරවල අළු දුම් රොටු තැන්පත් වෙනවා.

බිමල් පුතා ගෙ තිබුණු තේරුම් ගැනීමත් ඊට වඩා එයා වෙනස් වුණේ අර ක්ලබ් ගර්ල් එක්ක සම්බන්ධෙ නිසා තමයි. නැත්නම් එයා දැන් මගේ හිත, හිතාමතාම රිද්දන කෙනෙක් නෙමෙයි.

මට දැනෙන්නේ මගේ හිත එන්න එන්නම හිස් වෙනවා එනවා වාගේ. මට වැඩියක්ම පන්සලට යන්න හිතෙනවා. අනේ පන්සලේ බෝගහ යට දී මම විඳින මානසික සතුට මොන තරම්ද? බෝධියේ බෝ කොළ නටන වත්තම හරිම අපූරුයි. ඒ වත්තම මට හැමදාමත් හැම පන්සලකදීම මතක් වෙනවා.

දහම් පාසලේ උගන්නන කාලෙදී ධර්මෙ මට කියලා දීපු ධර්ම කරුණු වගේම තර්ක විතර්ක තාම මට මතක් වෙනවා. හිතකට මුලින්ම ඇතුල් වෙච්ච ආදරණීය හැඟීමක් කවදාවත් අමතක වෙන්නෙ නෑ කියන කතාව සත්‍යක් ඇත්ත. මරණ මංචකයේදීත් අමතක කරන්න බැරි හැඟීම් අතරේ ඒ හැඟීම

පවතිනවා ඇති කියලා මටත් හිතෙනවා. ඒක මට විතරක් පෞද්ගලික වෙච්ච දෙයක් නෙමේ. සිත හිස්කරගන්නා තරමට ජීවිතේ නිදහස්.

දරුවන් ගැන තියෙන අසීමිත ආදරෙන් සිත බර කරගත්තාම එතැන තියෙන්නෙ තෘෂ්ණාවක්. ඔවුන්ට ඔවුන්ගෙ ලෝකවල සතුට සොයාගන්න දීලා නිදහස් වෙන එක හිතට සුවයක්. සැමියා ගැන වුණත් හිත කළකිරිලා ගෙන දුක් විඳින එක මෝඩකමක්.

මම හුඟාක් දුරට අද මේ දේවල් ගැන කල්පනා කළා.

*සඟලා මුතුමාල - දිනපොත*
*දිනය: 2012 මැයි 20*

ආරණ්‍යයේ මිදුලේ දුවැන්ත බෝධිය දිහා නොසෙල්වී බලාගෙන ඉන්න එක උදේ පාන්දර මගේ ජීවිතයේ එක් වතාවතක්. දහම් පාසලේ උගන්නා කාලේ ඉඳන්ම මගේ හිත කාන්දමක් වගේ ඇදිලා ගියේ දහම් පොත් අතරට. බුදු හාමුදුරුවෝ ජීවමානව වැඩ ඉන්න ගතියක් ධර්ම පුස්තක ඇතුලේ මට දැනෙන්න ගත්තා. ලෞකික ආශාවල් කෙරෙහි මගේ කළකිරීම පටන් ගත්තේ බොහොම තරුණ කාලෙදිම නිසා මට මගේ හිත ගැන කිසිම අවිශ්වාසයක් නැහැ. මම මේ ජීවිතයට ඇතුළත් වුණේ මට මගේ සිත හසුරුවාගන්න පුළුවන් වගේම ධර්මය ගැන හදාරන්න මගේ හිතේ ඇති ආසාව සංසිඳුවාගෙන ඒ ආධාරයෙන් සමාජයට කිසියම් මඟ පෙන්වීමක් කරන්න මට පුළුවන් වෙතැයි අධිෂ්ඨානයෙන්.

අද මේ අරණ්‍ය සේනාසනයේ ඉඳගෙන මම මගේ සිත සුවපත් කරගත්තා වගේම අනෙක් අයටත් එසේ කරගන්න හැකි කියලා දෙන්නටත් මට ඉදිරියේදීත් හැකි වේවි.

මගේ සතුට එපමණක්මයි.

*ධර්මාරාම හාමුදුරුවෝ - දිනපොත*
*දිනය: 2012 සැප් 20*



අද උදෑසන තමා උදෑසන. මෙතෙකත් සතුටක් ...... සන්තෝෂයක්.

තාකි ඇඳුම ඇඳගත්තු ලියුම්කරුවා මගේ අතට දීලා ගියේ නිධානයක්........!

නිධානය තමා ලොකු තෑගි පෙට්ටියක්. ගෙවල් දොරවල්, යාන වාහන, හරකා බාන, වතු පිටි, ........ ඒ ඔක්කොටම වඩා වටිනා වස්තුවක් නිධන් කරපු තෑගි පෙට්ටියක් !

"ආදරණීය තාත්තා වෙත,

තාත්තා හිතාගෙන ඇත්තේ තාත්තා එක්ක මම හොඳටම අමනාප වෙලා ඇති කියලා නේද?

අද දවස ගැන හිතුවොත් ඒක එහෙම නෙමෙයි තාත්තේ. මායි මගේ වයිෆ් දුලානියි අපේ පුතායි තාත්තලා බලන්න ලබන 28 වැනිදා ලංකාවට එනවා. ඒ ඇවිත් මාසයක් විතර ඉඳලා යන්නයි කල්පනාව.

එදා තාත්තා එක්ක තරහ වෙලා මම ගෙදරින් පිටවෙලා ගියේ කෙලින්ම නිරූපාව මුණගැහිලා එයා එක්ක ගිහින් රෙජිස්ට්‍රාර් ළඟට යන්නයි. නමුත් එයාගේ අදහස් වෙනස් වෙලා තිබුණා මම ගියාම. මම විශාල කළකිරීමක් ඇති වෙලා එතැනින් එළියට ආවෙ. මට හැමදේම නැති වුණා කියන හැඟීම මාව පිස්සෙක් කරන්න ඇති. ජීවිතේ නැතිකර ගන්න හිතෙන තරමට මම අසරණ වුනා. පස්සෙ මට මතක් වුණා මගේ හොඳ යාළුවෙක් දිමුත්. එයා ඉන්නේ අනුරාධපුරේට බැඳලා. මම කෙලින්ම එයාගේ ගියා. දිමුත්ලා මාව පිළිගත්තේ හරිම ආදරයෙන්. දිමුත් ගේ නෝනාගේ ගෙදර අය මට සැලකුවේ එයාලාගෙම පුතෙකුට වාගේ. එයාලා ඔක්කොම හොඳට ඉඩකඩම් තියෙන බොහොම තම්බුකාර විදියට ජීවත් වෙන මිනිස්සු. අපේ අම්මලාගෙ දුර නෑයොත් වෙනවා කිව්වා. කොහොම හරි මම හරි හිතේ අමාරුවෙන් ඉඳිද්දී මට මෙහේ බැංකුවට ට්‍රාන්ස්ෆර් එක හදලා දුන්නේ දිමුත්ගේ තාත්තා.

ඒ අතරෙදි එයාලා මට යෝජනා කළා එයාලගේ දුව. ඒ කියන්නේ දිමුත්ගේ එකම නංගී දුලානී......

ඊළඟ අවුරුද්දෙ අපි විවාහ වුණා. තාත්තලාට කියලා එව්වෙ නැත්තෙ මගේ හිත සකසා ගන්න ඒ තරම් දුරකට පැහැදිලි තිබුණෙ නැති නිසා. ඊටත් පස්සෙ තමා මට ඔස්ට්‍රේලියා යන්න ලැබුණේ. අපි මෙහේ බොහොම සතුටින් ජීවිතේ ගත කරනවා.

මට තාත්තාට ස්තුති කරන්නයි ඕනෑ මට අර නිරූපා ගෙන් බේරලා දුන්නට. මට ආරංචි වුණා ඊයෙ ආපු යාලුවෙකුගෙන් එයා හරිම නරක චරිතයක් ඇති කෙනෙක්ලු. හරියට එයාගෙ අම්මා වගේ. අම්මත් ක්ලබ්වල නට නටා ඉඳලා සුද්දෙක් බැඳලා සුද්දාව මරා දාලා හිරෙත් ගිය කෙනෙක්ලු. ඒ දවස්වලම සුද්ද මරපු දවස්වලම එයා තව සල්ලිකාරයෙකුට අහුවෙලා ඉඳලා ඒ සම්බන්ධයෙන් තමා ඔය දුව ලැබිලා තියෙන්නෙ. ඒ කියන්නේ නිරූපා........"

මම මොහොතක් ත්‍රස්ත වෙමි. දූන්හම මට මේ හොඳටම ඇත.

පුතාගේ ලියුම මට ඊට එහාට කියවන්ට බැරිය. ඒත් ලියුමේ මේ මුල් ටික මට සතුටු වෙන්න හොඳටම ඇතිය.

සහදා දුවගෙන ඇවිත් මගේ අතින් ලියුම උදුරාගෙන කියවයි. අපි දෙන්නා ගේම ඇස්වල කඳුළු.

යමු යමු ගෙට.......... මිනිස්සුත් බලාවි අපිට පිස්සුද කියලා මේ රට ලියුමක් අතේ තියාගෙන තරහෙට අඩ අඩා ඉන්නේ."

ඇය මගේ පිටට අත තබා මා ගේ දෙසට තල්ලු කරමින් වාගේ කියද්දී මගේ හිත බර වෙයි. මට මා ගැන දුකය.

ලෝකය ලස්සන වන්නේ කුමකින්ද? මිනිසුන්ගේ සිත්වලින්ය. ඒ සිත් ලෝකයට විවෘත වන විටය. හිත පුරා ගත පුරා තෙරපෙන පීඩාවල් තැවුල් මා විසින් දුරලිය යුතුය.

ආලින්දයට ගොඩ වී ඇඳි පුටුවේ වාඩිවී මම බිරිඳ දෙස බලා ඉඳිමි.

ඇයද ලියුම අතේ තියාගෙන හාන්සි පුටුවක වාඩි වෙලාය.



"සමන්තා........!"

මම ඇයට කතා කරමි.

මේ විදියට මා ඇය දිහා බලන්නේ දහස කියනට පස්සෙදුරයි නොදනිමි.

"මං දන්නවා ඔයා කල්පනා කරන්නේ දූ ගැන නේද? දූලත් මේ සති අන්තෙ ඇවිත් යන්න එනවා කිව්වා ඔන්න........"

සමන්තාගේ ඇස් දිලිසෙයි. ඒවා පිරිසිදු පළිඟු වගේය. වෙනදා තරමම දිස්නයක් නැතත් තාමත් ඒ ඇස් දිලිසෙයි.

"ඇයි........ රංජිත් ඔයා අමුතු විදියට බලන්නෙ?"

"ඔයා මාත් එක්ක තරහද සමන්තා........"

"ඒ මොකටද ........?"

"ඔයාගෙ පුතා ඔයාට නැති කළා කියලා ඔයා එයා ගෙදර දාලා ගියදා ඉඳන්ම මට සාප කළා නේද?"

ඇ නිහඬය. ඒ නිහඬතාවය මට මහා දඬුවමක් වගේය. දැන් අවට කිසි දෙයක් ඇසෙන්නේ නැත. එහා ගෙදරකින් රේඩියෝ හඬක් යාන්තමට ඇසෙයි.

"සමන්තා........ මට ඔයාට යමක් කියන්න තියෙනවා........ ඒක අහලා ඔයා මා එක්ක තරහා වුණත් මං තරහා නෑ."

"ඉතිං කියන්න" යැයි නොකියා සමන්තා බලා සිටියි.

"මම පුතාගෙ සම්බන්ධෙට තදින්ම විරුද්ධ වෙච්ච එක කාරණයක් තියෙනවා........ ඒක........"

"එපා........ එපා........!"

ඇ මාව වළක්වන්නේ කෑ ගසමින්.

"කියන්න එපා මං ඒක දන්නවා.....!"

"මොනවා........?"

"මං ඊයෙ ඔයාගෙ දිනපොත් කැලි කියෙව්වා."

ඇ සිනාසෙයි. ඒ යාන්තමටය. ඒත් එය හොඳින් දේ පවසයි.

"ඉතිං කෝ ඔයාගෙ අලුත් නවල් එක........ ඒක ලියන්න තාම හිතුවෙ නැද්ද ඉතිං........"

"ඒක ඉතිං දැන් ඔයා කියවලා ඉවරයනෙ සමන්තා."

"මගේ අත් පිටපත ඔන්න ඉස්සෙල්ලම කියෙව්වෙ ඔයා.......... ඒක එහෙම වුණු එකට මං කැමතියි.........."

"මාත් කැමතියි ඒක එහෙම වුණු එකට..........!"

ඈ කියන්නේ ඇස්වල කඳුළු පුරවාගෙනය. ඇය තවදුරටත් මා සිතා සිටි මගේ රළු පරුෂ භාර්යාව නොවේ. ඈ සියුමැලි කුඩා දැරියක සේය. අතීතය නින්නාද වෙනවා ඇසේ. ඒත් එයින් ඇය භ්‍රාන්ත වන්නේ නැත.

"මම ඔයා ගැන දන්නවා රංජිත්......... සැමියෙකුගෙ හිත එයාගෙ භාර්යාව තරම් වෙන කෙනෙක් හඳුනන්නෙ නෑ........"

මම ඇගේ හිස මත මගේ අත තබමි.


එය තාත්තා කෙනෙකු දුවගේ හිස මත තබන අතකි...!

ඇය මගේ ඒ අතින් අල්ලා ගනියි.

එය අම්මා කෙනෙකු තම පුතුගේ අත අල්ලා ගන්නාක් බඳු සිලිලැල් පහසකි.....!

- ඉවරයි -

kathapothak.blogspot.com



# නින්නාදේ

[illegible]

[illegible]

kathapothak.blogspot.com

[illegible]

[illegible]



මිල රු. 420/-

ISBN 978-955-8933-72-[illegible]